# සාමඤ්ඤ ඵල සූත්‍රය


නා උයන ආරණ්‍යස්ථ ශ්‍රී සම්බුද්ධ
ශාසන අනුග්‍රහ සමිතිය
නා උයන ආරණ්‍ය සේනාසනය,
පන්සියගම.

**සම්පාදක :-**
**පූජ්‍ය නිකපිටියේ ගුණරතන හිමි.**

**(ධර්මදානය පිණිසයි)**

ශ්‍රී බුඃ වඃ 2601 වූ වප් මස අව පැලවිය නම් තිථිය ලත් බුධ ද

ව්‍යඃ වඃ 2017. 09. 06



ශ්‍රී ලංකා රාමඤ්ඤ මහා නිකායෙහි අනුනායක, මහෝපාධ්‍යාය, මහා කර්මස්ථානාචාර්ය, ත්‍රිපිටකධරාචාර්ය, පරම පූජනීය නා උයනේ අරියධම්මාභිධාන මහා ස්වාමින් වහන්සේ

# පුදමි ගුරු පූජාව විලසින...

නිරිඳු අජසත් - යුතුව සැදැ සිත්...
දිනක ගොයුම්ගොත් - සමිඳු සොයා ගොස්...

පැවිදි දිවියකින් - ලබන ඵලය කිම්...
ඇසුව පැනයකින් - සමිඳු දෙසුව දම්...

සැදැහැ සිත් පටන් - යුතුව පිළිවෙළින්...
කෙටිව මග නිවන් - සදන මග ඵලින්...

සියලු දුක තුරන් - කරන නිවන තෙක්...
දෙසුව පැවිද්දෙන් - ලබනතුම් ඵලයන්...

සමණ ඵල සුතුරින් ...

මේ උතුම් දම්කඳ - සිතට අරගෙන සොඳ...
වඩමු ගුණ මඳ මඳ - දමන තෙක් දුක් කන්ද සිඳබිඳ...

වත්මනෙහි වැඩසිටි - නා උයනෙ අප මාහිමි...
ලෙසින් ගුණයට රුසි - වෙලා අගුණය නිතර පටහැනි...

බඹ සුර නරන් විත් - නමකරයි කරතුට සිත්...
සිල්ගුණ කඳ මහත් - වූ නිසයි මනුලොවේ සිටියත්...

සමිඳු දිවි පුරා පැතිරුණ - සමණ ගුණ වනා කියමිණ...
සුසැදි මේ ගත කුළුණින - පුදමි ගුරු පූජාව විලසින...

සාධු සාධු සාධු...

# හැඳින්වීම

## නමො තසස භගවතො අරහතො සමමා සමබුදධසස

**"අප්පමාදරතො භික්ඛු - පමාදෙ භයදස්සි වා,**
**අභබ්බො පරිහානාය - නිබ්බානස්සෙව සන්තිකෙති"**

අප්‍රමාදයෙහි ඇලුණා වූ, ප්‍රමාදයෙහි භය දක්නා සුලු භික්ෂුව පිරිහීමට යෝග්‍ය නොවේ. නිවන සමීපයෙහිම සිටියේ වෙයි.

(අං: චː නිː චක්ක වː අපරිහානිය සුත්ත)

ඇවිදින සත්වයන්ගේ පා සටහන්වලින් ඇත් පා සටහන මහත් වේ ද, කුළු ගෙයක පරාල සියල්ලට කැණිමඩල ප්‍රධාන වේ ද, සුවඳ මුල් වර්ග අතර කලුවැල් සුවඳ අග්‍ර වේ ද, සුවඳ හර අතර රත් සඳුන් සුවඳ අග්‍ර වේ ද, සුවඳ මල් වර්ග අතර දෑ සමන් පිච්ච මල් සුවඳ අග්‍ර වේ ද, ලොව රජවරු අතර සක්විති රජහු අග්‍ර වේ ද, තාරකාවන්ගේ ආලෝකයන්ට වඩා චන්ද්‍රාලෝකය අග්‍ර වේ ද, සරත් කාලයෙහි පහ වූ වලාකුළු ඇති අහසෙහි සූර්යයා අන්ධකාරය නසා සියලු ආලෝකයන්ට අග්‍ර වේ ද, සමුද්‍රයට ගලා බස්නා ගඞ්ගා, යමුනා, අචිරවතී, සරභූ, මහී, ආදී මහා ගඞ්ගාවන්ට මහා සමුද්‍රය අග්‍ර වේ ද, එසේම මේ ලෝකයෙහි යම්තාක් කුසල ධර්මයෝ වෙත් ද, ඒ සියල්ල අප්‍රමාදය මුල්කොට ඇත්තේ වේ. අප්‍රමාදයෙන්ම රැස් වන්නේ වේ. ඒ කුසල ධර්මයන්ට අප්‍රමාදය ශ්‍රේෂ්ඨ ද, අග්‍ර ද වේ යැයි කියනු ලැබේ.

දිනක් පසේනදි කොසොල් රජතුමා භාග්‍යවතුන් වහන්සේ වෙත ගොස් මිනිසුන්ට මෙලොව පරලොව දෙකෙහි වැඩ සිදුකර දෙන එකම ධර්මයක් ඇත්තේ ද යැයි ඇසූ ප්‍රශ්නයට භාග්‍යවතුන් වහන්සේ, ඇත්තේය මහරජ, ඒ අප්‍රමාදය යැයි වදාළ සේක.

අප්‍රමාදය සීල පූර්ණය, ඉන්ද්‍රිය සංවරය, භෝජනයෙහි පමණ දැනීම, නිදි වැරීම ආදී වූ උසස් ශාසන ප්‍රතිපත්තීන් පූර්ණයට ද උපකාර වන්නා වූ ප්‍රධාන ධර්මය වේ.

අජාසත් රජතුමා භාග්‍යවතුන් වහන්සේ වෙත ගොස් සසුන් පැවිද්ද ලැබූ භික්ෂූන් වහන්සේට මෙලොවදීම දැකිය හැකි සාමඤ්ඤ ඵලයක් දැක්විය හැකිද, යනුවෙන් ඇසූ ප්‍රශ්නයට පිළිතුරු වශයෙන් භාග්‍යවතුන් වහන්සේ සාමඤ්ඤ ඵල එකුන් විස්සක් (19) දක්වමින් භික්ෂුවකට මෙලොවදීම අප්‍රමාදී විහරණයෙන් ලැබිය හැකි ඵලයන් වදාළ සේක.

මේ ලෝකයෙහි බුදු සසුනක ඇති භික්ෂු ප්‍රතිපදාව හා සමාන ගාම්භීර වූ ද, උත්කෘෂ්ඨ වූ ද, ප්‍රතිපදාවක් තවත් නැත. එම ශාසන ප්‍රතිපදාවෙහි අග්‍ර ශ්‍රාවක, මහා ශ්‍රාවක ආදී මහ රහතන් වහන්සේලා හා අනෙකුත් ආර්‍ය මහෝත්තමයන් වහන්සේලාම අග්‍ර වෙති.

සම්බුද්ධ ශාසන පැවිද්ද ලැබූ පෘථග්ජන භික්ෂූන් වහන්සේලා අතර සසුන් පැවිද්ද ලැබූ සම්බුද්ධත්වය පිණිස නියත විවරණ ලැබූ මහ බෝසතාණන් වහන්සේලා හා සමාන කිසිවෙකු නැත. සම්මා සම්බුදු රජාණන් වහන්සේ වදාළ ධර්මය - විනය මනාව ප්‍රගුණ කොට සසුන් පිළිවෙතෙහි මනාකොට හැසිරෙමින් අන්‍යයන්ට ද ඒ සඳහා උපකාර වෙමින් නිර්මල බුද්ධ වචනය ලොවට කියා දෙමින් ධර්ම දේශනා පවත්වමින් සසුන් පිළිවෙත මනාව හසුරුවන්නේ මහ බෝසතාණන් වහන්සේලාම ය.

ශ්‍රී කල්‍යාණී යෝගාශ්‍රම සංස්ථාව පිහිටුවා වදාළ පරම පූජනීය **මහෝපාධ්‍ය, රාජකීය පණ්ඩිත, කඩවැද්දුවේ ශ්‍රී ජිනවංශ මහා ස්වාමීන් වහන්සේ** ගේ නොසැලෙන අව්‍යාජ තේජවන්ත පැවැත්මෙන් ද, තත් සංස්ථාව බබුළුවමින් අලංකාරමත් කළ **මහෝපාධ්‍ය මහා කර්මස්ථානාචාර්‍යය, ත්‍රිපිටකධරාචාර්‍යය, පරම පූජනීය නා උයනේ අරියධම්මාභිධාන මහා ස්වාමීන් වහන්සේ** ගේ උත්කෘෂ්ඨ ප්‍රතිපත්තිකාමී පරමාදර්ශී පැවැත්මෙන් ද ඒ බව මනාව පැහැදිලි වන්නේම ය.

අති පූජනීය නා උයනේ අරියධම්මාභිධාන මහා නාහිමිපාණන් වහන්සේ අපවත් වී මෙම 2017-09-07 දිනට වසරක් සපිරීම නිමිත්තෙන් නා උයන ආරණ්‍යස්ථ ශ්‍රී සම්බුද්ධ ශාසනානුග්‍රහ සමිතිය මඟින් කළ ආරාධනයෙන් භික්ෂු ජීවිතයක හරය පැහැදිලි කරමින් දේශනා කොට වදාළ මෙම අගනා ධර්ම ග්‍රන්ථය මෙලෙස සකස් කරනුයේ ගුරු උපහාර පූජාවක් වශයෙනි. මෙම ග්‍රන්ථය පරිපූර්ණ ලෙස සැකසීමට මාස ගණනක් දිවා රෑ වෙහෙසීමෙන් සිදුකරගත් අප්‍රමාණ කුසලස්කන්ධය පරම පූජනීය **මහෝපාධ්‍ය, රාජකීය පණ්ඩිත, කඩවැද්දුවේ ශ්‍රී ජිනවංශ මහා ස්වාමීන් වහන්සේට** ද, **මහෝපාධ්‍ය මහා කර්මස්ථානාචාර්‍යය, ත්‍රිපිටක ධරාචාර්‍යය, පරම පූජනීය නා උයනේ අරියධම්මාභිධාන මහා ස්වාමීන් වහන්සේට** ද සමත්‍රිංශත් පාරමී ගුණ සුවසේ සපුරා මතු ලොව්තුරු බුදුබව ලබන්නට හේතු වේවා. එසේම යෝගාශ්‍රම සංස්ථාවෙහි ප්‍රධානාචාර්‍යය පරම පූජනීය **මාතර ශ්‍රී ඥානාරාම මහා**

**ස්වාමින් වහන්සේ, නා උයන ආරණ්‍යයෙහි වැඩසිට අපවත් වී වදාළ අති පූජනීය විගොඩ බෝධිරක්ඛිත මහා ස්වාමින් වහන්සේ** ප්‍රධාන අපවත් වී වදාළ සියලු මහා සංඝරත්නයට සුවසේම ප්‍රාර්ථනීය බෝධියෙන් නිවන්සුව ලබන්නට හේතු වේවා.

**පරම පූජනීය අග්ගමහා කර්මස්ථානාචාර්ය්‍ය ඌ ආචිණ්ණ සයාඩෝ මහා ස්වාමින් වහන්සේ** ප්‍රධාන ප්‍රතිපත්තිකාමී මහ සඟ රුවණට ද, ශ්‍රී ලංකාද්වීප ප්‍රතිපත්ති ශාසනයෙහි චූඩාමාණික්‍ය බඳු වූ නා උයන ආරණ්‍ය සේනාසනයෙහි ප්‍රධානාචාර්ය්‍ය අති පූජනීය **මීගොඩ මහා ස්වාමින් වහන්සේට** ද, ආරණ්‍යය සේනාසනයෙහි **කෘත්‍යාධිකාරී ප්‍රධාන කර්මස්ථානාචාර්ය්‍ය අති පූජනීය අඟුල්ගමුවේ අරියනන්ද මහා ස්වාමින් වහන්සේට** ද, අනෙකුත් මහ සඟරුවනට ද, ලංකාවාසී වූ ද, ලෝකවාසී වූ ද සියලු මහසඟරුවණට ද සසුන් කෙත බබුළුවමින් සුවසේ පිළිවෙත් සපුරා නිවන් සුව ලබන්නට හේතු වේවා. මෙම ධර්ම ග්‍රන්ථය සැකසීමට ආරාධනා කළා වූ ද, මුද්‍රණය සඳහා ධන පරිත්‍යාග කළා වූ ද නා උයන ආරණ්‍යස්ථ ශ්‍රී සම්බුද්ධ ශාසනානුග්‍රහ සමිතියේ නිලධාරී මණ්ඩලය ප්‍රධාන සාමාජික සියලු දෙනාට ද සියලු ප්‍රාර්ථනා ජයගෙන සුවසේ නිවන්සුව ලබන්නට හේතු වේවා!. සදේවක ලෝකවාසී සියලු සත්නට ද ලෞකික ලෝකෝත්තර සියලු සම්‍යක් ප්‍රාර්ථනා ජය ගැනීමට හේතු වේවා. මහා සංඝරත්නයට දනෝපස්ථානාදියෙන් මහෝපකාරීව සිටින දයක කාරකාදී සැමට ද, උපකාරක අනුග්‍රාහක සැමට ද සුව සේ නිවන්සුව ලබන්නට හේතු වේවා. මෙම ග්‍රන්ථය මනාව මුද්‍රණය කර දුන් මුද්‍රණාලයාධිපතිතුමා ප්‍රධාන කාර්ය්‍ය මණ්ඩලයට ද, මේ සඳහා දයකත්වය දැරූ පින්වතුන්ට ද සියලු ප්‍රාර්ථනාවන් ජය ගෙන නිවන්සුව ලැබීම පිණිස ම හේතු වේවා!

**"සද්ධම්මො චිරං තිට්ඨතු!"**

මෙයට සසුන් ලැදි,

නිකපිටියේ ගුණරතන හිමි.
නා උයන ආරණ්‍යය,
පන්සියගම,
මැල්සිරිපුර.

# ප්‍රස්ථාවනාව

## නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස

**"යො ච සමෙති පාපානි - අණුං ථූලානි සබ්බසො,**
**සමිතත්තා හි පාපානං - සමණොති පවුච්චතීති."**

(ධම්මපද, ධම්මට්ඨ වග්ග)

**"යම් භික්ෂුවක් කුඩු මහත් පාපයෝ සර්වප්‍රකාරයෙන් සන්සිඳුවයි ද, එසේ පාපයන් සන්සිඳ වූ බැවින් (ඒ උතුමන් වහන්සේ) ශ්‍රමණයෙකු යැයි කියනු ලැබේ"**

කල්ප කෙල ලක්ෂ ගණන් කල් ලෝකය පවතියි. පවතින ඒ ලෝකය තුළ මිනිසා, සතා, සිවුපාවා, ගස්, වැල් හටගනියි. නැසෙයි. තව තව විවිධ ලෙස හටගනියි. එසේ ඇතිව නැතිව යන දේවල් අතර ඉහළ අගයකින් යුත්, වටිනා දුර්ලභ වස්තු ද පහළ වේ. සඳුන් ගස ඉතා වටනේ ය. එහෙත් සෑම කැලයක ම සඳුන් ගස් නැත. ගල්කැට තිබූ පමණින් ඒ සෑම එකක් ම මැණික් වන්නේ නැත. ගජමුතු ඉතා වටින දෙයක් වුව ද, සෑම ඇතෙකුගේ ම ගජමුතු නැත. එලෙස ම උතුම් මනුෂ්‍ය ලෝකයෙහි මිනිසත් බව ලබා ඉපදුණු පමණින් සෑම මිනිසෙකුට ම කල්‍යාණ මිත්‍රයෙකු විය නොහැකි ය. එබඳු කල්‍යාණ මිත්‍රයන් අතරෙහි ද, සත්වයන් කෙරෙහි මහත් වූ කරුණා - මෛත්‍රී - අනුකම්පා ගුණයෙන් යුතු බෝසත් ගුණ ඇති උතුමන් ද අති දුර්ලභ ය. ඊටත් වඩා පරම දුර්ලභ වූ ලොවට හිත ඇති එකම කල්‍යාණ මිත්‍රයන් වහන්සේ නම් තුන් ලෝ ගුරු වූ සම්මා සම්බුදු රජාණන් වහන්සේ ය.

ලෝකයෙහි අති දුර්ලභව පහළ වී ලොව ඇති සැබෑ සත්‍ය ධර්මය ඉස්මතු කොට සදේවක ලෝ සතුන්ට පෙන්වා අවිදු අඳුර මකා සත්වයන්ට සදකාලික සැනසුම් සුවය උදකර දෙන්නේ තථාගතයන් වහන්සේලාම ය. ඒ උත්තම ධර්මය ලොවට දේශනා කර සැබෑ ශාසනයක් පිහිටුවීමෙන් සිවු පිරිස් සකස් වෙති. ඒ සිවු පිරිස් අතර කල්‍යාණ මිත්‍ර සසුන් පැවිද්ද ලැබූ ශ්‍රමණයන් වහන්සේ මත මුළු බුදු සසුනම පවත්නේ ය. ඒ මහ සඟරුවන ශ්‍රී සද්ධර්මය පිහිටීමට, ප්‍රචලිත

කිරීමට, ධර්මය රැකීමට, ඉදිරියට පවත්වා ගැනීමට උපකාර වන ප්‍රධාන පිරිස වේ. එලෙස කිරීමට ද සැබෑ ලෙස ශ්‍රමණ බැව්හි පිහිටි ශ්‍රාවකයෙකු විය යුතු ය.

සැබෑ ශ්‍රමණභාවය ඇතිකර ගැනීමට හැකි මාර්ගය සම්මා සම්බුද්ධ රජාණන් වහන්සේ පෙන්වා වදාළ සේක. ඒ වනාහී සීල, සමාධි, ප්‍රඥා යන ත්‍රී ශික්ෂා ධර්ම මාර්ගයයි. එම උතුම් ධර්ම මාර්ගයට පිවිස ක්‍රම ක්‍රමයෙන් සැබෑ ශ්‍රමණ ඵල හෙවත් පැවිදි දිවියේ උතුම් ප්‍රතිඵල තුළින් පැවිදි සැපයෙන් සැනසීමට ද, කෙළවර සියලු කෙලෙස් නැසීමෙන් පරම සැපය වන නිවන් සුවයත් සාක්ෂාත් කරගන්නා ආකාරය පිළිවෙලින් මෙම ශ්‍රමණ ඵල සූත්‍ර දේශනාවෙන් මනාව පෙන්වා දී ඇත්තේ ය. ගිහි සම්පත් හැර සසුන් ගතවන ශ්‍රමණයන් වහන්සේ පළමුව පිරිසිදු සීලයෙන් යුතුව තම ජීවිතය තුළ සීල පාරිශුද්ධිය ඇතිකර ගත යුතු ය. ඒ නිර්මල සීලය පිහිට ආධාර කරගෙන සිත සමාහිත කරගත යුතු ය. ඒ අතර පියවරෙන් පියවර ප්‍රඥාව දියුණු කරගත යුතු ය. එලෙස මුහු කරවන ලද ප්‍රඥාව තුළ පිහිටාගෙන නිවන් මග ඉදිරියට අනුගමනය කළ විට ශ්‍රමණ භාවයේ උසස්ම සුවය විඳ ගැනීමට හැකි වන්නේ ය. එයින් මෑත ඒ මාර්ගයෙහි ගමන් කිරීමෙහි දී සීලයෙන් ශක්තිමත් වීමේ ඉතා වටිනා ප්‍රතිඵල විඳීමට හැකි වන්නේ ය. සමාධියෙන් ශක්තිමත් වූ විට එය වඩාත් ප්‍රකටව දැනෙන්නේ ය. ප්‍රඥාව දියුණු වූ විට ගෙවෙන නිමේෂයක් පාසා අවබෝධයෙන් නුවණින් සියලු දේ තුළ සැබෑ තතු දකිමින් ඉතා සැහැල්ලුවෙන් සියලු කටයුතු කළ හැකි වන්නේ ය. ඉතිරි නැතිව සියලු කෙලෙස් සහමුලින් උදුරා දැමූ ශ්‍රමණ දිවිය ශ්‍රමණ ඵලයෙහි උත්තම ස්වභාවය යි. එම උතුම් මාර්ගය වැඩීම ම දෙවියන් සහිත බඹුන් සහිත සමස්ත ලෝක ධාතුවට ම උතුම් ආශිර්වාදයක් ශාන්තියක් වන්නේම ය. ඒ උත්තම ශ්‍රමණ ඵලය උදාකර ගැනීම පිණිස මහා කාරුණික සම්මා සම්බුදු රජාණන් වහන්සේ මුල සිට ක්‍රමානුකූලව පැවිද්ද ගතකළ යුතු ආකාරය පෙන්වා දුන් ආකාරයට ම පාලි, අර්ථකථා, ටීකා හා සංගෘහිත ග්‍රන්ථ හා තමන් වහන්සේ ගේ ශ්‍රමණ අත්දැකීම් පාදක කොටගෙන සකසන ලද මේ උත්තම ග්‍රන්ථය කාලීන ව ඉතා වැදගත් සත්කාරයක් සේ ද, සසුනට කරන උතුම් ධර්ම සංග්‍රහයක් සේ ද වටනේ ය. මේ සත්කාරයෙහි වටිනාකමට තවත් කාරණයක් ඇත. එනම් මීට වසරකට පෙර අපවත් වී වදාළ අර්ථයෙන් ධර්මයෙන් අනුශාසනා කළ ශ්‍රමණ

ගුණයෙන් පරතෙරට පැමිණියා වූ මහ බෝසත් ගුණයෙන් පිරිපුන් වූ දහස් සංඛ්‍යාත දෙස් විදෙස් සඟ පිරිසට මෙන් ම මුලු මහත් ලෝකයාට ම උතුම් පින් කෙතක් වූ මනා ශ්‍රමණ ඵලයන්ගෙන් අනූන වූ නා උයනේ ශ්‍රී අරියධම්ම මහා ස්වාමීන්ද්‍රයන් වහන්සේ ගේ වර්ෂ පූර්ණ පුණ්‍යෝත්සවය වෙනුවෙන් ගුරු පූජාවක් විලසින් ඒ උතුම් ජීවිතයේ පැවතියා වූ ගුණ කඳ විවරණය කිරීමක් ලෙසින් ද මෙම ග්‍රන්ථය එළි දැක්වේ.

සියලු පැවිදි පිරිසට ම විශේෂයෙන් තම පැවිදි දිවියේ අරුත් බව වැඩිකර ගැනීමට රසාලිප්ත වූ පැවිදි දිවියක් ගෙවන්නට හැකි පමණින් හෝ පරිශීලනය කළයුතු ධර්ම කොට්ඨාශයන් මෙහි අඩංගු වේ.

මෙලෙස කාලීන ව ඉතා වැදගත් වටිනා ධර්ම ග්‍රන්ථයක් සම්පාදනය කළා වූ පූජ්‍ය නිකපිටියේ ගුණරතන ස්වාමීන් වහන්සේට තවත් මෙවැනි වූ උතුම් සද් කාර්‍යයන් සිදු කිරීමට ත්‍රිවිධ රත්නයේ ආනුභාවයෙන් සහ අප සැමගේ ආශිර්වාදයෙන් ධර්ම ඥානය, භාවනා ඥානය සත, සහස්‍ර ගුණයෙන් වැඩි දියුණු වේවා. සියලු ශාසනික අභිමතාර්ථයන් සමෘද්ධ වේවා යැයි ආශිර්වාද කරමි.

ග්‍රන්ථය සම්පාදනයට සහය වූ සැමටත්, මුද්‍රණ වියදම් දරණ සැමටත්, මුද්‍රණය සිදුකරන සැමටත් සුව සේ නිර්වාණ ධාතුව සාක්ෂාත් වේවා. දෙවියන් සහිත ලෝකයාට ම උතුම් නිවන් මග විවර වේවා යැයි ඉත සිතින් ආශිර්වාද කරමි.

**"උතුම් ශ්‍රමණ ගුණ තුළින් සම්බුදු සසුන පන්දහසක් කල් පවතීවා!"**

**"චිරං තිට්ඨතු සද්ධම්මො - ධම්මෙ හොන්තු සගාරවා"**

මෙයට ශාසන ලැදි,

**පූජ්‍ය අඟුල්ගමුවේ අරියනන්ද මහා ස්ථවිර,**
**නා උයන ආරණ්‍යය,**
**පන්සියගම,**
**මැල්සිරිපුර.**

# පටුන


හැඳින්වීම.......................................................................................III

ප්‍රස්ථාවනාව.....................................................................................VI

සාමඤ්ඤ ඵල සූත්‍රය.............................................................................. 1

❄ සූත්‍ර නිදානය................................................................................. 1

❄ ප්‍රථම ධර්ම සංගායනාව .........................................................................2

☸ අනද තෙරුන් රහත්වීම ..........................................................................9

☸ විනය සංගායනා කිරීම...........................................................................10

☸ ධර්මය සංගායනා කිරීම .........................................................................11

☸ ධර්ම විනය බෙද දැක්වීම ......................................................................12

❄ සාමඤ්ඤඵල සූත්‍ර සංගායනාව .................................................................. 16

☸ නිසි බුද්ධෝපස්ථායෙකු නොවීම .............................................................. 17

☸ නිත්‍ය උපස්ථායෙකු පත් කර ගැනීම......................................................... 19

☸ ප්‍රතික්ෂේප සතර .............................................................................20

☸ ආයාචනා සතර ................................................................................20

☸ ජීවක වෛද්‍යාචාර්‍යතුමාගේ උත්පත්ති කථාව..............................................28

☸ ජීවකම්බවන පූජාව ...........................................................................29

☸ අජාසත් රජතුමාගේ උත්පත්ති කථාව ......................................................30

☸ දේවදත්ත තෙරුන්ගේ පැවිද්ද .................................................................. 31

☸ අජාසත් කුමරුගේ පීතෘ ඝාතනය............................................................. 33

☸ බුදුරජාණන් වහන්සේ මැරවීමේ උත්සාහය ................................................. 36

☸ අජාසත් රජු දිට්ඨධර්ම කර්ම විපාක විඳීම....................................................46

❄ රාජාමාත්‍ය කථා ..............................................................................49

⌘ පූර්ණ කාශ්‍යප ..............................................................................50

⌘ මක්ඛලි ගෝසාල ............................................................................ 51

⌘ අජිතකෙසකම්බල ..... 52
⌘ කකුධකච්චායන ..... 53
⌘ සඤ්ජය බෙල්ලට්ඨිපුත්‍ර ..... 54
⌘ නිගණ්ඨනාථපුත්‍ර ..... 54
❄ ජීවක වෛද්‍යාචාර්‍ය්‍යතුමාගේ බුදුගුණ වැනුම ..... 55
❄ අජාසත් රජතුමා ශ්‍රමණ ඵල විචාරීම ..... 63
☸ පූර්‍ණ කාශ්‍යපගේ වාද ..... 70
☸ මක්ඛලිගොසාලගේ වාද ..... 73
☸ අජිතකෙසකම්බලගේ වාද ..... 77
☸ කකුධ කච්චායනගේ වාද ..... 79
☸ නිගණ්ඨනාතපුත්‍රගේ වාද ..... 81
☸ සඤ්චයබෙලට්ඨපුත්‍රගේ වාද ..... 82
❄ ප්‍රථම සාන්දෘෂ්ටික ශ්‍රමණ ඵලය ..... 86
❄ දෙවන සාන්දෘෂ්ටික ශ්‍රමණ ඵලය ..... 91
❄ ප්‍රණීතතර ශ්‍රමණ ඵලය ..... 94
☸ ආචාරය ..... 107
☸ ගෝචරය ..... 109
⌘ උපනිස්සයගොචරය ..... 110
⌘ ආරක්ඛගොචරය ..... 113
⌘ උපනිබන්ධගොචරය ..... 114
❄ චූළ සීලය ..... 116
❄ මධ්‍යම සීලය ..... 123
⌘ ආහාර සන්නිධි ..... 123
⌘ පාන සන්නිධි ..... 124
⌘ වස්ත්‍ර සන්නිධි ..... 124
⌘ යාන සන්නිධි ..... 125

⌘ සයන සන්නිධි ........ 125

⌘ ගන්ධ සන්නිධි ........ 125

⌘ ආමිස සන්නිධි ........ 126

❈ මහා සීලය ........ 130

❈ ඉන්ද්‍රිය සංවරය ........ 136

❈ සති සම්පජඤ්ඤය ........ 136

❈ සිව්පස ප්‍රත්‍යය සන්තෝෂ ........ 138

❈ නීවරණ ප්‍රහාණය ........ 147

☸ කාමච්ඡන්ද නීවරණය ප්‍රහාණය කිරීම ........ 147

☸ ව්‍යාපාද නීවරණය ප්‍රහාණය කිරීම ........ 149

☸ ථිනමිද්ධය නීවරණය ප්‍රහාණය කිරීම ........ 151

☸ උද්දච්ච කුක්කුච්ච නීවරණය ප්‍රහාණය කිරීම ........ 154

☸ විචිකිච්ඡා නීවරණය ප්‍රහාණය කිරීම ........ 156

❈ ප්‍රථම ධ්‍යාන ලාභය ........ 158

❈ දුතියධ්‍යාන ලාභය ........ 160

❈ තතියධ්‍යාන ලාභය ........ 161

❈ චතුර්ථධ්‍යාන ලාභය ........ 162

❈ ආකාසානඤ්චායතන සමාපත්ති ලාභය ........ 163

❈ විඤ්ඤාණඤ්චායතන සමාපත්ති ලාභය ........ 164

❈ ආකිඤ්චඤ්ඤායතන සමාපත්ති ලාභය ........ 165

❈ නෙවසඤ්ඤානාසඤ්ඤායතන සමාපත්ති ලාභය ........ 165

❈ චුද්දසාකාර චිත්ත වශීතාවය ........ 166

❈ විදර්ශනා ඥාන ප්‍රතිලාභය ........ 169

☸ දිට්ඨි විශුද්ධිය ලාභය ........ 169

☸ කංඛාවිතරණ විශුද්ධි ලාභය ........ 171

☸ මග්ගාමග්ග ඤාණදස්සන විශුද්ධි ලාභය ........ 171

- ☸ ප්‍රතිපද ඤාණදස්සන විශුද්ධි ලාභය ........ 172
- ❇ මනෝමය ඍද්ධි ඤාණ ලාභය ........ 173
- ❇ ඍද්ධිවිධ ඤාණ ලාභය ........ 175
- ❇ දිබ්බසෝත ඤාණ ලාභය ........ 176
- ❇ චේතෝපරිය ඤාණ ලාභය ........ 177
- ❇ පුබ්බේනිවාස ඤාණ ලාභය ........ 178
- ❇ දිබ්බචක්ඛු ඤාණ ලාභය ........ 180
- ❇ ආශ්‍රවක්ෂය ඤාණ ප්‍රතිලාභය ........ 182
- ❇ අජාසත් රජතුමා උපාසකත්වය ප්‍රතිඥා කිරීම ........ 185
- ❇ සරණාගමනය ........ 189
  - ☸ ලෝකෝත්තර සරණගමනය ........ 190
  - ☸ ලෞකික සරණගමනය. ........ 190
    - ⌘ අත්තසන්නීයාතන සරණාගමනය ........ 191
    - ⌘ තත්පරායන සරණාගමනය ........ 191
    - ⌘ ශිෂ්‍යභාවෝපගමන සරණාගමනය ........ 191
    - ⌘ පණිපාත සරණාගමනය ........ 192
- ❇ පුණ්‍ය ප්‍රාර්ථනා ........ 197

# සාමඤ්ඤ ඵල සූත්‍රය

## නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස

## ❄ සූත්‍ර නිදනය

භාග්‍යවත් අර්හත් සම්මා සම්බුදු රජාණන් වහන්සේ රජගහ නුවර ජීවක වෛද්‍යාචාර්යතුමා විසින් සකස් කොට පූජා කරන ලද ජීවක අඹ වනයෙහි වැඩසිටි දිනක මෙම සාමඤ්ඤ ඵල සූත්‍රය අජාසත්ත රජතුමා හට දේශනා කොට වදළ සේක. ඒ පිළිබඳ අර්ථ විවරණය මෙසේය.

**"එවං මෙ සුතං එකං සමයං භගවා රාජගහෙ විහරති ජීවකස්ස කොමාරභච්චස්ස අම්බවනෙ මහතා භික්ඛුසඞ්ඝෙන සද්ධිං අඩ්ඪතෙළසෙහි භික්ඛුසතෙහි"**

**"මා විසින් මෙසේ අසන ලදී. එක් කාලයෙක භාග්‍යවතුන් වහන්සේ රජගහනුවර අසල කොමාර භච්ච ජීවක වෛද්‍යාචාර්යතුමා ගේ අඹ වනයෙහි එක්දහස් දෙසිය පනසක් වූ මහා භික්ෂු සංඝයා සමග වැඩ වාසය කළ සේක".**

බුද්ධුපස්ථායක වූ ආනන්ද තෙරුන් වහන්සේ විසින් ප්‍රථම සංගායනා කාලයෙහි ධර්ම සංගායනා කරන්නා වූ ආයුෂ්මත් මහා කාශ්‍යප මහරහතන් වහන්සේ විසින් විමසන ලදුව පන්සියයක් මහරහතන් වහන්සේලා හට මෙසේ ඉදිරිපත් කළේ ය. මෙම සූත්‍ර දේශනාව දීඝ නිකායේ සීලක්ඛන්ධ වර්ගයෙහි එන දෙවන සූත්‍රදෙශනාවයි.

භාග්‍යවතුන් වහන්සේ වනාහී සියලු ධර්මයන් තමන් වහන්සේ විසින් ම අවබෝධ කරගත් සේක. ආචාර්යවරයෙකු නොමැත්තේය. ලෝක නාථ වූ භාග්‍යවත් අර්හත් සම්මාසම්බුදු රජාණන් වහන්සේ දම්සක් පැවතුම් සූත්‍ර දේශනාවෙහි පටන් සුභද්‍ර පරිබ්‍රාජක තුමා හික්මවීම

දක්වා කළ යුතු සියලු බුද්ධ කෘත්‍යයෙන් සම්පූර්ණ කොට කුසිනාරා නුවර උපවර්තන නම් මල්ල රජ දරුවන්ගේ සල් වනයෙහි යමක ශාල වෘක්ෂයන් අතර පනවන ලද උතුම් බුද්ධාසනයෙහි නැවත නො නැගිටිනා සෙය්‍යාවෙන් වැඩ හිඳ වෙසක් පුර පසළොස්වක පොහෝදින අළුයම් වෙලෙහි අනුපාදිශේෂ පරිනිර්වාණ ධාතුවෙන් පිරිනිවන් පා වදාළ සේක.

## ❄ ප්‍රථම ධර්ම සංගායනාව

තථාගතයන් වහන්සේගේ පරිනිර්වාණය නිමිත්තෙන් රැස් වූ සත් ලක්ෂයක් භික්ෂු සංඝයා වහන්සේ අතර සංඝ ස්ථවිර වූ මහා කාශ්‍යප මහරහතන් වහන්සේ තථාගතයන් වහන්සේගේ පරිනිර්වාණයෙන් සත්වන දින පාවා නුවර සිට කුසිනාරාව වෙත වඩිමින් සිට මඳක් විවේක ගැනීම පිණිස මාර්ගයෙන් ඉවත්ව එක් වෘක්ෂ මූලයක වැඩසිටි සේක. එකල්හි පාවා නුවර වැසි එක් උපාසකයෙක් බුද්ධ ශරීරයට ගෞරව දක්වා දෙවියන් විසින් ආකාශයෙහි සිට බුදු සිරුරට පූජා කරන ලද පාත්‍රයක් පමණ වූ දිව්‍යමය මදාරා මලකුත් රැගෙන පාවා නුවර වෙත යමින් සිට මහා කාශ්‍යප මහරහතන් වහන්සේ වෙත පැමිණ වැඳ සිටියේ ය. එවිට තෙරුන් වහන්සේ ඒ උපාසක තුමාගෙන් "**කොහි සිට එන්නේ ද**" යැයි අසා සිටියේ ය. ඔහු කුසිනාරාවෙහි සිට ආවෙමි යැයි කීවේ ය. "**අපගේ ශාස්තෲන් වහන්සේ දන්නෙහි ද**" යැයි තෙරුන් වහන්සේ විචාළේ ය. තථාගතයන් වහන්සේ පිරිනිවී සත් දවසක් වන බව කීවේ ය. එය අසා රහතන් වහන්සේලා ද, අනාගාමී ආර්‍යයන් වහන්සේලා ද ධර්ම සංවේග උපදවා ගත්හ. කාම රාග ව්‍යාපාද ප්‍රහීණ නොවුණු බැවින් සෝවාන්, සකෘදගාමී ආර්‍යයන් වහන්සේලා ද, කල්‍යාණ පෘතග්ජන භික්ෂූන් වහන්සේලා ද අඬා වැලපෙන්නට වූහ.

ඒ අවස්ථාවේ සුභද්‍ර නම් මහලු පැවිද්දෙක් ඒ පිරිසෙහි සිටියේ ය. එම භික්ෂුව පූර්වයෙහි ආතුමා නුවර කරණවැමියෙකුව සිට වයස්ගතව පැවිදි වූවෙකි. මහලු වයසේ සිටි බැවින් දරුවන් ලවා තම ගෙවත්තෙහිම කුටියක් සාදවාගෙන එහි සිටිමින් තම දරුවන්ගේ කෙස් රැවුල් කපමින් ජීවිකාව කළේ ය. එක් චාරිකා සමයක තථාගතයන්

වහන්සේ එක්දහස් දෙසිය පනසක් පමණ වූ මහත් භික්ෂු පිරිසක් සමග කුසිනාරා නුවර සිට ආතුමා නුවරට වැඩි සේක. එකල්හි එම භික්ෂුව තථාගතයන් වහන්සේ විශාල සඟ පිරිසක් සමග වඩින්නේය යැයි අසා සාමණේර භාවයෙන් සිටි තම දරුවන් දෙදෙනා අමතා **"දරුවනි, නුඹලා ගොස් හිස කෙස් කැපීමට උවමනා උපකරණ රැගෙන ගෙයක් පාසා ඇවිද මිනිසුන්ගේ කෙස් රැවුල් කපා ලුණු තෙල් හා අනුභව කළ යුතු දේ රැස්කරවු. භාග්‍යවතුන් වහන්සේ ප්‍රධාන සංඝයාට බෙහෙත් කැඳ දනයක් දෙන්නෙමු"** යැයි කීවේ ය. ඒ සාමණේර පැවිද්දෝ ද එසේ කළහ. භාග්‍යවතුන් වහන්සේ වැඩි කල්හි මිනිසුන්ගේ ද අත් උදව් ඇතිව එලෙස එක්රැස් කරන ලද දෙයින් බොජ්ජ යාගුවක් (ඝන කැඳක්) සෑද වූහ. ගිතෙල්, මී පැණි, මත්ස්‍ය, මාංශ, මල් ඵල රසාදිය ද, යම් කෑ යුතු දෙයක් වේ ද ඒ සියල්ල එහි දැම්මවී ය. තව ද හකුරු යොදා කරන ලද **"මධුගෝළක"** නම් කැවිලි ද පිළියෙල කරවීය. මෙයට **"අතිරස කැවුම්"** යැයි ද, **"මධුසීසක"** යැයි ද කියනු ලැබේ. මේ සියල්ල දන්නා භාග්‍යවතුන් වහන්සේ භික්ෂු සංඝයා සමග නගරයට පිඬු පිණිස වැඩි සේක. මිනිස්සු **"භාග්‍යවතුන් වහන්සේ භික්ෂු සංඝයා සමග නගරයට පිඬු පිණිස වඩියි, ඔබ කාට කැඳ පිළිගන්වන්නෙහි ද"** යැයි එම භික්ෂුවට කීහ. එවිට ඒ භික්ෂුව කලබල වී භාග්‍යවතුන් වහන්සේ ඉදිරියට ගොස්, **"ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස, කැඳ පිළිගන්නා සේක්වා"** යැයි ආරාධනා කළේ ය. භාග්‍යවතුන් වහන්සේ **"මහණ, නුඹ කෙසේ කැඳ සැකසුවේ ද"** යැයි අසා ගර්හා කොට අකප්පිය සමාදනය ද, **"පූර්වයෙහි භාවිතා කළ කරණවැම් බඩු පාවිච්චි නොකළ යුතුය"** යැයි ද මෙසේ ඒ භික්ෂුව නිමිති කොට දුෂ්කට සිකපද දෙකක් පනවා දැහැමි කථාවක් කොට භික්ෂූන් අමතා මෙසේ වදාළ සේක. **"මහණෙනි, අනේක කල්ප කෝටි ගණනක් භෝජනය සොයන්නවුන් සමගම මේ දීර්ඝ සංසාරයේ කල් ගත කරන ලදි. මෙය වනාහී නුඹලාට අකැප ය. මේ අධර්මයෙන් උපයා ගත් භෝජනය පරිභෝග කළවුන් අනේක වූ ආත්මභාව සිය දහස් ගණනක් අපායෙහි ම උපදින්නෙහි ය. ඉවත් වන්න, මෙය පිළිනොගන්න"** යැයි වදරා පිඬු පිණිස වැඩි සේක. එක් භික්ෂුවකුදු එය පිළි නොගත්හ. සුභද්‍ර භික්ෂුව නොසතුටුව **"මොහු සියල්ල දනිමි යි ඇවිදියි. ඉදින් නොගනු කැමැත්තෙහි නම් එය කිය යුතු නොවන්නේ ද, මා වෙහෙසීමෙන් කරන ලද සියල්ල මොහු විසින් නසන ලද්දේය. මොහු මා කෙරෙහි හිතවත් බවක් නැත්තේය"** යැයි තථාගතයන් වහන්සේ සමග වෛරී ව සිට තථාගතයන් වහන්සේ ජීවමාන ව සිටියදී

කිසිවක් කියන්නට නොහැකිව සිට පිරිනිවියේ යැයි අසා සතුටු ව අඬා වැලපෙන භික්ෂූන් අමතා මෙසේ කීවේ ය.

**"ඇවැත්නි, ශෝක නොකරවු. නොවැළපෙව්. අපි ඒ මහා ශ්‍රමණයාගෙන් සම්පූර්ණයෙන් මිදුණෝ වෙමු. ඒ මහා ශ්‍රමණයා මෙය නුඹලාට කැපය, මෙය නුඹලාට අකැපය යනාදී ලෙස සිකපද පනවමින් අපි පීඩාවට පත්කරනු ලැබුවෝ වෙමු. දැන් අපි ඒ ගැහැටවලින් නිදහස් වූවෝ වෙමු. එබැවින් දැන් අපි යමක් කැමැත්තෙමු නම් එය කරන්නෙමු. යමක් අකැමැත්තෙමු නම් එය නොකරන්නෙමු"** යැයි මේ වචනය කීවේ ය.

මේ වචනය මහා කාශ්‍යප මහ රහතන් වහන්සේට හදවතට වැදුණු පහරක් මෙන් ද, හිසට පහත් වූ වියලි හෙනයක් මෙන් ද හැඟී ගියේය. මහත් වූ ධර්ම සංවේගයක් හට ගත්තේ ය. තෙරුන් වහන්සේ සිතන සේක් **"සත් දිනකට පෙර භාග්‍යවතුන් වහන්සේ පිරිනිවන් පෑ නමුත් අද ද ඒ බුදු සිරුර රන් පැහැයම ය. භාග්‍යවතුන් වහන්සේ විසින් දුකසේ ගොඩනැගූ සසුනෙහි පාපී කසටක්, කටුවක් හට ගත්තේ ය. මෙවන් පාපී පුද්ගලයන්ට වැඩෙන්නට ඉඩ ලැබුණ හොත් තවත් සහායකයන් ලැබ ශාසනය පසු බස්සවන්නට හැකි වන්නේ ය. ඉදින් වනාහී මම මේ මහල්ලා ව මෙහි දී ම රෙදි කඩක් අන්දවා අළු විසුරුවා බැහැර කරන්නෙම් නම්, මිනිස්සු ශ්‍රමණ ගෞතමයන් වහන්සේගේ දේහය තිබිය දී ම ශ්‍රාවකයෝ විවාද ඇති කර ගනිති යැයි අපට දෙස් පවරන්නාහුය"** යැයි සිතා නැවත ද සිතන සේක් "භාග්‍යවතුන් වහන්සේ විසින් එකට එකතු නොකළ මල් රාශියක් මෙන් ධර්මය දේශනා කරන ලදි. එහි යම් සේ වාතය වැදීමෙන් සමහර මල් විසිරී යයි. එපරිද්දෙන් මෙබඳු පව්ටු පුද්ගලයන් නිසා කල් ගතවන විට විනයෙහි සිකපද එක දෙක බැගින් විනාශ වී යන්නේ ය. සූත්‍රයන්හි එකක් දෙකක් ප්‍රශ්න වාරයන් නැසී යන්නේ ය. අභිධර්මයෙහි එක දෙක වෙනස් වෙනස් වාරයන් නැසී යන්නේ ය. මෙසේ පිළිවෙලින් මුල නැසුණු කල්හි අපි පිසාචයන් හා සම වූවෝ වෙමු. එබැවින් ධර්මයත් විනයත් සංගායනා කරන්නෙමි. මෙසේ ඇති කල්හි ශක්තිමත් නූලකින් ගැට ගසන ලද මල් මාලාවක් මෙන් ධර්ම - විනය දෙක ස්ථිරව පිහිටන්නේ ය. භාග්‍යවතුන් වහන්සේ මේ සඳහා ම මට පෙර ගමන් කළ සේක. අවවාද තුනකින් උපසම්පදාව දුන් සේක. කයින් සිවුරු මාරු

කළ සේක. මේ සියල්ලට වඩා අසාධාරණ වූ නවානුපූර්වී විහාර සමාපත්තීන්ගෙන් සම තැන තැබූ සේක. මෙසේ තමන් වහන්සේ හා සම තැන්හි තැබීමෙන් අනුග්‍රහ කරන ලද මට ධර්ම - විනය සංගායනාව හැර අන් කිනම් මගකින් ණය නැති බවක් වන්නේ ද, සක්විති රජෙක් තමන්ගේ සන්නාහයත් ආශ්චර්‍ය්‍යයත් දීමෙන් ස්වකීය කුල වංශය පිහිට වූ පුතුට මෙන් භාග්‍යවතුන් වහන්සේ **"මෙතෙම මාගේ සද්ධර්ම වංශය පිහිටුවන්නෙක් වන්නේ ය"** යැයි දැන මේ අසාධාරණ අනුග්‍රහයෙන් මට අනුග්‍රහ කළ සේක" යැයි සිතුවේ ය. එසේම "**මා වැනි භික්ෂූන් වහන්සේලා සිටියදී මේ පාපියෙකුට සසුනෙහි දියුණු වන්නට ඉඩක් නොතැබිය යුතු ය. යම්තාක් අධර්මය අවිනය නො බැබළේ ද ඒ තාක් ධර්මයත් විනයත් පසු බසින්නේ නැත. යම් විටෙක අධර්මය අවිනය බැබළේ ද එවිට ධර්මයත් විනයත් පසු බසින්නේ ය. එබැවින් අධර්මවාදීන් අවිනයවාදීන් බලවත් වීමට පෙර ධර්මවාදීන් විනයවාදීන් දුබල වීමට පෙර ධර්ම - විනය දෙක සංගායනා කරන්නේනම් මැනවි**" යැයි සිතා ඒ මොහොතේ කිසිවක් නොකියා කුසිනාරාව වෙත වැඩම කොට බුදු සිරුර තැන්පත් කරන ලද විසි රියන් උස සඳුන් දර සෑය වටා ප්‍රදක්ෂිණා කොට අධිෂ්ඨාන බලයෙන් බුදු සිරිපා තම නළලෙහි තබා වන්දනා කළේ ය. ඉන් පසු දේවානුභාවයෙන් ඒ චිතකය ගිනි ඇවිල ආදහනය වූයේ ය.

පරිනිර්වාණයෙන් පසු බුදු සිරුර සත් දිනක් ඒ ආසනයෙහි ම පැවතුණේ ය. ඒ කාලය සදේවක ලෝකවාසීන් විසින් වැඳුම් පිදුම් කළහ. සත්වන දින ආදහනය සිදුවිය. ඉන් පසු සත් දිනක් ධාතු පූජා කාලය වූහ. ඉන් පසු සර්වඥ ධාතු බෙදා දීමට සත් දිනක් ගත විය. මේ අවස්ථාවට සත් ලක්ෂයකට අධික භික්ෂු සංඝයා වහන්සේ රැස්ව සිටියහ. ඒ සර්වඥ ධාතු බෙදා දීමේ කටයුතු නිමා වූ පසුව මහා කාශ්‍යප මහ රහතන් වහන්සේ මෙවැනි භික්ෂු සන්නිපාතයක් නැවත දුර්ලභ යැයි සිතා භික්ෂු සංඝයා අමතා "ඇවැත්නි මම එක් සමයක පන්සියයක් පමණ වූ මහත් භික්ෂු පිරිසක් සමග පාවා නුවරින් නික්ම කුසිනාරාව බලා එන අතර තථාගතයන් වහන්සේගේ පරිනිර්වාණය අසා භික්ෂූන් හඬා වැළපෙනවිට එක් පාපියෙක් **"ඇවැත්නි නොහඬන්න නොවැළපෙන්න.... යමක් අකැමැත්තෙමු නම් එය නොකරන්නෙමු"** යැයි මෙසේ කීවේ ය. පරිනිර්වාණයට පත් තථාගතයන් වහන්සේගේ බුද්ධ ශරීරය ආදහනය වීමටත් පෙර මේ නිර්ලජ්ජී පාප භික්ෂූන් ගේ

නැඟී සිටීම විය. ධර්මය ශාස්තෲන් වහන්සේ සමගම නැතිව ගියේ යැයි ද, ධර්මය ශාස්තෲවරයෙකු නැති එකක් ය යැයි ද සිතන පාපී භික්ෂූන් වහන්සේලා අලජ්ජී පක්ෂය ලැබ, කොටස්වලට බෙදී නොබෝ කලකින් ම සද්ධර්මය අතුරුදහන් කරන්නාහු ය යන මේ කාරණයක් වේද, මෙය විද්‍යමාන වන්නේ ය. යම්තාක් ධර්මය විනය පවත්නේ ද, ඒ තාක් බුද්ධ වචනය නොයික්මවා සිටින ශාස්තෲවරයෙකු ඇති එකක් වන්නේය. භාග්‍යවතුන් වහන්සේ විසින් ම "**යො වො, ආනන්‍ද, මයා ධම්මො ච විනයො ච දෙසිතො පඤ්ඤත්තො, සො වො මමච්චයෙන සත්‍ථා**" යනුවෙන් "**ආනන්දය, මා විසින් යම් ධර්මයක් දේශනා කරන ලද්දේ ද, යම් විනයක් පනවන ලද්දේ ද, ඒ ධර්ම - විනය දෙක මාගේ පරිනිර්වාණයෙන් පසු නුඹලාට ශාස්තෲ වන්නේය**" යැයි මේ කාරණය වදරන ලද්දේ ම ය. එබැවින් යම් සේ මෙම ශාසනය බොහෝ කල් පැවැත්මට සුදුසු වූවක් කොට ධර්මයත් විනයත් සංගායනා කරන්නෙමු" යැයි දන්වා සිටියහ.

භික්ෂූන් වහන්සේලා "**ස්වාමීනි, එසේ නම් ස්ථවිරයන් වහන්සේම ඒ සඳහා භික්ෂූන් වහන්සේලා තෝරා ගන්නා සේක්වා**" යි කීහ. තෙරුන් වහන්සේ සියලු නවාංග ශාස්තෲ ශාසන සංඛ්‍යාත පර්යාප්තිධර වූ නොයෙක් සිය, දහස් ගණන් පෘථග්ජන, සෝතාපන්න, සකෘදගාමී, අනාගාමී, ශුෂ්ක විදර්ශක ක්ෂීණාශ්‍රව භික්ෂූන් හැර පියා ත්‍රිපිටක බුද්ධ වචනය හා සියලු පර්යාප්ති ප්‍රභේදයන්හි පාරප්‍රාප්ත සිවුපිළිසිඹියා පත් මහත් ආනුභාව ඇති, භාග්‍යවතුන් වහන්සේ විසින්ම අග්‍ර ස්ථානයෙහි තබන ලද ත්‍රිවිද්‍යා දී ප්‍රභේද ඇති ක්ෂීණාශ්‍රව භික්ෂූන් වහන්සේලා ම හාරසිය නවානූනමක් තෝරා ගත්හ. කුමක් සඳහා එක නමක් අඩු කළ සේක් ද යත්? ආනන්ද තෙරුන් වහන්සේට ඉඩ සලසනු සඳහා ය. ඒ වනවිට ආනන්ද තෙරණුවෝ රහත්ව නො සිටි බැවිනි. මේ ආනන්ද තෙරුන් වහන්සේ, භාග්‍යවතුන් වහන්සේ පසුපස යමින් අග්‍ර උපස්ථානය කරමින් බොහෝ ධර්ම - විනය කාරණා උගත්තේ ය. එබැවින් තෙරුන් වහන්සේ නොමැතිව ධර්ම සංගායනාව නොකළ හැකිය. ඉන් පසු අන් භික්ෂූන් වහන්සේලාගේ ඉල්ලීමෙන් ආනන්ද තෙරුන් වහන්සේ ද තෝරා ගත්හ. ඉන් පසු ස්ථවීර භික්ෂූන් වහන්සේලාට "අපි ධර්ම - විනය සංගායනාව කොතැන්හි දී කරන්නෙමු ද" යැයි මේ සිත විය. එවිට එම භික්ෂූන් වහන්සේලාට මේ අදහස වූහ.

**"රජගහ නුවර භික්ෂාව ලැබීමට පහසු ය. බොහෝ සෙනසුන් ද ඇත. අජාසත් රජතුමා ගේ දැහැමි ආරක්ෂාව ද ලැබිය හැක. එබැවින් අපි රජගහ නුවර වස් වසමින් ධර්මයත් විනයත් සංගායනා කරන්නෙමු, අපගේ මේ කටයුත්ත බොහෝ කල් පවත්නකි. කිසියම් විරුද්ධ පුද්ගලයෙක් සඟ මැදට පැමිණ අර්බුද ඇති කිරීමට ඉඩ ඇත. එබැවින් අන් භික්ෂූන් වහන්සේලා රජගහනුවර වස් නො විසිය යුතුය. ධර්ම සංග්‍රාහක භික්ෂූන් වහන්සේලා පමණක් රජගහ නුවර වස් සමාදන් විය යුතුය"** යැයි අදහස වී ඤත්ති දුතිය කර්මයෙන් එලෙස සම්මත කර ගත්හ.

ඉන් පසු වස් එළඹෙන සමය ලංවන බැවින් මහා කාශ්‍යප තෙරුන් වහන්සේ, සංගායනාවට සම්මත රහතන් වහන්සේලාගෙන් අඩක් ගෙන රජගහනුවර බලා එක් මඟකින් වැඩි සේක. අනුරුද්ධ තෙරුන් වහන්සේ ද, රහතන් වහන්සේලාගෙන් අඩක් ගෙන රජගහනුවර බලා එක් මඟකින් වැඩි සේක. ආනන්ද තෙරුන් වහන්සේ ද, රජගහනුවර වඩිනු කැමති ව, භාග්‍යවතුන් වහන්සේගේ පාත්‍රය හා චීවර ගෙන මහත් වූ භික්ෂූන් වහන්සේලා පිරිසක් පිරිවරා ගෙන සැවැත් නුවර බලා චාරිකාවෙහි වැඩි සේක. ජේතවනාරාමයට වැඩ භාග්‍යවතුන් වහන්සේ වැඩසිටි ගඳකිළියෙහි දොර විවර කොට ඇඳ පුටු බැහැරට ගෙන ගසා දමා ගඳකිළිය හැමද මැලවුණු මල් ආදී කසල බැහැර කොට ඇඳ පුටු ඇතුළට ගෙන ගොස් සුදුසු තැන්හි තබා භාග්‍යවතුන් වහන්සේ වැඩසිටි කල්හි මෙන් කළ යුතු සියලු වතාවත් සිදුකළ සේක. ආනන්ද තෙරුන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේගේ පරිනිර්වාණයෙහි පටන් සිටීම් හිඳීම් බහුලව සිටි බැවින් සෙම් පිත් ආදී දෙස් කිපුණු ශරීරයෙන් සිටි බැවින් දෙවන දින කිරි විරේකයක් පානය කොට විහාරයෙහි ම වැඩසිටි සේක. පසු දින සුභ මානවකයාගේ ආරාධනාවෙන් ඔහුගේ නිවසට වැඩ ඔහු විසින් විචාරන ලද පැන විසඳමින් දීඝ නිකායෙහි ඇතුලත් **"සුභ සූත්‍රය"** වදළ සේක. අනතුරුව දෙව්රම් වෙහෙරෙහි කැඩුණු බිඳුණු තැන් පිළිසකර කරවා වස් එළඹෙන සමය ලංවන බැවින් උපකාරක එක් භික්ෂූන් වහන්සේ නමක් සමග රජගහ නුවරට වැඩි සේක.

එසමයෙහි වනාහී රජගහනුවර මහා විහාර දහ අටක් වූහ. එනම් **තල් වනය, වේළුවනය, සීත වනය, මද්දකුච්ඡි මිගදය, ජීවක අම්බ**

**වනය**, **මෝර නිවාපය**, **ලට්ඨි වනය** යන මේවා රජගහ නුවර සමීපයෙහි විය. එසේම **චෝර පපාතය**, ඉසිගිලි පර්වතය පාමුල වූ **කාලසිලාව**, වේභාර පර්වතය පාමුල වූ **සප්තපර්ණි ගුහාව**, සීතවන සොහොන් බිම සමීපයෙහි වූ **සප්තසොණ්ඩික පබ්බභාරය**, **ගෝතම කන්දරය**, **තින්දුක ගුහාව**, **තපෝද කන්දරය**, **ඉන්ද සාල ගුහාව**, **පිප්ඵලි ගුහාව**, ගුජ්ඣකූට පර්වතයෙහි වූ **සූකර කත ලෙන** යන මේවා රජගහ නුවර වටා පිහිටි ඒවා ය. භාග්‍යවතුන් වහන්සේගේ පරිනිර්වාණයෙන් පසු භික්ෂූන් වහන්සේලා මේ විහාර සියල්ල අත්හැර දමා ගිය බැවින් මකුළු දැල් බැඳී කොළ රොඩුවලින් ගැවසී පාලුවිය. මහා කාශ්‍යප තෙරුන් වහන්සේ ද, අනුරුද්ධ තෙරුන් වහන්සේ ද සපිරිවරින් රජගහ නුවරට වැඩ අපවිත්‍ර වී පාලුවට ගොස් ඇති සෙනසුන් දැක **"භාග්‍යවතුන් වහන්සේගේ වචනයට ගරු කිරීම පිණිස ද, තීර්ථක උපවාදයෙන් මිදෙනු පිණිස ද පළමු මාසය අපවිත්‍ර සේනාසන පිරිසිදු කර කැඩුණු බිඳුණු තැන් පිළිසකර කරන්නෙමු"** යැයි මෙසේ සිතූහ.

තීර්ථකයෝ **"ශ්‍රමණ ගෞතමයන් වහන්සේගේ ශ්‍රාවකයෝ ශාස්තෲන් වහන්සේ සිටි කල්හි පමණක් විහාරයන් පිළිදැගුම් කළහ. පිරිනිවි කල්හි ඒ වතාවත් අත්හැරියාහුය"** යැයි මෙසේ කියන්නාහු ය. භාග්‍යවතුන් වහන්සේ විසින් විහාරයන්හි කැඩුණු බිඳුණු තැන් පිළිසකර කිරීම වර්ණනා කරන ලදි. ඇවැත්නි එබැවින් අපි වස්කාලයෙහි පළමු මස විහාර පිළිසකර කරමු, මැද මාසයෙහි රැස්ව ධර්ම - විනය සංගායනා කරන්නෙමු යැයි කතිකා කරගෙන දෙවන දින රජ මාලිගයට වැඩ අජාසත්ත රජතුමා සම්මුඛ වී විහාර පිළිසකර කිරීමට අත් උදව් අවශ්‍ය බව කීහ. රජතුමා මිනිසුන් දුන්නේ ය. තෙරුන් වහන්සේලා විහාර පිළිසකර කරවා රජතුමාට ඒ බව දන්වා නැවත ද **"මහරජ, ධර්ම සංගායනාවක් කරනු කැමැත්තෙමු"** යැයි කීහ. රජතුමා එය අසා **"ස්වාමීනි, විශ්වාස ඇත්තෝ ව කරනු මැනවි. ස්වාමින් වහන්සේලාට ධර්මචක්‍රය වේවා. මා හට ආඥා බලය වේවා. ඒ සඳහා මා විසින් කුමක් කළ යුතු ද"** යැයි අසා සිටියේ ය. "මහරජ, ධර්මය - විනය සංගායනා **කරන්නා වූ භික්ෂූන් වහන්සේලාට වැඩ හිඳීමට තැනක් කරවා ගත යුතුය"** යැයි කීහ. **"එය කොතැන්හි කළ යුතු ද"** යැයි රජතුමා ඇසුවේය. **"වේභාර පර්වතය පාමුල වූ සප්තපර්ණි ගුහා ද්වාරයෙහි සුදුසුය"** යැයි තෙරුන් වහන්සේලා කීහ.

එකල්හි රජතුමා, විශ්වකර්ම දිව්‍ය පුත්‍රයා විසින් මවන ලද්දක් හා සමාන වූ, මැනවින් බෙදන ලද බිත්ති ඇති, කණු ඇති, පියගැටපෙළ ඇති, නන් වැදෑරුම් මල්කම් ලිය කම්වලින් විසිතුරු කරන ලද මහා මණ්ඩපයක් කරවා, නොයෙක් මල් දම් එල්වන ලද මනහර වියනක් කරවා, නොයෙක් රත්නයන්ගෙන් විසිතුරු වූ මැණික් ඔබ්බවන ලද මාලා කර්මයන්ගෙන් විසිතුරු වූ බිමක් එහි කරවා, බ්‍රහ්ම විමානයක් සේ සරසා, පන්සියයක් භික්ෂූන් වහන්සේලාට වැඩ හිඳීමට අනගි වූ පස තුරුණු පණවා, මණ්ඩපය මැද නැගෙනහිරට මුහුණ ලා සම්මා සම්බුදු රජාණන් වහන්සේට වැඩ හිඳීමට සුදුසු බුද්ධාසනයක් ද පනවා, එහි දකුණුපස උතුරු දෙසට මුහුණ ලා ථේරාසනයක් ද, ඇත්දළ එබ්බ වූ විසිතුරු විජිනිපතක් තබා **"ස්වාමීනි, මගේ කටයුතු නිමවන ලදි"** යැයි තෙරුන් වහන්සේලාට දන්වා සිටියේ ය.

## ☸ අනඳ තෙරුන් රහත්වීම

මේ වන විටත් ආනන්ද තෙරුන් වහන්සේ ශෛක්‍ෂව සිටි බැවින් රහතන් වහන්සේලා ආනන්ද තෙරුන් වෙත පැමිණ **"ආනන්දය, හෙට අපගේ රැස්වීම වන්නේය. නුඹ තවම ශෛක්‍ෂයෙකි, රැස්වීමට යෑමට නුසුදුස්සෙකි. එබැවින් අප්‍රමාදී විය යුතුය"** යැයි කීහ. ආනන්ද තෙරණුවෝ ද **"හෙට රැස්වීම වන්නේය. මා විසින් ශෛක්‍ෂව රැස්වීමට යෑම නොවටීය"** යැයි සිතා රාත්‍රියෙහි බොහෝ වේලාවක් කායගතා සති කමටහනින් යුතුව සක්මනෙහි යෙදී උත්සාහ කළ නමුත් විශේෂාධිගමයක් නොවූ බැවින්, මඳක් විවේක ගෙන නැවත උත්සාහයෙහි යෙදෙන්නෙමි යැයි සිතා, අළුයම් වෙලෙහි සක්මනින් බැස පා සෝදා විහාරයට පිවිස, විඩා හරින්නෙමි යැයි ඇඳෙහි වැඩ හිඳ කොට්ටය වෙත හිස එළ වූ සේක. දෙපා පොළොවෙන් මිදුණාහ. හිස කොට්ටයට නොපැමිණියේ ය. මේ අතර රහත් වූ සේක. මෙසේ හිඳීම, සිටීම, සක්මන් කිරීම සැතපීම යන සිව් ඉරියව්වෙන් තොරව රහත් වූහ. **එබැවින් මේ බුදු සසුනෙහි සිව් ඉරියව්වෙන් තොරව යම් භික්ෂූන් වහන්සේ නමක් රහත් වූයේ නම් ඒ ආනන්ද තෙරුන් වහන්සේය** යැයි කිව යුතු වන්නේය.

පසු දින ස්ථවීර තෙරුන් වහන්සේලා බත්කිස කොට පාත්‍ර චීවර තැන්පත් කොට තබා ධර්‍ම මණ්ඩපයෙහි රැස්ව තමන් වහන්සේලාට නියමිත ආසනයන්හි වැඩහුන් සේක. ආනන්ද තෙරුන් වහන්සේ ගේ ආසනය පමණක් හිස් විය. ආනන්ද තෙරුන් වහන්සේ තමන් රහත්ව වැඩි බව හඟවනු පිණිස භික්ෂූන් වහන්සේලා සමග නොවැඩියේ ය. භික්ෂූන් වහන්සේලා **"මේ ආසනය කවරෙකු සඳහා ද"** යැයි විචාළහ. **"මෙය ආනන්ද තෙරුන් වහන්සේ සඳහා"** යැයි කීහ. ආනන්ද තෙරුන් වහන්සේ ඒ මොහොතේ සිටි ආවාසයෙන් පොළොව කිමිද මණ්ඩපයෙන් මතුව තමන් වහන්සේට නියමිත ආසනයෙහි වැඩසිටි සේක. මේ හේතුවෙන් ආනන්ද තෙරුන් වහන්සේ රහත්ව වැඩි බව සියලු භික්ෂූන් වහන්සේලා ම පිළිගත්හ.

## ☸ විනය සංගායනා කිරීම

මෙසේ ධර්‍ම සංග්‍රාහක මහා රහතන් වහන්සේලා ධර්‍ම මණ්ඩපයෙහි රැස් වූ කල්හි සංඝ ස්ථවීර වූ මහා කාශ්‍යප තෙරුන් වහන්සේ **"ඇවැත්නි, ධර්‍මය විනය දෙකෙන් කවරක් පළමුව සංගායනා කරන්නෙමු ද"** යැයි භික්ෂු සංඝයා ඇමතූ සේක. භික්ෂූන් වහන්සේලා **"ස්වාමීනි, ස්ථවිරයන් වහන්ස, විනය නම් බුද්ධ සාසනයාගේ ආයුෂයයි. විනය පිහිටි කල්හි ශාසනය සිටියේ වෙයි. එබැවින් පළමුව විනය සංගායනා කරමු"** යැයි කීහ. **"කවුරුන් ප්‍රධාන කොට ගෙන විනය සංගායනා කළ යුතුද"** යැයි කාශ්‍යප තෙරුන් වහන්සේ ඇසුවේ ය. **"ස්වාමීනි, ස්ථවිරයන් වහන්ස, මේ උපාලි තෙරුන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේ විසින් ම විනයධරයන් අතර අග්‍ර ස්ථානයෙහි තබා වදාළ සේක. එබැවින් උපාලි තෙරුන් වහන්සේ ප්‍රධාන කොට ගෙන සංගායනා කරමු"** යැයි භික්ෂූන් වහන්සේලා කීහ. ඉන් පසු කාශ්‍යප තෙරුන් වහන්සේ විනය විචාරීමට **"සුණාතු මෙ, ආවුසො, සඞ්ඝො. යදි සඞ්ඝස්ස පත්තකල්ලං, අහං ආයස්මන්තං උපාලිං විනයං පුච්ඡෙය්‍යං"** යනුවෙන් තමන් වහන්සේ ම සම්මත කරගෙන ථේරාසනයෙහි වැඩසිටි සේක. උපාලි තෙරුන් වහන්සේ විනය විසඳීමට **"සුණාතු මෙ, භන්තෙ, සඞ්ඝො. යදි සඞ්ඝස්ස පත්තකල්ලං, අහං ආයස්මතා මහාකස්සපෙන විනයං පුට්ඨො විස්සජ්ජෙය්‍යං"** යනුවෙන් තමන් වහන්සේ ම සම්මත කරගෙන අසුනින් නැඟිට සිවුර ගැට වටු

ගන්වාගෙන, වැඩිහිටි ස්ථවීර භික්ෂූන් වැඳ, විජිනිපත ගෙන ධර්මාසනයෙහි වැඩහුන් සේක. මහා කාශ්‍යප තෙරුන් වහන්සේ උපාලි තෙරුන් වහන්සේගෙන් මෙසේ විනය විචාල සේක.

**"ඇවැත්නි, උපාලිය, භාග්‍යවතුන් වහන්සේ පළමු පාරාජිකාව කොතැනක දී පනවා වදාළ සේක් ද"** යැයි ඇසීය. උපාලි තෙරුන් වහන්සේ **"ස්වාමීනි, ස්ථවිරයන් වහන්ස, විශාලා මහනුවර දී පනවා වදාළ සේක"** යැයි විසඳුවේ ය. **"කවුරුන් අරබයා පනවා වදාළ සේක් ද"** යැයි ඇසීය. **"කලන්දක පුත්‍ර සුදින්න තෙරුන් අරබයා පනවා වදාළ සේක"** යැයි විසඳුවේ ය. **"කුමන වස්තුවෙහි පනවා වදාළ සේක් ද"** යැයි ඇසීය. **"මෛථුන ධර්ම ප්‍රතිසේවනයෙහි පනවා වදාළ සේක"** යැයි විසඳුවේ ය. ඉන් පසු සියලු දෙනා වහන්සේ ම එකතුව පළමු පාරාජිකා සිකපදය නිදන සහිතව සන සජ්ඣායනා කළහ. මෙලෙස සෙසු සික්‍ෂා පදයන් ද, භික්‍ෂු භික්‍ෂුණී උභතෝ විභංගය ද, දෙව්සි ඛන්දකයන් ද, සොළොස් පරිවාරයන් ද සහිත සියලු විනය පිටකය සංගායනා කොට උපාලි තෙරුන් වහන්සේ විජිනිපත තබා ධර්මාසනයෙන් බැස වැඩිහිටි තෙරුන් වහන්සේලා වැඳ තමාට පැමිණි අසුනෙහි වැඩහුන් සේක.

## ☸ ධර්මය සංගායනා කිරීම

විනය සංගායනාවෙන් අනතුරුව ධර්මය සංගායනා කරනු කැමති මහා කාශ්‍යප තෙරුන් වහන්සේ, භික්‍ෂු සංඝයා වහන්සේ අමතා **"ධර්මය සංගායනා කරන්නා වූ අප විසින් කවුරුන් ප්‍රධාන කොට ගෙන කළ යුතු ද"** යැයි අසා සිටියේ ය. භික්‍ෂුන් වහන්සේලා **"ස්වාමීනි, ස්ථවිරයන් වහන්ස, මේ ආනන්ද තෙරුන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේ හමුවෙහි බොහෝ ධර්මයන් ඉගෙන ගත්තෙකි. භාග්‍යවතුන් වහන්සේ විසින් කරුණු පසකින් අග්‍ර ස්ථානයෙහි තබන ලද්දෙහි ය. එබැවින් මේ ආනන්ද තෙරුන් වහන්සේ ප්‍රධාන කොට ගෙන සංගායනා කරමු"** යැයි කීහ. ඉන් පසු කාශ්‍යප තෙරුන් වහන්සේ ධර්මය විචාරීමට **"සුණාතු මෙ, ආවුසො, සඞ්ඝො. යදි සඞ්ඝස්ස පත්තකල්ලං, අහං ආයස්මන්තං ආනන්දං ධම්මං පුච්ඡෙය්‍යං"** යනුවෙන් තමන් වහන්සේ ම සම්මත කරගෙන ථේරාසනයෙහි වැඩසිටි සේක. ආනන්ද තෙරුන් වහන්සේ ධර්මය විසඳීමට **"සුණාතු මෙ, භන්තෙ, සඞ්ඝො. යදි**

**සඞ්ඝස්ස පත්තකල්ලං, අහං ආයස්මතා මහාකස්සපෙන ධම්මං පුට්ඨො විස්සජ්ජෙය්‍යං"** යනුවෙන් තමන් වහන්සේ ම සම්මත කරගෙන අසුනින් නැගිට සිවුර ගැට වටු ගන්වා ගෙන වැඩිහිටි ස්ථවිර භික්ෂූන් වහන්සේලා වැඳ විජිනිපත ගෙන ධර්මාසනයෙහි වැඩහුන් සේක. මහා කාශ්‍යප තෙරුන් වහන්සේ ආනන්ද තෙරුන් වහන්සේගෙන් මෙසේ ධර්මය විචාල සේක.

**"ඇවැත්නි, ආනන්දය, භාග්‍යවතුන් වහන්සේ බ්‍රහ්ම ජාල සූත්‍රය කොතැනක දී දේශනා කොට වදාළ සේක් ද"** යැයි ඇසීය. ආනන්ද තෙරුන් වහන්සේ, **"ස්වාමීනි, ස්ථවිරයන් වහන්ස, රජගහ නුවරටත් නාලන්ද නුවරටත් අතර අම්බලට්ඨිකා රජ උයනෙහි වූ රාජාගාරයෙහිදී දේශනා කොට වදාළ සේක"** යැයි විසඳුවේ ය. **"කවුරුන් අරබයා දේශනා කොට වදාළ සේක් ද"** යැයි ඇසීය. **"ස්ථවිරයන් වහන්ස, සුප්පිය පරිබ්‍රාජකයා ද බ්‍රහ්මදත්ත මානවකයා ද අරබයා දේශනා කොට වදාළ සේක"** යැයි විසඳුවෙහි ය. මෙසේ බ්‍රහ්ම ජාල සූත්‍රයෙහි නිදානය ද විචාළහ. පුද්ගලයා ද විචාළහ. ඉන් පසු **"ඇවැත්නි, ආනන්දය, භාග්‍යවතුන් වහන්සේ සාමඤ්ඤ ඵල සූත්‍රය කොතැනක දී දේශනා කොට වදාළ සේක් ද"** යැයි ඇසීය. ආනන්ද තෙරුන් වහන්සේ, **"ස්වාමීනි, ස්ථවිරයන් වහන්ස, රජගහනුවර ජීවක අඹ වනයෙහි දී දේශනා කොට වදාළ සේක"** යැයි විසඳුවෙහි ය. **"කවුරුන් අරභයා දේශනා කොට වදාළ සේක් ද"** යැයි ඇසීය. **"වේදේහිපුත්‍ර අජාසත්ත රජතුමා අරබයා දේශනා කොට වදාළ සේක"** යැයි විසඳුවෙහි ය. මෙසේ සාමඤ්ඤඵල සූත්‍රයෙහි නිදානය ද විචාළහ. පුද්ගලයා ද විචාළහ. මේ ක්‍රමයෙන් සියලු සූත්‍ර පිටකය ද, සියලු අභිධර්ම පිටකය ද සංගායනා කළහ. මෙසේ සංගායනා කළා වූ ධර්ම - විනය විවිධාකාරයෙන් බෙදා දැක්වූහ.

## ☸ ධර්ම විනය බෙදා දැක්වීම

මේ සියලු බුද්ධ වචනය **"රස වශයෙන් එක් වැදෑරුම් වේ. ධර්මය - විනය වශයෙන් දෙ වැදෑරුම් වේ. වචන වශයෙන් තෙවැදෑරුම් වේ. පිටක වශයෙන් ද තෙවැදෑරුම් වේ. නිකාය වශයෙන් පස් වැදෑරුම්**

**වේ. අංග වශයෙන් නව වැදෑරුම් වේ. ධර්මස්කන්ධ වශයෙන් සුවාසූ දහසක් වේ".**

### බුද්ධ වචනය රස වශයෙන් එක් වැදෑරුම් වන්නේ කෙසේ ද?

භාග්‍යවතුන් වහන්සේ අනුත්තර සම්මා සම්බෝධියට පැමිණ දම්සක් සූත්‍රය පැවැත්වීමේ පටන් පිරිනිවන් මඤ්චකය දක්වා වදළ සියලු බුද්ධ වචනය, මහා සමුද්‍රයෙහි කොතැනින් ජලබිඳක් ගත්තේ ද එකම ලුණු රසය වන්නා සේ, දහම් පදයක් පදයක් පාසා ම සත්වයන් නිවනට පමුණුවන ගුණයෙන් යුක්ත බැවින් නිවන් රසයෙන් යුක්ත ය.

### ධර්ම විනය වශයෙන් දෙ වැදෑරුම් වන්නේ කෙසේ ද?

කාය - වාක් සංවරය පිණිස පනවා වදළ සියලු බුද්ධ වචනය **"විනය"** නම් වේ. සිතෙහි පවත්නා කෙලෙසුන්ගේ තදංග විෂ්කම්භන සමුච්ඡේද වශයෙන් ප්‍රහාණය පිණිස දේශනා කොට වදළ අවශේෂ බුද්ධ වචනය **"ධර්ම"** නම් වේ.

### වචන වශයෙන් තෙවැදෑරුම් වන්නේ කෙසේ ද?

බුදු බවට පැමිණ පටිච්ච සමුප්පාද හේතුඵල ධර්මය අනුලෝම ප්‍රතිලෝම වශයෙන් මනසිකාර කිරීමෙන් ඇති වූ පහන් සංවේගය වචන බවට පෙරළී ප්‍රථමයෙන් ම බුදු මුවින් පිටවුණු :-

**"අනෙක ජාති සංසාරං - සන්ධාවිස්සං අනිබ්බිසං,**
**ගහකාරකං ගවෙසන්තො - දුක්ඛා ජාති පුනප්පුනං"**

**"ගහකාරක දිට්ඨොසි - පුන ගෙහං න කාහසි,**
**සබ්බා තෙ ඵාසුකා භග්ගා - ගහකූටං විසඞ්ඛතං,**
**විසඞ්ඛාරගතං චිත්තං - තණ්හානං ඛයමජ්ඣගා"ති.**

යන මේ ගාථා දෙක ප්‍රථම බුද්ධ වචනයයි.

පරිනිර්වාණ මඤ්චකයෙහි සැතපී අවසාන වශයෙන් වදාළ **"හන්දදනි, භික්ඛවෙ, ආමන්තයාමි වො, වයධම්මා සඞ්ඛාරා, අප්පමාදෙන සම්පාදෙථ"** යන මෙය අන්තිම බුද්ධ වචනයයි. මේ අතරතුර පන්සාළිස් වසක් මුළුල්ලෙහි වදාළ සියල්ල මධ්‍යම බුද්ධ වචනයයි.

## පිටක වශයෙන් තෙවැදෑරුම් වන්නේ කෙසේ ද?

ප්‍රථම සංගායනාවේ දී සංගායනාවට නැගුණා වූ ද, නො නැගුණා වූ ද සියල්ල එක් කොට "උභය ප්‍රාතිමෝක්ෂය, උභය විභංගය, දෙවිසි කඳුවත්, සෝළස පරිවාර" යන මේ සියල්ල **"විනය පිටකය"** නම් වේ. "දීඝ නිකාය, මජ්ඣිම නිකාය, සංයුත්ත නිකාය, අංගුත්තර නිකාය, ඛුද්දක නිකාය" යන මේ සියල්ල **"සූත්‍ර පිටකය"** නම් වේ. "ධම්මසංගණී, විභංග, ධාතුකථා, පුග්ගල පඤ්ඤත්ති, කථා වත්ථු, යමක, පට්ඨාන" යන ප්‍රකරණ සත **"අභිධර්ම පිටකය"** නම් වේ.

## නිකාය වශයෙන් පස් වැදෑරුම් වන්නේ කෙසේ ද?

බ්‍රහ්ම ජාල සූත්‍රයෙහි පටන් දීඝ වූ සූත්‍ර තිස්හතරක් ඇති වර්ග තුනකින් යුත් සංග්‍රහය **"දීඝනිකාය"** නම් වේ. මූලපරියාය සූත්‍රයෙහි පටන් මධ්‍යම ප්‍රමාණයෙන් යුත් සූත්‍ර එකසිය දෙපණසකින් යුක්ත වූ වර්ග පසළොසකින් යුත් සංග්‍රහය **"මජ්ඣිම නිකාය"** නම් වේ. ඔඝතරණ සූත්‍රයෙහි පටන් සත් දහස් සත්සිය දෙසැටක් සූත්‍ර ඇති සංයුත්ත පනස් හයකින් යුත් සංග්‍රහය **"සංයුත්ත නිකාය"** නම් වේ. චිත්ත පරියාදය සූත්‍රයෙහි පටන් සූත්‍ර නවදහස් පන්සිය සත් පනසකින් යුත් වර්ග එකසිය සත් සැත්තෑවක් ඇති නිපාත එකොළොසකින් යුත් සංග්‍රහය **"අංගුත්තර නිකාය"** නම් වේ. එසේම මේ නිකාය සතරට ඇතුලත් නොවූ "ඛුද්දකපාඨ, ධම්මපද, උදාන, ඉතිවුත්තක, සුත්තනිපාත, විමානවත්ථු පෙතවත්ථු, ථෙරගාථා, ථෙරීගාථා, පටිසම්භිධා, අපදාන, ජාතක, නිද්දේස, බුද්ධවංස, චරියා පිටක" යන කුඩා ග්‍රන්ථ පසළොස ද, "විනය පිටකය හා අභිධර්ම පිටකය" යන දෙක ද ඇතුළත් ව මේ සියල්ල **"ඛුද්දක නිකාය"** නම් වේ. මෙසේ නිකාය වශයෙන් පස් වැදෑරුම් වේ.

### ❖ අංග වශයෙන් නව වැදෑරුම් වන්නේ කෙසේ ද?,

"සුත්ත, ගෙය්‍ය, වෙය්‍යාකරණ, ගාථා, උදාන, ඉතිවුත්තක, ජාතක, අබ්භූතධම්ම, වෙදල්ල" යන මේ නවයයි. මෙය "**නවාංග ශාස්තෘ ශාසනය**" නම් වේ.

- "උභතෝ විභංගය, නිද්දේස, ඛන්ධක, පරිවාර" යන මේවා ද, සුත්තනිපාතයෙහි ඇතුළත් "මංගල සූත්‍රය, රතන සූත්‍රය, නාලක සූත්‍රය, තුවටක සූත්‍රය" ආදී සූත්‍ර නාමයෙන් දැක්වෙන සියලු බුද්ධ වචනය "**සුත්ත**" නම් වේ.
- සියලු ගාථා සහිත සූත්‍ර "**ගෙය්‍ය**" නම් වේ. සංයුත්ත නිකායෙහි සගාථ වර්ගය ද, අන් සියලු සගාථ සූත්‍රයන් ද මෙහි ඇතුළත් වේ.
- සියලු අභිධර්ම පිටකය ද, සියලු නිර්ගාථක සූත්‍රයන් ද, අන් අංග අටෙහි සංග්‍රහ නොවූ සියලු බුද්ධ වචනය ද "**වෙය්‍යාකරණ**" නම් වේ.
- "ධම්මපද, ථෙරගාථා, ථෙරිගාථා" යන මේවා ද, සුත්තනිපාතයෙහි සූත්‍ර සංඛ්‍යාවට නොගැනෙන ගාථා වශයෙන් ඇති සියල්ල ද "**ගාථා**" නම් වේ.
- සොම්නස් සහගත සිතින් උපන් ගාථාවන්ගෙන් ප්‍රතිසංයුක්ත අසූදෙකක් සූත්‍ර "**උදාන**" නම් වේ.
- "වුත්තඤ්හෙතං භගවතා" ආදී ලෙස නැවත දේශනා කරන ලද එක සිය දොළොසක් සූත්‍ර "**ඉතිවුත්තක**" නම් වේ.
- අපණ්ණක ජාතකය ආදී කරුණක් ඇති කල්හි ම දේශනා කරන ලද පන්සිය පණසක් පමණ පූර්ව බෝධිසත්ව චර්යාවන් "**ජාතක**" නම් වේ.
- "චත්තාරොමෙ, භික්ඛවෙ, අච්ඡරියා අබ්භුතා ධම්මා ආනන්දෙ" යනාදී ලෙස පැවති සියලුම ආශ්චර්යය අද්භූත ධර්මයන්ගෙන් ප්‍රතිසංයුක්ත සූත්‍ර දේශනා "**අබ්භූතධම්ම**" නම් වේ.
- "චූළවෙදල්ල සූත්‍රය, මහාවෙදල්ල සූත්‍රය, සම්මාදිට්ඨි සූත්‍රය, සක්කපඤ්හ සූත්‍රය, සංඛාරභාජනීය සූත්‍රය, මහාපුණ්ණම සූත්‍රය"

ආදී සංවාද ස්වරූපයෙන් නුවණත් සතුටත් ලබමින් විචාරන ලදුව වදාළ සියලු සූත්‍ර "වෙදල්ල" නම් වේ.

### ධර්මස්කන්ධ වශයෙන් සුවාසූදහසක් වන්නේ කෙසේ ද?,

ධර්ම සංගායනාවේ දී ආනන්ද තෙරුන් වහන්සේ විසින් මෙසේ වදරණ ලද්දේය.

**"ඩාසීති බුද්ධතො ගණ්හිං - ද්වෙ සහස්සානි භික්ඛුතො,**
**චතුරාසීති සහස්සානි - යෙ මෙ ධම්මා පවත්තිනො"**

**"මම, භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහි දී ධර්මස්කන්ධ දෙයාසූදහසක් උගතිමි. සැරියුත් මුගලන් ආදී මහරහතන් වහන්සේලා සමීපයෙහි දී ධර්මස්කන්ධ දෙදහසක් උගතිමි. මෙසේ මාගේ සිතෙහි ධරන්නා වූ ධර්මය ප්‍රමාණ වශයෙන් සුවාසූ දහසකි"** යැයි වදළේ ය.

එහි එක් අනු සන්ධියක් ඇති සූත්‍රයක් එක ධර්මස්කන්ධයකි. අනු සන්ධි බොහෝ ඇති සූත්‍රයන්හි ඒ අනු සන්ධි ගණනින් ධර්මස්කන්ධ ගණන් ගත යුතුය. දෙවියන් විසින් **"කති ඡින්දෙ කති ජහෙ"** යනාදී ලෙස ප්‍රශ්න ඉදිරිපත් කිරීමේ දී ඒ ප්‍රශ්න ගාථාවක් එක ධර්මස්කන්ධයකි. එයට භාග්‍යවතුන් වහන්සේ **"පඤ්ච ඡින්දෙ පඤ්ච ජහෙ"** යනාදී ලෙස වදළ පිළිතුරු ගාථාව එක ධර්මස්කන්ධයකි. අභිධර්මයෙහි එක එක දුකමාතිකා, තිකමාතිකාවන් බෙදීම ද, එක එක චිත්තවාර බෙදීම ද, එක එක ධර්මස්කන්ධ වේ. විනයෙහි වස්තු ඇත, මාතෘකා ඇත, පදභාජනීය ඇත, අන්තරාපත්ති ඇත, ආපත්ති ඇත, අනාපත්ති ඇත, තිකපරිච්ඡේද ඇත. එහි එක එක කොට්ඨාශ එක එක ධර්මස්කන්ධ වේ. මෙසේ සියල්ල එකතුව ධර්මස්කන්ධ වශයෙන් සුවාසූදහසකි.

## ❄ සාමඤ්ඤඵල සූත්‍ර සංගායනාව

පඤ්චසතික සංගායනාවේ දී මූලාසනයෙහි වැඩසිටි මහා කාශ්‍යප මහරහතන් වහන්සේ අසන සේක් **"ආනන්දය, තථාගතයන්**

**වහන්සේ මෙම සාමඤ්ඤඵල සූත්‍රය කොතැනකදි දේශනා කළ සේක් ද?"** ධර්මාසනයෙහි වැඩසිටියා වූ ආනන්ද මහරහතන් වහන්සේ එය විසඳන සේක් **"ස්වාමීනි කාශ්‍යප ස්ථවිරයන් වහන්ස, රජගහ නුවර ජීවක අඹ උයනෙහි දී දේශනා කොට වදාළ සේක"** යැයි කීවේ ය. මහා කාශ්‍යප රහතන් වහන්සේ **"ආනන්දය, කවුරුන් අරභයා වදාළ සේක් ද"** යැයි ඇසූවේ ය. ආනන්ද තෙරුන් වහන්සේ **"ස්වාමීනි කාශ්‍යප ස්ථවීරන් වහන්ස, වේදේහි පුත්‍ර වූ අජාසත්ත රජතුමා අරභයා වදාළ සේක"** යැයි කීවේ ය. මහා කාශ්‍යප මහරහතන් වහන්සේ **"කුමන කරුණක් හේතුකොටගෙන වදාළ සේක් ද"** යැයි ඇසුවේ ය. ආනන්ද තෙරුන් වහන්සේ "ස්වාමීනි ස්ථවිරයන් වහන්ස, අජාසත් මහ රජතුමා තථාගතයන් වහන්සේ වෙත පැමිණ **"ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස, සම්බුද්ධ ශාසනයෙහි පැවිදි වූ භික්ෂූන් වහන්සේලා ඒ පැවිද්දෙන් මෙලොවදී ලබන ඵලයක් ඇත්තේ ද"** යැයි අසන ලද ප්‍රශ්නය විසඳ පිළිතුරු දේශනාවක් කිරීමෙන් පැහැදෙන ඒ මහ රජතුමා ගේ තෙරුවන් සරණ යෑම දක දේශනා කොට වදාළ සේක" යැයි කීවේ ය.

බුද්ධ උපස්ථායක වූ ධර්ම භාණ්ඩාගාරික ආනන්ද තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේ හමුවෙහි දී ඉගෙන ගන්නා ලද මේ සූත්‍රය සම්බුද්ධ පරිනිර්වාණයෙන් තෙමසක් ගත වූ තැන දී මහා කාරුණික වූ සම්මාසම්බුදු රජාණන් වහන්සේ ගේ අධිෂ්ඨානය පරිදි මේ උතුම් සද්ධර්මය වේනෙය්‍ය ජනයාගේ ප්‍රයෝජනය පිණිස බොහෝ කලක් පැවැත්මට භාග්‍යවතුන් වහන්සේ හමුවෙහි දී ඉගෙන ගත් බව දැක්වීමට මෙසේ ඉදිරිපත් කළේ ය. එහි පිළිවෙළ කථාව මෙසේ ය.

## ☸ නිසි බුද්ධෝපස්ථායෙකු නොවීම

ප්‍රථම බෝධිය වූ විසි වර්ෂය තුළ තථාගතයන් වහන්සේට නිත්‍ය උපස්ථායකයෙකු නොවී ය. ඒ කාලපරිච්ඡේදයෙහි දී **"නාගසමාල, නාගිත, උපවාන, සුනක්ඛත්ත, චුන්ද සාමණේර, සාගත, රාධ, මේඝිය"** යන තෙරුන්වහන්සේලා ද ඇතැම් විටෙක **"ආනන්ද තෙරනුවෝ"** ද උපස්ථාන කළහ.

එක් දිනක් භාග්‍යවතුන් වහන්සේ, **නාගසමාල තෙරුන් වහන්සේ** උපස්ථායක කොට දීඝී මාගීයට පිළිපන්නේ දෙමන් සන්දියකට පැමිණ, එයින් එක් මගකින් වැඩි සේක. එවිට නාගසමාල තෙරුන් වහන්සේ "**ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස, අපි මේ මගින් වඩිමු**" යැයි කීවේ ය. එවිට භාග්‍යවතුන් වහන්සේ "**නැත මහණ, මා විසින් මේ මාගීයෙන් යා යුතුය**" යැයි වදාළ සේක. මෙසේ භාග්‍යවතුන් වහන්සේ තුන් වතාවක් වදාළ නමුත් නාගසමාල තෙරණුවෝ "**එසේ නම් භාග්‍යවතුන් වහන්ස, පාත්‍ර චීවර ගත මැනව**" යැයි කියා භාග්‍යවතුන් වහන්සේ ගේ පාත්‍ර චීවර බිම තබා ගියේය. පසුව භාග්‍යවතුන් වහන්සේ තම පාත්‍රචිවර ගෙන එකලාව වැඩි සේක. අන් මගින් ගිය නාගසමාල තෙරුන් වනයෙහි දී සොරුන්ට හසු වූහ. පාත්‍ර චීවර ද පැහැර ගත්හ, හිස ද පැලූහ. ඉන් පසු තෙරණුවෝ "**මට භාග්‍යවතුන් වහන්සේ හැර අන් පිහිටක් නැත**" යැයි සිතා භාග්‍යවතුන් වහන්සේ සොයා ආයේ ය. භාග්‍යවතුන් වහන්සේ මේ කිම්ද යැයි ඇසූ සේක. තෙරණුවෝ සිදු වූ සියල්ල කීවේ ය. භාග්‍යවතුන් වහන්සේ "**මහණ, ඔය කරුණ දැනගෙනම ඒ මගින් යෑම වැළකුවෙමි**" යැයි වදාළ සේක.

එසේම තවත් දිනක භාග්‍යවතුන් වහන්සේ **මේඝිය තෙරුන් වහන්සේ** උපස්ථායකයෙකු වශයෙන් කැදවාගෙන පාචීනවංශ මුව වනයෙහි ජන්තු නම් ගමට වැඩි සේක. එහි පිඩුසිඟා ගිය මේඝිය තෙරුන් වහන්සේ අලංකාර වූ අඹ වනයක් දැක භාග්‍යවතුන් වහන්සේ වෙත පැමිණ මෙසේ කීවේ ය. ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස, භාග්‍යවතුන් වහන්සේ ගේ පාත්‍ර චීවර බාර ගන්නා සේක්වා. මම මේ වනයට ගොස් මහණ දම් පුරමි යැයි කීවේ ය. භාග්‍යවතුන් වහන්සේ තුන් වතාවක් ම වැළකූ නමුත් ගියේ ය. ඉන් පසු භාග්‍යවතුන් වහන්සේ ම තම පාත්‍ර චීවර රැගෙන එකලාවම වැඩි සේක. තෙරණුවෝ ඒ අඹ වනයට ගොස් භාවනාවට පටන් ගත්තේ ය. එහෙත් සුළු වේලාවකින් ම අකුසල විතර්කයන්ගෙන් පීඩිත ව මට භාග්‍යවතුන් වහන්සේ හැර අන් පිහිටක් නැතැයි සිතා භාග්‍යවතුන් වහන්සේ සොයා ආයේ ය. භාග්‍යවතුන් වහන්සේ "**මේඝිය, මම ඔය කරුණ දැනගෙනම ඒ ගමන වැළකුයෙමි**" යැයි වදාළ සේක.

## ☸ නිත්‍ය උපස්ථායෙකු පත් කර ගැනීම

පසු කලෙක බුද්ධත්වයෙන් විසිවන වර්ෂයෙහි දී සැවැත්නුවර ජේතවනාරාමයට වැඩියා වූ භාග්‍යවතුන් වහන්සේ, අග්‍ර ශ්‍රාවක, අසූ මහා ශ්‍රාවක මහරහතන් වහන්සේලා ප්‍රධාන විශාල භික්ෂූන් වහන්සේලා පිරිසක් පිරිවරා උතුම් බුද්ධාසනයෙහි වැඩ හිඳිමින්, මෙසේ වදාළ සේක. **"මහණෙනි, මම දැන් වයෝවෘධයෙමි. මට උපස්ථානයට පැමිණෙන ඇතැම් භික්ෂූන් වහන්සේලා මේ මගින් යමු යැයි කී විට, නැත භාග්‍යවතුන් වහන්ස, මේ මගින් යමු යැයි කියා මගේ පාත්‍ර - චීවර බිම දමා යති. එබැවින් මා හට නිත්‍ය උපස්ථායකයෙකු සම්මත කෙරේවා"** යැයි භික්ෂු සංඝයාට පැවරූ සේක. එවිට මහා සංඝයා හට මහත් සංවේගයක් ඇතිවූහ.

එවේලෙහි සැරියුත් මහරහතන් වහන්සේ නැගිට චීවරය ගැට වටු කොට පොරවා ගෙන භාග්‍යවතුන් වහන්සේට අභිවාදනය කොට **"ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස, මම භාග්‍යවතුන් වහන්සේ ම ප්‍රාර්ථනා කරගෙන ඒකාසංඛ්‍යා කල්ප ලක්ෂයක් පෙරුම්දම් පිරුවෙමි. මා වැනි වූ මහත් ප්‍රඥාවන්තයෙකු උපස්ථානයට සුදුසු නොවන්නෙහි ද? මම භාග්‍යවතුන් වහන්සේට උපස්ථාන කරමි"** යැයි කිවේය.

භාග්‍යවතුන් වහන්සේ එය අසා **"කම් නැත සාරිපුත්‍රය, නුඹ යම් දිශාවක වාසය කරන්නේ ද, ඒ දිශාව නොසිස් ය. එබැවින් ඔබගෙන් උවටැන් කරවා ගැනීමක් අවශ්‍ය නැත"** යැයි ප්‍රතික්ෂේප කළහ. මෙසේ මුගලන් මහරහතන් වහන්සේ, මහා කාශ්‍යප මහරහතන් වහන්සේ ආදී මහරහතන් වහන්සෙලා ද, වෙන වෙනම උපස්ථානය ඉල්ලා සිටියහ. භාග්‍යවතුන් වහන්සේ ඒ සියලු දෙනා වහන්සේගේ ම ඉල්ලීම ප්‍රතික්ෂේප කළ සේක. එසේ වුව ද ආනන්ද තෙරුන්වහන්සේ නිහඬව ම සිටියේ ය. එවිට අන් භික්ෂූන් වහන්සේලා ආනන්ද තෙරුන් වහන්සේ අමතා **"ආනන්දය, ඔබ භාග්‍යවතුන් වහන්සේ වෙතින් උපස්ථායක තනතුර ඉල්වාගනුව"** යැයි කීහ. එවිට ආනන්ද තෙරුන් වහන්සේ **"ඇවැත්නි, ඉල්වාගත් තනතුරු කෙබඳු වේද? කිම, භාග්‍යවතුන් වහන්සේ මා නොදක්නා සේක් ද, භාග්‍යවතුන් වහන්සේ කැමති වන සේක් නම් ආනන්දය, මට උපස්ථාන කරන්න"** යැයි වදරණ සේක යැයි කිවේය. එවිට භාග්‍යවතුන් වහන්සේ **"මහණෙනි, ආනන්ද අනුන් විසින්**

**උත්සාහ කළ යුත්තෙකු නොවේ. තමන් ම ඒ බව දන මට උපස්ථාන කරන්නේ ය"** යැයි වදාළහ. එවිට භික්ෂූන් වහන්සේලා **"ආනන්දය, නැඟී සිටින්න දස බලධාරීන් වහන්සේ ගේ උපස්ථානය ඉල්ලන්න"** යැයි කිහ. එවිට ආනන්ද තෙරුන්වහන්සේ නැඟිට චීවරය ගැටවටුගන්වා පොරවා ගෙන භාග්‍යවතුන් වහන්සේ සකසා වැඳ ඇඳිළි බැඳ ප්‍රතික්ෂේප කිරීම් සතරක් ඉල්ලා සිටියේ ය.

## ☸ ප්‍රතික්ෂේප සතර

1. භාග්‍යවතුන් වහන්සේට ලැබෙන චීවර මට නොදෙන සේක්වා.
2. භාග්‍යවතුන් වහන්සේට ලැබෙන පිණ්ඩපාතය මට නොදෙන සේක්වා.
3. භාග්‍යවතුන් වහන්සේ සමග එක ගඳකිළියෙහි විසිමට මට අවසර නොදෙන සේක්වා.
4. භාග්‍යවතුන් පිළිගත් ආරාධනාවලට මා කැඳවා ගෙන නොයන සේක්වා.

**"භාග්‍යවතුන් වහන්සේ මේ ප්‍රතික්ෂේප සතර පිළිගන්නා සේක් නම් මම උපස්ථාන කරමි"** යැයි කීවේ ය. එවිට භාග්‍යවතුන් වහන්සේ, **"ආනන්දය, නුඹ කවර ආදීනවයක් දක මේ ප්‍රතික්ෂේප සතර ඉල්වන්නෙහි ද"** යැයි අසා වදාළහ. එවිට ආනන්ද තෙරුන් වහන්සේ, **"ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස, ඇතැම් කෙනෙක් ආනන්ද තෙරුන් ලාභ අපේක්‍ෂාවෙන් භාග්‍යවතුන් වහන්සේට උපස්ථාන කරන්නේය යැයි මේ වචනය කියන්නේ ය. එබැවින් මේ ප්‍රතික්ෂේප සතර ඉල්ලමි"** යැයි කීවේ ය. නැවත මේ ආයාචනා සතර ද ඉල්ලා සිටියේ ය.

## ☸ ආයාචනා සතර

1. මා විසින් බාර ගත් දන ආරාධනාවලට භාග්‍යවතුන් වහන්සේ වඩින සේක්වා.

2. භාග්‍යවතුන් වහන්සේ දැකීමට පිටතින් පැමිණෙන පැවිදි ගිහි ආගන්තුකයන් පමා නොවී භාග්‍යවතුන් වහන්සේ වෙත යොමු කරවීමට මට අවසරය දෙන සේක්වා.

3. ධර්මය - විනය පිළිබඳව සැකයක් උපන් විගස ඒ මොහොතෙහි දී ම එය විසඳ ගැනීමට භාග්‍යවතුන් වහන්සේ වෙත පැමිණීමට මට අවසරය දෙන සේක්වා.

4. භාග්‍යවතුන් වහන්සේ මා නැති තැනක දී දේශනා කරන ධර්මයන් නැවත මා හට දේශනා කරන සේක්වා.

**"භාග්‍යවතුන් වහන්සේ මේ ආයාචනා සතර පිළිගන්නා සේක් නම් මම උපස්ථාන කරමි"** යැයි කීවේ ය. එවිට භාග්‍යවතුන් වහන්සේ **"ආනන්දය, නුඹ කුමන ආනිසංසයක් දැක මේ ආයාචනා සතර ඉල්වන්නෙහි ද"** යැයි අසා වදාළහ. එවිට ආනන්ද තෙරුන් වහන්සේ, **"ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස, සැදැහැති සත්පුරුෂයෝ භාග්‍යවතුන් වහන්සේ හමුවෙහි අවකාශ නොලැබ මා හමුවට පැමිණ, ස්වාමීනි! ආනන්ද ස්ථවිරයන් වහන්ස, භාග්‍යවතුන් වහන්සේ සමග හෙට මාගේ ගෙයි දනට වඩින සේක්වා"** යැයි ආරාධනා කොට යයි. භාග්‍යවතුන් වහන්සේට එයට අවකාශ නැති විට ඒ සත්පුරුෂයන් භාග්‍යවතුන් වහන්සේ හමුවට පමුණුවාලීමටත් සැක දුරුකර ගැනීමටත් අවකාශ ලබති. එසේ නොලැබුණු කල්හි **"කුමකට නම් මේ ආනන්ද තෙරුන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේ ගේ උපස්ථායක වූයෙහි ද, අපට මෙපමණකුදු අනුග්‍රහයක් නැත"** යැයි දෙස් නගන්නේ ය.

තව ද භාග්‍යවතුන් වහන්සේ නැති විටෙක ඇතැම් සත්පුරුෂයෝ මා හමුවට පැමිණ **"ඇවැත්නි, මේ සූත්‍රය, මේ ජාතකය, මේ ගාථාව භාග්‍යවතුන් වහන්සේ කොතැනක දී දේශනා කළ සේක්ද"** යැයි මගෙන් ඇසුව හොත් එය කිව යුතු වන්නේය. නොහැකි වුව හොත් **"මේ ආනන්ද තෙරුන් වහන්සේ කුමකට නම් භාග්‍යවතුන් වහන්සේගේ සෙවණැල්ල මෙන් පාත්‍ර - චීවර ගෙන යමින් පසුපස ඇවිද්දෙහි ද? මෙපමණවත් දෙයක් නොදන්නෙහි ද?"** යැයි මා හට දෙස් නගන්නේ ය. එබැවින් මේ ආනිශංස දැක මා නැති තැන දෙසූ ධර්මයන් නැවත මා හට දේශනා කරන ලෙස ඉල්ලමි යැයි කීවේ ය. භාග්‍යවතුන් වහන්සේ එම ඉල්ලීම් අට පිළිගෙන උපස්ථායක තනතුර

දුන් සේක. එතැන් පටන් ආනන්ද තෙරුන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේගේ නිත්‍ය උපස්ථායක වූයේ ය.

මේ ආනන්ද තෙරුන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේට උපස්ථායක වීමට කල්ප ලක්‍ෂයක් මුළුල්ලෙහි පුරන ලද පාරමිතා ගුණ ඇති මහෝත්තමයෙකි. මේ වරය ලත් දින පටන් ඇල් පැන් - උණු පැන් - දැහැටි සපයමින්, පිට පිරිමදිමින්, පාද පිරිමදිමින්, ගඳකිළි පිරිවෙන හමදිමින්, මේ වේලාවෙහි භාග්‍යවතුන් වහන්සේට මේ දෙය ලැබෙන්නට වටී ය, මේ වේලාවෙහි මේ දෙය කරන්නට වටී ය යැයි දවස මුළුල්ලෙහි ම බුද්ධෝපස්ථානයෙහි යෙදී සිටියේ ය. එසේම රාත්‍රී කාලයෙහි දඬු වැට පහනක් ගෙන නව වාරයක් භාග්‍යවතුන් වහන්සේ සැතපුණු ගඳකිළිය වටා ඇවිදින්නේ ය. මෙසේ කරන්නේ භාග්‍යවතුන් වහන්සේ මා ඇමතූ විටෙක මා නිදි බරව සිටියේ නම්, එවිට ප්‍රති උත්තර දීමට නොහැකි වන්නේය යැයි ඒ පහන අතින් නුමුදා ම රෑ පහන් කරන්නේ ය. මෙසේ මහත් ගුණ ඇති ආනන්ද තෙරුන් වහන්සේ මේ බුදු සසුනෙහි "**බහුශ්‍රැත භික්‍ෂූන් අතර අග්‍ර වූහ. සතිමන්ත භික්‍ෂූන් අතර අග්‍ර වූහ. ගතිමන්ත භික්‍ෂූන් අතර අග්‍ර වූහ. ධෘතිමන්ත භික්‍ෂූන් අතර අග්‍ර වූහ. බුද්ධ උපස්ථායක භික්‍ෂූන් අතර අග්‍ර වූහ**". මෙසේ අග්‍ර තානාන්තර පසකින් පිදුම් ලැබූහ.

ඒ මේ ආනන්ද තෙරුන් වහන්සේට එක් වරකට බණවර හැටක් (ගාථා පසළොස් දහසක්) ධාරණය වන්නේය. එය දීඝ නිකාය තරම් වූ ප්‍රමාණයකි. වසර විසි පහක් ම භාග්‍යවතුන් වහන්සේ පසුපස යමින් බොහෝ ධර්මයන් ඉගෙන ගත්තේ ය. ඒ නිසාම පඤ්චසතික සංගායනාවෙහි දී

**"ද්වාසීති බුද්ධතො ගණ්හිං - ද්වෙ සහස්සානි භික්ඛුතො,**
**චතුරාසීති සහස්සානි - යෙ මෙ ධම්මා පවත්තිනො"**

යනුවෙන් "**මම භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහි දී ධර්මස්කන්ධ දෙයාසූදහසක් උගතිමි. සැරියුත් මුගලන් ආදී මහරහතන් වහන්සේලා සමීපයෙහි දී ධර්මස්කන්ධ දෙදහසක් උගතිමි. මෙසේ මාගේ සිතෙහි ධරන්නා වූ ධර්මය ප්‍රමාණ වශයෙන් සුවාසූ දහසකි**" යැයි වදාළේ ය. මෙසේ ත්‍රිපිටක බුද්ධ වචනයෙන් බොහෝ දැ භාග්‍යවතුන් වහන්සේ

හමුවෙහි දී ඉගෙන ගන්නා ලද මේ ආනන්ද තෙරුන් වහන්සේ එම ධර්ම සංගීතියෙහි දී "**සාමඤ්ඤඵල සූත්‍රය**" නමින් මෙසේ සංගායනාවට නැගූහ. එහි අර්ථ විවරණය මෙසේ ය.

"**එවං මෙ සුතං**" මා විසින් මෙසේ අසන ලදි. මෙය වනාහී මා විසින් අවබෝධ නොකරන ලද්දකි. ප්‍රත්‍යක්ෂ නොකරන ලද්දකි. යනුවෙන් තමන් වහන්සේ අත්හැර, මෙය මා විසින් භාග්‍යවතුන් වහන්සේ වෙතින් ම උගත්තෙමි යැයි අවධාරණය කොට දක්වන්නේය.

"**එවං**" යනුවෙන් තථාගතයන් වහන්සේ විසින් මාගේ ශාසනයෙහි බහුශ්‍රැත භික්ෂූන් අතර ද, යහපත් පැවතුම් ඇති භික්ෂූන් අතර ද, මනා සිහිය ඇති භික්ෂූන් අතර ද, ධාරණ ශක්තිය ඇති භික්ෂූන් අතර ද, උපස්ථායක භික්ෂූන් අතර ද මේ ආනන්ද තෙරුන් වහන්සේ අග්‍ර යැයි වදාළ බුද්ධ වචනයට අනුරූප වූ තමන්ගේ ධාරණ ශක්තිය දක්වමින් "**මා විසින් මෙසේ අසන ලදි. එය ද අර්ථ වශයෙන් ද ව්‍යඤ්ජන වශයෙන් ද නො අඩුය. නොවැඩිය. මෙය මෙසේ ම මිස අන් අයුරකින් නොදත යුතුය**" යැයි සත්වයන් ගේ ඇසීමේ කැමැත්ත උපදවයි.

"**මෙ**" යනු මා විසින් යනුයි. භාග්‍යවතුන් වහන්සේ යම් සේ දේශනා කළ සේක ද, එසේම මා විසින් අඩු වැඩි නොකර වෙනස් නොකර මා විසින්ම භාග්‍යවතුන් වහන්සේ වෙතින් උගත්තෙමි යනුවෙන් දක්වමින් භාග්‍යවතුන් වහන්සේ මේ ධර්මය දේශනා කළ ධර්ම ශාස්තෲවරයාණන් වහන්සේ වශයෙන් දක්වා තමන් ශ්‍රාවකයෙකු කොට දක්වයි.

"**සුතං**" යනු අසන ලදි යනු යි. ඒ ඇසීම වනාහි අනිකෙකු භාග්‍යවතුන් වහන්සේගෙන් අසා දැනගෙන මට කීවා නොවේ. භාග්‍යවතුන් වහන්සේ හමුවෙහි දී මගේ කණින් ම අවධානය යොමු කොට මනා ධර්ම ගෞරවයෙන් ම අසා දැන ගත්තෙමි යැයි දක්වයි.

එසේම මේ ආනන්ද තෙරුන් වහන්සේ වනාහි මිහිරි හඬින් ධර්මදේශනා කරන්නා වූ බහුශ්‍රැත වූ විචිත්‍ර ධර්ම කථිකයෙකි. මේ ආනන්ද තෙරුන් වහන්සේ මෙසේ වාක් චාතුර්යයෙන් යුක්තව මහේශාක්‍ය

මහරහතන් වහන්සේලා ඉදිරියෙහි මේ උතුම් බුද්ධ වචනය සංගායනා කරන කල්හි එය දැකීමට ශ්‍රවණය කිරීමට අප්‍රමාණ දෙවියෝ ද බ්‍රහ්මයෝ ද රැස් වූහ. ඔවුන් අතරින් ඇතැම් දෙවියන්ට මෙබඳු සැකයක් උපන්හ. **"තුන්ලෝකාග්‍ර වූ භාග්‍යවත් අතීත් සම්මා සම්බුදු රජාණන් වහන්සේ ද ශාක්‍ය වංශිකයෙකි. මේ ආනන්ද තෙරුන් වහන්සේ ද ශාක්‍ය වංශිකයෙකි. භාග්‍යවතුන් වහන්සේ ගේ සුළු පියා වූ අමිතෝධන ශාක්‍ය රජතුමාගේ පුත්‍රයා ය. රූපයෙන් ද ස්වරයෙන් ද ශෝභමානය. භාග්‍යවතුන් වහන්සෙගේ දායාදය ද ලබති. භාග්‍යවතුන් වහන්සේ ම මේ ආනන්ද තෙරුන් වහන්සේ කරුණු පසකින් අග්‍ර තැන්හි තැබූහ. ආශ්චර්‍ය්‍ය ධර්ම සතරකින් යුක්ත වූවෙකු ද වෙති. සැමට ප්‍රියමනාප වූයේ වේ. දැන් භාග්‍යවතුන් වහන්සේ ගේ ධර්මදායාදය ලැබ බුදු වූයේය"** යැයි සිතූහ. එබැවින් ආනන්ද තෙරුන් වහන්සේ දෙවියන් තුළ වූ ඒ සිත තම සිතින් දැන එසේ වූ අද්භූත වූ ගුණ සම්භාවනාව නො ඉවසන සුළු වූයේ දෙවියන්ට ඇති වූ ඒ රැවටුණු අදහස් දුරු කරමින් ශාස්තෘන් වහන්සේට ඉමහත් ගෞරවය දක්වා තමන්ගේ ශ්‍රාවක බව **"එවං මෙ සුතං"** යනුවෙන් ප්‍රතිඥා කළේ ය.

තවද **"එවං මෙ සුතං"** යනුවෙන් **"මා විසින් මේ ධර්මය චතුවෛශාරද්‍ය විශාරද වූ, දසබල ධාරී වූ, උත්තමස්ථානයෙහි පිහිටියා වූ, සිංහනාද සමාන නාද ඇත්තා වූ, සියලු සත්වයන්ට උත්තම වූ, ධර්මේශ්වර වූ, ධර්මරාජ වූ, ධර්මාධිපති වූ, ධර්මද්වීප වූ, ධර්මසරණ වූ, සද්ධර්ම වර චක්‍රවර්ති වූ, සම්මා සම්බුද්ධ වූ භාග්‍යවතුන් වහන්සේ ගේ සම්මුඛයෙන් පිළිගන්නා ලද්දේ වෙමි. මෙහි අර්ථයෙහි හෝ ධර්මයෙහි හෝ පදයෙහි හෝ ව්‍යඤ්ජනයෙහි හෝ සැකයක් හෝ විමතියක් හෝ නොකළ යුතුය"** යැයි සියලු දෙව් මිනිසුන් ගේ මේ ධර්මයෙහි අශ්‍රද්ධාව නසන සේක. ශ්‍රද්ධාව උපදන සේක.

**"එකං සමයං භගවා රාජගහෙ විහරති ජීවකසස කොමාරභච්චසස අම්බවනෙ"** එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ ජීවක කෝමාරභච්ච වෛද්‍යාචාර්‍ය්‍යතුමා විසින් සාදවා පූජා කරන ලද අඹ වනයෙහි වැඩසිටි සේක.

මෙහි **"එකං සමයං"** යන මෙහි සංවත්සර, ඍතු, මාස පක්ෂ දින පූර්වාහ්නය, මධ්‍යාහ්නය, අපරාහ්නය ප්‍රථම යාමය, මධ්‍ය යාමය, පශ්චිම

යාමය වශයෙන් කාලය දක්වීම **"සමය"** නම් වේ. මෙහි සමය බොහෝ වේ. පූරිත පාරමිතා ගුණ ඇති මහ බෝසතාණන් වහන්සේ දසදහසක් ලෝකධාතු වැසි දිව්‍ය බ්‍රහ්මයන් ගේ ආරාධනයෙන් පඤ්ච මහා විලෝකනයන් බලා සුදුසු මවු කුසෙහි පිළිසිඳ ගැනීම **"ගර්‍භාවක්‍රාන්ති සමය"** නම් වේ. උයනක දී මවු කුසෙන් බිහි වීම **"ජාති සමය"** නම් වේ. එතැන් පටන් සතර පෙර නිමිති දැකීම දක්වා ගිහි ව විසීම **"සංවේග සමය"** නම් වේ. පුතෙකු උපන් දම පැවිදි රුවක් දැක මහාභිනිෂ්ක්‍රමණය කිරීම **"අභිනිෂ්ක්‍රමණ සමය"** නම් වේ. අඩුම තරමින් සත් දිනක් හෝ දුෂ්කර ක්‍රියා කිරීම **"දුෂ්කර ක්‍රියා සමය"** නම් වේ. බෝධි මූලයට වැඩ අපරාජිත පර්‍ය්‍යංකයෙහි වැඩ හිඳිමින් මාර පරාජය කිරීම **"මාරවිජය සමය"** නම් වේ. ඒ එකම පර්‍ය්‍යංකයෙහි වැඩ හිඳිමින් තුන් යම් රාත්‍රියෙහි පුර්‍වේනිවාස ඥානය, දිව්‍යශ්‍රෝත ඥානය, ආශ්‍රවක්‍ෂය ඥානය ලැබීමත් සමගම සර්‍වඥතාඥාන ඥාන ප්‍රතිලාභයෙන් අභිසම්බෝධියට පැමිණීම **"අභිසම්බෝධි සමය"** නම් වේ. සත් සති ගත කිරීම ද, නිරෝධ සමාපත්ති, ඵල සමාපත්ති, ධ්‍යාන සමාපත්ති සුව විඳීම **"දිට්ඨධම්ම සුඛවිහරණ සමය"** නම් වේ. බ්‍රහ්මාරාධනාවෙන් දම්සක් සූත්‍රය දෙසීමෙහි පටන් ධර්‍මදේශනා කිරීම **"ධර්‍මදේශනා සමය"** නම් වේ. සූවිසි කෝටි ලක්‍ෂ වාරයක් නවානුපූර්‍වී විහාර සමාපත්ති සුව විඳ එයින් නැඟී සිට අනුපාදිශේෂ පරිනිර්‍වාණ ධාතුවෙන් පරිනිර්‍වාණයට පැමිණීම **"පරිනිර්‍වාණ සමය"** නම් වේ.

ඒ සමයන් අතර මෙහි **"එකං සමයං"** යනු එක් ධර්‍ම දෙශනා සමයක දී යනුයි. ඒ දේශනා සමය ද, **"ඤාන කෘත්‍ය, කරුණා කෘත්‍ය"** සමයන් අතර **"කරුණා කෘත්‍ය"** සමයකි. **"ආත්ම හිත ප්‍රතිපත්ති සමය, පරහිත ප්‍රතිපත්ති සමය"** යන ප්‍රතිපත්ති සමයන් අතර **"පරහිත ප්‍රතිපත්ති"** සමයකි. රැස් වූ විට කළ යුතු වූ **"ධර්‍මකථා සමය, දේශනා ප්‍රතිපත්ති සමය"** යන සමයන් අතර **"ධර්‍මකථා"** සමයකි. මේ සියල්ල අතරින් මෙය **"දේශනා සමයකි"**.

**"භගවා"** යනු ගුණයෙන් විශිෂ්ට වූ සත්වයන්ට උත්තම වූ ලෞකික ලෝකෝත්තර සැප නිපදවන්නා වූ දන සීලා දී පාරමී භාවයට පැමිණි කුසල් ඇති බැවින් ද, දස ක්ලේශ, අකුශල මූල, දුෂ්චරිත ආදී අනේක විධ වූ ක්ලේශයන් බිඳ හළ බැවින් ද, ආශ්චර්‍ය්‍ය භාග්‍යා දී කීර්ති ප්‍රශංසාවට ගෞරවයට ලක්වන ගුණයෙන් යුක්ත වන බැවින් ද,

අවබෝධ කළ යුතු වූ සියලු ධර්‍ම කුශලත්‍රිකා දී ලෙස බෙද දක් වූ බැවින්ද "**භගවා**" නම් වන සේක.

තවද මෙහි "**එවං මෙ සුතං**" යන වචනයෙන් ඇසූ පරිදි ඉගෙන ගත් පරිදි ධර්‍මය දේශනා කරන්නා වූ දේශකයෝ භාග්‍යවතුන් වහන්සේගේ ධර්‍ම ශරීරය පමණක් ම දේශනා කරති. එබැවින් "**මේ ධර්‍මය වනාහී ශාස්තෲවරයෙකු නොමැති එකක් නොවේ. මේ නුඹලාගේ ශාස්තෲවරයාය**" යැයි භාග්‍යවතුන් වහන්සේ නොදැකීමෙන් රූපකයෙහි පිරිනිවීම දක්වයි. එමගින් "**මේ ආයර්‍ය ධර්‍මය දේශනා කළා වූ දසබල ධාරී වූ සම්මා සම්බුදු රජාණන් වහන්සේ ද, වජ්‍ර සමාන කයක් ඇත්තේ නමුදු පරිනිර්‍වාණයට පත් වූ සේක් නම්, එබඳු ශක්තියක් නැති අන්‍යයන් විසින් දුබල ජීවිත කෙරෙහි කුමන කරුණක් හේතුකොටගෙන ජීවිතාශාව ඉපදවිය යුත්තේ ද**" යැයි ජීවිත මදෙන් මත් වූ ජනතාව සංවේගයට පත් කරයි. ඔවුනට සද්ධර්‍මයෙහි උත්සාහ උපදවයි. මෙසේ "**එවං**" යන්නෙන් දේශනා සම්පත්තිය ද "**මෙ සුතං**" යන්නෙන් ශ්‍රාවක සම්පත්තිය ද "**එකං සමයං**" යන්නෙන් කාල සම්පත්තිය ද "**භගවා**" යන්නෙන් දෙශක සම්පත්තිය ද දක්වයි.

"**රාජගහෙ විහරති ජීවකස්ස කොමාරභච්චස්ස අම්බවනෙ**" රජගහ නුවර සමීපයෙහි වූ ජීවක වෛද්‍යාචාර්‍යතුමා විසින් සාදවා ආරාමයක් කොට පූජා කරන ලද අඹ වනයෙහි වැඩසිටි සේක යන මෙහි "**රාජගහෙ**" යනු මෙනම් නම් ඇති නගරයයි. අතීතයෙහි මහා මන්ධාතු මහා ගෝවින්ද ආදී මහානුභාව සම්පන්න මහා රජවරුන් ගේ ග්‍රහණයට ආධිපත්‍යයට යටත් ව පැවති බැවින් "**රජගහ**" නම් වේ. තව ද ගාලක් වටේ බැඳි ආරක්‍ෂක වැටක් මෙන් **පාණ්ඩව පර්‍වතය, වේභාර පර්‍වතය, ගිජ්ඣකූට පර්‍වතය, ඉසිගිලි පර්‍වතය, වේපුල්ල පර්‍වතය,** යන මහා පර්‍වත රාජයන්ගෙන් වටව පවතින්නා වූ මෙය මහා නගරයක් වූ බැවින් "**රජගහනුවර**" නම් වේ. මේ රජගහ නුවර ලොව්තුරා බුද්ධෝත්පාද කාලයන්හි දී ද, සක්විති රජවරු ලොව උපදින කාලයන්හිදී ද ජනාකීර්‍ණ වූ සියලු සැපතින් පිරුණු දඹදිව් තලයෙහි පවතින නගරයන් අතර අග්‍ර නගරය වේ. අන් කාලයන්හි දී යක්‍ෂාදීන්ගේ වාසභූමියක් වූ ජන ශූන්‍යය පාලු කැලෑ ප්‍රදේශයක් වේ. සොළොස් මහා ජනපදයන්ගෙන් ප්‍රධාන ජනපදයක් වන මගධ රට අගනුවර වූයේ මේ රජගහ පුරයයි.

භාග්‍යවතුන් වහන්සේ ජීවමාන කල්හි මෙහි අටළොස් කෝටියක් ජනගහනය සිටියහ. බිම්බිසාර මහ රජතුමා රාජ්‍ය පාලකයා විය.

**"විහරති"** යනු දිව්‍ය බ්‍රහ්ම ආර්‍ය්‍ය විහරණයන්ගෙන් යම් විහරණයකින් වාසය කරයි යනුයි. එනම් සිටීම - හිඳීම - සැතපීම - ගමන් කිරීම යන සිව් ඉරියව් පවත්වමින් වාසය කිරීමයි. භාග්‍යවතුන් වහන්සේ දෙවන තුන් වන, සිව් වන සහ සතළොස්වන වස් කාලයන් මේ රජගහ පුරය ඇසුරු කොට වැඩසිටි සේක.

**"ජීවකස්ස කොමාරභච්චස්ස අම්බවනෙ"** ජීවක වෛද්‍යාචාර්‍ය්‍ය තුමාගේ අඹ වනයෙහි ය. මෙහි යම් ගෙදුරුගමක් ඇසුරු කොට සතර ඉරියව් පවත්වමින් පහසු විහරණයෙන් වාසය කිරීමට යෝග්‍ය වාසස්ථානය දැක්වීම වේ. මෙහි රජගහ නුවර දැක්වීමෙන් ගොදුරු ගම දක්වයි. ආරාමය දැක්වීමෙන් පැවිද්දට යෝග්‍ය නිවාසස්ථානය දක්වයි. තවද රජගහ නුවර දැක්වීමෙන් භාග්‍යවතුන් වහන්සේගේ ගිහි ජනයාට අනුග්‍රහ කිරීම ද, ආරාමය දැක්වීමෙන් පැවිද්දන්ට අනුග්‍රහ කිරීම ද දක්වයි. එසේම නගරය දැන්වීමෙන් සිවුපසය ලැබීමෙන් අත්ථකිලමතානු යෝගයෙන් දුරු වීම ද, ආරාමය දැක්වීමෙන් වස්තු කාම ප්‍රහාණයෙන් වෙන් වීමේ උපාය ද දක්වයි. එසේම නගරය දැක්වීමෙන් ධර්‍ම ශ්‍රවණය ද, ආරාමය දැක්වීමෙන් ඒ ධර්‍මයෙහි යෙදීම ද දක්වයි. එසේම ගොදුරු ගම දැක්වීමෙන් කරුණාවෙන් ජනයා වෙත එළඹීම ද, ආරාමය දැක්වීමෙන් ඒ ගෘහවාසයෙහි ආදීනව දැක ඒවාගෙන් නිදහස්වීම ද දක්වයි. එසේම ගොදුරු ගම දැක්වීමෙන් සත්වයන්ට හිතසුව ඇති කිරීමේ අදහස ද, ආරාමය දැක්වීමෙන් අනුන්ට හිතසුව ඇති කිරීමෙහි නොගැලී සිටීම ද දක්වයි. එසේම ගොදුරු ගම දැක්වීමෙන් ධාර්මික සැපය අත නොහැරීම නිමිති කොට ඇති පහසු විහරණය ද, ආරාමය දැක්වීමෙන් උත්තරිමනුෂ්‍ය ධර්‍මයෙහි යෙදීම නිමතිකොට ඇති පහසු විහරණය ද දක්වයි. එසේම ගොදුරු ගම දැක්වීමෙන් මිනිසුන්ට බොහෝ උපකාර බව ද, ආරාමය දැක්වීමෙන් දෙවියන්ට බොහෝ උපකාර බව ද දක්වයි. එසේම ගොදුරු ගම දැක්වීමෙන් ලෝක ජනයා අතර ඉපද ඔවුන් අතරම වැඩුණු බව ද, ආරාමය දැක්වීමෙන් ලෝකය හා නො ඇලුණු බව ද දක්වයි.

## ☸ ජීවක වෛද්‍යාචාර්‍ය්‍යතුමාගේ උත්පත්ති කථාව

පෙර විශාලා මහනුවර ලිච්ඡවි රජ දරුවන්ගේ අඹ උයනක අඹ ගසක් යට සොළොස් හැවිරිදි වයසැති ව කුමාරිකාවක් ඕපපාතිකව උපන්නාය. ඇය **අම්බපාලී** නම් වූවාය. පසුව ලිච්ඡවි රජවරුන් ඇය ගණිකාවක් වශයෙන් ඇසුරු කළහ. ඇය නිසා විසාලා මහ නුවර මහත් සේ දියුණුවට ගියේය. මෙය කරුණු කොට ගෙන රජගහ නුවර ද රාජ සභාවෙහි කතිකාවක් ඇති වී එය නිමිති කොට ගෙන සාලවතී නම් රූමත් කුමාරිකාවක් ගණිකාවක් වශයෙන් සම්මත කොට තැබූහ. එයින් රජගහ නුවර ද දියුණුවට පත්විය. මෙම ගණිකාවට පිරිමි දරුවෙකු ලැබුණි. ඇය තම දාසියකට කථා කොට එම දරුවා රාත්‍රියෙහිම කසල ගොඩට දමන්න යැයි අණ කළා ය. දාසිය එම දරුවා කුඩයකින් රැගෙන ගොස් කසල ගොඩට දමා ගියා ය. උදෑසන අභය රාජ කුමාරයා රාජ්‍ය සේවයට බිම්බිසාර රජතුමාගේ මාලිගයට යන අතර කසල ගොඩ කපුටන් වට වී සිටිනු දැක මාවතේ යන්නෙකුට කථා කොට කුමක්දැයි බලන්නට අණ කළේ ය. ඔහු එය විමසා බලා කුඩයක දරුවෙකු සිටින බව කීවේ ය. ජීවත්ව සිටින්නේ දැයි අසා එසේය යැයි කී විට ගෙන්වාගෙන බලා දරු පෙම් උපදවා තම අන්තඃපුරයට යවා කිරි මවුවරුන් ලවා පෝෂණය කරවීය. කසල ගොඩ සතුන් වටකරගෙන සිටි නමුත් මහා පින් ඇති දරුවෙකු බැවින් කිසි අනතුරක් නොවූයේ ය. එසේ ජීවත් ව සිටි බැවින් "**ජීවක**" යැයි නම් තැබුවේ ය. අභය රාජ කුමාරයා විසින් රජ කුමරෙකු වශයෙන් පෝෂණය කර වූ බැවින් "**කෝමාරභච්ච**" නම් විය. මේ නම් දෙකම එක්ව ගෙන "**ජීවක කෝමාරභච්ච**" නම් වේ. මෙම ජීවක අභය රාජ කුමාරයාට ම දාව උපන් දරුවෙකි. මෙම ජීවක අට හැවිරිදි වියෙහි දී අන් රජ කුමරුවන් සමග කෙලි සෙල්ලම් කරන විට අන් රජ කුමරුවන්ට තම මව්පියන් විසින් නොයෙක් දේ ගෙනත් දෙනු දැක තමන්ට එසේ නොවීම ගැන කල්පනා කොට අභය රාජ කුමාරයා වෙත ගොස් "**පියාණෙනි, මට මවක් පියෙක් නැද්ද**" යැයි ඇසුවේ ය. එවිට අභය රාජ කුමාරයා "**දරුව! නුඹේ මව නම් මම නො දනිමි, පියෙකු වශයෙන් නුඹ පෝෂණය කළෙමි**" යැයි කීවේ ය. ඉන් පසු ජීවක තෙමේ තමන් රජ පවුලෙහි සිටියත් රාජ්‍ය සම්පත් වරප්‍රසාද තමන්ට නො ලැබෙන බව සිතා දිවි පැවැත්මට කළ යුතු දෙයක් සිහි කරන්නේ පූර්ව පිනෙන් වෛද්‍ය ශාස්ත්‍රය සුදුසු යැයි වැටහී තක්ෂිලා නුවරට ගොස් වෛද්‍ය ශාස්ත්‍රය ඉගෙන සම්පූර්ණත්වයට

පැමිණ අවුත් සකල ජම්බුද්වීපයෙහි අග්‍ර වෛද්‍යවරයා විය. බිම්බිසාර මහ රජතුමාගේ රාජ්‍ය වෛද්‍යවරයා ද විය.

## ☸ ජීවකම්බවන පූජාව

පසු කලෙක භාග්‍යවතුන් වහන්සේ තුන්දෙස් කිපීමෙන් ගිලන් වූ විටෙක බිම්බිසාර මහ රජතුමාගේ නියමයෙන් ජීවක වෛද්‍යාචාර්‍ය්‍ය තුමා වේළුවනාරාමයට ගොස් භාග්‍යවතුන් වහන්සේට විරේක බෙහෙත් කොට ඒ දෝෂයන් සුව කළේ ය. පසුව පජ්ජෝත රජුගේ රෝග සුව කිරීම හේතුවෙන් එම රජතුමා විසින් තමන්ට තෑගි කොට එවන ලද උතුරුකුරු දිවයින් වැසියන් අඳින සීවෙය්‍යක වස්ත්‍ර[1] යුග්මයක් භාග්‍යවතුන් වහන්සේට පූජා කොට තථාගතයන් වහන්සේ එහි අනුමෝදනා දේශනාව කළ කල්හි සෝවාන් මාර්ග ඥානයෙහි පිහිටියේය. වේළුවනාරාමය දුර බැවින් තමන්ට පහසුවෙන් දිනකට තුන් වතාවක් බුද්ධෝපස්ථානයට යෑම පිණිස තමන්ට හිමි අලංකාරමත් අඹ උයන රාත්‍රී ස්ථාන, දිවා ස්ථාන, මණ්ඩප, සක්මන්, ලෙන්, කුටි ආදී සියල්ල මනාව සාදවා අටළොස් රියනක් උස ඇති තඹ පැහැති පවුරකින් වට කරවා, බුද්ධ ප්‍රමුඛ මහා සංඝරත්නය වැඩම කරවා, තුන් සිවුරු සහිත කොට ප්‍රණීත දනයක් පිළිගන්වා, විහාරය අත පැන් වඩා භාග්‍යවතුන් වහන්සේට පූජා කළේ ය. මේ භූමිය එතැන් පටන් "**ජීවකම්බවන ආරාමය**" නම් විය.

ඒ කාලයෙහි පාණ්ඩිත්‍යයෙන් යුක්ත වූ මගධ රටට අධිපති වේදේහි පුත්‍ර වූ අජාසත්ත රජතුමා වස්සාන ඍතුවෙහි සාර මාසය පිරෙන ඉල් පුර පසළොස්වක දින කුමුදු මල් පිපෙන සුන්දර රාත්‍රියෙහි රජ මහ ඇමති ගණයා පිරිවරාගෙන රජ මාළිගයේ උඩුමහල් තලයෙහි සිටියේ ය.

"**රාජා මාගධො අජාතසත්තු වෙදෙහිපුත්තො**" යන මෙහි දඹදිව් තලයෙහි මධ්‍යය වූ රජගහ නුවරට ප්‍රධාන හෙවත් නායක බැවින් "**මාගධො**" නම් වේ. "**රාජා**" යනු "**ධම්මෙන පරෙ රඤ්ජෙතීති රාජා**"

---

[1] මේවා උතුරු කුරු දිවයින් වැසියන් අඳින කල්ප වෘක්ෂයෙන් පහළ වන වස්ත්‍රය.

තමන්ගේ ආශ්චර්‍ය සම්පත්තියෙන් සතර සංග්‍රහ වස්තුවෙහි පිහිටා මහජනයා සතුටු කරවන බැවින් "**රජ**" නම් වේ. "**අජාතසත්තු**" යනු එම රජු "**නූපන් කල්හි ම පිය රජතුමාට සතුරු වූයේ ය**" යැයි නිමිත්ත පාඨකයන් විසින් නිර්දේශ කරන ලද එම රජුගේ නාමයයි. එම රජතුමාගේ උත්පත්ති කථාව මෙසේ ය.

## ☸ අජාසත් රජතුමාගේ උත්පත්ති කථාව

පූර්වයෙහි සැවැත් නුවර රාජ්‍ය කළ මහ කොසොල් රජතුමාගේ නැගණිය රජගහ නුවර රාජ්‍යය කළ බිම්බිසාර මහ රජතුමාට අග මෙහෙසිය වූවා ය. ඇයගේ කුසෙහි මේ අජාසත් කුමරු පිළිසිඳ ගත්තේ ය. මේ අජාසත් කුමරු පිළිසිඳ ගත් වෙලෙහි එම රජ බිසවට බිම්බිසාර රජතුමාගේ දකුණු උර මඬල පලා ලේ බොන්නට දොළක් උපන්නාය. මෙය කිසිවකුටත් කීමට නොහැකි කරුණක් බැවින් ඒ දුක සඟවා ගෙන පීඩිත ව සිටි ඇය බොහෝ සෙයින් කෘශ වී දුර්වර්ණ වූවා ය. රජතුමා ඇසූ විට එය නො අසන ලෙස කීවා ය. රජතුමා එය තමන්ට නොකියන්නේ නම් වෙන කාට කියන්නී ද යැයි එය අසා ඒ දොළදුක දැනගෙන "**නුවණ මඳ තැනැත්තිය, තී බැරෑරුම් හැඟීමකින් යුක්ත වූයේ කුමක් නිසා ද**" යැයි කියා වෙදෙකු කැඳවා රන් ආයුධයකින් දකුණු අත උරහිස පළවා රන් බඳුනකින් ලේ ගෙන ජලය සමග කලතා ඇයට පෙවුවේ ය. එයින් ඇයගේ දොළදුක සන් සිඳින. නිමිත්ත පාඨකයෝ එය අසා "**මේ ගැබ රජුට සතුරු වන්නේය මොහු විසින් රජු මරනු ලබන්නේය**" යැයි ප්‍රකාශ කළහ. දේවිය එය අසා "**මාගේ කුසෙන් බිහි වෙන තැනැත්තා මහ රජු මරන්නේය**" යැයි අසා ගැබ හෙළනු කැමතිව උයනට ගොස් කුස මර්දනය කරවූවා ය. ගැබ නො හැලෙන බැවින් නැවත නැවත එසේ කරවූවා ය. රජතුමා මැය නිතර නිතර කුමක් පිණිස උයනට යන්නී ද යැයි පරීක්ෂා කොට දේවියට කථා කොට "**සොඳුර තිගේ කුසෙහි සිටින්නේ පුත්‍රයෙකු ද, දුවක ද නොදත හැකිය. තමාට උපන් දරුවාට මෙසේ කළේ ය යැයි මහත් අගුණ රැසක් දඹදිව පුරා පැතිර යන්නේ ය. එබැවින් එසේ නොකරන්න**" යැයි අවවාද කොට ඇයට ආරක්ෂාව ලබා දුන්නේ ය. ඉන් පසු ඇය එම දරුවා උපන් පසු මරන්නට තැත් කළා ය. ආරක්ෂකයන් එය දැක කුමරු ඉවතට ගෙන ගියහ. පසු කළ දෙ තුන් හැවිරිදි වියේ වූ කුමරු ඇයට පෙන්වූහ. ඇය

ඔහු දැක පුත්‍ර ස්නේහය ඇති කර ගත්තා ය. එයින් ඔහු මැරීමට නොහැකි විය. බිම්බිසාර මහ රජතුමා ද අනුක්‍රමයෙන් ඔහුට යුවරජ තනතුර දුන්නේ ය.

## ☸ දේවදත්ත තෙරුන්ගේ පැවිද්ද

එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ අනුපිය නියම් ගම අනුපිය මල්ල රජුන්ගේ අඹ වනයෙහි වැඩසිටි සේක. එකල්හි බොහෝ ශාක්‍ය කුමාරයෝ භාග්‍යවතුන් වහන්සේ අනුව පැවිදි වෙති. එතෙක් පැවිදි නොවී සිටි "**භද්දිය, අනුරුද්ධ, ආනන්ද, භගු, කිම්බිල, දේවදත්ත**" යන ක්ෂත්‍රිය කුමාරවරු **උපාලි කපු මහත්මා** ද සමග අනුපිය අඹ වනයට ගොස් භාග්‍යවතුන් වහන්සේ හමුවෙහි පැවිදි වූහ. ඒ පිරිස අතරින් භද්දිය තෙරණුවෝ ත්‍රී විද්‍යා ඤාණ සහිතව රහත් වූයේ ය. අනුරුද්ධ තෙරණුවෝ දිබ්බචක්ඛු ඥානය ලබා භාග්‍යවතුන් වහන්සේගෙන් මහා පුරිසවිතක්ක සූත්‍රය අසා රහත් වූයේ ය. ආනන්ද තෙරණුවෝ ප්‍රතිසම්භිධා ප්‍රාප්තව සෝවාන් විය. භගු කිම්බිල තෙරුන් වහන්සේලා ද මඳ කලක් ගෙවා රහත් වූහ. දේවදත්ත තෙරුන් ලෞකික අභිඥා පමණක් ලැබීය. මේ පිරිස පැවිදි වූ පසු භාග්‍යවතුන් වහන්සේ ශ්‍රාවක සංඝයාත් සමග කොසඹෑ නුවරට වැඩි සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේට බොහෝ ලාභ සත්කාර ලැබුණාහ. රෑ දහවල නිරන්තරයෙන් ජනයා චීවර, ගිතෙල්, මී පැණි, හකුරු, සුවඳ මල් ආදිය රැගෙන විහාරයට ගොස් භාග්‍යවතුන් වහන්සේ කොතැන වැඩ සිටින සේක් ද? යැයි අසා සොයා ගෙන ගොස් පුද සත්කාර කරති.

එසේම සාරි පුත්‍ර, මහ මුගලන්, මහා කාශ්‍යප, භද්දිය, ආනන්ද, භගු, කිම්බිල ආදී තෙරුන් වහන්සේලා මහා පිරිස් ඇතිව වෙසෙති. මේ සාරිපුත්‍ර තෙරුන්ගේ පිරිසය, මේ මුගලන් තෙරුන්ගේ පිරිසය මේ මහා කාශ්‍යප තෙරුන්ගේ පිරිසය ආදී ලෙස මහා පිරිවරින් ප්‍රසිද්ධ ය. ජනයා ද අසවල් රහතන් වහන්සේ කොතැන වැඩ සිටින සේක් ද? යැයි අසති. කුටියෙන් කුටියට සොයා ගොස් පුද සත්කාර කරති. එහෙත් දේවදත්ත තෙරුන් කොතැන සිටින්නේ ද යැයි කිසිවෙකු නො අසයි. පූජා සත්කාර කිසිත් නොකරයි. එබැවින් මම ද පිරිසක් ඇති කරගෙන ප්‍රසිද්ධ විය යුතුය යැයි සිතුවේ ය. නැවත ද මෙසේ සිතුවේ ය. ලාභ

සත්කාර නැතිව පිරිසක් සාද ගැනීම නොකළ හැකිය. මම ප්‍රථමයෙන් ලාභ සත්කාර ලැබෙන මගක් ඇති කරගත යුතුය.

තව ද දෙව්දත් තෙරුන් මෙසේ සිතුවේ ය. "මම ද පැවිදි වූයේ **මේ පිරිසත් සමගම ය. මේ පිරිස ද ක්‍ෂත්‍රියයෝ ය. මම ද ක්‍ෂත්‍රිය වෙමි. එහෙත් ජනයා චීවර පරිෂ්කාරාදිය රැගෙන විත් අසවලා කොතැන ද යැයි අසමින් මොවුන්ට ම පූජා කරති. මා ගැන කිසිවෙක් නො අසති. කිසිත් පූජා නොකරති. එබැවින් මට ද චීවරාදිය පූජා කරන්නෙකු සොයා ගත යුතුය. ඒ සඳහා කවරෙකු පහදවා ගනිම් ද? බිම්බිසාර රජතුමා බුදුරජාණන් වහන්සේ දුටු දිනයෙහිදී ම එක් ලක්‍ෂ විසි දහසක් පිරිස සමග සෝවාන් වූහ. එබැවින් ඔහු පහදවා ගැනීමට නොහැකිය. පසේනදි කොසොල් රජතුමා ද පහදවා ගැනීමට නොහැකිය. මේ බිම්බිසාර රජුගේ පුත් අජාසත්ත කුමාරයා කිසිවකුගේ හොඳ නරක කිසිවක් නොදනී. එබැවින් ඒ කුමාරයා පහදවා ගැනීමට උත්සාහ කළයුතුය"** යැයි සිතා කොසඹෑ නුවරින් රජගහ නුවරට ගොස් රාජ සභාවෙහි පිරිවර ජනයා සමග හුන් අජාසත්ත කුමාරයා වෙත ගොස් ඍද්ධි බලයෙන් කුඩා දරුවෙකුගේ වේශයක් ගෙන, අත් - පා - ඉන - බෙල්ල ආදියෙහි සර්පයන් වෙලාගෙන සර්ප ඔටුන්නක් පළඳගෙන අජාසත්ත කුමාරයාගේ උකුලෙහි පහළ විය. එයින් බියට පත් අජාසත් කුමරු මේ කවරෙක් දැයි කෑ ගැසුවේ ය. රාජ කුමාරය බිය නොවෙව, මම දෙව්දත් තෙරුන්ය යැයි කියා තමන්ගේ ස්වභාවයෙන් පෙනී සිට කුමරු පහදවා ගත්තේ ය. එතැන් පටන් උදේ සවස රිය පන්සියයකින් උපස්ථානයට එන අජාසත්ත කුමාරයා අතිශයින් විශ්වාසවන්ත වූ බව දුන භික්ෂු සංඝයා පරිහරණය කිරීමට සිතක් උපන්නේ ය. ඒ ක්‍ෂණයෙහිම දේවදත්ත තෙරුන්ගේ අභිඥා ගුණ පිරිහී ගියේය.

ඉන් පසු තෙරණුවෝ බිම්බිසාර මහ රජතුමා ප්‍රධාන පිරිවර ජනයාට ධර්ම දේශනා කරමින් සිටි භාග්‍යවතුන් වහන්සේ වෙත ගොස් ඇඳිලි බැඳ වැඳ මෙසේ කීවේ ය.

**"ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස, භාග්‍යවතුන් වහන්සේ දැන් මහලු ය. දීර්ඝ කාලයක් ගත කොට දැන් අන්තිම වයසෙහි සිටින සේක. එබැවින් දැන් මන්දෝත්සාහී ව ඵල සමාපත්ති සුවයෙහි යෙදී වැඩ සිටින සේක්වා. මම භික්ෂු සංඝයා පරිහරණය කරමි. මට එය කළ හැකිය.**

**භාග්‍යවතුන් වහන්සේ මා හට භික්ෂු සංඝයා භාර දෙන සේක්වා, මම භික්ෂු සංඝයා පාලනය කරන්නෙමි"** යනුවෙන් ඉල්ලා සිටියේ ය.

එවිට භාග්‍යවතුන් වහන්සේ "**දේවදත්තය කම් නැත, භික්ෂු සංඝයා ඔබට බාර නොදෙමි. මම සාරිපුත්ත, මොග්ගල්ලාන දෙදෙනාට ද භික්ෂු සංඝයා බාර නොදෙන්නෙමි. කිමෙක් ද ලාමක වූ කෙළ බුදින**[1] **ඔබට භික්ෂු සංඝයා බාර නොදෙමි"** යැයි තෙරුන්ට කෙළතොලු වාදයෙන් ගැහී කොට ඒ ඉල්ලීම ප්‍රතික්ෂේප කොට වදාළ සේක. එයින් නොසතුටට පත්ව භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි වෛර බැඳ, "**භාග්‍යවතුන් වහන්සේ රජුන් සහිත පිරිසෙහි මට කෙළතොලු වාදයෙන් පහත් කොට කථා කරති. සැරියුත් මුගලන් තෙරුන් උසස් තැන තබති"** යැයි කිපී නොසතුටුව භාග්‍යවතුන් වහන්සේ වැඳ නික්ම ගියේය. මේ භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි දේවදත්ත තෙරුන්ගේ පළමු වෛර බැඳීමයි.

ඉන් පසු භාග්‍යවතුන් වහන්සේ සාරිපුත්‍ර මහ රහතන් වහන්සේට අණ කොට දේවදත්ත තෙරුන්ට ඤත්ති දුතිය කර්මයෙන් **ප්‍රකාශනීය කර්මය**[2] කර වූහ.

ඉන් පසු දේවදත්ත තෙරුන් අජාසත් කුමරු සමීපයට ගොස් මෙසේ කීවේ ය. "**කුමරුනි! පෙරකාලේ මිනිස්සු දීර්ඝායුෂ ඇත්තෝ වූහ. දැන් මිනිස්සු අල්පායුෂ්ක ය. එබැවින් ඔබ පියා මරා රජ වන්න. මම බුදුන් මරා බුදු වන්නෙමි"** යැයි මෙසේ කියා අජාසත් කුමරු පියා මැරවීමට පෙළඹවීය.

## ☸ අජාසත් කුමරුගේ පිතෘ ඝාතනය

අජාසත් කුමරු ද දෙව්දත් තෙරුන් මහානුභාව ඇත්තේය ඔහු නොදන්නා දෙයක් නම් නැත සත්‍යයක්ම කීවේය යැයි සිතා කලවයෙහි

---

[1] මිථ්‍යා ආජීවයෙන් ජීවත් වෙන

[2] පෙර දෙව්දත් තෙරුන්ගේ ප්‍රකෘති ස්වභාවය එකකි. දැන් අන්‍ය ස්වභාවයකි. දෙව්දත් තෙරුන් කයින් වචනයෙන් යමක් කරයි ද එය මේ සසුන් පිළිවෙතක් යැයි නොපිළිගත යුතුය. එයින් දෙව්දත් තෙරුන්ගේ විකෘතියක්ම බව දත යුතුය.

පිහියක් බැඳගෙන, උදෑසන බියට පත්ව කලබලයෙන් යුතුව, සැකයෙන් දළදඬු බැවින් යුතුව, ඇතුළු නුවරට පිවිසියේ ය. ඇමතියන් ඔහු අල්ලාගෙන පරීක්ෂා කොට කලවයෙහි බැඳි පිහිය දක, කරුණු විමසා මේ සඳහා කවුරුන් විසින් ඔබ මෙහෙයවන ලද්දේ ද යැයි ඇසූහ. දේවදත්ත තෙරුන් විසින් යැයි කීවේ ය. එකල්හි ඇමතිවරු මේ කුමාරයා ද මැරිය යුතු ය. දේවදත්ත තෙරුන් ද මැරිය යුතු ය. සියලු භික්ෂූන් ද මැරිය යුතු ය යැයි සම්මත කරගෙන, මහ රජතුමාගේ අවසරය පරිදි කරන්නෙමු යැයි මහ රජතුමාට එය දැන්වූහ.

රජතුමා කුමරු හා භික්ෂූන් මැරිය යුතුය යැයි කී ඇමතිවරු එම තනතුරුවලින් ඉවත් කරවා නො මරනු කැමති ඇමතියන් උසස් තනතුරුවල පිහිටුවා කුමරුගෙන් "**ඔබ මා මරනු කැමැත්තේ කුමක් පිණිස ද**" යැයි අසා රාජ්‍ය වෙනුවෙන් යැයි කී කල්හි කුමාරයාට රාජ්‍ය ලබා දුන්නේ ය. එයින් කුමරු මගේ මනෝ රථය සපිරුණේ ය යැයි සතුටු වූයේ ය.

ඉන් පසු අජාසත් කුමරු දේවදත්ත තෙරුන් වෙත ගොස් පියාගෙන් රාජ්‍යය ලැබුණු බව කීවේය. එවිට දේවදත්ත තෙරුන් කුමරු අමතා "**ඔබ මීයෙකු ඇතුළට දමා බෙරය වසා බඳිනා මිනිසෙකු මෙන් කටයුතු කරන බව සිතමි. කීප දවසකින් ඔබගේ පියා ඔබ කළ අවමානය ගැන සිතා ඔහු ම රජ වන්නේය**" යැයි කීවේය. එසේ නම් කුමක් කළ යුතු ද යැයි කුමරු ඇසුවේ ය. පියා ඝාතනය කරන්න යැයි තෙරුන් කීවේය. මා විසින් පියා කෙසේ ඝාතනය කරන්නෙම් ද යැයි කුමරු ඇසූ විට ආහාර නොදී මරවන්න යැයි තෙරුන් කීවේය.

ඉන් පසු කුමරු ගොස් පිය මහරජු දුම් ගෙයෙහි දමා මගේ මව හැර අන් කිසිවෙක් එහි නොයා යුතුය යැයි අණ කළේ ය. දේවිය රන් බඳුනකින් ආහාර උකුලෙහි තබා ගෙන යයි. රජතුමා එය අනුභව කොට යැපෙයි. කුමරු මගේ පියා කෙසේ යැපෙන්නේ ද යැයි අසා ඒ බව දැන මගේ මවට උකුලෙහි තියා ආහාර ගෙන යාමට නොදෙවු යැයි අණ කළේ ය. එතැන් පටන් දේවිය හිස් වැසුමෙහි සඟවා ආහාර ගෙන යයි. කුමරු එය ද අසා මවට හිස් වැස්ම පැළඳ පිවිසෙන්නට නොදෙවු යැයි අණ කළේ ය. එතැන් පටන් දේවිය රන් මිරිවැඩි සඟලෙහි සඟවා ආහාර ගෙනයයි. කුමරු එය ද අසා මවට රන් මිරිවැඩි පළඳ යෑමට

නොදෙවු යැයි අණ කෙළේය. දේවිය එතැන් පටන් සුවඳ පැනින් නා සිරුරෙහි චතුමධුර ගල්වා පොරවා ගෙන යයි. රජතුමා ඇයගේ සිරුර ලෙව කා යැපෙයි. කුමරු එය අසා මෙතැන් පටන් මගේ මවට එහි යෑමට නොදෙවු යැයි අණ කෙළේය. දේවිය දෙර ළඟ සිට **"හිමියනි මොහු ළදරු කළ මරවන්න නුඹුන්නෙහි ය. තමාගේ සතුරා තමා විසින් ම පෝෂණය කෙළෙහිය. දැන් මේ ඔබ තුමාගේ අවසන් දැක්මය. මම මින් පසු ඔබතුමා දක්නට නො ලබමි. මාගේ දෙසක් ඇතොත් සමා වනු මැනව"** යැයි කියා හඬා වැලපී නික්ම ගියාය.

එතැන් පටන් රජතුමාට අහරක් නැත. රජතුමා මාර්ග - ඵල සුවයෙන් සක්මන් කරමින් යැපෙයි. ධර්ම ප්‍රීතියෙන් කල් ගෙවන රජතුමාගේ ශරීරය අතිශයින් බබලයි.

අජාසත් කුමරු මගේ පියාගේ තතු කෙසේ ද යැයි අසා දේවයන් වහන්ස සක්මනින් යැපෙයි යැයි සේවකයන් කී විට දැන් ඔහුගේ සක්මන නවත්වමි යැයි සිතා **"මගේ පියාගේ පාද දැළි පිහියෙන් පලා ලුණු තෙලින් අතුල්ලා කිහිරි අඟුරුවලින් චිටි චිටි යන හඬ ඇතිවෙන සේ පුළුස්සව්"** යැයි අණ කොට කරණවෑමියන් යැවීය. රජතුමා ඔවුන් දැක **"ඒකාන්තයෙන් මගේ පුත්‍රයා කවුරුන් හෝ මගේ තොරතුරු දන්වන ලදුව මගේ රැවුල කැපීමට මොවුන් එවන්න ඇත"** යැයි සිතුවේ ය. ඔවුහු ගොස් රජතුමාට වැඳ සිටියහ. කුමක් පිණිස පැමිණියෙහි ද යැයි රජතුමා ඇසුවේ ය. ඔවුහු රජ හසුන දැන්වූහ. එවිට රජතුමා තොපගේ රජුගේ අණ කරව් යැයි කීවේය. ඔවුහු හිඳිනු මැනවි දේවයන් වහන්ස, යැයි කියා රජතුමා වැඳ අවසර ගෙන කියන්නේ **"දේවයන් වහන්ස, අපි රජ අණ කරමු. අපට නොකිපෙනු මැනව. මේ නම් නුඹ වහන්සේ වැනි ධාර්මික රජුන්ට නොවිය යුතු දෙයකි"** යැයි කියා වම් අතින් ගොප් මස ගෙන දකුණතින් දැලිපිහිය ගෙන පතුල් පළා ලුණු තෙල් ගා කිහිරි අඟුරු මත චිටි චිටි යන හඬ ඇසෙන තෙක් පිළිස්සූහ.

පූර්වයෙහි මේ රජතුමා චෛත්‍ය මළුවක පාවහන් සහිතව ගියේය. හිඳීම පිණිස පනවන ලද ඇතිරිල්ලක් දූවිලි සහිත පයින් පෑගීය. මේ එහි විපාකය වේ.

එසේ පිළිස්සීමෙන් රජතුමාට මහත් වේදනා ඇතිවිය. එතුමා **"භාග්‍යවතුන් වහන්සේ ආශ්චර්‍ය්‍යය, ධර්මය ආශ්චර්‍ය්‍යය"** යනුවෙන් සිහි කරමින් සිට චෛත්‍ය මළුවක දැමූ මල් දමක් වියළෙන්නා සේ වියළී මියගොස් චාතුම්මහාරාජික දෙව්ලොව වෛශ්‍රවණ දිව්‍ය රාජයාගේ පිරිවරෙහි **"ජනවසභ නම් යක්ෂ සේනාපතියෙකුව"** උපන්නේය.

## ☸ බුදුරජාණන් වහන්සේ මැරවීමේ උත්සාහය

දේවදත්ත තෙරුන් අජාසත් කුමරු වෙත ගොස් බුදුරජාණන් වහන්සේ ඝාතනය කරවන්නට පුරුෂයන් ඉල්ලීය. කුමරු ද පුරුෂයන්ට දේවදත්ත තෙරුන් කියන ලෙස කරව් යැයි අණ කළේ ය. තෙරුන් එයින් කෙනෙකු අමතා **"නුඹ මේ මගින් ගොස් ගිජ්ඣකූට පර්වතයෙහි සිටින ගෞතමයන් නසා මේ මගින් පැමිණෙව"** යැයි අණ කළේ ය. ඔහු එන මගට ඔහු නැසීමට අණ කොට දෙදෙනෙකුන් යැවූහ. ඒ ඒ දෙදෙනා එන මගට ඔවුන් නැසීමට සිව් දෙනෙකුන් යැවූහ. ඒ සිව්දෙනා එන මගට ඔවුන් නැසීමට අණ කොට අට දෙනෙකුන් යැවූහ. ඒ අට දෙනා එන මගට ඔවුන් නැසීමට අණ කොට සොළොස් දෙනෙකුන් යැවූහ.

එසේ අණ ලැබූ පුරුෂයා කඩු පලිස් දරා දුන්න හා ඊතල මිටිය බැඳගෙන භාග්‍යවතුන් වහන්සේ සමීපයට ගොස් භාග්‍යවතුන් වහන්සේට නුදුරෙහි සිට බියට පැමිණ තැති ගෙන කැලඹුණු සිත් ඇතිව ගල් ගැසී ගිය කය ඇතිව සිටියේ ය. එය දුටු භාග්‍යවතුන් වහන්සේ **"පුරුෂය මෙහි එව, බිය නොවෙව"** යැයි වදාළ සේක.

එවිට ඒ පුරුෂයා එම ආයුධ පසෙක දමා ගොස් භාග්‍යවතුන් වහන්සේ පා මුල හිස නමා වැඳ **"ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස, නුවණ මඳ බැවින් මුළා වී දුෂ්ට සිතැතිව භාග්‍යවතුන් වහන්සේට වධ කරන්නට මෙහි පැමිණියෙමි ද, ඒ වරද මා ඉක්මවා ගියෙමි. ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස මාගේ මතු සංවරය පිණිස මාගේ ඒ වරද වරද වශයෙන් පිළිගෙන මාහට සමාවන සේක්වා"** යැයි කීවේය.

එවිට භාග්‍යවතුන් වහන්සේ "**පුරුෂය නුඹ වරද වරද වශයෙන් දැක එයට පිළියම් කොට ආයති සංවරයෙහි පිහිටන්නේ ද, මෙය ආර්‍ය්‍යය විනයෙහි වැඩි දියුණුවක් ය**" යැයි වදාළ සේක.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ඔහුට ධර්‍ම දේශනා කොට සෝවාන් ඵලයට පමුණුවා, "**පුරුෂය නුඹ මේ මගින් නොගොස් මේ මගින් යව**" යැයි ඔහු වෙනත් මගකින් යැවූ සේක.

ඔහු මැරීම පිණිස මග රැක සිටි දෙදෙනා ද එම පුරුෂයා නොපැමිණෙන බැවින් ඉදිරියට යන්නාහු රුකක් මුල වැඩසිටි භාග්‍යවතුන් වහන්සේ දැක එහි ගොස් වැඳ බණ අසා සෝවාන් වූහ. ඔවුන්ට භාග්‍යවතුන් වහන්සේ "**මේ මගින් නොගොස් මේ මගින් යවු**" යැයි වෙනත් මගකින් යැවූ සේක.

ඔවුහු දෙදෙනා මැරීම පිණිස මග රැක සිටි සිව්දෙනා ද එම පුරුෂයන් දෙදෙනා නොපැමිණෙන බැවින් ඉදිරියට යන්නාහු රුකක් මුල වැඩසිටි භාග්‍යවතුන් වහන්සේ දැක එහි ගොස් වැඳ බණ අසා සෝවාන් වූහ. ඔවුන්ට ද භාග්‍යවතුන් වහන්සේ "**මේ මගින් නොගොස් මේ මගින් යවු**" යැයි වෙනත් මගකින් යැවූ සේක.

ඔවුහු සිව්දෙනා මැරීම පිණිස මග රැක සිටි අට දෙනා ද එම පුරුෂයන් සිව්දෙනා නොපැමිණෙන බැවින් ඉදිරියට යන්නාහු රුකක් මුල වැඩසිටි භාග්‍යවතුන් වහන්සේ දැක එහි ගොස් වැඳ බණ අසා සෝවාන් වූහ. ඔවුන්ට ද භාග්‍යවතුන් වහන්සේ "**මේ මගින් නොගොස් මේ මගින් යවු**" යැයි වෙනත් මගකින් යැවූ සේක.

ඔවුහු අට දෙනා මැරීම පිණිස මග රැක සිටි සොළොස් දෙනා ද එම පුරුෂයන් අට දෙනා නොපැමිණෙන බැවින් ඉදිරියට යන්නාහු රුකක් මුල වැඩසිටි භාග්‍යවතුන් වහන්සේ දැක එහි ගොස් වැඳ බණ අසා සෝවාන් වූහ. ඔවුන්ට ද භාග්‍යවතුන් වහන්සේ "**මේ මගින් නොගොස් මේ මගින් යවු**" යැයි වෙනත් මගකින් යැවූ සේක.

මුලින් ම භාග්‍යවතුන් වහන්සේ නැසීමට ගිය පුරුෂයා දේවදත්ත තෙරුන් වෙත ගොස් ස්වාමීනි, ඒ භාග්‍යවතුන් වහන්සේ

දිවියෙන් තොර කරන්නට මට නොහැක්කෙමි. ඒ භාග්‍යවතුන් වහන්සේ මහත් සෘද්ධි ඇති සේක. මහත් ආනුභාව ඇති සේක යැයි කීවේය.

එවිට දේවදත්ත තෙරුන් කම් නැත නුඹ සිටුව. මම ම ඒ ගෞතමයන් දිවියෙන් තොර කරන්නෙමි යැයි කියා ගිජ්ඣකූට පර්වතයට නැඟ එහි පාමුල සෙවනෙහි සක්මන් කරන්නා වූ භාග්‍යවතුන් වහන්සේ ගේ හිස මතට මහත් ගලක් පෙරළීය. පොළොවෙන් ගල් දෙකක් මතුව ඒ පෙරලූ ගල පිළිගත්තේ ය. ඒ පෙරළුු ගලෙහි පතුරක් ගැලවී ඇවිත් භාග්‍යවතුන් වහන්සේගේ පාදයෙහි වැදී ලේ නික්මිණ.

එවිට භාග්‍යවතුන් වහන්සේ උඩ බලා "**හිස් පුරුෂය නුඹ නපුරු සිතින් වධක චේතනාවෙන් යුක්තව තථාගත සිරුරෙන් ලේ සෙලවීය. එයින් නුඹ බොහෝ පව් රැස් කරන ලද්දෙහි ය**" යැයි වදාළ සේක.

එසේ ගල් පතුර වැදීමෙන් භාග්‍යවතුන් වහන්සේට මහත් වේදනාවක් ඇතිවිය. ජීවක වෛද්‍යාචාර්ය තුමා පැමිණ තථාගතයන් වහන්සේගේ පාදය පලා නරක් වූ ලේ මුදා හැර සෝදා බෙහෙත් ගල්වා එය සුව කළේ ය.

ඉක්බිති භික්ෂූන් වහන්සේලා ඒ කරුණ දැන "**අපි භාග්‍යවතුන් වහන්සේට ආරක්ෂාව සපයන්නෙමු**" යැයි ඒ හාත්පස රැස් වූහ. එය දැන භාග්‍යවතුන් වහන්සේ "**අට්ඨානමෙතං, භික්ඛවෙ, අනවකාසො, යං පරූපක්කමෙන තථාගතං ජීවිතා වොරොපෙය්‍ය. අනුපක්කමෙන, භික්ඛවෙ, තථාගතා පරිනිබ්බායන්ති**" යනුවෙන් "**මහණෙනි පරෝපක්‍රමයෙන් තථාගතයන් වහන්සේ දිවියෙන් තොර කරන්නේ ය යන මෙය සිදු නොවන්නකි. එය වන්නට කරුණක් නැත. මහණෙනි තථාගතයන් වහන්සේලාගේ පරිනිර්වාණය පරෝපක්‍රමයකින් තොරවම සිදු වෙති**" යැයි වදරා නැවත ද "**මහණෙනි නුඹලා තම තමන්ගේ සෙනසුන්වලට යවු. තථාගතයන් වහන්සේලා අන්‍යයන් විසින් නොරැක්ක යුත්තෝ ය**" යැයි වදාළ සේක.

ඉන් පසු තථාගතයන් වහන්සේ මහත් භික්ෂු සංඝයා පිරිවරා ගෙන මහත් වූ බුද්ධ ලීලාවෙන් රජගහ නගරයට වැඩි සේක.

ඉක්බිති දේවදත්ත තෙරුන් භාග්‍යවතුන් වහන්සේ දැක මෙසේ සිතුවේ ය. ශ්‍රමණභවත් ගෞතමයන් වහන්සේගේ රූප සෝභාවෙන් අග තැන්පත් සිරුර දැක කිසි කෙනෙකුන්ට උන් වහන්සේ වෙත ලංවිය නොහැකි වෙයි. රජුගේ නාළාගිරි ඇතා චණ්ඩ ය. පරුෂය. මනුෂ්‍ය ඝාතකයෙකි. ඒ ඇතා බුද්ධ ධම්ම සංඝ ගුණ නොදනී. එබැවින් ඒ ඇතා ගෞතමයන් වහන්සේ ව ජීවිතක්‍ෂයට පමුණුවන්නේය. මෙසේ සිතා රජ මාලිගයට ගොස් අජාසත් රජතුමාට එය කීවේය. රජතුමා යහපති යැයි පිළිගෙන ඇත්ගොව්වා කැඳවා මිත්‍රය, හෙට නාළාගිරි ඇතා මත් කොට උදෑසනම ශ්‍රමණ භවත් ගෞතමයන් වහන්සේ පිළිපන් මාර්ගයට පිටත් කොට හරිව් යැයි අණ කෙළේය. ඇත් ගොව්වා යහපත යැයි එය පිළිගත්තේ ය. එවිට දේවදත්ත තෙරුන් අන් දිනවල ඇතා කොපමණ සුරා පානය කරන්නේ ද යැයි අසා කළ අටක් යැයි කී කල්හි එසේ නම් හෙට ඇතාට සුරා කළ සොළොසක් පොවා ගෞතමයන් වහන්සේ ඉදිරියට මුදා හරව යැයි කීවේය.

අජාසත් රජතුමා එදින නගරයෙහි බෙර හසුරුවා හෙට නාළාගිරි ඇතා මත් කොට නගරයට පමුණුවන්නේ ය. නුවර වාසීන් උදෑසන කළමනා කටයුතු නිමවත්වා. අතුරු වීථියට නොපැමිණෙත්වා යැයි කීවේය. දේවදත්ත තෙරුන් රජ මාලිගයෙන් බැස ඇත්හලට ගොස් ඇත් ගොව්වන් අමතා **"අපි උසස් තනතුරු පහත් කරන්නට ද, පහත් තනතුරු උසස් කරන්නට ද දක්‍ෂයෝ වෙමු. ඉදින් නුඹලා කීර්තිමත් වූයේ හෙට උදෑසනම ඇතුට පැසුණු රා කළ සොළොසක් පොවා, උල් තෝමරයෙන් (හෙණ්ඩුවෙන්) ඇන ඇතු කොප කරවා, ඇත්හල බිඳවා, ඇතු මුදා හැර ශ්‍රමණ ගෞතමයන් වහන්සේ ජීවිතක්‍ෂයට පමුණුවව්"** යැයි කීවේය.

මේ පුවත මුළු නුවර පුරා ප්‍රසිද්ධ විය. රත්නත්‍රය මාමක උපාසකයෝ ශාස්තෲන් වහන්සේ වෙත ගොස් වැඳ මෙසේ කීහ. **"ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස, දේවදත්ත තෙරුන් රජතුමා සමග එකතුව හෙට භාග්‍යවතුන් වහන්සේ පිළිපන් වීථියට නාළාගිරි ඇතා මත් කොට පමුණුවන්නේය. හෙට පිඬු පිණිස නොවැඩ මෙහි ම වැඩ හිඳින සේක්වා. අපි විහාරයෙහිදී ම බුද්ධ ප්‍රමුඛ භික්‍ෂු සංඝයාට දන් දෙන්නෙමු"** යැයි කීහ. එකල්හි ශාස්තෲන් වහන්සේ හෙට පිඬු පිණිස නුවරට නොවඩින්නෙමි යැයි නොකියා **"හෙට මම නාළාගිරි ඇතා**

**දමනය කර ප්‍රාතිහාර්‍යය දක්වා තීර්ථකයන් මැඩ රජගහ පුර පිඬු පිණිස නොහැසිර භික්ෂු සංඝයා පිරිවරා නගරයෙන් නික්ම වේළුවනාරාමයට යන්නෙමි. නුවර වාසීහු දනය රැගෙන වේළුවනාරාමයට පැමිණෙන්නාහ. හෙට විහාරයෙහි ම දන් වැළඳීම වන්නේය**" යැයි ඉවසා වදාළ සේක.

ශාස්තෲන් වහන්සේ එදින රාත්‍රී ප්‍රථම යාමයෙහි භික්ෂූන් වහන්සේලාට හා භික්ෂුණීන් වහන්සේලාට දහම් දෙසා, මධ්‍යම යාමයෙහි දෙවියන්ගේ ප්‍රශ්න විසඳ දහම් දෙසා, පශ්චිම යාමයේ ප්‍රථම කොටසෙහි සිංහ සෙය්‍යාවෙන් සැතපී, දෙවන කොටසෙහි මහා කරුණාවෙන් ධර්මාවබෝධයට සුදුසු වෛනෙය්‍යය ජනයන් බලා වදාරණ සේක්, නාළාගිරි දමනයෙහි දී සුවාසූදහසක් සත්වයන් මඟ ඵල නිවන්සුව ලබන බව දැක ආනන්ද තෙරුන් අමතා "**ආනන්දය, රජගහ නුවර හාත්පස අටළොස් විහාරයන්හි වැඩ සිටින සියලු භික්ෂූන් වහන්සේලාට, අද මා සමග පිඬු පිණිස වැඩීමට දැනුම් දෙන්න**" යැයි වදාළ සේක. ආනන්ද තෙරුන් එසේ කළේ ය. සියලු භික්ෂූන් වහන්සේලා වේළුවනයට රැස් වූහ. ශාස්තෲන් වහන්සේ සියලු භික්ෂු සමූහයා පිරිවරා ප්‍රාතිහාර්‍යයෙන් යුක්තව රජගහ නුවරට වඩිනු පිණිස පිළිපන් සේක. ඇත් ගොව්වෝ කැමති ලෙස තම කාර්‍යය කළහ. එය බැලීමට මහත් සේනාවක් රැස් වූහ. සැදැහැති බුද්ධිමත් බෞද්ධයෝ අද වනාහී බුද්ධ නම් මහ හස්ති රාජයෙකු තිරිසන් ගත ඇතෙකු සමග යුද්ධයක් වන්නේය. උපමා රහිත බුද්ධ ලීලාවෙන් නාළාගිරි දමනය බලන්නෙමු යැයි ප්‍රාසාද සැදවීය. ගෙවල් පියසි ආදියට නැගී සිටියහ. සැදැහැ නැති මිසදිටුවෝ මේ නාළාගිරි චණ්ඩ ය පරුෂය මනුෂ්‍ය ඝාතකයෙකි. බුදුවරුන්ගේ ගුණ නොදන්නෙකි. අද ඇතා විසින් ශ්‍රමණ ගෞතමයන්ගේ රන්වන් සිරුර සුනු විසුනු කොට ජීවිතක්ෂයට පමුණුවන්නේය. අද අපගේ පසමිතුරා පිටු දකින්නෙමු යැයි ගස් ගෙවල් ආදියට නැගී සිටියහ.

එදින පෙරවරුවෙහි භාග්‍යවතුන් වහන්සේ සතළිස් දහසක් පමණ භික්ෂු සංඝයා පිරිවරා ගෙන ප්‍රාතිහාර්‍යයෙන් යුක්තව පිඬු පිණිස රජගහ නුවර වීථියට පිළිපන් සේක.

ඇත් ගොව්වෝ ද ඒ බව දැන ඇතාට රා කළ දහසයක් පොවා කුලප්පු කොට වීථියට මුදා හැරියේ ය. ඇතා දුරින් වඩින්නා වූ භාග්‍යවතුන් වහන්සේ දැක සොඬය හා වලිගය ඔසවා ගෙන කන් විදහා ගෙන ගෙවල් බිඳිමින් භාග්‍යවතුන් වහන්සේ වෙත දිවීය.

භික්ෂූන් වහන්සේලා එලෙස දිව එන ඇතා දැක භාග්‍යවතුන් වහන්සේ අමතා ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස, මිනිසුන් මරණ නපුරු වූ නාළාගිරි ඇතා මේ වීථියට පැමිණියේ ය. භාග්‍යවතුන් වහන්ස නැවත හැරී වඩින සේක්වා, සුගතයන් වහන්ස නැවත හැරී වඩින සේක්වා යැයි කීහ. එවිට භාග්‍යවතුන් වහන්සේ "**මහණෙනි එව්, බිය නොවව්, පරෝපක්‍රමයෙන් තථාගතයන් වහන්සේ දිවියෙන් තොර කරන්නේ ය යන මෙය සිදු නොවන්නකි. එය වන්නට කරුණක් නැත. මහණෙනි පරෝපක්‍රමයකින් තොරවම තථාගතයන් වහන්සේලාගේ පරිනිර්වාණය සිදු වෙති**" යැයි වදාළ සේක. එවිට සාරිපුත්ත මහරහතන් වහන්සේ "ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස, භාග්‍යවතුන් වහන්සේ වැඩ සිටින සේක්වා මම ඇතා දමනය කරමි" යැයි කීහ. එවිට භාග්‍යවතුන් වහන්සේ සාරිපුත්‍රය බුද්ධ බලය අනිකකි. ශ්‍රාවක බලය තව එකකි. නුඹ සිටින්න මම ඇතා දමනය කරමි යැයි වදාළ සේක. අනෙකුත් අසූ මහා ශ්‍රාවකයන් වහන්සේලා ද ඉදිරිපත් වූහ. ශාස්තෲන් වහන්සේ ඒ සියලු දෙනා වහන්සේලාම වැළැක්වූ සේක.

ඒ ඇතා දැක බියපත් වූවෝ සඳළු ප්‍රාසාද පියසි ගස් ආදියට නැගී ගත්හ. බුදු සසුනෙහි නො පහන් වූවෝ "**අද විශිෂ්ට රූප සෝභා ඇති මහා ශ්‍රමණයා ඇතු විසින් නසනු ලැබේ ය**" යැයි කීහ. බුදු සසුනෙහි පහන් වූ ශ්‍රද්ධා සම්පන්න බුද්ධිමත්හු "**පින්වත්නි, කළකට පසු අද නාගයන් (ශ්‍රේෂ්ඨයන්) දෙදෙනෙකු ගේ සටනක් දැකිය හැකි වන්නේය**" යැයි කීහ. ඇතා ලංවත්ම ආනන්ද තෙරුන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේට අනතුරක් වීම මට බලා සිටිය නොහැකිය යැයි සිතා භාග්‍යවතුන් වහන්සේ ඉදිරියට පැමිණියේ ය. භාග්‍යවතුන් වහන්සේ තම ඍද්ධියානුභාවයෙන් පොළොව කරකවා ආනන්ද තෙරුන් පසුපසට කළ සේක.

එක් ස්ත්‍රියක් මරණ බියෙන් යුතුව තම ඇකයෙහි සිටි කුඩා දරුවා වීථියෙහි දමා පලා ගියා ය. ඇතු ඇය ලුහුබැඳ ගොස් ඒ දරුවා

වෙතට ආවේය. දරුවා මහ හඬින් හැඬීය. එකල්හි භාග්‍යවතුන් වහන්සේ දස දහසක් ලෝක ධාතුන්ට පතුරවන මෙත් සිත එම ඇතාට පතුරවා සුමිහිරි බ්‍රහ්ම ස්වරය විහිදුවා ඇතු අමතා **"නාලාගිරිය, නුඹට සොළොස් කළයක් පිරුණු රා පොවා මත්කරවූයේ අනෙකකු ගැන්වීමට නොවේ, නිකරුණේ පාද වෙහෙසීමට පත් නොකොට මෙහි පැමිණෙව"** යැයි වදාළ සේක. ශාස්තෘන් වහන්සේගේ ඒ මධුර නාදය ඇසෙත් ම ඇතා ගේ වෛරී මත සිඳී ගොස් නෙත් කුඩා කොට භාග්‍යවතුන් වහන්සේගේ රූප සෝභාවය බලා සංවේගයට පැමිණ සොඬය පහත දමා කන් සොලවමින් ශාන්ත ඉරියව්වෙන් ගොස් භාග්‍යවතුන් වහන්සේ ගේ පාද මූලයෙහි වැටුණේ ය. එකල්හි භාග්‍යවතුන් වහන්සේ ඇතු අමතා **"නාලාගිරිය නුඹ තිරිසන් ගත ඇතෙකි. මම බුද්ධ නැමති ඇතා ය. නුඹ මෙතැන් පටන් චණ්ඩ නොවෙව. පරුෂ නොවෙව. මනුෂ්‍ය ඝාතකයෙකු නොවෙව. මෛත්‍රී සිත් ඇත්තෙකු වෙව"** යැයි වදරා දකුණු අතින් ඇතාගේ කුම්බස්ථලය පිරිමදිමින් ගාථාවලින් මෙසේ වදාළ සේක.

**"මා කුඤ්ජර නාගමාසදෙ - දුක්ඛඤ්හි කුඤ්ජර නාගමාසදෙ,**
**න හි නාගහතස්ස කුඤ්ජර - සුගති හොති ඉතො පරං යතො.**

"හස්තිය, බුද්ධ නාගයන් වහන්සේට පීඩා කරන්නකුට මෙයින් මතු සුගතියක් නොවන්නේ ද, එහෙයින් හිංසා කිරීමේ සිතින් බුද්ධ නාගයන් වහන්සේ වෙත ළං නොවෙව. බුද්ධ නාගයන් වහන්සේට හිංසා කිරීමේ සිතින් ළං වීම ඒකාන්තයෙන් දුකට හේතු වේ".

**"මා ච මදෙ මා ච පමාදෙ - න හි පමත්තා සුගතිං වජන්ති තෙ,**
**ත්වඤ්ඤෙව තථා කරිස්සසි - යෙන ත්වං සුගතිං ගමිස්සසීති"**

"හස්තිය මත් නොවෙව. පමා නොවෙව. පමා වූවෝ සුගතියට නොයති. එබැවින් යමකින් නුඹ සුගතියට යන්නෙහි ද නුඹ ම එලෙසට දැනගෙන කරව" යැයි වදාළ සේක.

ඒ උපදේශයන් අසා ඇතාගේ මුළු සිරුරම සතුටින් පිනා ගොස් එයින් නිරතුරුව පැතිරුණේ විය. ඒ ඇතු එදා තිරිසනෙකු නොවුනේ නම් එදින සෝවාන් ඵලයෙහි පිහිටන්නේ ය. රැස්ව සිටි ජනයා ඒ

ප්‍රාතිහාර්‍යය දැක සාධුකාර පැවැත්වූහ. මහ හඬින් නාද කළහ. අත්පොළසන් ගැසූහ. හටගත් සොම්නසින් නොයෙක් රන් රිදී ආදී නොයෙක් ආභරණ ඇතුට විසි කළහ. ඒවා ඇතුගේ ඇඟෙහි වැදී ගියහ. එතැන් පටන් ඒ ඇතාගේ නාළාගිරි යන නාමය වෙනස් ව "**ධනපාල ඇතා**" යැයි නමක් විය. ඉන් පසු භාග්‍යවතුන් වහන්සේ එම ඇතා පාලි භාෂා වචනයෙන් තෙරුවන් සරණ ගන්වා පඤ්ච සීලයෙහි පිහිටුවා ලූ සේක. එයින් ඇතා දමනය වී තෙරුවන් සරණ පිහිටා අතිශයින් සංවර විය.

ඉන් පසු ඇතා සොඬින් භාග්‍යවතුන් වහන්සේගේ පා දූවිලි ගෙන හිස මුදුනෙහි වගුරුවාගෙන භාග්‍යවතුන් වහන්සේ නොපෙනී යන තාක් පසුපසට ගොස් ආපසු හැරී ගියේය. එතැන් පටන් ඇතා කිසි කලෙකවත් ස්වල්ප මාත්‍ර වූ ද කලබලයක් හෝ හානියක් නොකළ විරූය.

ශාස්තෲන් වහන්සේ ඇතු හික්මවා පිරිපුන් මනෝ රථය ඇතිව "**යමෙකු විසින් යම් ධනයක් ඇතු වෙත විසි කරන ලද්දේ ද, ඒ ධනය ඔවුන්ට ම වේවා**" යැයි අධිෂ්ඨාන කොට "**අද මා විසින් මහත් ප්‍රාතිහාර්‍යයක් කරන ලද්දේ වෙමි. එබැවින් මේ නගරයෙහි පිඬු පිණිස හැසිරීම නුසුදුසු ය**" යැයි සිතා භික්‍ෂු සංඝයා පිරිවරා ආපසු විහාරයට වැඩ නුවර වාසීන් පිළිගැන්වූ ප්‍රණීත දනය වළඳ පැමිණ සිටි රජගහ නුවර වැසි අටළොස් කෝටියක් ජනයාට දන කථා ආදී පිළිවෙළ කථාව වදරා ඔවුහු එකඟ වූ සිතින් යුක්ත වූ කල්හි චතුරාර්‍ය සත්‍යයන් කුළු ගන්වා ධර්ම දේශනා කිරීමෙන් සුවාසූදහසක් දෙනා මග - ඵල නිවන්සුව ලැබූහ. එය "**ධනපාල හස්ති සමාගමය**" නම් වේ.

ඉන් පසු නුවර වැසියෝ කිපී "**ධර්මිෂ්ඨ බිම්බිසාර මහ රජතුමා මරවණ ලද්දේ ද, මේ දේවදත්ත තෙරුන්ම ය. භාග්‍යවතුන් වහන්සේ නැසීමට දුනුවායන් යොදවන ලද්දේ ද, මේ දේවදත්ත තෙරුන්ම ය. භාග්‍යවතුන් වහන්සේ නැසීමට ගල් පෙරලන ලද්දේ ද, මේ දේවදත්ත තෙරුන්ම ය. එලෙසට දූන් භාග්‍යවතුන් වහන්සේ නැසීමට නාළාගිරි ඇතා මෙහෙයවන ලද්දේ ද මේ දේවදත්ත තෙරුන්ම ය. එහෙත් අජාසත් රජු මෙබඳු පව්ටෙකු ගෙනම හැසිරෙයි**" යනුවෙන් අරගල කරන්නට වූහ. එකල්හි රජතුමා නුවර වාසීන් තමන්ට එරෙහිව අරගල

කරන බව අසා දැසිදස් කම්කරුවන් ලවා දේවදත්ත තෙරුන්ට බත් සැලි යවා රජ වාසලෙහි ම සිටියේ ය. රටවැසියෝ එතැන් පටන් දේවදත්ත තෙරුන්ට බත් සැන්දක් තරම්වත් නොදුන්හ. එතැන් පටන් දේවදත්ත තෙරුන් ලාභ සත්කාරවලින් පිරිහීමට පත්ව කුහකකමින් දිවි පැවැත්මට සිතා භාග්‍යවතුන් වහන්සේ වෙත පැමිණ වැඳ මේ වස්තු පස අනුදැන වදරණ සේක්වා යි ඉල්ලීය. එනම් :-

- ❖ දිවි ඇති තාක් භික්ෂූන් වහන්සේලා ආරණ්‍යයෙහි ම විසිය යුතුය
- ❖ දිවි ඇති තාක් භික්ෂූන් වහන්සේලා පිණ්ඩපාතික විය යුතුය.
- ❖ දිවි ඇති තාක් භික්ෂූන් වහන්සේලා පංශුකූලික විය යුතුය.
- ❖ දිවි ඇති තාක් භික්ෂූන් වහන්සේලා රුක් මුල් සෙනසුන්හි විසිය යුතුය.
- ❖ දිවි ඇති තාක් භික්ෂූන් වහන්සේලා මස් මාංශ වැළඳීමෙන් වැළකිය යුතුය.

භාග්‍යවතුන් වහන්සේ ඒවා ප්‍රතික්ෂේප කළ සේක. එකල්හි දේවදත්ත තෙරුන් භික්ෂු සංඝයා මැදට ගොස් **"බුදුන්ගේ හැටි කොහොම ද, මම භික්ෂූන්ට ගැලපෙන මේ ඉල්ලීම් පස ඉල්ලූ කල්හි ඒවා ප්‍රතික්ෂේප කළේ ය. අප දෙදෙනාගෙන් භික්ෂු සංඝයාට වඩාත් හිත කවුද? එබැවින් දුකින් නිදහස් වීමට කැමැත්තෝ මා සමග පැමිණෙත්වා"** යැයි කියා අලුත පැවිදි වූ භික්ෂූන් පන්සියයක් දෙනා රැගෙන ගොස් රළු පැවතුම්වලට කැමති ජනයා පහදවාගෙන ගෙයක් පාසා ගොස් ආහාර ගනිමින් සංඝ භේදයට උත්සාහ කළේ ය. භාග්‍යවතුන් වහන්සේ සංඝ භේදයෙහි ආදීනව දක්වා එය නොකරන ලෙස අවවාද කළ නමුත් නොපිළිගත්තේය.

පසුව පොහොය දිනයක සිය පිරිස සමග පසෙක හිඳ ඇවැත්නි මේ පඤ්ච වස්තුන්ට යමෙක් කැමැත්තෙහි නම් ඔහු මෙයින් කුසපත් ගතයුතුය යැයි කියා කිසිවක් නොදත්තා වූ නවක පැවිද්දන් වූ වජ්ජිපුත්තක භික්ෂූන් පන්සියයක් වෙන්කරගෙන ගයා ශීර්ෂයට ගියේය. භාග්‍යවතුන් වහන්සේ සැරියුත් මුගලන් රහතන් වහන්සේලා එහි යැවූ

සේක. එහි දී සැරියුත් මහ රහතන් වහන්සේ කළ ධර්ම දේශනය අසා ඒ සියලු දෙනා වහන්සේ ම රහත්ව අහසින් වැඩියහ. ඒ බව අසා දේවදත්ත තෙරුන්ගේ මුවින් උණු ලේ වමනය විය. බලවත් ලෙස ඔත්පළ විය. මෙසේ නව මසක් රෝගාතුර ව සිට භාග්‍යවතුන් වහන්සේ දකිනු කැමති ව තම ශ්‍රාවකයන්ට ඒ බව කීවේය. ඔවුහු එයට අකැමැති වූහ. එවිට දේවදත්ත තෙරුන් **"අනේ තෙපි මා නොනසවු. මා භාග්‍යවතුන් වහන්සේට අපරාධ කළ නමුත් ඒ භාග්‍යවතුන් වහන්සේ මා හට වෙනසක් නොකළ සේක. තමන් වහන්සේ නසන්නට ගිය මට ද, නාළාගිරි ඇතුට ද, අංගුලිමාලට ද, සිය පුත්‍ර වූ රාහුල පුතුට මෙන් සම සිත් ඇති සේක. එබැවින් මා ඒ භාග්‍යවතුන් වහන්සේ වෙත රැගෙන යවු"** යැයි කිහිප වරක් ම කී පසු ශ්‍රාවකයෝ තෙරුන් ඇඳකින් රැගෙන ගියහ. භික්ෂූන් වහන්සේලා ඒ බව භාග්‍යවතුන් වහන්සේට දැනුම් දුන්හ. එවිට භාග්‍යවතුන් වහන්සේ මහණෙනි එය සිදු නොවන්නකි. මේ භවයෙහි දී ඔහුට මා දැකිය නොහැකිය. **"යම් භික්ෂුවක් ඉහත කී පඤ්ච වස්තූන් ඉල්ලා සිටියේ නම් ඔහු එතැන් පටන් තථාගතයන් වහන්සේ දැකීමට නොලබයි. මෙය ධර්ම නියාමයකි"** යැයි වදාළ සේක.

දේවදත්ත තෙරුන් ඔසවා ගෙන පැමිණි භික්ෂූන් වහන්සේලා ඇඳ දෙව්රම් පොකුණු තෙර තබා නෑමට දියට බැස්සාහ. තෙරුන් ද ඇඳෙන් නැගිට පා බිම තැබීය. එකෙනෙහිම පොළොව විවර වී තෙරුන් ගිනි දැලින් වෙළීගත්තේය. ඒ මොහොතේ බුදුරජාණන් වහන්සේ ගේ ගුණ කියමින් සරණ ගොස් අවීචි මහ නරකයට ඇදී ගියේය. මෙයින් කල්ප ලක්‍ෂයකින් මතු **"අට්ඨිස්සර"** නමින් පසේ බුද්ධත්වයට පැමිණ නිවන් සුව ලබන්නේ ය.

මෙසේ වූ පාප මිත්‍ර ඇසුර හේතුවෙන් අජාසත් රජතුමා නූපන් කල්හි ම තම පියාට සතුරු වූ බැවින් නිමිත්ත පාඨකයන් කුමරුට **අජාසත්ත** යන නාමය තබන ලදි.

## ☸ අජාසත් රජු දිට්ඨධම්ම කම්ම විපාක විඳීම

මෙලෙස පාප මිත්‍ර ඇසුර හේතුවෙන් අජාසත් රජතුමා දුක් පමුණුවා පිය මහ රජතුමා ඝාතනය කළේ ය. එදවසම අජාසත් රජතුමාට ද පුත්‍රයෙකු උපන්නේය. රාජ සභාවෙහි සිටි රජතුමාට පුත්‍රයා උපන් බව ද, පිය මහ රජු මියගිය බව ද දැන්වීමට එක විටම හසුන් දෙකක් ගෙන ආහ. ඇමතියෝ පළමුව පුතු උපන් බව දන්වමු යැයි එම ලිපිය රජු අත තැබීය. රජුට ඒ මොහොතේ පුත්‍ර ස්නේහය ඉපද එය ඇට ඇටමිදුලු දක්වා පැතිර ගියේය. ඒ ක්ෂණයෙහිම පියාගේ ගුණ දැනගෙන **"මා උපන් වෙලෙහිත් මගේ පියාට ද මෙබඳු දරු සෙනෙහසක් ඇති වන්නට ඇත"** යැයි සිතා **"කොල්ලනි යවු මගේ පියා වහා නිදහස් කරව්"** යැයි කීවේය. එවිට ඇමතිවරු **"දේවයන් වහන්ස, කුමක් නිදහස් කරන්න ද"** යැයි කියා අනෙක් හසුන ඉදිරිපත් කළේ ය. ඒ පුවත අසා හඬමින් මව වෙත ගොස් **"මෑණියනි, මගේ පියාට මා කෙරෙහි සෙනෙහසක් වී ද"** යැයි ඇසුවේ ය. දේවිය මෙසේ කීවා ය. **"මෝඩ පුත්‍රය! කුමක් කියහි ද? නුඹ ළදරු කාලයෙහි නුඹගේ ඇඟිල්ලෙහි ගෙඩියක් නැගින. ඒ වේදනාවෙන් නුඹ හඬන විට එය දරා ගැනීමට නොහැකිව අධිකරණ ශාලාවෙහි සිටි නුඹගේ පියා වෙත මම නුඹ රැගෙන ගියෙමි. පියා නුඹගේ ඇඟිල්ල මුවෙහි තබා ඉරුවේ ය. ගෙඩිය මුව තුළ ම පුපුරා ගියේය පියා නුඹට ඇති සෙනෙහස නිසා ඒ ලේ මුසු සැරව එළියට නොදමා ගිල්ලේ ය. නුඹගේ පියාගේ සෙනෙහස එබඳු ය"** යැයි කීවා ය. දේවිය හඬා වැලපී රජතුමාගේ දේහය ගෞරව සම්ප්‍රයුක්තව ආදහනය කරවූවා ය.

**"වෙදෙහිපුත්තො"** යනු මහ කොසොල් රජතුමාගේ දූවගේ පුත්‍රයා ය. එනම් පසේනදි කෝසල මහ රජතුමාගේ නැගණියගේ පුත්‍රයා ය. බිම්බිසාර රජතුමා විවාහ වී සිටියේ පසේනදි කොසල රජතුමාගේ නැගණිය සමගය. පසේනදි කෝසල රජතුමා විවාහ වී සිටියේ බිම්බිසාර රජතුමාගේ නැගණිය සමගය. එබැවින් මේ රජවරු දෙදෙන දෙමස්සිනෝ වූහ.

**"තදහුපොසථෙ පන්නරසෙ කොමුදියා චාතුමාසිනියා පුණ්ණාය පුණ්ණමාය රත්තියා"** වස්සාන ඍතුවේ සතරවන මාසය වන ඉල් මාසයෙහි අවසන් දිනය වන පුර පසළොස්වක පොහෝ දින කුමුදු මල්

පිපී සුදුවන්ව බැබළෙන, මී දුම, දූවිලි, වළාකුළු නැති රාහු අසුරේන්ද්‍රයාගේ ග්‍රහණයක් නැති, අතිශයින් පිරිසිදු අහස්තලයෙහි සුදෝ සුදුවන්ව චන්ද්‍රාලෝකය පැතිරී ඇති එදවස රාත්‍රියෙහි **"රාජාමච්චපරිවුතො උපරිපාසාදවරගතො නිසින්නො හොති"** අජාසත්ත රජතුමා රජ මාලිගයෙහි උඩුමහල් තලයට නැගී ඔසවන ලද සේසත් ඇති ස්වර්ණමය ආසනයෙහි රාජ මහාමාත්‍ය ගණයා පිරිවරාගෙන හුන්හ.

කුමක් නිසා මෙසේ හුන්නේ ද යත්? නිදි වැරීම සඳහා ය. මේ අජාසත් රජ තම ධර්මිෂ්ඨ පිය රජතුමාට හිරිහැර කළ දින පටන් නින්දට යන්නෙමි යැයි ඇස් පියාගත් ක්‍ෂණයෙහි ආයුධ සියයකින් පහර දෙනු ලැබූවෙකු මෙන් හඬමින් බියෙන් පුබුදී. අන්‍යයෝ මේ කිමෙක්දැයි ඇසූ විට කිසිවක් නැතයි කියයි. මෙසේ නින්දට ගිය විගස බියවෙන බැවින් රජුට නින්ද ප්‍රිය නැත. මෙසේ දිනපතා ම නිදි වර්ජිත ව ඇමති ගණයා පිරිවරා කථාවෙන් රාත්‍රිය ගත කරයි. එදින ඉල් නැකත් යෝගයෙන් රටවැසීන්ට නුවර සම කරවා සුදු වැලි ඉස ධජ පතාකා නංවා පහන් දල්වා සියලු දිසාවන් විසිතුරු ව බැබළෙන රාත්‍රියෙහි උත්සව ක්‍රීඩා පවත්වමින් වීථි බැස රියට නැඟී නැකත් සැණකෙළිවලින් සතුටු වෙමින් නිදි වැරූහ. රජ කුලයට සැමදා නැකැත්ම ය. එසේ වුවත් මේ රජතුමාට නිදීමට නොහැකි බැවින් මෙසේ නිදි වැරීම පිණිස පිරිවර ජනයා සමග රාත්‍රියෙහි හුන්නේ වේ.

**"අථ ඛො රාජා මාගධො අජාතසත්තු වෙදෙහිපුත්තො තදහුපොසථෙ උදානං උදානෙසි"** ඉක්බිති වේදේහිපුත්‍ර වූ අජාසත්ත රජතුමා එදවස පොහෝ දින රාත්‍රියෙහි ප්‍රීති වාක්‍යයක් කීවේය.

මෙහි **"උදානං උදානෙසි"** යනු උදාන වාක්‍යයක් හෙවත් ප්‍රීති වාක්‍යයකි. යම් සේ තෙලක් මිම්මක් ගැනීමට නොහැක්කේ ද වැගිරී යන්නේ ද එය **"ගලා යාමක්"** යැයි කියනු ලැබේ. යම් සේ ජලයක් පොකුණකට ගැනීමට නොහැක්කේ ද උතුරා යන්නේ ද එය **"ඕඝ"** යැයි කියනු ලැබේ. එසේම යම් ප්‍රීති වචනයක් හදවතට ගැනීමට නොහැක්කේ ද වැඩි වී ඇතුළත නො රැඳී පිටතට නික්මේ ද එය **"උදාන"** යැයි කියනු ලැබේ. රජු එබඳු වූ ප්‍රීතිමත් වචනයක් නිකුත් කළේ ය. එනම් :-

**"පින්වත්නි, ආශ්චර්යයකි. මී දුම, දුම, දූවිලි, රාහු යන උපක්ලේශයන්ගෙන් බාධා නැති සඳ රැසින් පිරුණු රාත්‍රිය සිත් කළු වෙයි. පින්වත්නි රාත්‍රිය සඳරැසින් විශේෂයෙන් ශෝභනය. පින්වත්නි, රාත්‍රිය සඳරැසින් දැකුම්කළුය. පින්වත්නි, රාත්‍රිය සඳරැසින් ප්‍රසාද ජනකය. පින්වත්නි, රාත්‍රිය සඳරැස් හේතුවෙන් අලංකාරමත් ය. මේ සිත් කළු රාත්‍රියෙහි අපගේ ප්‍රශ්න විසඳ චිත්ත ප්‍රසාදය ගෙන දෙන කුමන මහණෙකු හෝ බමුණෙකු ඇසුරු කරන්නෙමු ද?"**

මෙසේ රජතුමා මේ සියලු වචනයන්ගෙන් රාත්‍රී අලංකාරය වර්ණනා කොට ආලෝකය පිළිබඳ නිමිත්ත කර්මයක් (හැඟවීමක්) කළේ ය. කවරෙකු උදෙසා කළේ ද යත්? ජීවක වෛද්‍යාචාර්යතුමා උදෙසාය. කුමක් සඳහා ද යත්? භාග්‍යවත් අර්හත් සම්මා සම්බුදු රජාණන් වහන්සේ දකිනු සඳහා ය. භාග්‍යවතුන් වහන්සේ දැකීමට මේ රජතුමාට යාමට නොහැක්කේ ද? එසේ ය. නොහැක්කේමය. කුමක් හෙයින් ද යත්? මහා අපරාධ කළ බැවිනි. භාග්‍යවතුන් වහන්සේගේ ශාසනයෙහි උපාසකත්වයට පත් ආර්ය ශ්‍රාවක වූ තමන්ගේ පියා වූ බිම්බිසාර මහ රජතුමා තමන් විසින් ම මරවණ ලද්දේය. එබැවිනි. එසේම දේවදත්ත තෙරුන් අජාසත් රජුගේ සහායෙන් ම භාග්‍යවතුන් වහන්සේට බොහෝ අනර්ථ කළේ ය. ඒ සියල්ල මහා අපරාධ කර්මයෝ ය. මෙසේ මහා අපරාධ කර ඇති බැවින් රජ වුවත් තමාගේ ශක්තියෙන් භාග්‍යවතුන් වහන්සේ සමීපයට යාමට නොහැක්කේය. ජීවක වෛද්‍යාචාර්යතුමා වනාහී භාග්‍යවතුන් වහන්සේගේ උපස්ථායකයාය. එතුමාගේ මාර්ගයෙන් උපකාරයෙන් මුවාවෙන් භාග්‍යවතුන් වහන්සේ දකින්නෙමි යැයි මෙසේ නිමිත්ත කර්මයක් (හැඟවීමක්) කළේ ය.

කිමෙක් ද? මේ රජතුමා තමන් උදෙසා කරන නිමිති හැඟවීම ජීවක වෛද්‍යාචාර්යතුමා නොදන්නෙහි ද? එසේ ය දනියි. එසේ දනිත්නම් අන්‍යයන් තමන් ඇසුරු කරන ශ්‍රමණයන් ගැන කියන විට කිසිවක් නොකියා නිහඬ වී සිටියේ ද? වික්ෂේපය (ස්ථාවරයකට නොපැමිණීම) බිඳ දමනු පිණිස ය. එතුමාගේ එළඹ සිටි සිහිය වැඩී ඇත. තව ද මේ රාජ සභාවෙහි නොයෙක් ශාස්තෘවරුන්ගේ උපස්ථායකයෝ රැස්ව සිටිති. ඔවුහු නොහික්මුණු අය ඇසුරු කිරීමෙන් ඔවුහු ද නොහික්මුණු ස්වභාව ඇත්තෝ ය. මා මුලින් ම භාග්‍යවතුන් වහන්සේගේ ගුණ කථාව පටන් ගත් කල්හි ඔවුහු වරින් වර නැගිට තම

තමන්ගේ ශාස්තෘවරුන්ගේ ගුණ කථාව කියන්නාහුය. මෙසේ ඇති කල්හි මාගේ ශාස්තෘන් වහන්සේගේ ගුණ කථාව නිමාවකට නොයන්නේය. රජතුමා ද මේ අන්‍ය ශාස්තෘවරු වෙත නිතර එළඹෙන ස්වභාව ඇති හෙයින් සත්‍ය තතු මනාව දන්නා බැවින් අන්‍යයන්ගේ කථාවන්ට නොසතුටුව මා විචාරන්නේ ය. එවිට මම වික්ෂේප නොවී මාගේ ශාස්තෘන් වහන්සේගේ ගුණ කියා රජතුමා ශාස්තෘන් වහන්සේ වෙත කැඳවාගෙන යන්නෙමි යැයි දන්නා නුවණින් යුත් බැවින් අන්‍ය වික්ෂේපයන් බිඳ දමනු පිණිස නිහඬ විය.

## ❄ රාජාමාත්‍ය කථා

ඒ සභාවෙහි සිටි ඇමතියන් මෙසේ සිතූහ. අද රජතුමා පද (කරුණු) පසකින් රාත්‍රිය වර්ණනා කරන්නේ ය. ඒකාන්තයෙන් යම්කිසි ශ්‍රමණයෙකු හෝ බ්‍රාහ්මණයෙකු කරා එළඹ ප්‍රශ්න අසා ධර්මය අසනු කැමැත්තෙහි ය. රජතුමා ධර්මය අසා පැහැදෙන කෙනෙකුට මහත් සත්කාර කරන්නේ ය. කුලුපග ශ්‍රමණයෙකු වේ නම් හෙතෙම රාජ කුලුපග වේ. එය ඔහුට මහත් ලාභියෙකි, යහපතකි, යැයි සිතා **"මම මගේ කුලුපග ශ්‍රමණයා වෙත රජු ගෙන යන්නෙමි, මම මගේ කුලුපග ශ්‍රමණයා වෙත රජු ගෙන යන්නෙමි"** යැයි ඔවුහු තම තමන්ගේ කුලුපග ශ්‍රමණයන්ගේ ගුණ කීම ඇරඹූහ.

රජතුමා විසින් **"මේ සිත් කළු රාත්‍රියෙහි අපගේ ප්‍රශ්න විසඳ චිත්ත ප්‍රසාදය ගෙන දෙන කුමන මහණෙකු හෝ බමුණෙකු ඇසුරු කරන්නෙමු ද?"** යැයි ඇසූ කල්හි එක්තරා රජ ඇමතියෙක් අජාසත් රජතුමාට මෙසේ කීවේය.

**"දේවයන් වහන්ස, මේ කාශ්‍යප ගෝත්‍රයෙහි උපන් පූර්ණයන්ට ශ්‍රාවක සමූහයා ඇත්තේය. පිරිස් ඇත්තේය. පිරිසට ගුරුවරයෙකි. ප්‍රසිද්ධ කීර්තියක් දරන්නෙකි. තීර්ථක ධර්මදේශනා කරන්නෙකි. බොහෝ දෙනා විසින් යහපත් යැයි පිළිගත්තෙකි. බොහෝ කල් පැවිදි ව සිටින්නෙකි. බොහෝ කල් ගත වී ගොස් මහලු වයසට පැමිණ**

**සිටින්නෙකි. දේවයන් වහන්සේ ඒ පූර්ණ කාශ්‍යපයන් ආශ්‍රය කෙරෙත්වා. ඔහු ආශ්‍රය කරන ඔබගේ සිත හොඳින් පහදින්නේය".**

ඒ ඇමති මෙසේ කී කල අජාසත් රජ රන්වන් මිහිරි රසයෙන් යුත් අඹ පලයක් කනු කැමති පුරුෂයා ගෙනවිත් අත තබන ලද කඳුරු ගෙඩියක් දැක මෙන් ධ්‍යාන අභිඥාදී ගුණයෙන් යුත් ත්‍රිලක්ෂණයෙන් මුසු මිහිරි දහම් කථාව ඇසීමට කැමති වන බැවින් ද, පෙර පූර්ණකාශ්‍යපයන්ගේ රූපය දැකීමෙන් ද නොසතුටට පත් වූ බැවින් ඒ කියන ලද ගුණ කථාවෙන් ද නොසතුටට පත්ව නිශ්ශබ්ද විය.

## ⌘ පූර්ණ කාශ්‍යප

මොහු අනූනවයක් වූ දසයන් ඇති එක්තරා කුල ගෙයක සියය සම්පූර්ණ කරමින් උපන්නේය. එබැවින් එම සිටුවරයා සතුටු ව ඔහුට "**පූර්ණ**" යයි නමක් තැබීය. ඔවුන්ගේ කුල ගෝත්‍රය "**කාශ්‍යප**" නම් විය. එබැවින් ඒ නම් දෙක එකතුව ඔහුට "**පූර්ණකාශ්‍යප**"යැයි නමක් තැබූහ. හෙතෙම දසයන් සියය සම්පූර්ණ කරමින් උපන් හෙයින් ද, ප්‍රධාන දස පවුලේ මංගල දසයා වූ බැවින් ද ඔහුගෙන් කිසි වැඩක් නොගත්තේය. ඔහු කුමක් කළ ද, එය වරදක් යැයි කියන්නෙක් නැත. කළ යුතු දේ නොකළ කල්හි ද දෙස් නඟන්නෙක් නැත. පසු කලෙක සිටුවරයා ඔහුව වෙහෙසක් නැති වැඩක යොදවමි යැයි සිතා වාසල් දොර රැකීමට නියෝග කළේ ය. හෙතෙම "**මා මෙහි වසන්නේ කුමට ද**" යැයි සිතා පලා ගියේය. ඉක්බිති සොරු ඔහුගේ හැඳි වස්ත්‍ර පැහැර ගත්හ. හෙතෙම කොළවලින් හෝ තෘණවලින් හෝ කය වසා ගන්නට නොදත් බැවින් නිර්වස්ත්‍රව ම සිටියේ ය. මිනිස්සු ඔහු දැක "**නුඹ කවරෙක් ද**" යැයි ඇසූහ. හෙතෙම "**මම අන් දෙයක් කියන්නේ නම් මට රැකවරණයක් නොවන්නේ ය**" යැයි සිතා "**මගේ බඩ සියලු ශාස්ත්‍රයෙන් සම්පූර්ණ වූ හෙයින් මට පූර්ණ යැයි කියති. ගෝත්‍ර වශයෙන් බ්‍රාහ්මණ වංශයෙහි උපන් බැවින් කාශ්‍යප නම් වෙමි. දැන් මම රහත් කෙනෙක් වෙමි, පූර්ණ කාශ්‍යප නම් බුදුවරයා මම**" යැයි කීවේය. මිනිස්සු "**මේ ශ්‍රමණයා අල්පේච්ඡ ය, රහත් ය, මොහු හා සමානයෙක් ලොව තවත් නැත**" යැයි සිතා කෑ යුතු වැළඳිය යුතු ආහාර ද පාන වර්ග ද ගෙන ඔහු වෙත එළඹුණහ. හෙතෙම "**මා වස්ත්‍ර නො හැඳි බැවින් මේ ප්‍රත්‍ය ලැබුණේ**

ය” යැයි සිතා එතැන් පටන් වස්ත්‍ර ලැබ ද නොහැන්දේය. එය ම පැවිද්ද සේ ගත්තේ ය. ඔහුගේ සමීපයෙහි පන්සියයක් පමණ මිනිස්සු පැවිදි වූහ. ඉන් පසු හෙතෙම බොහෝ පිරිසකට ආචාර්‍යයවරයෙකු විය.

තවද එක්තරා රජ ඇමතියෙක් අජාසත් රජුට මෙසේ කීය.

**“දේවයන් වහන්ස, මේ ගෝසාල වූ මක්ඛලිට ද ශ්‍රාවක සමූහයා ඇත්තේය. පිරිස් ඇත්තේය. පිරිසට ගුරුවරයෙකි. ප්‍රසිද්ධ කීර්තියක් දරන්නෙකි. තීර්ථක ධර්මදේශනා කරන්නෙකි. බොහෝ දෙනා විසින් යහපත් යැයි පිළිගත්තෙකි. බොහෝ කල් පැවිදි ව සිටින්නෙකි. බොහෝ කල් ගත වී ගොස් මහලු වයසට පැමිණ සිටින්නෙකි. දේවයන් වහන්සේ ඒ මක්ඛලි ගෝසාලයන් ආශ්‍රය කෙරෙත්වා. ඔහු ආශ්‍රය කරන ඔබගේ සිත හොඳින් පහදින්නේය.”**

මෙසේ කී කල අජාසත් රජ පෙර මක්ඛලි ගෝසාලයන්ගේ රූපය දැකීමෙන් ද නොසතුටට පත් වූ බැවින් ඒ කියන ලද ගුණ කථාවෙන් ද නොසතුටට පත්ව නිශ්ශබ්ද විය.

## ⌘ මක්ඛලි ගෝසාල

“**මක්ඛලි**” යනු ඔහු ගේ නමය. ගව හලක දී උපන් බැවින් “**ගෝසාල**” යැයි දෙවැනි නමක් විය. මොහු ද සිටුවරයෙකුගේ දාස පවුලක උපන්නෙකි. දිනක් ඔහු ඒ සිටුවරයා සමග මඩ සහිත බිමක තෙල් කලයක් කර තියාගෙන පසුපස යන විට සිටුවරයා “**තාත! මා ඛලි**” “දරුව වැටෙන්නට එපා” යැයි කීවේය. එහෙත් ඔහු සැලකිල්ලක් නැතිව වටපිට බලමින් යන විට පය පැකිළී වැටී තෙල් කලය බිඳුනේය. එයින් හෙතෙම ස්වාමියාට බියෙන් පළා යාමට පටන්ගත්තේ ය. ස්වාමියා පසුපස දුව ගොස් ඔහුගේ රෙදි කොනින් අල්ලා ගත්තේ ය. ඔහු සළුව අත්හැර දමා නිර්වස්ත්‍රවම පළාගියේ ය. හෙතෙම ද කොළවලින් හෝ තෘණවලින් හෝ කය වසාගන්නට නොදත් බැවින් නිර්වස්ත්‍රව ම සිටියේ ය. සිටුවරයා “**තාත! මා ඛලි**” යැයි කී වචනය මුල්කොට “**මා ඛලි**” යැයි ව්‍යවහාර වී පසුව “**මක්ඛලි**” නම් විය. මිනිස්සු ඔහු දැක ඔබ කවුද යැයි ඇසූහ. හෙතෙම “**මක්ඛලි ගෝසාල**” නම්

රහතන් වහන්සේ මම වෙමි යැයි කීවේය. මිනිස්සු **"මේ ශ්‍රමණයා අල්පේච්ඡ ය, රහත්ය, මොහු හා සමානයෙක් ලොව තවත් නැත"** යැයි සිතා කෑ යුතු වැළඳිය යුතු ආහාර ද පාන වර්‍ග ද ගෙන ඔහු වෙත එළඹුණහ. හෙතෙම **"මා වස්ත්‍ර නො හැඳි බැවින් මේ ප්‍රත්‍ය ලැබුණේය"** යැයි සිතා එතැන් පටන් වස්ත්‍ර ලැබ ද නොහැන්දේය. එය ම පැවිද්ද සේ ගත්තේ ය. ඔහුගේ සමීපයෙහි පන්සියයක් පමණ මිනිස්සු පැවිදි වූහ. ඉන් පස් හෙතෙම බොහෝ පිරිසකට ආචාර්‍යයවරයෙකු විය.

තවද එක්තරා රජ ඇමතියෙක් ට අජාසත් රජුට මෙසේ කීය.

**"දේවයන් වහන්ස, මේ කෙසකම්බල අජිත ශ්‍රාවක සමූහයා ඇත්තේය. පිරිස් ඇත්තේය. පිරිසට ගුරුවරයෙකි. ප්‍රසිද්ධ කීර්තියක් දරන්නෙකි. තීර්‍ථක ධර්‍මදේශනා කරන්නෙකි. බොහෝ දෙනා විසින් යහපත් යැයි පිළිගත්තෙකි. බොහෝ කල් පැවිදි ව සිටින්නෙකි. බොහෝ කල් ගත වී ගොස් මහලු වයසට පැමිණ සිටින්නෙකි. දේවයන් වහන්සේ ඒ කෙසකම්බල අජිතයන් ආශ්‍රය කෙරෙත්වා. ඔහු ආශ්‍රය කරන ඔබගේ සිත හොඳින් පහදින්නේය."**

මෙසේ කී කල්හි ද අජාසත් රජ පෙර අජිත කේශකම්බලිගේ රූපය දැකීමෙන් ද නොසතුටට පත් වූ බැවින් ඒ කියන ලද ගුණ කථාවෙන් ද නොසතුටට පත්ව නිශ්ශබ්ද විය.

## ⌘ අජිතකෙසකම්බල

**"අජිතො"** යනු ඔහුගේ නමය. මොහු උසස් කුලවතෙකි. අනුන්ගෙන් ණය ගෙන ගෙවාගත නොහැකිව තම රට හැර ප්‍රත්‍යන්තයකට පලාගොස් ජීවනෝපායක් නැති හෙයින් වනගත විය. ඇඳීමට වස්ත්‍ර නැති හෙයින් මනුෂ්‍ය කෙස්වලින් කළ කම්බිලියක් සාදගෙන එය ඇඳගත්තේය. මෙසේ කේසකම්බිලියක් දැරූ බැවින් **"කෙසකම්බලි"** නම් විය. මෙතෙමේ **"අජිතකෙසකම්බල"** නම් රහතන් වහන්සේ මමය යැයි කියා ප්‍රතිඥා කොට අඥානයන් පහදවා පන්සියයක් පමණ පිරිසක් පැවිදි කොට ශාස්තෘවරයෙකු විය.

තවද එක්තරා රජ ඇමතියෙක් අජාසත් රජුට මෙසේ කීය.

**"දේවයන් වහන්ස, මේ කච්චායන ගෝත්‍රයෙහි වූ කකුධට ශ්‍රාවක සමූහයා ඇත්තේය. පිරිස් ඇත්තේය. පිරිසට ගුරුවරයෙකි. ප්‍රසිද්ධ කීර්තියක් දරන්නෙකි. තීර්ථක ධර්මදේශනා කරන්නෙකි. බොහෝ දෙනා විසින් යහපත් යැයි පිළිගත්තෙකි. බොහෝ කල් පැවිදි ව සිටින්නෙකි. බොහෝ කල් ගත වී ගොස් මහලු වයසට පැමිණ සිටින්නෙකි. දේවයන් වහන්සේ ඒ කච්චායන ගෝත්‍රයෙහි වූ කකුධයන් ආශ්‍රය කෙරෙත්වා. ඔහු ආශ්‍රය කරන ඔබගේ සිත හොඳින් පහදින්නේය"**

මෙසේ කී කල්හි ද අජාසත් රජ පෙර කකුධ කච්චායනගේ රූපය දැකීමෙන් ද නොසතුටට පත් වූ බැවින් ඒ කියන ලද ගුණ කථාවෙන් ද නොසතුටට පත්ව නිශ්ශබ්ද විය.

## ⌘ කකුධකච්චායන

මෙතෙමේ උසස් කුලවතෙකි. පියෙකු නැතිව වැන්දඹු ස්ත්‍රියකට පුත්ව උපන්නෙකි. මව දුක්ඛිත හෙයින් ගෙයක් දෙරක් නැති හෙයින් ඔහු කුඹුක් ගසක් මුල වද හැර දමා ගියා ය. එක්තරා බ්‍රාහ්මණයෙකු ඔහු ගෙන ගොස් පෝෂණය කෙළේය. කුඹුක් ගස මුල උපන් හෙයින් **"කකුධ"** යැයි නම් තැබීය. **"කච්චායන"** යනු ඒ බ්‍රාහ්මණයාගේ ගෝත්‍ර නාමයයි. මෙසේ නාම ගෝත්‍ර සැසඳීමෙන් **"කකුධකච්චායන"** නම් විය. හෙතෙම බ්‍රාහ්මණයාගේ මරණින් පසු ජීවනෝපායක් නැතිව වන වැදී තවුස් වෙස් ගෙන රහත්බව ප්‍රතිඥා කොට පන්සියයක් පමණ පිරිසක් පැවිදි කොට ශාස්තෘවරයෙකු විය. මිනිස්සු පැහැ ද බොහෝ සත්කාර සම්මාන කළහ.

තවද එක්තරා රජ ඇමතියෙක් අජාසත් රජුට මෙසේ කීය.

**"දේවයන් වහන්ස, මේ බෙලට්ඨ පුත්ත සඤ්ජයට ශ්‍රාවක සමූහයා ඇත්තේය. පිරිස් ඇත්තේය. පිරිසට ගුරුවරයෙකි. ප්‍රසිද්ධ කීර්තියක් දරන්නෙකි. තීර්ථක ධර්මදේශනා කරන්නෙකි. බොහෝ දෙනා විසින් යහපත් යැයි පිළිගත්තෙකි. බොහෝ කල් පැවිදි ව සිටින්නෙකි.**

**බොහෝ කල් ගත වී ගොස් මහලු වයසට පැමිණ සිටින්නෙකි. දේවයන් වහන්සේ ඒ බෙලට්ඨ පුත්ත සඤ්ජයයන් ආශ්‍රය කෙරෙත්වා. ඔහු ආශ්‍රය කරන ඔබගේ සිත හොඳින් පහදින්නේය.”**

මෙසේ කී කල්හි ද අජාසත් රජ පෙර සඤ්ජය බෙල්ලට්ඨි පුත්‍රගේ රූපය දැකීමෙන් ද නොසතුටට පත් වූ බැවින් ඒ කියන ලද ගුණ කථාවෙන් ද නොසතුටට පත්ව නිශ්ශබ්ද විය.

## ⌘ සඤ්ජය බෙල්ලට්ඨිපුත්‍ර

“**සඤ්ජය**” යනු ඔහුගේ නමය. බේලට්ඨගේ පුත්‍රයා වූ බැවින් “**බෙල්ලට්පුත්ත**” නම් විය. මේ දෙක එකතුව “**සඤ්ජය බෙල්ලට්ඨිපුත්ත**” නම් විය. මොහු දාස පවුලක උපන්නෙකි. පසුව දාස බවෙන් නිදහස් කරන ලදුව නොයෙක් ශාස්ත්‍ර ඉගෙන මහත් වූ නුවණක් ඇතිව තර්ක වාද ඉගෙන ගෙන තාපස පැවිද්දෙන් පැවිදි ව වනගත ව මම රහත් වූවෙක්මි යැයි කියා අඥනයන් පහදවාගෙන පන්සියයක් පමණ පිරිසක් පැවිදි කරගෙන ශාස්තෲවරයෙකු විය.

තවද එක්තරා රජ ඇමතියෙක් අජාසත් රජුට මෙසේ කීය.

“**දේවයන් වහන්ස, මේ නාථ පුත්‍ර නිගණ්ඨ ශ්‍රාවක සමූහයා ඇත්තේය. පිරිස් ඇත්තේය. පිරිසට ගුරුවරයෙකි. ප්‍රසිද්ධ කීර්තියක් දරන්නෙකි. තීර්ථක ධර්මදේශනා කරන්නෙකි. බොහෝ දෙනා විසින් යහපත් යැයි පිළිගත්තෙකි. බොහෝ කල් පැවිදි ව සිටින්නෙකි. බොහෝ කල් ගත වී ගොස් මහලු වයසට පැමිණ සිටින්නෙකි. දේවයන් වහන්සේ ඒ නාථ පුත්‍ර නිගණ්ඨයන් ආශ්‍රය කෙරෙත්වා. ඔහු ආශ්‍රය කරන ඔබගේ සිත හොඳින් පහදින්නේය.**”

## ⌘ නිගණ්ඨනාථපුත්‍ර

මෙතෙමේ “**නාථ**” නම් ගොවියෙකුගේ පුත්‍රයෙකු වූ බැවින් “**නාථ පුත්‍ර**” නම් විය. ඔහු කෛරාටිකයෙක් ව නක්ෂත්‍ර, ගණිත, නිමිති

ශාස්ත්‍රාදී නොයෙක් දේ ඉගෙන ගෙන **"මම ලොව එක් රහත් කෙනෙක්මි"** යැයි නැති ගුණ හඟවා **"මගේ ළයෙහි කෙලෙස් ගැට නැත, මම නොදන්නා ශාස්ත්‍ර ගැටයකුත් නැත, එබැවින් මම "නිගණ්ඨී" නම් වෙමි"** යැයි කියා ඇවිද්දේය. පසුව ඔහු **"නිගණ්ඨනාථපුත්‍ර"** නම් රහතන් වහන්සේ යැයි ප්‍රසිද්ධ වූහ. පන්සියයක් පමණ අතවැසි පිරිසක් කැටුව ශාස්තෲවරයෙකු ලෙස පෙනී සිටියේ ය.

මෙසේ කී කල්හි ද අජාසත් රජ පෙර නිගණ්ඨ නාතපුත්‍රගේ රූපය දැකීමෙන් ද නොසතුටට පත් වූ බැවින් ඒ කියන ලද ගුණ කථාවෙන් ද නොසතුටට පත්ව නිශ්ඛද විය.

## ❄ ජීවක වෛද්‍යාචාර්‍යතුමාගේ බුදුගුණ වැනුම

ඒ රජ ඇමතියන් තම තමන්ගේ ශ්‍රමණයන්ගේ ගුණ කථා කියන විට කොමාර භච්ච ජීවක වෛද්‍යාචාර්‍යතුමා නිශ්ශබ්දව අජාසත් රජ සමීපයෙහි උන්නේ විය. රජතුමා ඒ ඇමතිවරුන්ගේ වචන අසා මෙසේ සිතුවේ ය. මම යම් යම් අයෙකුගේ වචන නො අසනු කැමැත්තෙම් ද, ඒ ඒ පුද්ගලයෝ ම අදහස් දක්වති. යමෙකුගේ වචන අසන්නට කැමැත්තෙම් ද හෙතෙම නාග භවනයට පත් ගුරුළු රාජයා මෙන් නිහඬ ය. මෙය මට ඒකාන්තයෙන් අනර්ථයකි. ඉක්බිති රජතුමාට මෙසේ අදහසක් ඇතිවිය. මේ ජීවක වනාහී උපසාන්ත වූ භාග්‍යවතුන් වහන්සේගේ උපස්ථායෙකි. මේ ජීවක ද ස්වභාවයෙන් ම උපසාන්තය. වත්ත සම්පන්න භික්ෂුවක් මෙන් නිහඬව ම සිටී. මා කථා නොකරනතාක් ඔහු ද කථා නොකරයි. ඇතා පාගන කල්හි ඇතාගේම පාදය අල්වාගත යුතු වන්නාක් මෙන් ජීවක වෛද්‍යාචාර්‍යතුමා සමග කථාවක් ආරම්භ කරමින් මෙසේ කීවේය.

**"යහලු ජීවකය, ඔබ කුමන කරුණක් නිසා නිශ්ශබ්දව සිටින්නෙහි ද? තම තමන්ගේ කුලුපග ශ්‍රමණයාගේ ගුණ කියන මේ ඇමතියන්ගේ මුව ප්‍රමාණවත් නොවේ. යම් සේ අන්‍යයන්ට කුලුපග ශ්‍රමණයන් ඇත්තේ නම් ඔබට කුලුපග ශ්‍රමණයෙකු නැත්තේ ඇයි? ඔබ දිළින්දෙක් ද? මාගේ පියා විසින් ඔබට ධනය නොදෙන ලද්දේ ද?**

**නැතහොත් තම කුලුපග ශ්‍රමණයා පිළිබඳ ශ්‍රද්ධාව නැත්තේ ද?"** යැයි ඇසුවේ ය.

එවිට ජීවක වෛද්‍යාචාර්‍යතුමාට මෙසේ සිතිණ. **"මේ රජතුමා මාගේ කුලුපග ශ්‍රමණයාගේ ගුණ කියන්න කියයි. දැන් මා නිහඬව සිටිය යුතු වේලාව නොවේ. මේ ඇමතියන් රජතුමාට වැඳගෙන තම කුලුපග ශ්‍රමණයාගේ ගුණ කීවා සේ මාගේ ශාස්තෲන් වහන්සේගේ ගුණ කීම යුතු නොවේ"** යැයි හුනස්නෙන් නැගිට භාග්‍යවතුන් වහන්සේ වැඩ සිටින තමන් ම පූජා කළ අඹ වනය දෙස බලා පසඟ පිහිටුවා වැඳ නිය දසය එක් කිරීමෙන් බබළන ඇඟිලිවලින් ඇඳිලි බැඳගෙන මෙසේ කීවේය.

**"මහ රජතුමනි, මා ගැන මෙසේ කිරීමෙන් වරදවා නොසිතනු මැනවි. මේ ජීවක ඕනෑම ශ්‍රමණයෙකු කරා එළඹෙන්නේ ය. මාගේ ශාස්තෲන් වහන්සේ මව්කුස පිළිසිඳ ගත් කල්හි ද, මව්කුසින් මෙලොවට බිහි වෙන කල්හි ද, මහාභිනිෂ්ක්‍රමණය කරන කල්හි ද, සම්බුද්ධත්වයට පත්වන කල්හි ද, දම්සක් දේශනාව පවත්වන කල්හි ද දස දහසක් ලෝකධාතු කම්පා විය. යමක ප්‍රාතිහාර්‍යය කළ සේක. දේවාරෝහණය කළ සේක. මාගේ ශාස්තෲන් වහන්සේගේ ගුණ කියන්නෙමි මහරජතුමණි! එකඟ වූ සිතින් අසනු මැනවි"** යැයි කියා බුද්ධ ගුණ වර්ණනාව කියන්නට පටන් ගත්තේ ය.

දේවයන් වහන්ස, මේ අරහත් සම්මා සම්බුදු භාග්‍යවතුන් වහන්සේ මහා භික්ෂු සංඝයා වූ එක්දහස් දෙසිය පණහක් පමණ භික්ෂූන් වහන්සේ සමග අපගේ අඹ වනයෙහි වාසය කරන සේක. ඒ භාග්‍යවතුන් වහන්සේගේ මෙබඳු ස්තුති ඝෝෂාව උස්ව නැංගේ ය. කෙසේ ද යත්:-

❖ ඒ භාග්‍යවතුන් වහන්සේ සියලු කෙලෙසුන්ගෙන් දුරු වූ බැවින් ද, සියලු කෙලෙස් සතුරන් නැසූ බැවින් ද, සංසාර චක්‍රය පැවැත්මට හේතුවන කෙලෙස් බැම් සිඳ දැමූ බැවින් ද, මෙලෙස කෙලෙසුන්ගෙන් තොර ව ඉතා පිරිසිදු සිත් ඇති හෙයින් ආමිස ප්‍රතිපත්ති පූජා වන්ට සුදුසු වූ බැවින් ද, රහසිනිදු අකුසල් සිතක් හෝ ඇති නොවන බැවින් ද **"අර්හත්"** නම් වන සේක.

❖ ඒ භාග්‍යවතුන් වහන්සේ අවබෝධ කළ යුතු දුක්ඛ සත්‍යය අවබෝධ කොට වදාළ බැවින් ද, ප්‍රහාණය කළ යුතු සමුදය සත්‍යය ප්‍රහාණය කොට වදාළ බැවින් ද, ප්‍රත්‍යක්ෂ කළ යුතු නිරෝධ සත්‍යය ප්‍රත්‍යක්ෂ කොට වදාළ බැවින් ද, මාර්ගය වශයෙන් වැඩිය යුතු ආර්යාෂ්ටාංගික මාර්ගය වැඩූ බැවින් ද, සංස්කාර විකාර ලක්ෂණ ප්‍රඥප්ති නිර්වාණ යන දත යුතු සියලු ධර්මයන් දැන වදාළ බැවින් ද **"සම්මා සම්බුද්ධ"** නම් වන සේක.

❖ ඒ භාග්‍යවතුන් වහන්සේ පුබ්බෙනිවාස ඥානය - දිබ්බචක්ඛු ඥානය ආශ්‍රවක්ෂය ඥානය යන **ත්‍රී විද්‍යාවන්ගෙන්** ද, විපස්සනා ඥානය - මනොමය ඍද්ධි ඥානය - ඍද්ධිවිධ ඥානය - දිබ්බසෝත ඥානය - චේතෝපරිය ඥානය - පුබ්බෙනිවාස ඥානය - දිබ්බචක්ඛු ඥානය ආශ්‍රවක්ෂය ඥානය යන **අෂ්ට විද්‍යාවන්ගෙන්** ද, සීල සංවරය - ඉන්ද්‍රිය සංවරය - භෝජනයෙහි පමණ දැනීම - නිදිවැරීම - ශ්‍රද්ධාව - හිරිය - ඔත්තප්පය - බහුශ්‍රැත භාවය - වීර්යය - සතිය - ප්‍රඥාව - ප්‍රථම ධ්‍යානය - ද්‍විතිය ධ්‍යානය - තතිය ධ්‍යානය - චතුර්ථ ධ්‍යානය යන **පසළොස් චරණ ධර්මයන්ගෙන්** ද යුක්ත වන බැවින් **"විජ්ජා චරණ සම්පන්න"** නම් වන සේක.

❖ ඒ භාග්‍යවතුන් වහන්සේ පිරිසිදු ආර්ය මාර්ගයේ ගමන් ගත් බැවින්ද, සුන්දර නිර්වාණයට ගමන් ගත් බැවින් ද, සතර මාර්ග ඥානයෙන් නැසූ කෙලෙස් නැවත නූපදවමින් ගමන් ගත් බැවින් ද, දීපංකර බුදුරජාණන් වහන්සේ හමුවෙහි පටන් බෝධි මණ්ඩලය දක්වා මධ්‍යම ප්‍රතිපදාවෙහි ගමන් ගත් බැවින් ද **"සුගත"** නම් වන සේක.

❖ ඒ භාග්‍යවතුන් වහන්සේ පඤ්චස්කන්ධ ලෝකය සර්වප්‍රකාරයෙන් අවබෝධ කොට වදාළ බැවින් ද, ලෝකය ලෝක ස්වභාවය - ලෝක සමුදය - ලෝක නිරෝධය - ලෝක නිරෝධෝපාය වශයෙන් අවබෝධ කොට වදාළ බැවින් ද, සංස්කාර ලෝකය - සත්ව ලෝකය - අවකාශ ලෝකය යන ත්‍රිවිධ ලෝකය සර්වප්‍රකාරයෙන් අවබෝධ කොට වදාළ බැවින් ද **"ලොකවිදූ"** නම් වන සේක.

❖ ඒ භාග්‍යවතුන් වහන්සේ සීලයෙන් - සමාධියෙන් - ප්‍රඥාවෙන් - විමුක්තියෙන් - විමුක්ති ඥානදර්ශනයෙන් ලොව අන් සියල්ලන්ට වඩා උත්තරීතර වන බැවින් ද, දමනය කළ යුතු දිව්‍ය - බ්‍රහ්ම -

මනුෂ්‍යයා - යක්‍ෂ - රාක්‍ෂ - සිද්ධ විද්‍යාධර, තිරිසන්ගත සත්වයන් උත්තරීතර ලෙස දමනය කොට වදළ බැවින් **"අනුත්තර පුරිසදම්මසාරථී"** නම් වන සේක.

❖ ඒ භාග්‍යවතුන් වහන්සේ සත්වයන්ට මෙලොව අභිවෘද්ධිය පිණිස ද - පරලෝක අභිවෘද්ධිය පිණිස ද - නිර්වාණය පිණිස ද අනුශාසනා කොට වදළ බැවින් ද, ජාති කාන්තාරය - ජරා කාන්තාරය - ව්‍යාධි කාන්තාරය - මරණ කාන්තාරය - සෝක පරිදේව දුක්ඛ දෝමනස්ස උපායාස කාන්තාරයන්ගෙන් සත්වයන් එතර කළ බැවින් දෙවි මිනිසුන්ට **ශාස්තෲ** (ගුරුවර) වන බැවින් **"සත්ථා දේවමනුස්සානං"** නම් වන සේක.

❖ ඒ භාග්‍යවතුන් වහන්සේ දුක්ඛාර්‍ය්‍ය සත්‍යය අවබෝධ කළ බැවින් ද, දුක්ඛ සමුදයාර්‍ය්‍ය සත්‍යය අවබෝධ කළ බැවින් ද, දුක්ඛ නිරෝධාර්‍ය්‍ය සත්‍යය අවබෝධ කළ බැවින් ද, දුක්ඛ නිරෝධගාමිනී ප්‍රතිපදාර්‍ය්‍ය සත්‍යය අවබෝධ කළ බැවින් ද එසේම අන්‍යයන්ට අවබෝධ කරවූ බැවින් ද **"බුද්ධ"** නම් වන සේක.

❖ ඒ භාග්‍යවතුන් වහන්සේ සමත්‍රිංශත් පාරමී ධර්ම සංඛ්‍යාත පුණ්‍ය භාග්‍යයෙන් සමන්වාගත බැවින් ද, ක්ලේශාදී පඤ්ච මාරයන් බිඳ හළ බැවින් ද, ඓශ්චර්‍ය්‍යාදී භාග්‍ය ධර්මයන්ගෙන් සමන්වාගත බැවින් ද, භජනය කළ යුතු විවේක විහරණ විමෝක්ෂාදී උත්තරි මනුෂ්‍ය ධර්ම භජනය කළ බැවින් ද, සසර ගමනට හේතු වූ තෘෂ්ණාව වමාරා දමා නිර්වාණ සැපයට සැපත් වූ බැවින් ද **"භගවා"** නම් වන සේක.

එබැවින් දේවයන් වහන්සේ ඒ භාග්‍යවතුන් වහන්සේ ආශ්‍රය කෙරෙත්වා. ඒ භාග්‍යවතුන් වහන්සේ ආශ්‍රය කරන ඔබ වහන්සේගේ සිත සැකයක් නැතුව පහදින්නේම ය. මහරජ ඔබ වැන්නවුන් ප්‍රශ්න සියයක් දහසක් ලක්‍ෂයක් එකවිට අසන්නේ නමුත් මාගේ ශාස්තෲන් වහන්සේට ඒ සියල්ල සිතට ගෙන් වෙන වෙනම විසඳන්නට ශක්තියද බලය ද ඇති සේක. එබැවින් විශ්වාස ඇතිවම එළඹ අසනු මැනවි මහරජතුමණි යැයි කීවේය.

භාග්‍යවතුන් වහන්සේගේ ගුණ කථාව ඇසූ රජතුමාගේ සියලු සිරුර පස්වනක් ප්‍රීතියෙන් නිරතුරුව පිරී ගියේය. රජතුමා එකෙනෙහිම

යනු කැමති ව "**මේ වෙලාවෙහි මා දසබලධාරින් වහන්සේ හමුවට යන විට ජීවක හැර අන් කිසිවෙක් රිය යෙදවීමට නොහැකිය**" යැයි සිතා ජීවක වෛද්‍යාචාර්යතුමා අමතා "**යහලු ජීවකය, එසේ නම් ඇත් යානාවක් සරසව**" යැයි කීවේය.

නොයෙක් අශ්ව රථ ආදී යානාවන් ඇත්තේ නමුත් හස්ති යානය උතුම් ය. උත්තමයෙකු හමුවට උතුම් යානයකින් යා යුතුම ය. එසේම අශ්ව යාන රථ යාන ශබ්ද සහිත ය. දුරට ශබ්ද ඇසෙයි. හස්ති යානය පසුපසින් ගියේ නමුත් ශබ්ද නො ඇසේ. නිවුණා වූ භාග්‍යවතුන් වහන්සේ ගේ සමීපයට නිහඬව යා යුතුය යැයි සිතා හස්ති යානය සූදනම් කිරීමට කීවේය.

"**එහෙමයි දේවයන් වහන්ස**" යැයි කියා ජීවක වෛද්‍යාචාර්යතුමා අජාසත් රජතුමාට පිළිතුරු දී, ඇතින්නන් පන්සියයක් සහ රජුට නැගීමට ඇතෙකු ද සරසවා, "**දේවයන් වහන්ස, ඇත් යානා පිළියෙළ කෙළේය. ගමනට කාලය යැයි සලකන්නේ නම් එය දැනගත මැනව**" යැයි රජතුමාට දැන්විය.

මේ ජීවක වෛද්‍යාචාර්යතුමා රජතුමා විසින් කියන ලද්දක් ම කළේ ද? නැත. නොකියූ දෙයක් ම කළේ ය. කුමක් හෙයින් ද යත්? පණ්ඩිත වූ බැවිනි. ජීවක වෛද්‍යාචාර්යතුමාට මෙසේ සිතිණ.

මේ රජතුමා මේ වේලාවෙහි ම යමු යැයි කියයි. රජවරු නම් බොහෝ සතුරන් ඇත්තෝ ය. යම් හෙයක්න් අතරමග කිසියම් අනතුරක් වේ ද, එය හේතු කොට ගෙන "**මේ ජීවක තෙමේ රජතුමා ග්‍රහණය කරගෙන රාජ්‍යය ගැනීමට කුමන්ත්‍රණ කළේ ය**" යැයි මම ද ගැරහීමට අපකීර්තියට පත් වෙයි. රජතුමා ද නො කල්හි යුද පිණිස නික්මෙයි. එසේම භාග්‍යවතුන් වහන්සේට ද "**ශ්‍රමණ ගෞතමයන් වහන්ස! මට කථාවක් කියන්නට ඇත. ගෞතමයන් වහන්සේගේ ශ්‍රාවක වූ මේ ජීවක ගෞතමයන් වහන්සේ සමීපයට යමු යැයි කියා මා ග්‍රහණය කරගැනීමට උත්සාහ කළේ ය**" යැයි කල් නො සලකාම කථා කරති. මෙසේ භාග්‍යවතුන් වහන්සේට ද ගරහන්නේ ය. එබැවින් මටවත් භාග්‍යවතුන් වහන්සේට වත් ගැහීවක් හෝ අපකීර්තියක් ඇති නොවන සේ රජතුමාගේ ආරක්ෂාව ඇතිවේ ද එසේ කරන්නෙමි.

තව ද ස්ත්‍රීන් නිසා පුරුෂයන්ට බියක් නම් නැත්තේමය. එබැවින් ස්ත්‍රීන් පිරිවරා රජතුමා සැප සේ යන්නේ ය යැයි ඇතින්නන් පන්සියයක් සරසවා පන්සියයක් ස්ත්‍රීන් පිරිමි වෙස් ගන්වා **"කඩු තෝමර ගත් අත් ඇතිව රජතුමා පිරිවරා සිටිව්"** යැයි අණ කොට නැවත මෙසේ සිතුවේ ය.

මේ රජතුමාට මේ ආත්මභාවයෙහි දී මාර්ග - ඵල ලැබීමට උපනිඃශ්‍රය සම්පත් නැත්තේ ය. බුදුරජාණන් වහන්සේලා උපනිඃශ්‍රය සම්පත් බලාම ධර්ම දේශනා කරති. මම දැන් මහජනයා රැස් කරවමි. මෙසේ ඇති කල්හි භාග්‍යවතුන් වහන්සේ කවර කෙනෙකුගේ හෝ උපනිඃශ්‍රය බලා ධර්ම දේශනා කරන සේක. එය මහජනයාට උපකාර පිණිස වන්නේය යැයි සිතා **"අද රජතුමා භාග්‍යවතුන් වහන්සේ හමුවට යයි. සියලු දෙනා තම තමාට හැකි අයුරින් රජතුමාට ආරක්‍ෂාව සපයත්වා"** යනුවෙන් ඒ ඒ තැනට හසුන් යැවීය. බෙර හැසිරවීය. එකල්හි මහජනයා මෙසේ සිතුහ.

**"රජතුමා භාග්‍යවතුන් වහන්සේ දැකීමට යයි. එබැවින් අද ධර්ම දේශනාව කෙබන්දක් වේවි ද, අපට නැකත් ක්‍රීඩාවලින් කම් නැත"** යැයි සියලු දෙනා සුවඳ මල් ආදිය ගෙන්වාගෙන රජතුමාගේ පැමිණීම අපේක්ෂාවෙන් මහමග සිටියාහු ය.

ජීවක වෛද්‍යාචාර්යතුමා ද රජතුමා අමතා **"මහරජ තුමනි! නුඹ වහන්සේ යමක් සඳහා අණ කරන ලද්දේ ද, එය මා විසින් කරන ලදි. හස්ති යානය සූදානම් කර ඇත. දැන් යාමට හෝ නොයාමට කාලය යැයි සිතන්නේ ද, ඒ අනුව කරන්න"** යැයි මෙසේ දැන්වීය.

ඉන් පසු අජාසත්ත මහ රජතුමා තමන්ට සූදානම් කර තැබූ ඇත් යානයට නැගී ඒම රාත්‍රියෙහි දඬු වැට පන්දම් දරනු ලබන කල්හි යොදුන් තුන්සියයක් විශාල වූ අංග, මගධ යන රටවල් දෙකට අධිපතිව මහත් වූ රාජානුභාවයෙන් යුක්තව රජගහ නුවරින් පිටත්ව ජීවක වෛද්‍යාචාර්යතුමාගේ අඹ වනය යම් තැනක ද එතැනට ගියේ ය.

එසේම පන්සියයක් ඇතිනි යානයන්හි එක් එක් ස්ත්‍රිය බැගින් නංවා ඒම ස්ත්‍රීන් හිස් වැසුමෙන් වෙන් ව, අංශයෙහි තබා ගත් කඩු

ඇතිව මැණික් දඬු පැහැති තෝමර ගෙන රජතුමා පිරිවරා ගෙන නික්මුණාහු ය.

තව ද සොළොස්දහසක් නාටක ස්ත්‍රීහු ද රජතුමා පිරිවරා සිටියහ. ඔවුන්ගේ කෙළවර කුදු, මිටි, වැදි ආදී ජනයා සිටියහ. ඔවුන්ගේ කෙළවර අන්තඃපුරය රක්නා විශ්වාසවත් පුරුෂයෝ සිටියහ. ඔවුන්ගේ කෙළවර විචිත්‍ර වෙස් ගත් සැටදහසක් පමණ මහ ඇමතිවරු ද, ඔවුන්ගේ කෙළවර විවිධ අලංකාරයන්ගෙන් යුක්ත නාන ප්‍රකාර ආයුධ ගත් අත් ඇති විද්‍යාධර තරුණයන් වැනි වූ අනූ දහසක් පමණ රටවැසි පුත්‍රයෝ ද, ඔවුන්ගේ කෙළවර කහවණු ලක්‍ෂයක් අගනා ඇඳුම් ඇඳ පන්සියයක් අගනා උතුරුසළු ඒකාංශ කර ස්නානය කොට තෙල් ගැල්වූ රන් ආදී නා නා ආභරණයෙන් ශෝභමාන වූ දස දහසක් බ්‍රාහ්මණයෝ දකුණු අත ඔසවා ජය ඝෝෂා කරමින් යති. ඔවුන්ගේ කෙළවර පංචාංග තූර්ය භාණ්ඩ ඇතියෝය. ඔවුන්ගේ කෙළවර දුනු පෙලින් වට කරන ලද්දේය. ඔවුන්ගේ කෙළවර ඇත් සමූහය වේ. ඇතුන්ගේ කෙළවර ගෙලෙන් ගෙල ගැටෙන සේ වූ අශ්ව පන්තිය ය. අශ්වයන්ගේ කෙළවර එකට එක ඇඳුණු රථ පන්තිය ය. රථ කෙළවර තම තමන්ට අනුරූප වූ අබරණ සම්පතින් බබළන බලසේනා අටළොසය.

මෙලෙස යම් සේ පිරිසි කෙළවර සිට විදින ලද ඊ තලය රජතුමා වෙත නොපැමිණේ ද, එලෙස ජීවක වෛද්‍යාචාර්යතුමා රජතුමාගේ පිරිස සංවිධානය කොට එතුමා රජතුමාට නුදුරෙන් යයි. එසේ කරනු ලබන්නේ රජතුමාට යම් උවදුරක් ඇති වුවහොත් සියල්ලට පළමුව රජතුමාගේ ජීවිතය ආරක්‍ෂා කර දීම පිණිසය. ඒ රාත්‍රියෙහි දඬු වැට පන්දම් සියයක් ය, දහසක් ය, ලක්‍ෂයක් ය යැයි ගණන් සීමාවක් නැත. මේ රජතුමා මෙසේ වූ මහා ආරක්‍ෂා සංවිධාන මධ්‍යයෙහි මහත් වූ රාජ සෘද්ධියෙන් යුක්තව භාග්‍යවතුන් දකිනු පිණිස නික්මුණේ ය.

මෙසේ සම්මා සම්බුදුරජාණන් වහන්සේ දැකීම පිණිස මහ පිරිවරින් ජීවක අඹ වනය බලා නික්ම ගිය රජතුමාට මහත් භයක් වූයේ ය. කුමක් හෙයින් ද යත්?

රජගහ නුවර මහා දෙරටු දෙතිසක් ඇත. කුඩා දෙරටු සිවුසැටක් ඇත. ජීවක වෛද්‍යාචාර්‍ය්‍ය තුමාගේ අඹ උයන නුවර වට කළ ප්‍රාකාරයට ද ගිජ්ඣකූට පර්‍වතයට ද අතර පිහිටියේය. අජාසත්ත රජතුමා සපිරිවරින් තම රජ මාලිගයෙන් පිටත්ව නුවර නැගෙනහිර දෙරටුවෙන් නික්ම වේහාර පර්‍වතයෙහි සෙවනට පැමිණියේ ය. බැස යන සඳමඬල පර්‍වත මුඳුනින් වැසී තිබුණේ වේ. එබැවින් පර්‍වත සෙවනින් ද, රුක් සෙවනින් ද අන්ධකාර විය. මෙපමණ පිරිවර ජනයා ඇතිව යන කල්හි අඳුර බියට කරුණක් නොවේ. එදින දඬු වැට පන්දම් ලක්ෂ ගණනින් ද පමණ නැත. මේ ප්‍රදේශයෙහි අල්ප ශබ්ද ඇති බැවින් ද, ජීවක වෛද්‍යාචාර්‍ය්‍ය තුමා කෙරෙහි සැක ඇති බැවින් ද බියට පත්විය. මේ ගමන පැමිණීමට කලින් රජ මාලිගයෙහිදීම ම ජීවක වෛද්‍යාචාර්‍ය්‍ය තුමා රජතුමා අමතා **"මහරජතුමණි! භාග්‍යවතුන් වහන්සේ අල්ප ශබ්දයට කැමති සේක. එබැවින් අපි අල්ප ශබ්ද ඇතිව ම එහි එළඹිය යුතුය"** යැයි කීවේය. එබැවින් රජතුමා තූර්‍ය්‍ය වාද්‍ය භාණ්ඩයන් ගෙන ගියේ නමුත් වාදනය කිරීම වැළැක්වීය. උස් හඬින් වචන කථා නොකරමින් අසුරු සඤ්ඤවෙන් ගියහ. අඹ වනයෙහි ද බුද්ධ ප්‍රමුඛ එක්දහස් දෙසිය පණසක් ආර්‍ය්‍යයන් වහන්සේලා වැඩ සිටින නමුත් උගුර පාදන හෝ කහින හඬක්වත් නැත. රජවරු ශබ්දයෙහි ඇලුණෝම වෙති. එහි අල්ප ශබ්ද ඇති බැවින් කලකිරීමට පත්ව ජීවක වෛද්‍යාචාර්‍ය්‍ය තුමා කෙරෙහි සැක ඉපදවීය.

එකල්හි රජතුමා මෙසේ සිතීය. **"මේ ජීවක තම අඹ වනයෙහි බුද්ධ ප්‍රමුඛ එක්දහස් දෙසිය පණසක් භික්ෂූන් වහන්සේලා ඇතැයි කියයි. මෙහි කහින ශබ්ද මාත්‍රයක් වත් නැත. මෙය නොවිය හැකි දෙයකි. මේ ජීවක මා නගරයෙන් පිට කරවා පෙරටුව බලකාය රඳවා මා ජීවග්‍රහයෙන් ගෙන තමාගේ සේසත ඔසවනු කැමැත්තෙහි ය. මොහුට ඇතුන් පස් දෙනෙකුගේ කාය බල ඇත්තේ ය. මගේ ළඟින් ම යයි. මාගේ සමීපයෙහි ආයුධ ගත් අත් ඇති එක් පුරුෂයෙකු හෝ නැත. අහෝ මා හට දැන් අනර්‍ථයකි"** යැයි සිතා බියට පත්ව තැති ගෙන ලොමුඩැහැ ගැන්වී නොබිය වූවෙකු ලෙස සිටීමට ද නොහැකිව ජීවක වෛද්‍යාචාර්‍ය්‍යතුමා අමතා **"යහළු ජීවකය, කෙසේ ද? නුඹ මා වඤ්චා කළා නොවේ ද? යහළු ජීවකය, නැති දේ ඇතැයි කියා මා රැවටුවා නොවේ ද? යහළු ජීවකය මා සතුරන්ට පාවාදුන්නා නොවේ ද? එක් දහස් දෙසිය පනසක් පමණ වූ මහා භික්ෂු සංඝයා සිටින්නාහු නම්**

**කිවිසුම් ශබ්දයක් හෝ කැරුම් ශබ්දයක් හෝ කථා ශබ්දයක් හෝ කුමක් නිසා නො ඇසෙන්නාහු ද"** ඇසුවේ ය.

එවිට ජීවක වෛද්‍යාචාර්‍යතුමා රජතුමා අමතා "**මහ රජතුමනි, බිය නොවන්න දේවයන් වහන්ස, ඔබ වඤ්චා නොකරමි. දේවයන් වහන්ස, ඔබ බොරුවෙන් නොරවටමි. දේවයන් වහන්ස, ඔබ සතුරන්ට පාවා නොදෙමි. මහ රජතුමනි, ඉදිරියට යන්න. මහ රජතුමනි, ඉදිරියට යන්න**[1]**. මහ රජතුමනි සොර බලමුළු සිටින තැන්හි පහන් දල්වා නොසිටියි. මේ චක්‍රාකාර ශාලාවෙහි පහන් දැල්වෙයි. රජතුමනි මේ පහන් ආලෝකය බලා ඉදිරියට යන්න**" යැයි කීවේය.

## ❄ අජාසත් රජතුමා ශ්‍රමණ ඵල විචාරීම

ඉන් පසු අජාසත්ත රජතුමා හස්ති යානයෙන් යා හැකි තාක් දුර ගොස්, අඹ උයනෙහි පිටත දොර කොටුවෙහි දී ඇතුපිටින් බැස පා ගමනින් ම චක්‍රාකාර ශාලාවේ දොර ලඟට එළඹියේ ය. එකල්හි මණ්ඩල මාල භූමියෙහි එලා ඇති කලාලයෙහිදී ම භාග්‍යවතුන් වහන්සේගේ තේජස රජතුමාගේ සිරුර පුරා පැතිර ගියේය. රජතුමාගේ සිරුර පුරා දහදිය ගලන්නට විය. හැඳසිටි ඇඳුම් ඉවත් කළ යුතු සේ විය. එවිට රජතුමා තමාගේ අපරාධය සිහිකළේය. එවිට මහත් බියක් උපන්නේය. ඉන් පසු රජතුමාට සෘජු ව භාග්‍යවතුන් වහන්සේ වෙත යාමට නොහැකිව ජීවක වෛද්‍යාචාර්‍යතුමාගේ අතින් අල්ලාගෙන ආරාම චාරිකාවෙහි හැසිරෙන්නකු මෙන් "**මිත්‍ර ජීවකය, මෙය නුඹ කළ හොඳ දෙයකි**" යැයි කියමින් විහාරයෙහි ගුණ කියමින් අනුක්‍රමයෙන් මණ්ඩල මාලයට පැමිණියේ ය.

මේ රජතුමා තරුණ කල්හි බිම්බිසාර පිය මහ රජතුමා සමග ගොස් භාග්‍යවතුන් වහන්සේ දුටු විරූය. පසුව පාප මිත්‍ර ආශ්‍රයෙන් පියා මැරීම සිදු කොට, භාග්‍යවතුන් වහන්සේ නැසීමට දුනුවායන් යවා, ධනපාල හස්තියා මුදා හරවා, මහා අපරාධකාරයෙකු වී භාග්‍යවතුන්

---

[1] වරක් කී විට දැඩි නොවේ යැයි තදින් දෙවරක් කීවේ ය.

වහන්සේ හමුවීමට නො පැමිණි බැවින් ද, නොහඳුනන බැවින් ජීවක වෛද්‍යාචාර්‍යතුමා අමතා "**යහළු ජීවකය, භාග්‍යවතුන් වහන්සේ කොතැන වැඩ සිටින සේක් ද**" යැයි ඇසුවේ ය. එසේ භාග්‍යවතුන් වහන්සේ නොහඳුනන්නේ නමුත් දැක නොහැඳිනගැනීමට කරුණක් නොවේ. මක් නිසා ද යත්? ඒ භාග්‍යවතුන් වහන්සේ දෙතිසක් මහ ලකුණෙන් ද, අසූවක් කුඩා ලකුණෙන් ද සැරසී සවනක් රැසින් මුළු ආරාමය බබුළුවා තරු ගණයා පිරිවැරූ පූර්ණ චන්ද්‍රයා මෙන් භික්ෂු ගණයා පිරිවරා මණ්ඩල මාලය මධ්‍යයෙහි වැඩහුන් සේක. මෙසේ වූ භාග්‍යවතුන් වහන්සේ හැඳිනීමට කවරෙක් නම් නොදනිත් ද? මේ රජතුමා තමාගේ ආශ්චර්‍ය ලීලාවෙන් ම "**යහළු ජීවකය, භාග්‍යවතුන් වහන්සේ කොතැන වැඩ සිටින සේක් ද**" යැයි ඇසුවේ ය. මෙය රාජ කුලයන්ගේ ස්වභාවයයි. යමක් දැනගෙන ද නොදන්නවුන් මෙන් අසති.

එවිට ජීවක වෛද්‍යාචාර්‍යතුමා මෙසේ සිතුවේ ය. "**මේ රජතුමා පොළොවෙහි සිට පොළොව කොහෙද යැයි අසන්නාක් මෙන් ද, අහස දෙස බලා සඳ - හිරු කොහෙද යැයි මහමෙර පාමුල සිට අසන්නෙකු මෙන් ද, දසබලධාරින් වහන්සේ ඉදිරියෙහි සිට භාග්‍යවතුන් වහන්සේ කොහෙද යැයි අසයි**" මේ රජතුමාට දැන් භාග්‍යවතුන් වහන්සේ පෙන්වමි යැයි සිතා භාග්‍යවතුන් වහන්සේ වැඩසිටි දිසාවට ඇඳිලි ප්‍රණාමය කොට "**මහරජ මේ භාග්‍යවතුන් වහන්සේ ය, මහරජ, මේ භාග්‍යවතුන් වහන්සේ ය, මහරජ, මැද කණුව ඇසුරු කොට නැගෙනහිර දෙස බලා භික්ෂු සංඝයා පිරිවරා වැඩ සිටින්නේ භාග්‍යවතුන් වහන්සේ ය**" යැයි කීවේය.

එවිට රජතුමා භාග්‍යවතුන් වහන්සේ වැඩ හිඳින තැනට පැමිණියේ ය. පැමිණ පිටුපසින් ද නොසිට, ඉදිරියෙන් ද නොසිට, ඉතා ආසන්නයේ ද නොසිට, ඉතා දුර ද නොසිට, බිත්ති ආදියට සමීපයෙහි ද නොසිට, උඩු සුළඟෙහි ද නොසිට, ඉතා පහත් තැනක ද නොසිට, උස් තැනක ද නොසිට වම් පසින් හෝ දකුණු පසින් එක් පසෙක සිට භාග්‍යවතුන් වහන්සේට වැඳ සර්වාලංකාරයෙන් සැරසී පැමිණි රජතුමා දෙස හෝ අන් රජ පිරිස දෙස හෝ බැලීමක් නැතිව හාත්පසින් ම සන්සුන් වූ එක භික්ෂුවක ගේ වත් අත් සෙලවීමක් පා සෙලවීමක් නැතිව භාග්‍යවතුන් වහන්සේ දෙසම එකලෙසම බලා සිටින අතිශයින් ම නිශ්ශබ්ද වූ පිරිසිදු විලක් මෙන් ප්‍රසන්න ඉන්ද්‍රියයන් ඇත්තා වූ භික්ෂු

සංඝයා දෙස නැවත නැවත බලා, "**දැන් මේ භික්ෂු සංඝයා යම් කායික වාචසික මානසික උපශාන්ත සංසිඳීමකින් යුක්ත වේද මාගේ පුත්‍ර වූ උදයභද්‍ර කුමාරයා ද ඉන්ද්‍රිය දමනය කර ගැනීමෙන් යුක්ත වේවා**" යැයි ප්‍රීති වාක්‍යයක් පහළ කෙළේය.

මේ අජාසත්ත රජතුමා උපශාන්ත භික්ෂු සංඝයා දැක මෙසේ ප්‍රීති වාක්‍යයක් පහල කළේ තම පුත්‍රයා බුද්ධ ශාසනයෙහි පැවිදිව සිටිනු දැකීමට ම නොවේ. මේ රජතුමාට භික්ෂු සංඝයා දැක තම පුත්‍රයා සිහි විය. දුබල දෙයක ලැබුණු තැනැත්තාට ආශ්චර්‍යවත් දෙයක් ලැබුණු විට ප්‍රිය වූ ඤාති මිත්‍රාදීන් සිහිවීම ලෝකයාගේ ස්වභාවයකි. එබැවින් ආශ්චර්‍යවත් භික්ෂු සංඝයා දැක තම පුත්‍රයා සිහි වී ඔහු ද මේ භික්ෂු සංඝයා මෙන් සන්සිඳීමට පත්වේවා යැයි කීවේය. කුමක් පිණිස මෙසේ කීයේ ද?

රජතුමා තම පුත්‍රයා කෙරෙහි සැක ඇතිව ඔහුගේ උපසමය (සන්සිඳීම) කැමැත්තෙන් මෙසේ කීවේය. රජතුමාට මෙසේ සිතුනේය. මාගේ පුත්‍රයා යම් දවසක මෙසේ අසන්නේ ය. "**මාගේ පියා තරුණය, මාගේ මුත්තා කොහි ද? එතුමා ඔබගේ පියා විසින් මරණ ලද්දේය යැයි අසා මම ද මාගේ පියා මරා රජය ලබන්නේ නම් යෙහෙක යැයි සිතන්නේ ය.**" එබැවින් පුත්‍රයා කෙරෙහි සැක ඇතිව ඔහුගේ උපසමය (සන්සිඳීම) කැමැත්තෙන් මෙසේ කීවේය. පසුව එම පුත්‍රයා අජාසත්ත රජතුමා ඝාතනය කොට රාජ්‍යයට පත්විය. ඒ වංශයෙහි පියා මැරීම පරම්පරා පසක් ම ගියේය.

අජාසත් කුමරු බිම්බිසාර රජතුමා ඝාතනය කළේ ය. උදයභද්‍ර කුමාරයා අජාසත්ත රජු ඝාතනය කළේ ය. ඔහුගේ පුත්‍රයා වූ මහාමුණ්ඩ කුමාරයා උදයභද්‍ර රජු ඝාතනය කළේ ය. ඔහුගේ පුත්‍ර වූ අනුරුද්ධ කුමාරයා මහාමුණ්ඩ රජු ඝාතනය කළේ ය. ඔහුගේ පුත්‍ර වූ නාගදාස කුමාරයා අනුරුද්ධ රජු ඝාතනය කළේ ය. මේ රජවරු වංශය විනාශ කරන්නෝ ය. මොවුන්ගෙන් ඇති ප්‍රයෝජනය කිම්ද යැයි රාජ්‍යවාසීහු කිපී නාගදාස රජු ඝාතනය කොට කාලාශෝක ඇමති රාජ්‍යයෙහි පිහිටුවීය.

භාග්‍යවතුන් වහන්සේ අජාසත් රජතුමා අමතා **"මහරජ, භික්ෂු සංඝයා බලා තොපගේ සිත ප්‍රේමය ඇති තැන කරා ගියේ වේද?"** යැයි ඇසූ සේක. කුමක් හෙයින් භාග්‍යවතුන් වහන්සේ රජතුමාට මෙසේ කී සේක් ද? රජතුමා මෙහි පැමිණ කථා නොකොට නිහඬව කුමක් සිතමින් සිටින්නේ ද? යැයි තම නුවණින් බලා රජතුමාගේ සිතෙහි පැවති අදහස දැන මෙසේ සිතූ සේක. **"මොහු මා සමග කථා කිරීමට නොහැකිව භික්ෂු සංඝයා දෙස බලා පුත්‍රයා සිහිකළේය. මොහුට මා කථා නොකළහොත් කිසිවක් කියන්නට අසමත් ය. එබැවින් දැන් මම මොහු සමග කථා කරමි"** යැයි සිතා භික්ෂු සංඝයා පිළිබඳව රජතුමා කළ ප්‍රීති වාක්‍යයත් සමගම භාග්‍යවතුන් වහන්සේ රජතුමා අමතා **"මහරජ, භික්ෂු සංඝයා බලා තොපගේ සිත ප්‍රේමය ඇති තැන කරා ගියේ වේද?"** යැයි වදාළ සේක. එහි අර්ථය නම් "මහරජ උස් තැනකට වැටුණු වැසි ජලය යම් තැනක නිම්නයක් වේ ද, එතැනට ගලා යයි ද, එසේම සීලාදී වූ අප්‍රමාණ ගුණයන්ගෙන් යුත් භික්ෂු සංඝයා දෙස බලා යම් තැනක ප්‍රේමය වේ ද එතැනට පැමිණියේ ය" යනුයි.

ඉක්බිති රජතුමාට මෙසේ අදහසක් ඇතිවිය. **"බුදුගුණ ආශ්චර්‍යය. පුදුමය. භාග්‍යවතුන් වහන්සේට මා වැනි අපරාධකාරයෙකු නම් තවත් නැත. මම භාග්‍යවතුන් වහන්සේගේ අග්‍ර උපස්ථායකයාගේ ඝාතකයා වෙමි. දේවදත්ත තෙරුන්ගේ කීම අසා භාග්‍යවතුන් වහන්සේ නැසීමට දුනුවායන් යැවුවෙමි. නාළාගිරි ඇතා මුදා හරින ලදි. මගේ උපකාර ඇතිව දේවදත්ත තෙරුන් භාග්‍යවතුන් වහන්සේ නැසීමට ගල් පෙරලන ලදි. මෙසේ මහා අපරාධකාරයෙකු වූ මා හට කථා කරන දසබලධාරින් වහන්සේගේ මුව නොපොහොනේය. භාග්‍යවතුන් වහන්සේ පස් අයුරකින් තාදී ලක්ෂණයෙහි පිහිටි සේක. මෙබඳු ශාස්තෘන් වහන්සේ නමක් හැර අන් ශාස්තෘවරයෙකු බැහැරින් නො සොයන්නෙමි"** යැයි සොම්නසට පැමිණ භාග්‍යවතුන් වහන්සේ අමතා **"ස්වාමීනි, උදයභද්‍ර කුමාරයා මට ප්‍රිය ය, ස්වාමීනි, දැන් මේ භික්ෂු සංඝයා යම් ඉන්ද්‍රියයන් දමනය කර ගැනීමකින් යුක්ත ද, උදයභද්‍ර කුමරු ද එසේම ඉන්ද්‍රිය දමනය කර ගැනීමෙන් යුක්ත වේවා"** යැයි මෙසේ කීවේය.

ඉන් පසු අජාසත්ත රජතුමා භාග්‍යවතුන් වහන්සේට මනාකොට වැඳ, මෙසේ සිතුවේ ය. මම භාග්‍යවතුන් වහන්සේට වැඳ

ඒ ඒ තැන්වලට ගොස් භික්ෂු සංඝයා වඳින්නෙම් නම් භාග්‍යවතුන් වහන්සේට පිටු පෑමට සිදුවෙයි. මෙය ගරු කිරීමක් නොවේ. රජුන් වැඳ යුවරජුන් වඳින කල්හි මහ රජුට අගෞරවයක් කරන ලද්දේ වෙයි යැයි සිතා එතැන හිඳම භික්ෂු සංඝයාට දෑත එකතු කොට වැඳ, එකත්පසෙක හුන්නේය.

එසේ හුන්නා වූ අජාසත් රජතුමා භාග්‍යවතුන් වහන්සේ අමතා **"ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස, දැන් ප්‍රශ්නයක් ඇසීමට අවසර දෙන්නේ නම්, භාග්‍යවතුන් වහන්සේගෙන් කිසියම් ප්‍රශ්නයක් අසමි"** යැයි කීවේය.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ රජතුමාට ප්‍රශ්න ඇසීමේ උත්සාහය ඇති කරවමින් **"මහරජ, නුඹ යමක් අසනු කැමැත්තෙහි නම් එය අසන්න. ප්‍රශ්න විසඳීමෙහි මට බරක් නැත. නුඹ අසන සියල්ල විසඳ දෙන්නෙමි"** යැයි වදරා සර්වඥ පවාරණය කළ සේක. පසේ බුදුරජාණන් වහන්සේලාට හා අග්‍ර ශ්‍රාවක, මහා ශ්‍රාවක රහතන් වහන්සේලාට මෙය අවිෂය ය. (මෙසේ පැවරීම කළ නොහැකි වෙති). ඒ උතුමන් වහන්සේලා කැමති නම් අසන්න යැයි නොකියයි. ඇසූ කල්හි විසඳමි යැයි කියයි. මෙසේ භාග්‍යවතුන් වහන්සේ සර්වඥ පවාරණය කළ කල්හි අතිශයින් සතුටට පත් රජතුමා මෙලෙස ප්‍රශ්නයක් ඇසුවේ ය.

"ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස, ජීවිකාව පිණිස හේතු වූ බොහෝ ශිල්පයන්හි යෙදෙන්නෝ වෙති. එනම්: ඇතුන් හික්මවන්නෝ ද, ඇතුන්ට බෙහෙත් කරන්නෝ ද, ඇත්පොර මෙහෙයවන්නෝ ද වෙති. අශ්වයන් පදවන්නෝ ද, අශ්වයන්ට බෙහෙත් කරන්නෝ ද, අශ්ව පොර මෙහෙයවන්නෝ ද වෙති. රථ රියදුරෝ ද, රථ යෝධයෝ ද, රථ රකින්නෝ ද වෙති. දුනු ඇදුරෝ ද, දුනුවායෝ ද වෙති. යුද්ධයෙහි දී පෙරටුව ජයකොඩි ගෙන යන්නෝ වෙති. මෙතන අසවල් අමාත්‍යයාගේ තැනය ආදී ලෙස සේනාවේ ස්ථාන නියම කරන්නෝ වෙති. යුද පිණිස නික්මෙන මහා යෝධයෝ වෙති. යුද කරන ක්ෂත්‍රියයෝ වෙති. (ඔට්ටු අල්ලා) සතුරන්ගේ හිස් ආදිය ගෙන එන්නෝ වෙති. ඇතෙකුට වුවත් පසු නොබස්නා මහා යෝධයෝ වෙති. සංග්‍රාම ශූරයෝ නම් යුද දක්ෂයෝ වෙති. හම් හැට්ට ඇඳ හෝ පලිහ ගෙන යුද

කරන්නෝ වෙති. මෙහෙකරුවෝ වෙති. කෑම සපයන්නෝ වෙති. රැවුල් කපන්නෝ වෙති. නාවන්නෝ වෙති. ආහාර පිසින්නෝ වෙති. කම්හල්කරුවෝ වෙති. රෙදි සෝදන්නෝ වෙති. රෙදි වියන්නෝ ද වේවැල් ආදියෙන් වැඩ කරන්නෝ ද වෙති. වලන් සාදන්නෝ වෙති. නැකැත්කරුවෝ වෙති. හස්ත මුද්‍රා ගණන් සාදමින් ජීවත් වෙන්නෝ වෙති. මේ හැර තවත් බොහෝ ශිල්පයෝ ද වෙති. ඒ ශිල්පයන් දක්වා මේ ආත්මයේ ම තමා විසින් දැක්ක හැකි ශිල්ප ඵලය නිසා ජීවත් වෙති. ඔවුහු ඉන් තම ජීවිතය සුවපත් කෙරෙති, පිනවීම කෙරෙති, දරුවන් සහ භාර්‍යාව සුවපත් කෙරෙති, පිනවීම කෙරෙති. මිත්‍රයින් සුවපත් කෙරෙති, පිනවීම කෙරෙති. මත්තෙහි ඵල දෙන ස්වර්ගයට පමුණුවන සැප විපාක උපදවන දනය මහණ බමුණන් කෙරෙහි පිහිටුවති"

ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස, ගිහි කර්මාන්ත හේතුවෙන් ඉහාත්මයෙහිම ධන ධාන්‍ය වස්තු ඉපදවීම අඹු දරුවන් මවපිය ඤාතීන් පෝෂණය කිරීමාදී ඵල ලැබිය හැකිවන්නාක් මෙන් මේ මහණ දම් පිරීමෙන් මේ ආත්ම භාවයෙහි දැක්ක හැකි වූ විපාක ඵලයක් දක්වන්නට හැකි වේ ද?

රජතුමා මේ ප්‍රශ්නය ඇසූ කල්හි එය නොවිසඳ භාග්‍යවතුන් වහන්සේ මෙසේ සිතූ සේක. "මේ බොහෝ අන්‍ය තීර්ථක ශ්‍රාවක වූ රාජ අමාත්‍යයෝ මෙහි පැමිණ ඇත. ඔවුහු නිවැරදි මාර්ගයෙන් බැහැර ශ්‍රමණ ප්‍රතිපත්තීන් හි සුගතියට හෝ නිවනට මගක් නැති බව පෙන්වමින් එහි ආදීනව දක්වමින් කියන කල්හි ද, නිවැරදි ආර්‍ය මාර්ගය දක්වමින් බුදු සසුනෙහි ඇති නෛර්‍යාණික ප්‍රතිපදවෙහි ආනිශංස දක්වමින් සුගති මග, නිවන් මග දක්වා කියන කල්හි ද, "**අපගේ රජතුමා මහත් උත්සාහයෙන් මෙහි පැමිණියේ ය. රජතුමා පැමිණි තැන් පටන් ශ්‍රමණ ගෞතම තෙමේ ශ්‍රමණ ප්‍රතිපත්තීන් හි මතවාද හා ඒවායෙහි ඇති පරස්පරතාවයන් දක්වමින් ශ්‍රමණ කෝලාහලයම කරයි. මෙනම් මතවාද ඇත්තවුන්ගේ මේ මතය දෙස් සහිතය, මෙනම් මතවාද ඇත්තවුන්ගේ මේ මතය දෙස් සහිතය යනුවෙන් අන් පැවිද්දන් පහත් කොට දක්වමින් මේ සසුනෙහි පැවිද්ද උසස් කොට දක්වමින් ශ්‍රමණ සොරකමම කරයි**" යැයි උද්ඝෝෂණය කරති. සකස්කොට ධර්මය ඇසීමට නොදෙති. රජතුමා ලවා කියවන කල්හි උද්ඝෝෂණය කිරීමට නොහැකි වෙති. එවිට රජතුමාට ම අනුවර්තනය වන්නාහුය. තව ද මේ ලෝකය ධනයට

අනුවර්තනය වන්නකි. එබැවින් මම දූන් බුදු සසුනෙන් බැහැර අන්‍ය පැවිද්දන් ගේ තතු හෙළි කිරීමට රජුට ම බාරදෙමි" යැයි රජතුමා අමතා **"මහරජ, ඔබ මේ ප්‍රශ්නය අන් මහණ බමුණන්ගෙනුත් ඇසුවා නොවේ ද? එසේ ඇසූ බව හොඳින් දන්නෙහි ද? ඔබට එසේ ඇසූ බවක් අමතක නැත්තෙහි ද?"** යැයි අසා වදාළ සේක.

එවිට අජාසත් රජතුමා **"ස්වාමීනි, මේ ප්‍රශ්නය වෙනත් මහණ බමුණන්ගෙන් ඇසූ බව දනිමි. එසේ ඇසූ බව අමතක නැත"** යැයි පිළිතුරු දුන්නේ ය.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ **"මහරජ, ඔවුහු එය යම් අයුරකින් විසඳුවෙහි ද? එලෙස මෙහි දී කීමට බැරි කමක් නැත්තෙහි ද? ඉඳින් ඔබට අපහසුවක් නොවේ නම් කියව"** යැයි වදාළ සේක.

එවිට රජතුමා **"ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ හෝ භාග්‍යවතුන් වහන්සේ බඳු අන්‍යයෝ හෝ යම් තැනක වෙත් ද, එබඳු උතුමන් ඉදිරියෙහි කියන්නට අපහසු නොවේ"** යැයි පිළිතුරු දුන්නේ ය.

මෙලෙස රජතුමා කුමක් සඳහා කීයේ ද යත්? පණ්ඩිත ප්‍රතිරූපකයන් (පණ්ඩිතයන් මෙන් පෙනී සිටින්නන්) හමුවෙහි කීම දුක් සහිත වෙයි. කුමක් නිසා ද යත්? ඔවුහු පදයෙන් පදය අකුරින් අකුර දෙස් ම කියති. ඒකාන්තයෙන් සැබෑ පඬිවරු කථාව අසා හොඳින් කියූ දෙය පසසත්. වරදවා කියූ දෙය අසා එය නිවැරදි කොට කියත්. ලොව භාග්‍යවතුන් වහන්සේ හා සමාන ඒකාන්ත පඬිවරයෙකු නැත්තේම ය. එසේ හෙයින් රජතුමා **"ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ හෝ භාග්‍යවතුන් වහන්සේ බඳු අන්‍යයෝ හෝ යම් තැනක වෙත් ද, එබඳු උතුමන් ඉදිරියෙහි කියන්නට අපහසු නොවේ"** යැයි කීවේය.

එවිට භාග්‍යවතුන් වහන්සේ **"මහරජ, එසේ නම් කියනු මැනව"** යැයි වදාළ සේක.

## ☸ පූර්ණ කාශ්‍යපගේ වාද

එවිට රජතුමා මෙසේ කීවේය. ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස, මම එක් දිනක් පූර්ණ කාශ්‍යපයන් යම් තැනක ද එතැනට පැමිණ, ඔහු සමග සතුටු සාමීචි කථා කළෙමි. සතුට උපදවන්නා වූ, සිහි කටයුතු කථා නිම කොට එකත්පසෙක හුන්නෙමි. ස්වාමීනි. එසේ හුන් මම පූර්ණ කාශ්‍යපයන්ට මෙසේ කීවෙමි.

පින්වත් කාශ්‍යපය, ජීවිකාව පිණිස හේතු වූ බොහෝ ශිල්පයන්හි යෙදෙන්නෝ වෙති. එනම්ඃ ඇතුන් හික්මවන්නෝ ද, ඇතුන්ට බෙහෙත් කරන්නෝ ද, ඇත්පොර මෙහෙයවන්නෝ ද වෙති. අශ්වයන් පදවන්නෝ ද, අශ්වයන්ට බෙහෙත් කරන්නෝ ද, අශ්ව පොර මෙහෙයවන්නෝ ද වෙති. රථ රියදුරෝ ද, රථ යෝධයෝ ද, රථ රකින්නෝ ද වෙති. දුනු ඇදුරෝ ද, දුනුවායෝ ද වෙති. යුද්ධයෙහි දී පෙරටුව ජයකොඩි ගෙන යන්නෝ වෙති. මෙතන අසවල් අමාත්‍යයාගේ තැනය ආදී ලෙස සේනාවේ ස්ථාන නියම කරන්නෝ වෙති. යුද පිණිස නික්මෙන මහා යෝධයෝ වෙති. යුද කරන ක්‍ෂත්‍රියයෝ වෙති. (ඔට්ටු අල්ලා) සතුරන්ගේ හිස් ආදිය ගෙන එන්නෝ වෙති. ඇතෙකුට වුවත් පසු නොබස්නා මහා යෝධයෝ වෙති. සංග්‍රාම ශූරයෝ නම් යුද දක්‍ෂයෝ වෙති. හම් හැට්ට ඇඳ හෝ පලිහ ගෙන යුද කරන්නෝ වෙති. මෙහෙකරුවෝ වෙති. කෑම සපයන්නෝ වෙති. රැවුල් කපන්නෝ වෙති. නාවන්නෝ වෙති. ආහාර පිසින්නෝ වෙති. කම්හල්කරුවෝ වෙති. රෙදි සෝදන්නෝ වෙති. රෙදි වියන්නෝ ද වේවැල් ආදියෙන් වැඩ කරන්නෝ ද වෙති. වලන් සාදන්නෝ වෙති. නැකැත්කරුවෝ වෙති. හස්ත මුද්‍රා ගණන් සාදමින් ජීවත් වෙන්නෝ වෙති. මේ හැර තවත් බොහෝ ශිල්පයෝ ද වෙති. ඒ ශිල්පයන් දක්වා මේ ආත්මයේ ම තමා විසින් දැක්ක හැකි ශිල්ප ඵලය නිසා ජීවත් වෙති. ඔවුහු ඉන් තම ජීවිතය සුවපත් කෙරෙති, පිනවීම කෙරෙති, දරුවන් සහ භාර්‍ය්‍යාව සුවපත් කෙරෙති, පිනවීම කෙරෙති. මිත්‍රයින් සුවපත් කෙරෙති, පිනවීම කෙරෙති. මත්තෙහි ඵල දෙන ස්වර්ගයට පමුණුවන සැප විපාක උපදවන දනය මහණ බමුණන් කෙරෙහි පිහිටුවති”

පින්වත් කාශ්‍යපය, ගිහි කර්මාන්ත හේතුවෙන් ඉහාත්මයෙහිම ධන ධාන්‍ය වස්තු ඉපදවීම, අඹු දරුවන් මවපිය ඥාතීන් පෝෂණය

කිරීමාදී ඵල ලැබිය හැකිවන්නාක් මෙන්, මේ මහණ දම් පිරීමෙන් මේ ආත්ම භාවයෙහි දක්ක හැකි වූ විපාක ඵලයක් දක්වන්නට හැකි වේද?"

ස්වාමීනි, මා මෙසේ කී කල පූර්ණකාශ්‍යපයෝ මට මෙසේ කීවේය. කෙසේ ද යත්?

මහරජ, සිය අතින් ප්‍රාණඝාතාදිය කරන්නා හට ද, අණ දී අනුන් ලවා කරවන්නා හට ද, අත් පා ආදිය කපන්නා හට ද, අනුන් ලවා කප්පවන්නා හට ද, අනුන් දඬු ආදියෙන් පෙළන්නා හට ද, එසේ පරපීඩා කරවන්නා හට ද, තමන් ම පර සන්තක බඩු ආදිය පැහැර ගෙන අනුන්ට ශෝක ඇති කරන්නා හට ද, එලෙස ම අනුන් ලවා ශෝක ඇති කරවන්නා හට ද, ආහාර වැළැක්වීම් ආදියෙන් අනුන් වෙහෙසවන්නා හට ද, එසේම අනුන් ලවා වෙහෙස කරවන්නා හට ද, ප්‍රාණ හිංසා කරන්නාහට ද, එසේම අනුන් ලවා කරවන්නා හට ද, නුදුන් දෙය ගන්නා හට ද, ගෙවල් බිඳින්නා හට ද, කිසිවක් ඉතිරි නොකොට පැහැර ගන්නා හට ද, අනුන් ලවා එසේ කරවන්නහුට ද, එක් ගෙයක් වට කොට උපද්‍රව කොට එහි ඇති බඩු පැහැර ගන්නහුට ද, මඟ රැක සිට එහි යන්නවුන්ගේ බඩු පැහැර ගන්නවුන්ට ද, පර අඹුවන් කරා යන්නා හට ද, බොරු කියන්නා හට ද මෙසේ පව් කරමි යැයි සිතා යමක් කරන්නාට පව් සිදු නොවේ.

තවද යමෙක් කර කැත්තක් සේ තියුණු නිම් වලල්ලක් ඇති චක්‍රයකින් මේ පොළොවෙහි වසන (සියලු) සත්වයන් මරා එකම මස් ගොඩක් එකම මස් පිඬක් කරන්නේ ද, ඒ හේතුවෙන් පවක් නැත්තේ ය, පාපයාගේ පැමිණීමක් නැත්තේ ය. (සත්වයන්) හිංසා කරමින්, කරවමින්, සිඳිමින්, සිඳවමින්, පීඩා කරමින්, කරවමින් ඒ හේතු කොට ද සිදුවන පාපයක් නැත්තේ ය, පාපයාගේ පැමිණීමක් නැත්තේ ය.

එසේම සතුන් මරමින්, අනුන් ලවා මරවමින්, අත පා සිඳිමින්, අනුන් ලවා සිඳුවමින්, අන්‍යයන් පෙලමින්, අනුන් ලවා පෙලවමින්, ගංගා නදියේ දකුණු තෙරට[1] යන්නේ නමුත් ඒ හේතුවෙන් පවක් නැත.

[1] දකුණු දිසාවෙහි මනුෂ්‍යයෝ කර්කශ දරුණු ය එබැවින් මෙසේ කීවේය.

එසේම දන් දෙමින්, අනුන් ලවා දෙවමින්, යාග කරමින්, අනුන් ලවා කරවමින් ගංගා නදියෙහි උතුරු තෙරට[1] යන්නේ නමුත් ඒ හේතුවෙන් ද පිනක් නැත්තේ ය. පුණ්‍යයාගේ වැඩීමක් නැත්තේ ය. (දන්) දීමෙන් ද, ඉන්ද්‍රිය සංවරයෙන්, සීල් රැකීමෙන් සත්‍ය ප්‍රකාශ කිරීමෙන් පිනක් නැත්තේ ය. පුණ්‍යයාගේ පැමිණීමක් නැත්තේ ය යැයි කීවේය. මෙලෙස හාත්පසින් ම පින් පව් ප්‍රතික්ෂේපය කීවේය.

ස්වාමීනි, මෙසේ මා විසින් මේ ආත්ම භාවයෙහි දැක්ක හැකි වූ විපාක ඵලයක් දක්වන්නට හැකි වේ ද? යැයි ඇසූ විට පූර්ණකාශ්‍යපයෝ නොකිරීම[2] ප්‍රකාශ කෙළේය. ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස, අඹ ගස කෙබඳු ද, අඹ ගසේ කොළ ගෙඩි කඳ කෙබඳු ද යැයි ඇසූ විට, දෙල් ගස මෙබඳුය, දෙල් කොළ ගෙඩි කඳ මෙබඳුය යැයි කියන්නාක් මෙන්, දෙල් ගස කෙබඳු ද, දෙල් ගසේ කොළ ගෙඩි කඳ කෙබඳු ද යැයි ඇසූ විට, අඹ ගස මෙබඳුය, අඹ ගසේ කොළ ගෙඩි කඳ මෙබඳුය යැයි කියන්නාක් මෙන්, ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස, එපරිද්දෙන්ම මා විසින් මේ ආත්ම භාවයෙහි දැක්ක හැකි වූ විපාක ඵලයක් දක්වන්නට හැකි වේ ද? යැයි ඇසූ විට පූර්ණකාශ්‍යපයෝ නොකිරීම ප්‍රකාශ කෙළේය.

ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස, එවිට මට මෙබඳු අදහසක් විය. මා වැනි රජෙකු සිය අණ පවත්නා පෙදෙසෙහි වසන මහණෙකු හෝ බමුණෙකු වෙහෙසිය යුත්තකු (රටින්) නෙරපිය යුත්තකු කොට කෙසේ නම් සිතන්නේ ද? යනුයි. ස්වාමීනි, එබැවින් මම පූර්ණකාශ්‍යපයන්ගේ කථාවට නොමසතුටු වීමි. ප්‍රශංසා ද නොකොට, ප්‍රතික්ෂේප ද නොකොට නොසතුටු සිත් ඇතිව නොසතුටු වචන නොකියා (කාශ්‍යපයන්ගේ) ඒ වචනය සාර වශයෙන් නොගෙන, ඒ කීම නොපිළිගෙන හුන් ආසනයෙන් නැගිට ගියෙමි.

---

[1] උතුරු දිසාවෙහි මනුෂ්‍යයෝ ශ්‍රද්ධා ඇත්තෝ ය. ප්‍රසන්න වූවෝ ය. රත්නත්‍රය විෂයයෙහි ගෞරව ඇත්තෝ ය එබැවින් මෙසේ කීවේය.

[2] අකිරිය වාදය

## ☸ මක්ඛලිගොසාලගේ වාද

ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස, මම එක් දිනක මක්ඛලිගොසාලයන් වෙතට පැමිණ ඔහු සමග සතුටු සාමීචියෙහි යෙදී සතුට උපදවන සිහි කටයුතු කථා කොට නිමවා එකත් පසෙකට වී හුන්නෙමි. එසේ හුන් මම මක්ඛලිගොසාලයන්ට මෙසේ කීවෙමි. කෙසේ ද යත් :-

භවත් ගොසාලය, යම් සේ "ජීවිකාව පිණිස හේතු වූ බොහෝ ශිල්පයෝ වෙති. එනම්ඃ ඇතුන් හික්මවන්නෝ, පෙ... මත්තෙහි ඵල දෙන ස්වර්ගයට පමුණුවන සැප විපාක උපදවන දනය මහණ බමුණන් කෙරෙහි පිහිටුවති"

භවත් ගොසාලය, ගිහි කර්මාන්ත හේතුවෙන් ඉහාත්මයෙහිම ධන ධාන්‍ය වස්තු ඉපදවීම අඹු දරුවන් මව්පිය ඥාතීන් පෝෂණය කිරීමාදී ඵල ලැබිය හැකිවන්නාක් මෙන් මේ මහණ දම් පිරීමෙන් මේ ආත්ම භාවයෙහි දැක්ක හැකි වූ විපාක ඵලයක් දක්වන්නට හැකි වේද?"

ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස, මා මෙසේ ඇසූ කල්හි මක්ඛලි ගොසාල මට මෙය කීවේය.

මහරජ, සත්ත්වයන්ගේ කෙලෙසීමට (පිරිහීමට) හේතුවක්, ප්‍රත්‍යයක් නැත්තේ ය. හේතු රහිතව සත්ත්වයෝ කෙලෙසෙත්. සත්ත්වයන්ගේ පිරිසිදු වීමට හේතුවක්, ප්‍රත්‍යයක් නැත්තේය. හෙතු රහිතව ප්‍රත්‍යය රහිතව සත්ත්වයෝ පිරිසිදු වෙත්. තමා විසින් කරනු ලබන කිසියම් කර්මයකින් මේ සත්වයෝ දේවත්වයට, බ්‍රහ්මත්වයට, මාරත්වයට පැමිණීමක් හෝ ශ්‍රාවක බෝධියට ද, පසේ බුදු බවට ද, සර්වඥ බවට ද පැමිණීමට කළ යුතු කර්මයක් නැත. අනුන්ගේ යහපත සඳහා කළ යුතු අවවාදනුශාසනා දී කර්මයන් හේතුවෙන් මනුෂ්‍ය සම්පත් ලැබීමක්, දිව්‍ය සම්පත් ලැබීමක් හෝ ලෝකෝත්තර මාර්ග - ඵල නිවන් සුවයට පැමිණීමක් නැත. ඒ ඒ දෙය කරන්නවුන් සැපතට පමුණුවන දුකට පමුණුවන කර්මය කියා බලයක් නැත. වීර්‍යයක් නැත. පුරුෂ පරාක්‍රමයක් නැත. ඔටුවන් ගොනුන් කොටළුවන් ආදී සියලු සත්වයෝ ද, එක් ඉන්ද්‍රියක් ඇති ඉන්‍ද්‍රිය දෙකක් ඇති ආදී සියලු ප්‍රාණීහු ද, අණ්ඩ

කෝෂ වස්ති කෝෂ ආදී තැන්හි හටගත් සියලු භූතයෝ ද, හැල් තිරිඟු ආදී සියලු ජීවයන්[1] ද යන සියල්ලෝ ම ශක්තියක් බලයක් වීර්‍ය්‍යයක් නැතිවම ස්වභාවායන් ම තම තමන් අයත් ගති ඇති බැවින් සය ආකාර ජාතීන් අතුරෙහි ඒ ඒ ගතිවලට පැමිණීමෙන් උත්පත්තිය අනුව ම සුව දුක් විඳිත්.

යම් බඳු බාලයෝත් පණ්ඩිතයෝත් බොහෝ ලෙස හැසිර දුක් කෙළවර කෙරෙත් නම් එබඳු වූ මේ උතුම් යෝනි දහසතර ලක්ෂ හයදහස් හයසියයකි, කර්‍මය පන්සියයකි[2]. ඇස කන නාසය දිව කය යනුවෙන් ඉන්ද්‍රිය පසකි. කාය වාක් මනෝ වශයෙන් කර්‍ම තුනකි. කාය වාක් කර්‍ම දෙක අර්ධ කර්‍මය නම් වේ. මනෝ කර්‍මය කාය කර්‍මාදී කර්‍මයකින් සතරෙන් කොටසකි. ප්‍රතිපදාවෝ දෙසැටකි (දෙසැට මිථ්‍යා දෘෂ්ටි). අන්තර කල්පයෝ හැටසතරකි[3]. කණ්හ නීල ලෝහිත හළිද්ද සුක්ක, පරමසුක්ක යැයි ජාති සයකි, එහි :-

- ❖ බැටළුවන් ඌරන් කුරුල්ලන් මුවන් මතස්‍යයන් මරන්නෝ ද, සොරු ද, සොරුන් මරන්නෝ ද, වැදි ජනයා ද, බන්ධනාගාරයන්හි සිරකරුවන් රකින්නෝ ද, තවත් මේ ආදී පවුකම් කරන්නෝ ද **කණ්හ ජාතිය** නම් වේ.
- ❖ භික්ෂූන් වහන්සේ හා කර්‍ම - විපාක පිළිගන්නා ශ්‍රමණ, බ්‍රාහ්මණාදීහුද අන්‍යයන් විසින් පින් ඵල අදහා දෙනු ලබන මිහිරි හෝ රළු ප්‍රත්‍යයෙන් යැපෙන බැවින් **නීල ජාතිය** නම් වේ.
- ❖ නිගණ්ඨයෝ **ලෝහිත ජාතිය** නම් වේ.
- ❖ සුදු වස්ත්‍ර අඳින ගිහියෝ ද, අචේලක ශ්‍රාවකයෝ ද **හළිද්ද ජාතිය** නම් වේ.
- ❖ ආජීවකයෝ ද, ආජීවිකාවෝ ද **සුක්ක ජාතිය** නම් වේ.

---

[1] හැල් යව තිරිඟු ආදිය වැඩෙන ස්වභාවයෙන් යුත් බැවින් ජීව සඤ්ඤා ඇත්තේ වේ.

[2] මෙයින් තර්‍ක මාත්‍රයෙන් නිරර්ථක වූ දෘෂ්ටියක් දක්වයි.

[3] මහා කල්පයකට අන්තර් කල්ප අසූවක් බව බොහෝ අර්ථකථාවන්හි දැක්වේ.

- ❖ නන්ද, වච්ඡ, කිස, සංකිච්ච, මක්ඛලි ගෝසාල යන මොවුන් **පරමසුක්ක ජාතිය** නම් වේ.

මන්ද භූමි, ඛිඩ්ඩාභූමි, විමංසන භූමි, උජුගතභූමි, සේඛභූමි, සමණභූමි, ජිනභූමි, පණ්ණභූමි යැයි පුරිස භූමි අටකි. එහි :-

- ❖ උපන් ද පටන් සත් දිනක් දක්වා ළදරු කාලය බාධා ඇති තැන වූ මව්කුසින් නික්මුණු අර්ථයෙන් **මන්දමෝච** නම් වේ. මෙයම **මන්ද භූමි** නම් වේ.
- ❖ යමෙක් දුගතියේ සිට මනුලොවට ආවේ වේ ද, ඔවුහු නිතර හඬති. කෑ ගසති. යමෙක් සුගතියෙහි සිට මනුලොවට ආවේ වේ ද, ඔවුහු එය සිහි කොට නිතර සිනාසෙති. ඔවුහු **ඛිඩ්ඩාභූමි** නම් වේ.
- ❖ මව්පියන්ගේ අත් පා හෝ ඇඳ පුටු හෝ අල්ලාගෙන බිම පා එබීම **විමංසන භූමි** නම් වේ.
- ❖ පාද ගමනින් යා හැකි කාලය **උජුගතභූමි** නම් වේ.
- ❖ ශිල්ප උගන්නා කාලය **සේඛභූමි** නම් වේ.
- ❖ ගිහිගෙයින් නික්මී පැවිදි වන කාලය **සමණභූමි** නම් වේ.
- ❖ ගුරුවරයා ඇසුරු කොට ඉගෙන ගන්නා කාලය **ජිනභූමි** නම් වේ.
- ❖ භික්ෂුව ද පණ්ණක වූයේ ගුරු ඇසුරෙහි ශිල්ප ඉගෙන ගත්තේ නමුත් අන්‍යයන්ට නොකියන තැනැත්තාට කිසිවක් නොකීවේ කියා ජනයාගෙන් ආහාරාදී ප්‍රත්‍ය නොලබන ශ්‍රමණයා **පණ්ණභූමි** නම් වේ.

නිර්වස්ත්‍රව සිඟා යමින් ආගම අදහන පැවතුම් එකසිය හතලිස් නවයකි. පැවිදි ක්‍රම එකසිය හතලිස් නවයකි. නාගමණ්ඩල එකසිය හතලිස් නවයකි. ඉන්ද්‍රිය එකසිය විස්සකි. නිරය එකසිය තිහකි. රාජොධාතු තිහකි. සංඥ ගර්භ තිස්හතකි. (හැල් ආදී) අසංඥගර්භ සතකි. (උක්, හුණ) ආදී නිගණ්ඨි ගර්භ සතකි. දිව්‍ය නිකාය සතකි. මිනිස් යෝනි සතකි. පිසාච යෝනි සතකි. විල් සතකි. මහ ගැට සතකි. කුඩා ගැට

එකසිය සතකි. මහා ප්‍රපාත සතකි. මහා ස්වප්න සතකි. කුඩා ස්වප්න එකසිය සතකි. මහා කල්ප සුවාසූ ලක්‍ෂයකි. අනුවණ අය ද, නුවණ ඇත්තෝ ද භවයෙන් භවයට ගොස් ජීවත් වෙමින් දුක් අවසන් කෙරෙති.

"එහි මේ සීලයෙන් හෝ එබඳු වෙන ව්‍රතයකින් හෝ බඹසරින් හෝ නොමුහු කළ කර්‍මය මුහුකරවන්නෙමි යැයි කියා කළ යුත්තක් නැත. රැස් කරන ලද කර්‍ම විපාක විඳ අවසන් කරන්නට කියා කළ යුත්තක් නැත. ද්‍රෝණයෙන් (කුරුණි සතරෙන්) මැන ප්‍රමාණ කළවුන් මෙන් සැප දුක් විඳ කියන ලද කාලය ගෙවුණු පසු සසර කෙළවර වෙයි. සංසාරයෙහි අඩු වීමක් හෝ වැඩි වීමක් නැත්තේ ය. සසරෙහි නැඟීමක් හෝ බැසීමක් නැත්තේ ය. යම් සේ නූල් බෝලය ඔතා නූලෙහි අගින් අල්ලාගෙන නූල් බෝලය අත්හැරිය විට එය ලිහෙමින් දිග ඇති තාක් ගොස් නතර වේ ද, එයින් එපිට නොයයි ද, එසේම කියන ලද කාලසීමාව සසර ගත කොට දුක් කෙළවර කරන්නේ වේ.

"ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස, මෙසේ මා විසින් මේ ආත්ම භාවයෙහි දැක්ක යුතු විපාක ඇති මාර්‍ගයක් හෝ ඵලයක් ඇත්තේ ද යැයි ඇසූ කල්හි, මක්ඛලි ගොසාල භවයෙන් භවයට යාමෙන් සත්වයා පිරිසිදු වන බව ප්‍රකාශ කළේ ය.

ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස, අඹ ගස කෙබඳු ද, අඹ ගසේ කොළ ගෙඩි කඳ කෙබඳු ද යැයි ඇසූ විට, දෙල් ගස මෙබඳුය, දෙල් කොළ ගෙඩි කඳ මෙබඳුය යැයි කියන්නාක් මෙන්, දෙල් ගස කෙබඳු ද, දෙල් ගසේ කොළ ගෙඩි කඳ කෙබඳු ද යැයි ඇසූ විට, අඹ ගස මෙබඳුය, අඹ ගසේ කොළ ගෙඩි කඳ මෙබඳුය යැයි කියන්නාක් මෙන්, මා විසින් මේ ආත්ම භාවයෙහි දැක්ක හැකි වූ විපාක ඵලයක් දක්වන්නට හැකි වේ ද? යැයි ඇසූ විට මක්ඛලි ගොසාල කර්‍ම, විපාක දෙකම ප්‍රතික්ෂේප කොට සංසාර ශුද්ධිය ප්‍රකාශ කෙළේය.

ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස, එවිට මට මෙබඳු අදහසක් විය. මා වැනි රජෙකු සිය අණ පවත්නා පෙදෙසෙහි වසන මහණෙකු හෝ බමුණෙකු වෙහෙසිය යුත්තකු (රටින්) නෙරපිය යුත්තකු කොට කෙසේ නම් සිතන්නේ ද? යනුයි. ස්වාමීනි, එබැවින් මම මක්ඛලි

ගෝසාලයන්ගේ කථාවට නොමසතුටු වීමි. ප්‍රශංසාව ද නොකොට, ප්‍රතික්ෂේප ද නොකොට, නොසතුටු සිත් ඇතිව නොසතුටු වචන නොකියා ඒ වචනය සාර වශයෙන් නොගෙන, ඒ කීම නොපිළිගෙන හුන් ආසනයෙන් නැගිට ගියෙමි.

## ☸ අජිතකෙසකම්බලගේ වාද

ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස, මම එක් දිනක අජිතකෙසකම්බලයන් වෙතට පැමිණ ඔහු සමග සතුටු සාමීචියෙහි යෙදී සතුට උපදවන සිහි කටයුතු කථා කොට නිමවා එකත් පසෙකට වී හුන්නෙමි. එසේ හුන් මම අජිතකෙසකම්බලයන්ට මෙසේ කීවෙමි. කෙසේ ද යත් :-

භවත් අජිතයෙනි, යම් සේ "ජීවිකාව පිණිස හේතු වූ බොහෝ ශිල්පයෝ වෙති. එනම්ඃ ඇතුන් හික්මවන්නෝ, පෙ... මත්තෙහි ඵල දෙන ස්වර්ගයට පමුණුවන සැප විපාක උපදවන දනය මහණ බමුණන් කෙරෙහි පිහිටුවති"

භවත් අජිතයෙනි, ගිහි කර්මාන්ත හේතුවෙන් ඉහාත්මයෙහිම ධන ධාන්‍ය වස්තු ඉපදවීම, අඹු දරුවන් මව්පිය ඥාතීන් පෝෂණය කිරීමාදී ඵල ලැබිය හැකිවන්නාක් මෙන්, මේ මහණ දම් පිරීමෙන් මේ ආත්ම භාවයෙහි දැක්ක හැකි වූ විපාක ඵලයක් දක්වන්නට හැකි වේද?"

"ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස, මා විසින් මෙසේ ඇසූ කල්හි කෙසකම්බල අජිත මට මෙසේ කීවේය.

මහරජ, දන වශයෙන් දෙන දෙයෙහි විපාක නැත, මහා යාගයෙහි විපාක නැත, ගරු බුහුමන් කිරීමක් නැත, කුසලා කුසල කර්මයන්ගේ ඵලයක් නැත, විපාකයක් නැත, මෙලොව සිටියහුට පරලොවක් නැත, මවට කරන හොඳ නරක දෙකෙහි ඵල විපාක නැත, පියාට කරන හොඳ නරක දෙකෙහි ඵල විපාක නැත, මරණින් මතු නැවත උපදින සත්වයෝ නැත. යමෙක් මෙලොව පරලොව විශේෂ

ඥානයෙන් දැන අවබෝධ කොට ප්‍රකාශ කෙරෙත් ද, එබඳු ආර්‍ය්‍ය මාර්ගයට පැමිණි හොඳින් පිළිපැද්ද මහණ බමුණෝ[1] ලෝකයේ නැත.

සතර මහා ධාතූන්ගෙන් නිර්මිත වූ මේ සත්වයෝ යම් කලක කළුරිය කෙරෙත් ද, එකල්හි ඒ ශරීරගත පෘථිවි ධාතුව බාහිර පෘථිවි ධාතුවට ම එක් වෙයි. ආපෝ ධාතුව ආපො ධාතුවට ම එක් වෙයි, තේජෝ ධාතුව තේජෝ ධාතුවට ම එක් වෙයි. වායෝ ධාතුව වායෝ ධාතුවට ම එක් වෙයි. ඉන්ද්‍රියයෝ අහසට යති. සයනය කළ ඇඳ පස්වැනි කොට ඇති ඇඳෙහි පා සතර ගත් පුරුෂයෝ සතර දෙන සොහොන දක්වා ගෙණ යත්, ගුණාගුණ වචන ප්‍රකාශ කරත්. එවිට ශරීරය පමණක් පෙණෙයි. ඇට පරෙවි පිහාටු වැනි පාට ඇතිවේ. පහනක සක්කරාදී (ගිනි පිදීම් ආදී) වශයෙන් දෙන ලද සියලු දානයෝ අලු කෙළවර කොට ඇත්තාහ, යම් (දන්) දීමක් වේ නම් එය අඥානයන් විසින් පනවන ලද්දකි. යමෙකු කර්‍මය විපාක ඇත යැයි වාද ඇත්තේ ද, ඒවා ඔවුන්ගේ හිස් වූ බොරු වූ වචන වේ. අනුවණ අය ද, නුවණ ඇත්තෝ ද මරණින් පසු සහ මුලින් නැතිවෙත්, වැනසෙත්. නැවත නූපදිති යැයි කීවේය.

ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස, මෙසේ මා විසින් මේ ආත්ම භාවයෙහි දැක්ක යුතු විපාක ඇති මාර්ගයක් හෝ ඵලයක් ඇක්විය හැක්කේ ද යැයි ඇසූ කල අජිත තෙමේ උච්ඡේද වාදය පැවසීය. අඹ ගස කෙබඳු ද, අඹ ගසේ කොළ ගෙඩි කඳ කෙබඳු ද යැයි ඇසූ විට, දෙල් ගස මෙබඳුය, දෙල් කොළ ගෙඩි කඳ මෙබඳුය යැයි කියන්නාක් මෙන්, දෙල් ගස කෙබඳු ද, දෙල් ගසේ කොළ ගෙඩි කඳ කෙබඳු ද යැයි ඇසූ විට, අඹ ගස මෙබඳුය, අඹ ගසේ කොළ ගෙඩි කඳ මෙබඳුය යැයි කියන්නාක් මෙන්, මා විසින් මේ ආත්ම භාවයෙහි දැක්ක හැකි වූ විපාක ඵලයක් දක්වන්නට හැකි වේද? යැයි ඇසූ විට කෙසකම්බල අජිත තෙමේ විපාක පක්ෂය ප්‍රතික්ෂේප කොට උච්ඡේද වාදය පැවසීය.

ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස, එවිට මට මෙබඳු අදහසක් ඇතිවිය. එනම්, "මා වැනි රජෙකු කෙසේ නම් සිය රාජ්‍යයෙහි වසන මහණෙකු හෝ බමුණෙකු වෙහෙසිය යුත්තකු, නෙරපිය යුත්තකු කොට

[1] බුදු පසේ බුදු මහරහතන් වහන්සේලා

සිතන්නේ ද?" එබැවින් මම කෙසකම්බල අජිතගේ වචනවලට සතුටු නොවී, නින්ද ද නොකොට, ප්‍රශංසා ද නොකොට, අස් කිරීම ද නොකොට, නොසතුටු සිත් ඇතත් නොසතුටු වචන නොකියා, ඔහු කී දේම සාරයයි නොගෙන ඒ සිතෙහි නො පිහිටුවා හුන් ආසනයෙන් නැගිට ගියෙමි.

## ☸ කකුධ කච්චායනගේ වාද

"ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස, මම එක් දිනක් කච්චායන ගෝත්‍රයෙහි වූ කකුධයන් වෙත ගියෙමි. ඔහු සමග සතුටු සාමීචි පවත්වා සතුට උපදවන සිහි කටයුතු කථා නිම කොට එකත් පසෙක හිඳ ඒ කාත්‍යායන ගෝත්‍රික කකුධයන්ට මෙසේ කීවෙමි. කෙසේ ද යත්ඃ

භවත් කකුධය, යම් සේ "ජීවිකාව පිණිස හේතු වූ බොහෝ ශිල්පයෝ වෙති. එනම්, ඇතුන් හික්මවන්නෝ, පෙ... මත්තෙහි ඵල දෙන ස්වර්ගයට පමුණුවන සැප විපාක උපදවන දනය මහණ බමුණන් කෙරෙහි පිහිටුවති"

භවත් කකුධය, ගිහි කර්මාන්ත හේතුවෙන් ඉහාත්මයෙහිම ධන ධාන්‍ය වස්තු ඉපදවීම අඹු දරුවන් මව්පිය ඥාතීන් පෝෂණය කිරීමාදී ඵල ලැබිය හැකිවන්නාක් මෙන් මේ මහණ දම් පිරීමෙන් මේ ආත්ම භාවයෙහි දැක්ක හැකි වූ විපාක ඵලයක් දක්වන්නට හැකි වේ ද?"

ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස, මා මෙසේ ඇසූ කල්හි කකුධ කච්චායන මට මෙසේ කීය.

මහරජ, කිසිවෙකු විසින් නොකරන ලද්ද වූ, මෙසේ කරවයි කිසිවකු ලවා නො කරවන ලද්ද වූ, නො මවන ලද්ද වූ, වඳ වූ හෙවත් කිසිවකු නූපදවන්නා වූ, ගල් කණුවක් මෙන් නොසෙල්වී සිටියා වූ, (සමූහයෝ) සත් දෙනෙක් වෙත්. ඔවුහු කම්පා නොවෙත්, නොපෙරළෙත්. ඔවුනොවුන්ගේ සැප පිණිස හෝ දුක් පිණිස හෝ කිසිවක් කිරීමට සමත් නොවෙත්. කවර (සමූහ) සතක්ද යත්ඃ- පඨවී සමූහය, ආපෝ සමූහය, තෙජෝ සමූහය, වායෝ සමූහය, සැපය, දුකය,

ප්‍රාණය යන මොවුහු ය. මේ සමූහ සත කිසි හේතුවකින් නොකරන ලදහ. මෙසේ කරවයි කිසිවකු ලවා නො කරවන ලදහ. කිසිවකු විසින් හෝ කිසිවකු ලවා නො මවන ලද්දෝ ය. කිසිවකු විසින් නූපදවන්නෝ ය. ගල් කණුවක් මෙන් ස්ථිරව සිටින්නෝ ය. මන්දර පර්වතයක් මෙන් නොසෙල්වී සිටින්නෝ ය. කම්පා නොවන්නෝ ය. ස්වභාව ගතිය නොහරින්නෝ ය. ඔවුනොවුන්ට පීඩා නොකරන්නෝ ය. ඔවුනොවුන්ගේ සැප පිණිස හෝ දුක් පිණිස හෝ සමත් නොවන්නෝය. ඒ ප්‍රාණය සත් වැනි කොට ඇති සමූහයන්හි හිංසා කරන්නෙකු හෝ කරවන්නෙකු හෝ අසන්නෙකු හෝ අසවන්නෙකු හෝ දන්නෙකු හෝ දන්වන්නෙකු හෝ නැත්තේ ය. යමෙක් තියුණු ආයුධයකින් හිස සිඳී ද එහි දී කිසිවෙකු කිසිවෙක් ජීවිතයෙන් තොර නොකරයි. පඨවි ආදී සත් වැදෑරුම් සමූහයන් අතරින් එහි සිදුරෙන් ආයුධයක් ඇතුළු වීම පමණක් වෙයි.

ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස, මා මෙසේ මේ ආත්ම භාවයෙහි දැක්ක යුතු විපාක ඇති මාර්ගයක් හෝ ඵලයක් ඇත්තේ ද යැයි ඇසූ කල කකුධ තෙමේ අනිකකින් අනිකක් පැවසීය. අඹ ගස කෙබඳු ද, අඹ ගසේ කොළ ගෙඩි කඳ කෙබඳු ද යැයි ඇසූ විට, දෙල් ගස මෙබඳුය, දෙල් කොළ ගෙඩි කඳ මෙබඳුය යැයි කියන්නාක් මෙන්, දෙල් ගස කෙබඳු ද, දෙල් ගසේ කොළ ගෙඩි කඳ කෙබඳු ද යැයි ඇසූ විට, අඹ ගස මෙබඳුය, අඹ ගසේ කොළ ගෙඩි කඳ මෙබඳුය යැයි කියන්නාක් මෙන්, මා විසින් මේ ආත්ම භාවයෙහි දැක්ක හැකි වූ විපාක ඵලයක් දක්වන්නට හැකි වේ ද? යැයි ඇසූ විට කකුධ කච්චායන තෙමේ අනිකකින් අනිකක් පැවසීය.

ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස, එවිට මට මෙබඳු අදහසක් ඇතිවිය. එනම්, "මා වැනි රජෙකු කෙසේ නම් සිය රාජ්‍යයෙහි වසන මහණෙකු හෝ බමුණෙකු වෙහෙසිය යුත්තකු නෙරපිය යුත්තකු කොට සිතන්නේ ද?" එබැවින් මම කෙසකම්බල අජිතගේ වචනවලට සතුටු නොවී, නින්දා ද නොකොට, ප්‍රශංසා ද නොකොට, අස් කිරීම ද නොකොට, නොසතුටු සිත් ඇතිව නමුත් නොසතුටු වචන නොකියා, ඔහු කී දේ සාර වශයෙන් නොගෙන ඒවා සිතෙහි නො පිහිටුවා හුන් ආසනයෙන් නැගිට ගියෙමි.

## ☸ නිගණ්ඨනාතපුත්‍රගේ වාද

ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස, මම එක්කලෙක නිගණ්ඨ නාථ පුත්‍රයන් යම් තැනෙකද එතැනට ගියෙමි. ඔහු සමග සතුටු සාමීචි පවත්වා, සතුට උපදවන සිහි කටයුතු කථා නිම කොට එකත්පසෙක හිඳ ඒ නිගණ්ඨ නාථ පුත්‍රයාට මෙසේ කීවෙමි. කෙසේ ද යත්:-

භවත් අග්ගිවෙස්සනය, යම් සේ "ජීවිකාව පිණිස හේතු වූ බොහෝ ශිල්පයෝ වෙති. එනම්, ඇතුන් හික්මවන්නෝ, පෙ... මත්තෙහි ඵල දෙන ස්වර්ගයට පමුණුවන සැප විපාක උපදවන දනය මහණ බමුණන් කෙරෙහි පිහිටුවති"

භවත් අග්ගිවෙස්සනය, ගිහි කර්මාන්ත හේතුවෙන් ඉහාත්මයෙහිම ධන ධාන්‍ය වස්තු ඉපදවීම, අඹු දරුවන් මව්පිය ඥාතීන් පෝෂණය කිරීමාදී ඵල ලැබිය හැකිවන්නාක් මෙන්, මේ මහණ දම් පිරීමෙන් මේ ආත්ම භාවයෙහි දක්ක හැකි වූ විපාක ඵලයක් දක්වන්නට හැකි වේද?

ස්වාමීනි, මා මෙසේ ඇසූ කල්හි ඒ අග්ගිවෙස්සන තෙමේ මෙසේ කීයः-

මහරජ, මේ ලෝකයෙහි නිගණ්ඨ තෙමේ චතුයාම සංවරයෙන් යුක්ත වේ. මහරජ කෙසේ නම් නිගණ්ඨ තෙමේ චතුයාම සංවරයෙන් යුක්ත ද? මහරජ, මේ ලෝකයෙහි නිගණ්ඨ තෙමේ සිසිල් ජලය පරිභෝගයෙන් වැළකුණේ වේ. සියලු ආකාර සංවරයෙන් යුක්ත වූයේ වේ. සියලු පව් පිඹ හැරියේ වේ. සියලු පව් වැළැක්වීමෙන් විමුක්තිය ස්පර්ශ කරන ලද්දේ වේ. මහරජ, නිගණ්ඨ තෙමේ චතුයාම සංවරයෙන් යුක්ත වේ. මහරජ, නිගණ්ඨ තෙමේ මෙසේ චතුයාම සංවරයෙන් යුක්තව මෝක්ෂය ලැබීමෙන් කෙළවරට පැමිණි සිත් ඇති බැවින්, දමනය කරන ලද්ද වූ මනාව පිහිටි ඉන්ද්‍රිය ඇත්තේ වෙයි යැයි කීවේය.

ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස, මා විසින් මෙසේ මේ ආත්මභාවයෙහි දක්ක යුතු විපාක ඇති මාර්ගයක් හෝ ඵලයක් ඇත්තේද යැයි ඇසූ කල්හි, නිගණ්ඨ නාථ පුත්‍ර තෙමේ චතුයාම සංවරය ප්‍රකාශ

කෙළේය. අඹ ගස කෙබඳු ද, අඹ ගසේ කොළ ගෙඩි කඳ කෙබඳු ද යැයි ඇසූ විට, දෙල් ගස මෙබඳුය, දෙල් කොළ ගෙඩි කඳ මෙබඳුය යැයි කියන්නාක් මෙන්, දෙල් ගස කෙබඳු ද, දෙල් ගසේ කොළ ගෙඩි කඳ කෙබඳු ද යැයි ඇසූ විට, අඹ ගස මෙබඳුය, අඹ ගසේ කොළ ගෙඩි කඳ මෙබඳුය යැයි කියන්නාක් මෙන්, මා විසින් මේ ආත්ම භාවයෙහි දක්ක හැකි වූ විපාක ඵලයක් දක්වන්නට හැකි වේ ද? යැයි ඇසූ විට නිගණ්ඨ නාථ පුත්‍ර තෙමේ චතුයාම සංවරය පැවසීය.

ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස, එවිට මට මෙබඳු අදහසක් ඇතිවිය. එනම්: "මා වැනි රජෙකු කෙසේ නම් සිය රාජ්‍යයෙහි වසන මහණෙකු හෝ බමුණෙකු වෙහෙසිය යුත්තකු, නෙරපිය යුත්තකු කොට සිතන්නෙම් ද?" ස්වාමීනි, එබැවින් මම නිගණ්ඨ නාථ පුත්‍රගේ වචනවලට සතුටු ද නොවී, නින්ද ද නොකොට, ප්‍රශංසා ද නොකොට, අස් කිරීම ද නොකොට, නොසතුටු සිත් ඇතිව නමුත් නොසතුටු වචන නොකියා, ඔහු කී දේ සාර වශයෙන් නොගෙන ඒවා සිතෙහි නො පිහිටුවා හුන් ආසනයෙන් නැගිට ගියෙමි.

## ☸ සඤ්චයබෙලට්ඨපුත්‍රගේ වාද

"ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස, මම එක් දිනක් බෙලට්ඨපුත්‍ර වූ සඤ්ජය වෙත ගියෙමි. ඔහු සමග සතුටු සාමීචි පවත්වා සතුට උපදවන සිහි කටයුතු කථා නිම කොට එකත්පසෙක හිඳ සඤ්ජය බෙලට්ඨපුත්‍රයා හට මෙසේ කීවෙමි. කෙසේ ද යත්:-

'භවත් සඤ්ජයෙනි, යම් සේ "ජීවිකාව පිණිස හේතු වූ බොහෝ ශිල්පයෝ වෙති. එනම්: ඇතුන් හික්මවන්නෝ, පෙ... මත්තෙහි ඵල දෙන ස්වර්ගයට පමුණුවන සැප විපාක උපදවන දනය මහණ බමුණන් කෙරෙහි පිහිටුවති"

භවත් සඤ්ජයෙනි, ගිහි කර්මාන්ත හේතුවෙන් ඉහාත්මයෙහිම ධන ධාන්‍ය වස්තු ඉපදවීම, අඹු දරුවන් මව්පිය ඥාතීන් පෝෂණය කිරීමාදී ඵල ලැබිය හැකිවන්නාක් මෙන්, මේ මහණ දම් පිරීමෙන් මේ ආත්ම භාවයෙහි දක්ක හැකි වූ විපාක ඵලයක් දක්වන්නට හැකි වේද?

ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස, මා මෙසේ කී කල සඤ්ජය බෙලට්ඨිපුත්‍ර මෙසේ කීය. මහරජ, 'පරලොවක් ඇත්තේ ද යැයි මා විචාරන්නෙහි නම් පරලොවක් ඇතැයි මෙසේ මට අදහස් වී නම්, පරලොවක් ඇතැයි ඔබට ප්‍රකාශ කරන්නෙමි. එසේ පරලොවක් ඇත්තේ යැයි කියා අදහසක් ද මට නොවෙයි. අන් පරිද්දෙකින් වූ අදහසක් ද මට නොවෙයි.

පරලොවක් නැත්තේ ද යැයි මා විචාරන්නෙහි නම් පරලොවක් නැතැයි මෙසේ මට අදහස් වී නම්, පරලොවක් නැත යැයි ඔබට ප්‍රකාශ කරන්නෙමි. එසේ පරලොවක් නැත යැයි කියා අදහසක් ද මට නොවෙයි. අන් පරිද්දෙකින් වූ අදහසක් ද මට නොවෙයි.

පරලොවක් ඇත්තේත් නොවෙයි ද, නැත්තේත් නොවෙයි ද යැයි මා විචාරන්නෙහි නම්, පරලොවක් ඇත්තේත් නොවෙයි ද, නැත්තේත් නොවෙයි ද යැයි මෙසේ මට අදහස් වී නම්, පරලොවක් ඇත්තේත් නොවෙයි නැත්තේත් නොවෙයි යැයි ඔබට ප්‍රකාශ කරන්නෙමි. එසේ පරලොවක් ඇත්තේ නොවෙයි කියා ද, නැත්තේත් නොවෙයි කියා ද අදහසක් ද මට නොවෙයි. අන් පරිද්දෙකින් අදහසක් ද මට නොවෙයි.

මේ භවයෙන් චුතව පරලොව උපදින සත්වයෝ ඇත්තේ ද යැයි මා විචාරන්නෙහි නම්, මේ භවයෙන් චුතව පරලොව උපදින සත්වයෝ ඇත යැයි මට අදහස් වී නම්, මේ භවයෙන් චුතව පරලොව උපදින සත්වයෝ ඇත යැයි ඔබට ප්‍රකාශ කරන්නෙමි. එසේ පරලොව උපදින සත්වයෝ ඇත යැයි මට අදහසක් ද නොවෙයි. අන් පරිද්දෙකින් අදහසක් ද මට නොවෙයි.

මේ භවයෙන් චුතව පරලොව උපදින සත්වයෝ නැත්තේ ද යැයි මා විචාරන්නෙහි නම් මේ භවයෙන් චුතව පරලොව උපදින සත්වයෝ නැත යැයි මට අදහස් වී නම්, මේ භවයෙන් චුතව පරලොව උපදින සත්වයෝ නැත යැයි ඔබට ප්‍රකාශ කරන්නෙමි. එසේ මේ භවයෙන් චුතව පරලොව උපදින සත්වයෝ නැත කියා අදහසක් මට නොවෙයි. අන් පරිද්දෙකින් අදහසක් ද මට නොවෙයි.

තව ද මේ භවයෙන් ච්‍යුතව පරලොව උපදින සත්වයෝ ඇත්තේත් නොවෙයි ද නැත්තේත් නොවෙයි ද යැයි මා විචාරන්නෙහි නම් මේ භවයෙන් ච්‍යුතව පරලොව උපදින සත්වයෝ ඇත්තේත් නොවෙයි නැත්තේත් නොවෙයි යැයි මෙසේ මට අදහස් වී නම්, මේ භවයෙන් ච්‍යුතව පරලොව උපදින සත්වයෝ ඇත්තේත් නොවෙයි නැත්තේත් නොවෙයි යැයි ඔබට ප්‍රකාශ කරන්නෙමි. එසේ මේ භවයෙන් ච්‍යුතව පරලොව උපදින සත්වයෝ ඇත්තේත් නොවෙයි කියා හෝ නැත්තේත් නොවෙයි කියා හෝ අදහසක් ද මට නොවෙයි. අන් පරිද්දෙකින් අදහසක් ද මට නොවෙයි.

කුශලාකුශල කර්‍මයන් ගේ ඵල හා විපාක ඇත්තේ ද, යැයි මා විචාරන්නෙහි නම් කුශලාකුශල කර්‍මයන් ගේ ඵල හා විපාක ඇත යැයි මට අදහස් වී නම්, කුශලාකුශල කර්‍මයන් ගේ ඵල හා විපාක ඇත යැයි ඔබට ප්‍රකාශ කරන්නෙමි. මට එසේත් අදහස් නොවෙයි, කුශලාකුශල කර්‍මයන් ගේ ඵල හා විපාක ඇත යැයි මට අදහසක් ද නොවෙයි. අන් පරිද්දෙකින් අදහසක් ද මට නොවෙයි.

කුශලාකුශල කර්‍මයන් ගේ ඵල හා විපාක නැතතේ ද, යැයි මා විචාරන්නෙහි නම් කුශලාකුශල කර්‍මයන් ගේ ඵල හා විපාක නැත යැයි මට අදහස් වී නම්, කුශලාකුශල කර්‍මයන් ගේ ඵල හා විපාක නැත යැයි ඔබට ප්‍රකාශ කරන්නෙමි. මට එසේත් අදහස් නොවෙයි, කුශලාකුශල කර්‍මයන් ගේ ඵල හා විපාක නැත යැයි මට අදහසක් ද නොවෙයි. අන් පරිද්දෙකින් අදහසක් ද මට නොවෙයි.

කුශලාකුශල කර්‍මයන් ගේ ඵල හා විපාක ඇත්තේත් නොවෙයි ද, නැතතේත් නොවෙයි ද යැයි මා විචාරන්නෙහි නම්, කුශලාකුශල කර්‍මයන් ගේ ඵල හා විපාක ඇත්තේත් නොවෙයි, නැතතේත් නොවෙයි යැයි මෙසේ මට අදහස් වී නම්, කුශලාකුශල කර්‍මයන් ගේ ඵල හා විපාක ඇත්තේත් නොවෙයි ද, නැතතේත් නොවෙයි යැයි ඔබට ප්‍රකාශ කරන්නෙමි. මට එසේත් අදහස් නොවෙයි, කුශලාකුශල කර්‍මයන් ගේ ඵල හා විපාක ඇත්තේත් නොවෙයි ද, නැතතේත් නොවෙයි කියා හෝ අදහසක් ද මට නොවෙයි. අන් පරිද්දෙකින් අදහසක් මට නොවෙයි.

සත්වයා මරණින් මතු වන්නෙහි ද යැයි මා විචාරන්නෙහි නම්, සත්වයා මරණින් මතු වන්නේ යැයි මට අදහස් වී නම්, සත්වයා මරණින් මතු වන්නේ යැයි ඔබට ප්‍රකාශ කරන්නෙමි. මට එසේ සත්වයා මරණින් මතු වන්නේ යැයි අදහසක් නැත. අන් පරිද්දෙකින් අදහසක් ද මට නොවෙයි.

සත්වයා මරණින් මතු නොවන්නෙහි ද යැයි මා විචාරන්නෙහි නම්, සත්වයා මරණින් මතු නොවන්නේ යැයි මට අදහස් වී නම්, සත්වයා මරණින් මතු නොවන්නේය යැයි ඔබට ප්‍රකාශ කරන්නෙමි. මට එසේ සත්වයා මරණින් මතු නොවන්නේය යැයි අදහසක් නැත. අන් පරිද්දෙකින් අදහසක් ද මට නොවෙයි.

සත්වයා මරණින් මතු වන්නෙහි ද නොවන්නෙහි ද යැයි මා විචාරන්නෙහි නම්, සත්වයා මරණින් මතු වන්නෙහි ද නොවන්නෙහි ද යැයි මට අදහස් වී නම්, සත්වයා මරණින් මතු වන්නෙහි ද නොවන්නෙහි ද යැයි ඔබට ප්‍රකාශ කරන්නෙමි. මට එසේ සත්වයා මරණින් මතු වන්නෙහි ද නොවන්නෙහි ද යැයි අදහසක් නැත. අන් පරිද්දෙකින් අදහසක් ද මට නොවෙයි.

ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස, මා විසින් මෙසේ මේ ආත්මභාවයෙහි දක්ක යුතු විපාක ඇති මාගීය ඵලය ඇසූ කල බෙලට්ඨි පුත්‍ර සඤ්ජය තෙමේ අපයාීන්ත වික්ෂේපය[1] ප්‍රකාශ කෙළේය.

ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස, අඹ ගස කෙබඳු ද, අඹ ගස කෙබඳු ද, අඹ ගසේ කොළ ගෙඩි කඳ කෙබඳු ද යැයි ඇසූ විට, දෙල් ගස මෙබඳුය, දෙල් කොළ ගෙඩි කඳ මෙබඳුය යැයි කියන්නාක් මෙන්, දෙල් ගස කෙබඳු ද, දෙල් ගසේ කොළ ගෙඩි කඳ කෙබඳු ද යැයි ඇසූ විට, අඹ ගස මෙබඳුය, අඹ ගසේ කොළ ගෙඩි කඳ මෙබඳුය යැයි කියන්නාක් මෙන්, අමරා වික්ෂේප වාදය ප්‍රකාශ කොට බෙලට්ඨිපුත්‍ර සඤ්ජය තෙමේ ප්‍රශ්නය ඉවත ලෑම කෙළේය. ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස, එවිට මට මේ අදහස විය. මේ සඤ්ජය තෙමේ අන් ශ්‍රමණ බ්‍රාහ්මණ සියල්ලන්ට ම වඩා අනුවණය, මෝඩය කෙසේ නම් මේ

[1] ඉමක් කොනක් නැති වචනයන්ගෙන් ප්‍රශ්නය ඉවත් කිරීම

ආත්මභාවයෙහි දැක්ක යුතු විපාක ඇති මාර්ගීය ඵලය ඇසූ කල ප්‍රශ්නය ඉවත ලෑම කරන්නේ ද කියායි.

එවිට මට මෙබඳු අදහසක් ඇතිවිය. එනම්:- "මා වැනි රජෙකු කෙසේ නම් සිය රාජ්‍යයෙහි වසන මහණෙකු හෝ බමුණෙකු වෙහෙසිය යුත්තකු නෙරපිය යුත්තකු කොට සිතන්නේ ද?" එබැවින් මම සඤ්ජය බේලට්ඨිපුත්‍රගේ වචනවලට සතුටු නොවී, නින්ද ද නොකොට, ප්‍රශංසා ද නොකොට, අස් කිරීම ද නොකොට, නොසතුටු සිත් ඇතිව නමුත් නොසතුටු වචන නොකියා, ඔහු කී දේ සාර වශයෙන් නොගෙන ඒවා සිතෙහි නො පිහිටුවා හුන් ආසනයෙන් නැගිට ගියෙමි.

## ❄ ප්‍රථම සාන්දෘෂ්ටික ශ්‍රමණ ඵලය

ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස, මම අන්‍ය ශ්‍රමණ බ්‍රාහ්මණයන් වෙත ගොස් ප්‍රශ්න විචාරීමෙන් වැලි මිරිකා ජලය නොලබන්නාක් මෙන් කිසි හරයක් නොලැබුවෙමි. ඒ මම භාග්‍යවතුන් වහන්සේ ද විචාරමි.

"ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස, ජීවිකාව පිණිස හේතු වූ බොහෝ ශිල්පයන්හි යෙදෙන්නෝ වෙති. එනම්: ඇතුන් හික්මවන්නෝ ද, ඇතුන්ට බෙහෙත් කරන්නෝ ද, ඇත්පොර මෙහෙයවන්නෝ ද වෙති. අශ්වයන් පදවන්නෝ ද, අශ්වයන්ට බෙහෙත් කරන්නෝ ද, අශ්ව පොර මෙහෙයවන්නෝ ද වෙති. රථ රියදුරෝ ද, රථ යෝධයෝ ද, රථ රකින්නෝ ද වෙති. දුනු ඇදුරෝ ද, දුනුවායෝ ද වෙති. යුද්ධයෙහි දී පෙරටුව ජයකොඩි ගෙන යන්නෝ වෙති. මෙතන අසවල් අමාත්‍යයාගේ තැනය ආදී ලෙස සේනාවේ ස්ථාන නියම කරන්නෝ වෙති. යුද පිණිස නික්මෙන මහා යෝධයෝ වෙති. යුද කරන ක්ෂත්‍රියයෝ වෙති. (ඔට්ටු අල්ලා) සතුරන්ගේ හිස් ආදිය ගෙන එන්නෝ වෙති. ඇතෙකුට වුවත් පසු නොබස්නා මහා යෝධයෝ වෙති. සංග්‍රාම ශූරයෝ නම් යුද දක්ෂයෝ වෙති. හම් හැට්ට ඇඳ හෝ පලිහ ගෙන යුද කරන්නෝ වෙති. මෙහෙකරුවෝ වෙති. කෑම සපයන්නෝ වෙති. රැවුල් කපන්නෝ වෙති. නාවන්නෝ වෙති. ආහාර පිසින්නෝ වෙති.

කම්හල්කරුවෝ වෙති. රෙදි සෝදන්නෝ වෙති. රෙදි වියන්නෝ ද වේවැල් ආදියෙන් වැඩ කරන්නෝ ද වෙති. වලන් සාදන්නෝ වෙති. නැකැත්කරුවෝ වෙති. හස්ත මුද්‍රා ගණන් සාදමින් ජීවත් වෙන්නෝ වෙති. මේ හැර තවත් බොහෝ ශිල්පයෝ ද වෙති. ඒ ශිල්පයන් දක්වා මේ ආත්මයේ ම තමා විසින් දැක්ක හැකි ශිල්ප ඵලය නිසා ජීවත් වෙති. ඔවුහු ඉන් තම ජීවිතය සුවපත් කෙරෙති, පිනවීම කෙරෙති, දරුවන් සහ භාර්‍යාව සුවපත් කෙරෙති, පිනවීම කෙරෙති. මිත්‍රයින් සුවපත් කෙරෙති, පිනවීම කෙරෙති. මත්තෙහි ඵල දෙන ස්වර්ගයට පමුණුවන සැප විපාක උපදවන දනය මහණ බමුණන් කෙරෙහි පිහිටුවති"

ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස, ගිහි කර්මාන්ත හේතුවෙන් ඉහාත්මයෙහිම ධන ධාන්‍ය වස්තු ඉපදවීම, අඹු දරුවන් මවපිය ඤාතීන් පෝෂණය කිරීමාදී ඵල ලැබිය හැකිවන්නාක් මෙන්, මේ මහණ දම් පිරීමෙන් මේ ආත්ම භාවයෙහි දැක්ක හැකි වූ විපාක ඵලයක් දක්වන්නට හැකි වේ ද?

මහ රජාණෙනි හැක්කේය, එසේ නම් මහ රජ මේ කරුණෙහි ලා ඔබගෙන් ම අසන්නෙමි. යම් ලෙසකින් ඔබට රුචි වන්නේ ද එසේ ප්‍රකාශ කරව.

මහරජ, මේ මතු දැක්වෙන කරුණු ඔබගෙන් අසමි. ඒ පිළිබඳ ඔබ කෙසේ සිතන්නෙහි ද?

ඔබගේ රාජ්‍යය ඇතුළම උපන්නා වූ හෝ මිලයට වැඩ කරන්නා වූ හෝ බලහත්කාර කමින් ගෙන එන ලද්ද වූ හෝ නොමැලිව හොඳින් වැඩපළ කරන, සැමට ම පළමුව නින්දෙන් නැගී සිටන, කළ යුතු සියලු කාර්‍යයන් සොයා බලා අවසන් කොට සැමට ම පසුව නිදන, කීකරු ව හැසිරෙන, ඔබ මනාප දෙයක් ම කරන, ප්‍රිය කථා මනාප කථා ඇතිව ඔබගේ මුහුණ (සිත) සතුටු කරන්නට ම උත්සාහවත් වන දස පුරුෂයෙක් වෙයි. ඔහුට මෙවැනි අදහසක් ඇතිවෙයි.

**"පින්වත්නි, පිනෙහි ස්වභාවය පිනෙහි විපාක අහෝ ආශ්චර්‍යයකි. අහෝ පුදුමයකි. මේ අජාසත් රජතුමා ද මනුෂ්‍යයෙකි, මම ද මිනිසෙක්මි. මේ අජාසත් රජතුමා පස් කම් ගුණයෙන් යුක්තව**

**ඉඳුරන් පිනවමින්, දනාදී පින් කරමින් සතුටු සිතින් යුතුව දෙවියෙකු මෙන් වාසය කරයි. මම වනාහි නොමැලිව හොඳින් වැඩපළ කරන, සැමට ම පළමුව නින්දෙන් නැගී සිටන, කළ යුතු සියලු කාර්‍යයන් සොයා බලා අවසන් කොට සැමට ම පසුව නිදන, කීකරු ව හැසිරෙන, රජතුමා මනාප දෙයක් ම කරන, ප්‍රිය කථා මනාප කථා ඇතිව රජතුමාගේ මුහුණ (සිත) සතුටු කරන්නට ම උත්සාහවත් වන දසයෙක් වෙමි. එසේ වූ මම ද ඉදින් පින් කරන්නෙම් නම් ඒකාන්තයෙන් ඒ රජතුමා වැනි කෙනෙක් වන්නෙමි. එසේ වුව ද මම මුළු ජීවිතයෙහි ම දන් දුන්නේ නමුත් රජතුමා එක් දවසක දෙන දනයෙන් සියයෙන් පංගුවක් දීමට අපොහොසත් වෙමි. එබැවින් මම රජතුමාට හා සම සම්පත් කෙසේ ලබන්නෙම් ද? එබැවින් මම ඒකාන්තයෙන් කෙස් දැළි රැවුල් කපා දමා සිවුරු හැඳ පෙරව ගිහිගෙන් නික්ම සසුනෙහි පැවිදි වන්නෙම් නම් ඉතා යහපති”** යනුවෙනි.

ඔහු පසු කලෙක කෙස් දැළි රැවුල් කපා දමා, සිවුරු හැඳ පෙරව, ගිහිගෙන් නික්ම සසුනෙහි පැවිදි වන්නේය. ඔහු මෙසේ පැවිදි ව කයින් සිදුවන ප්‍රාණඝාත, අදත්තාදන, කාම මිථ්‍යාචාර අකුසලයන්ගෙන් වැළකීමෙන් කායික සංවරයෙන් යුක්ත වේ. වචනයෙන් සිදුවන බොරු කීම, කේලම් කීම, පරුෂ වචන කීම, හිස් වචන කීම යන අකුසලයන්ගෙන් වැළකී වාචසික සංවරයෙන් යුක්ත වේ. මනසින් සිදුවන අභිධ්‍යාව නම් වූ විෂම ලෝභය, ව්‍යාපාදය, මිථ්‍යාදෘෂ්ඨිය යන අකුසලයන්ගෙන් වැළකී මානසික සංවරයෙන් යුක්ත වේ.

ධාර්මික ව ලැබෙන සිව්පසය ප්‍රත්‍ය ඇතිව, ධුතාංග ගුණ සමාදන්ව, ලද දෙයින් සතුටු වෙමින්, ලද පමණින් සතුටු වෙමින්, පහසුවෙන් පෝෂණය කළ හැකි සරල පැවැත්මෙන් යුක්තව, අවම පරිෂ්කාර ඇතිව සීල විශුද්ධියෙන් යුක්ත වේ.

මෙසේ සීල සම්පත්තියෙහි පිහිටාගෙන, පිරිසෙන් වෙන් ව දස කසිණ, දස අසුභ, දස අනුස්සති, සතර බ්‍රහ්ම විහාර, සතර අරූප ධ්‍යාන වඩමින් කෙලෙසුන් තුනී කරන කෙලෙස් දවාලන පැවැත්මෙන් යුක්තව චිත්ත පාරිශුද්ධියෙන් යුක්ත වේ.

මෙසේ ධ්‍යාන භාවනාවෙන් පාරිශුද්ධියට පත්ව, ප්‍රභාස්වර වූ ප්‍රඥා සම්පන්න සිතින් යුතුව නාමරූප, පඤ්ච උපාදානස්කන්ධාදී සංස්කාර විදර්ශනාව කොට ත්‍රිලක්ෂණ, චතුරාර්‍ය්‍ය සත්‍යය වශයෙන් ප්‍රත්‍යක්ෂයෙන් දැක සෝවාන් ආදී මග - ඵල පිළිවෙලින් අභීත්වයට පැමිණ ඵල සමාපත්තියට නිරෝධ සමාපත්තියට සම වදිමින් නිවන්සුව භුක්තිවිඳීම නම් වූ උපධි විවේකයෙන් අග්‍ර පැවැත්මෙන් යුක්තව වාසය කරයි.

එවිට ඔබගේ (රාජ) පුරුෂයෝ ඒ බව ඔබට මෙසේ දන්වන්නාහුය. අවසර දේවයන් වහන්ස! දැනගන්න, ඔබ වහන්සේගේ වැඩපළ නොමැලිව හොඳින් කරන, සැමට ම පළමුව නින්දෙන් නැගීසිටියා වූ, කළ යුතු සියලු කාර්‍ය්‍යයන් සොයා බලා අවසන් කොට සැමට ම පසුව නිදන්නා වූ, කීකරු ව හැසිරුණා වූ, ඔබ මනාප දෙයක් ම කරන්නා වූ, ප්‍රිය කථා මනාප කථා ඇතිව ඔබගේ මුහුණ (සිත) සතුටු කරන්නට ම උත්සාහවත් වූවා වූ දාස පුරුෂයෙක් වී ද, දේවයන් වහන්ස, හෙතෙම කෙස් දැළි රැවුල් කපා දමා සිවුරු හැඳ පෙරව ගිහිගෙන් නික්ම සසුනෙහි පැවිදි වූයේය.

ඔහු මෙසේ පැවිදි වී කයින් සිදුවන ප්‍රාණඝාත, අදත්තාදාන, කාම මිථ්‍යාචාර අකුසලයන්ගෙන් වැළකීමෙන් කායික සංවරයෙන් යුක්ත වේ. වචනයෙන් සිදුවන බොරු කීම, කේලම් කීම, පරුෂ වචන කීම, හිස් වචන කීම යන අකුසලයන්ගෙන් වැළකී වාචසික සංවරයෙන් යුක්ත වේ. මනසින් සිදුවන අභිධ්‍යාව නම් වූ විෂම ලෝභය, ව්‍යාපාදය, මිථ්‍යා දෘෂ්ඨිය යන අකුසලයන්ගෙන් වැළකී මානසික සංවරයෙන් යුක්ත වේ.

ධාර්මික ව ලැබෙන සිව්පස ප්‍රත්‍ය ඇතිව, ධූතාංග ගුණ සමාදන්ව, ලද දෙයින් සතුටු වෙමින්, ලද පමණින් සතුටු වෙමින්, පහසුවෙන් පෝෂණය කළ හැකි සරල පැවැත්මෙන් යුක්තව, අවම පරිෂ්කාර ඇතිව, සීල විශුද්ධියෙන් යුක්ත වේ.

මෙසේ සීලයෙහි පිහිටා ධ්‍යාන වඩමින්, කෙලෙසුන් තුනී කරන කෙලෙස් දවාලන පැවැත්මෙන් යුක්තව චිත්ත පාරිශුද්ධියෙන් යුක්ත වේ.

මෙසේ ධ්‍යාන භාවනාවෙන් පාරිශුද්ධියට පත්ව ප්‍රභාස්වර වූ ප්‍රඥා සම්පන්න සිතින් යුතුව නාමරූප පඤ්ච උපාදනස්කන්ධාදී සංස්කාර විදර්ශනාව කොට ත්‍රිලක්ෂණ චතුරාර්‍ය්‍ය සත්‍යය වශයෙන් ප්‍රත්‍යක්ෂයෙන් දැක නිවන් සුව භුක්තිවිඳීම නම් වූ උපධි විවේකයෙන් අග්‍ර පැවැත්මෙන් යුක්තව වාසය කරයි යනුවෙනි.

කිම, මහරජ? **"ඒ මාගේ වැඩ කරුවා නැවතත් මාවෙත පැමිණේවා, ඔහු නැවත ද වැඩපළ නොමැලිව හොඳින් කරමින් සැමට ම පළමුව නින්දෙන් නැගීසිටිමින්, කළ යුතු සියලු කාර්‍ය්‍යයන් සොයා බලා අවසන් කොට සැමට ම පසුව නිදමින්, කීකරු ව හැසිරෙමින්, මට මනාප දෙයක් ම කරමින්, ප්‍රිය කථා මනාප කථා ඇතිව මගේ මුහුණ (සිත) සතුටු කරමින් කටයුතු කරන දස පුරුෂයෙක් වේවා"** යැයි ඔබ මෙසේ කියන්නෙහි ද? යැයි අසා වදාළ සේක.

එවිට රජතුමා, **"ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස එය එසේ නොවේ. එසේ ඇති කල්හි ඔහුට අපි ආදර ගෞරව දක්වා වැඳීම ද කරන්නෙමු. ඔහු දැක හුනස්නෙන් නැගිටින්නෙමු, සකස් කරන ලද ආසනයෙන් ද පවරන්නෙමු. සිවුරු පිණ්ඩපාත, සෙනසුන්, ගිලන්පස, බෙහෙත් පිරිකර යන මෙයින් යමක් අවශ්‍ය වේ නම්, ඒ බව අපට කිව මැනව යැයි ද විශෙෂයෙන් පවරන්නෙමු. ධාර්මික වූ ආරක්ෂාවෙන් රැකවරණය ද සලසන්නෙමු"** යැයි කීවේය.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ **"මහරජ ඔබ කුමක් සිතන්නෙහි ද? ඉදින් එසේ ඇති කල්හි පැවිදි ව සසුන් ගුණ පිරීමෙන් මේ ආත්ම භාවයෙන් දැකිය හැකි විපාක ඵලයක් ඇත්තේ වේ ද? නොවේ ද? ඒ ගැන ඔබ කුමක් සිතන්නෙහි ද?"** යැයි අසා වදාළ සේක.

එවිට රජතුමා **"ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස, මෙසේ ඇති කල්හි ඒකාන්තයෙන් ම මේ ආත්ම භාවයෙහි දැකිය හැකි විපාක ඵලයක් වේමය"** යැයි කීවේය.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ **"මහරජ, මේ වනාහි මා විසින් ඔබට දක්වන ලද මේ ආත්මයෙහි ලැබිය හැකි පළමුවැනි වූ මේ පැවිදි දම් පිරීමෙහි විපාක ඵලය වේ"** යැයි වදාළ සේක.

# ❄ දෙවන සාන්දෘෂ්ටික ශ්‍රමණ ඵලය

නැවත ද රජතුමා භාග්‍යවතුන් වහන්සේ අමතා **"ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස, එපරිද්දෙන් ම පැවිදි ගුණ පිරීමෙන් ලැබෙන මේ ආත්ම භාවයෙහි දැකිය හැකි අන්‍ය වූ ද විපාක ඵලයක් දැක්විය හැක්කේ ද?"** යැයි අසා සිටියේ ය.

එවිට භාග්‍යවතුන් වහන්සේ **"හැක්කේය මහරජ, එසේ නම් මහරජ මේ කරුණෙහි ලා ඔබගෙන් ම අසන්නෙමි. යම් ලෙසකින් ඔබට වැටහෙන්නේ ද එලෙස පිළිතුරු දෙන්න"** යැයි වදරා නැවත ඒ කරුණ දක්වමින් මෙසේ වදාළ සේක.

මහරජ, මතු දක්වන කරුණෙහි ලා ඔබ කුමක් සිතන්නෙහි ද? ඔබගේ ගොවි බිම්හි සී සාන්නා වූ, ගෘහපතියෙක් ව සිටිමින් අයබදු ගෙවමින්, ධන ධාන්‍ය සපයා දෙන්නා වූ පුරුෂයෙකු වෙයි. ඔහුට මෙබඳු අදහසක් ඇති වෙයි.

**"පින්වත්නි, පිනෙහි ස්වභාවය, පිනෙහි විපාක අහෝ ආශ්චර්යයකි. අහෝ පුදුමයකි. මේ අජාසත් රජතුමා ද මනුෂ්‍යයෙකි, මම ද මිනිසෙක්මි. මේ අජාසත් රජතුමා පස් කම් ගුණයෙන් යුක්තව ඉඳුරන් පිනවමින්, දනාදී පින් කරමින්, සතුටු සිතින් යුතුව දෙවියෙකු මෙන් වාසය කරයි. මම වනාහි නොමැලිව හොඳින් වැඩපළ කරන, සැමට ම පළමුව නින්දෙන් නැඟී සිටන, කළ යුතු සියලු කාර්යයන් සොයා බලා අවසන් කොට සැමට ම පසුව නිදන, කීකරු ව හැසිරෙන, රජතුමා මනාප දෙයක් ම කරන, ප්‍රිය කථා මනාප කථා ඇතිව රජතුමාගේ මුහුණ (සිත) සතුටු කරන්නට ම උත්සාහවත් වන කම්කරුවෙකු වෙමි, එසේ වූ මම ද ඉදින් පින් කරන්නෙම් නම් ඒකාන්තයෙන් ඒ රජතුමා වැනි කෙනෙක් වන්නෙමි. එසේ වුව ද මම මුළු ජීවිතයෙහි ම දන් දුන්නේ නමුත් රජතුමා එක් දවසක දෙන දනයෙන් සියයෙන් පංගුවක් දීමට අපොහොසත් වෙමි. එබැවින් මම රජතුමාට හා සම සම්පත් කෙසේ ලබන්නෙම් ද? එබැවින් මම ඒකාන්තයෙන් කෙස් දැළි රැවුල් කපා දමා, සිවුරු හැඳ පෙරව, ගිහිගෙන් නික්ම සසුනෙහි පැවිදි වන්නෙම් නම් ඉතා යහපති"** යනුවෙනි.

හෙතෙම ඉන් මෑත කාලයෙක ස්වල්ප වූ හෝ භෝග රාශිය හැර, මහත් වූ හෝ භෝග රාශිය හැර, ස්වල්ප වූ හෝ නෑ පිරිස් හැර, බොහෝ වූ හෝ නෑ පිරිස් හැර, කෙස් දැළි රැවුල් කපා දමා සිවුරු හැඳ පෙරව ගිහිගෙන් නික්ම සසුනෙහි පැවිදි වන්නේය. ඔහු මෙසේ පැවිදි ව කයින් සිදුවන ප්‍රාණඝාත, අදත්තාදන, කාම මිථ්‍යාචාර අකුසලයන්ගෙන් වැළකීමෙන් කායික සංවරයෙන් යුක්ත වේ. වචනයෙන් සිදුවන බොරු කීම, කේලම් කීම, පරුෂ වචන කීම, හිස් වචන කීම යන අකුසලයන්ගෙන් වැළකී වාචසික සංවරයෙන් යුක්ත වේ. මනසින් සිදුවන අභිධ්‍යාව නම් වූ විෂම ලෝභය, ව්‍යාපාදය මිථ්‍යාදෘෂ්ඨිය යන අකුසලයන්ගෙන් වැළකී මානසික සංවරයෙන් යුක්ත වේ.

ධාර්මික ව ලැබෙන සිව්පසය ප්‍රත්‍ය ඇතිව, ධුතාංග ගුණ සමාදන් ව, ලද දෙයින් සතුටු වෙමින්, ලද පමණින් සතුටු වෙමින්, පහසුවෙන් පෝෂණය කළ හැකි සරල පැවැත්මෙන් යුක්තව, අවම පරිෂ්කාර ඇතිව සීල විශුද්ධියෙන් යුක්ත වේ.

මෙසේ සීලයෙහි පිහිටා ධ්‍යාන වඩමින් කෙලෙසුන් තුනී කරන කෙලෙස් දවාලන පැවැත්මෙන් යුක්තව චිත්ත පාරිශුද්ධියෙන් යුක්ත වේ.

මෙසේ ධ්‍යාන භාවනාවෙන් පාරිශුද්ධියට පත්ව ප්‍රභාස්වර වූ ප්‍රඥ සම්පන්න සිතින් යුතුව නාමරූප පඤ්ච උපාදනස්කන්ධාදී සංස්කාර විදර්ශනාව කොට ත්‍රිලක්ෂණ චතුරාර්‍ය සත්‍යය වශයෙන් ප්‍රත්‍යක්ෂයෙන් දැක නිවන් සුව භුක්තිවිඳීම නම් වූ උපධි විවේකයෙන් අග්‍ර පැවැත්මෙන් යුක්තව වාසය කරයි යනුවෙනි.

මහරජ ඔබගේ (රාජ) පුරුෂයෝ ඒ බව ඔබට මෙසේ දන්වති. දේවයන් වහන්ස, අසන සේක්වා! ඔබ වහන්සේගේ ගොවි බිම්හි සී සාමින් සිටි ගෘහපතියෙකු වූ, අයබදු ගෙවා ධන ධාන්‍ය රැස් කළ යම් ඒ පුරුෂයෙක් වී ද, දේවයන් වහන්ස! හෙතෙම කෙස් දැළි රැවුල් කපා දමා සිවුරු හැඳ පෙරව ගිහිගෙන් නික්ම සසුනෙහි පැවිදි වූයේය.

ඔහු මෙසේ පැවිදි ව කයින් සිදුවන ප්‍රාණඝාත, අදත්තාදන, කාම මිථ්‍යාචාර අකුසලයන්ගෙන් වැළකීමෙන් කායික සංවරයෙන් යුක්ත වේ. වචනයෙන් සිදුවන බොරු කීම, කේලම් කීම, පරුෂ වචන කීම, හිස් වචන කීම යන අකුසලයන්ගෙන් වැළකී වාචසික සංවරයෙන් යුක්ත වේ. මනසින් සිදුවන අභිධ්‍යාව නම් වූ විෂම ලෝභය, ව්‍යාපාදය, මිථ්‍යාදෘෂ්ඨිය යන අකුසලයන්ගෙන් වැළකී මානසික සංවරයෙන් යුක්ත වේ.

ධාර්මික ව ලැබෙන සිව්පස ප්‍රත්‍ය ඇතිව, ධූතාංග ගුණ සමාදන්ව, ලද දෙයින් සතුටු වෙමින්, ලද පමණින් සතුටු වෙමින්, පහසුවෙන් පෝෂණය කළ හැකි සරල පැවැත්මෙන් යුක්තව අවම පරිෂ්කාර ඇතිව සීල විශුද්ධියෙන් යුක්ත වේ.

මෙසේ සීලයෙහි පිහිටා ධ්‍යාන වඩමින් කෙලෙසුන් තුනී කරන කෙලෙස් දවාලන පැවැත්මෙන් යුක්තව චිත්ත පාරිශුද්ධියෙන් යුක්ත වේ.

මෙසේ ධ්‍යාන භාවනාවෙන් පාරිශුද්ධියට පත්ව ප්‍රභාස්වර වූ ප්‍රඥා සම්පන්න සිතින් යුතුව නාමරූප පඤ්ච උපාදනස්කන්ධාදී සංස්කාර විදර්ශනාව කොට ත්‍රිලක්ෂණ චතුරාර්‍ය සත්‍යය වශයෙන් ප්‍රත්‍යක්ෂයෙන් දැක නිවන් සුව භුක්තිවිඳීම නම් වූ උපධි විවේකයෙන් අග්‍ර පැවැත්මෙන් යුක්තව වාසය කරයි යනුවෙනි.

මහරජ කිම? ඒ මාගේ පුරුෂ තෙමේ නැවතත් මා වෙත පැමිණේවා, හෙතෙම මාගේ ගොවිබිම්හි සී සාන්නා වූ ගෘහපතියෙකු වේවා, අයබදු ගෙවන්නා වූ ධන ධාන්‍ය රැස් කරන්නා වූ තැනැත්තෙක් වේවා යැයි ඔබ මෙසේ කියන්නෙහි ද?"

එවිට රජතුමා ස්වාමීනි **"ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස එය එසේ නොවේ. එසේ ඇති කල්හි ඔහුට අපි ආදර ගෞරව දක්වා වඳින්නෙමු. ඔහු දැක හුනස්නෙන් නැගිටින්නෙමු, සකස් කරන ලද ආසනයෙන් ද පවරන්නෙමු. සිවුරු පිණ්ඩපාත, සෙනසුන්, ගිලන්පස, බෙහෙත් පිරිකර යන මෙයින් යමක් අවශ්‍ය වේ නම් ඒ බව අපට කිව**

**මැනව යැයි ද විශෙෂයෙන් පවරන්නෙමු. ධාර්මික වූ ආරක්‍ෂාවෙන් රැකවරණය ද සලසන්නෙමු"** යැයි කීවේය.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ "**මහරජ ඔබ කුමක් සිතන්නෙහි ද? ඉදින් එසේ ඇති කල්හි පැවිදි ව සසුන් ගුණ පිරීමෙන් මේ ආත්ම භාවයෙන් දැකිය හැකි විපාක ඵලයක් ඇත්තේ වේ ද? නොවේ ද? ඒ ගැන ඔබ ගේ අදහස කුමක් ද?"** යැයි අසා වදාළ සේක.

එවිට රජතුමා "**ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස, මෙසේ ඇති කල්හි ඒකාන්තයෙන් ම මේ ආත්ම භාවයෙහි දැකිය හැකි විපාක ඵලයක් වේමය"** යැයි කීවේය.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ "**මහරජ, මේ වනාහි මා විසින් ඔබට දක්වන ලද මේ ආත්මයෙහි ලැබිය හැකි දෙවැනි වූ මේ පැවිදි දම් පිරීමෙහි විපාක ඵලය වේ"** යැයි වදාළ සේක.

## ❄ ප්‍රණීතතර ශ්‍රමණ ඵලය

භාග්‍යවතුන් වහන්සේ විසින් මේ දිවියෙහි ම දැකිය හැකි ශ්‍රමණ ඵල දෙකක් දැක්වීමෙන් සතුටු වූ රජතුමා නැවත භාග්‍යවතුන් වහන්සේ අමතා "ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස, මේ ආත්ම භාවයෙහි දැක්ක යුතු වූ කියන ලද විපාක ඵලයන්ට වඩා මනාප වූ වඩා උතුම් වූ අන්‍ය වූ ද වෙනත් විපාක ඵලයක් දක්වන්නට හැක්කේ ද?" යැයි අසා සිටියේ ය.

භාග්‍යවතුන් වහන්සේ එයට පිළිතුරු වශයෙන් "**සක්කා, මහාරාජ තෙනහි, මහාරාජ, සුණොහි, සාධුකං මනසි කරොහි, භාසිස්සාමී'ති"** යනුවෙන් "**හැක්කේය මහරජ, එසේ නම් අසව මහරජ, මනාකොට මෙනෙහි කරව, කියන්නෙමි"** යැයි වදාළ සේක.

මෙහි "**සුණොහි"** යන්නෙන් "එසේ වී නම් මහරජ, ඔබ පැවිද්ද ලැබූවහුට මෙලොවදීම ලැබිය හැකි ඒ ශ්‍රමණ ඵල දැනගනු කැමැත්තෙහි නම් මැනවින් කන් යොමු කරමින් සෝතින්ද්‍රියෙහි විසිර යාම

වළක්වමින් මෙම දේශනාවට ම කන යොමු කොට ධර්‍ම ගෞරවයෙන් අසව යනුයි. "**සාධුකං මනසිකරොහි**" යන්නෙන් සිතෙහි අවධානය ගැඹුරට යොදා ගනිමින් නොවිසිරුණා වූ මනා සිහියෙන් යුතුව මෙනෙහි කරව යනුයි.

එසේම "**සුණොහි සාධුකං මනසිකරොහි**" යන්නෙන් ධර්මයෙහි ගැඹුරු බව ද, එහි අර්ථ විග්‍රහයන් ගැඹුරු බව ද, දේශනා ක්‍රමය ගැඹුරු බව ද, එය මාර්ග ඥානයෙන් අවබෝධ කරගැනීම අතිශයින් ගැඹුරු බව ද දත යුතුය යැයි දක්වයි.

මෙසේ ගැඹුරු වූ කල්හි "**මම කෙසේ පිහිටක් ලබන්නෙම් ද**" යැයි ධර්ම ශ්‍රවණයට පසු බසින්නා වූ රජතුමා හට ධර්මශ්‍රවණයට උත්සාහ ඇතිකරවීම පිණිස "**භාසිස්සාමි**" යන්නෙන් "**මහරජ, මනාව ධර්ම ගෞරවයෙන් අසන්නෙහි නම්, මනාකොට අර්ථ සිහි කරන්නෙහි නම් අර්ථ ව්‍යඤ්ජනයන්ගෙන් පරිපූර්ණ කොට යම් සේ ඔබට දත හැකි වන්නේ ද එලෙස දේශනා කරන්නෙමි**" යැයි වදාළ සේක.

රජතුමා "**ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස, එසේ ය. මැනවින් අසන්නෙමි. මැනවින් මෙනෙහි කරන්නෙමි**" යැයි පිළිතුරු දුන්නේ ය.

භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළ සේක. "**ඉධ, මහාරාජ, තථාගතො ලොකෙ උප්පජ්ජති අරහං, සම්මාසම්බුද්ධො, විජ්ජාචරණසම්පන්නො, සුගතො, ලොකවිදූ, අනුත්තරො පුරිසදම්මසාරථී, සත්ථාදෙවමනුස්සානං, බුද්ධො, භගවා. සො ඉමං ලොකං සදෙවකං සමාරකං සබ්‍රහ්මකං සස්සමණබ්‍රාහ්මණිං පජං සදෙවමනුස්සං සයං අභිඤ්ඤා සච්ඡිකත්වා පවෙදෙති. සො ධම්මං දෙසෙති ආදිකල්‍යාණං, මජ්ඣෙකල්‍යාණං, පරියොසානකල්‍යාණං, සාත්ථං සබ්‍යඤ්ජනං, කෙවලපරිපුණ්ණං පරිසුද්ධං බ්‍රහ්මචරියං පකාසෙති**"

එහි "**ඉධ**" යනු "**මධ්‍ය දේශයෙහි**" ය. ඇතැම් තැනක ලෝකය සඳහා ද, බුද්ධ ශාසනය සඳහා ද, වාසය කරන ස්ථානය සඳහා ද කියනු ලැබේ. මෙතැන්හි දී සියලු බුදුරජාණන් වහන්සේලා ලොව පහළ වන මධ්‍ය දේශය සඳහා කියන ලදි. "**මහරජ**" යනුවෙන් මුලින් ප්‍රශ්න

විසඳීමට රජතුමා හට දී ඇති ප්‍රතිඥාව අනුව නැවත රජතුමාගේ අවධානය ඇති කර ගැනීම සඳහා වූ ආමන්ත්‍රණය යි. මෙසේ ආමන්ත්‍රණය කොට **"මහාරාජ ඉමස්මිං ලොකෙ තථාගතො උප්පජ්ජති අරහං ... භගවා."** අර්හත් වූ, සම්‍යක් සම්බුද්ධ වූ, ත්‍රි විද්‍යා අෂ්ටවිද්‍යා පසළොස් චරණ ධර්මයන්ගෙන් සමන්වාගත වූ, යහපත් ගති ඇත්තා වූ, සියලු ලෝකය දන්නා වූ, දමනය කළ යුත්තන් දමනයෙහි නිරුත්තර වූ, දෙව් මිනිසුන්ට ශාස්තෘ වූ, තමන් දත් චතුරාර්‍ය සත්‍ය ධර්මය අන්‍යයන්ට ද දේශනා කරන්නා වූ, සියලු භාග්‍යය ධර්මයන්ගෙන් යුක්ත වූ තථාගතයන් වහන්සේ මෙලොව උපදනාහ.

එහි **"තථාගතො"** යනු **"තථා ආගතොති තථාගතො, තථා ගතොති තථාගතො, තථලක්ඛණං ආගතොති තථාගතො, තථධම්මෙ යාථාවතො අභිසම්බුද්ධොති තථාගතො, තථදස්සිතාය තථාගතො, තථවාදිතාය තථාගතො, තථාකාරිතාය තථාගතො, අභිභවනට්ඨෙන තථාගතොති"** යන අට කරුණකින් ඒ බුදුරජාණන් වහන්සේ තථාගත නම් වේ. එහි අර්ථ මෙසේ ය.

❖ **"තථා ආගතොති තථාගතො"**

**පූර්වයෙහි පහළ වූ බුදුරජාණන් වහන්සේලා අනුව ආ බැවින් භාග්‍යවතුන් වහන්සේ තථාගත නම් වේ.**

පූර්වයෙහි පහළ වූ විපස්සී සිඛී වෙස්සභූ ආදී බුදුරජාණන් වහන්සේලා නියත විවරණය ලැබූ තැන් පටන් සමත්‍රිංශත් පාරමිතා ධර්ම පූර්ණය කොට අංග - නේත්‍ර - ධන - රාජ්‍ය - පුත්‍ර දර යන පඤ්ච මහා පරිත්‍යාග කොට, පූර්ව යෝග[1] පූර්ව චර්‍යා[2] ධර්මඛ්‍යාන[3] ඤාතත්‍ථ චර්‍යාදිය ද, සත් තිස් බෝධි පාක්ෂික ධර්මයන් ද පූර්ණය කොට බුදු බව දක්වා පැමිණ වදාළ සේක් ද, එලෙස ම අපගේ භාග්‍යවතුන් වහන්සේ ද, දීපංකර භාග්‍යවතුන් වහන්සේ හමුවෙහි පටන් සමත්‍රිංශත් පාරමිතා ධර්ම පූර්ණය කොට, අංග - නේත්‍ර - ධන - රාජ්‍ය - පුත්‍ර දර යන පඤ්ච මහා පරිත්‍යාග කොට පූර්ව යෝග පූර්ව චර්‍යා ධර්මඛ්‍යාන ඤාතත්‍ථ චර්‍යාදිය ද සත් තිස් බෝධි පාක්ෂික ධර්මයන්

---

[1] පූර්ව භවයන්හි දී කළ දන සීලාදී ක්‍රියා
[2] පූර්ව භවයන්හි දී පුරුදු කළ පැවතුම්
[3] ධර්ම දේශනා කිරීම

ද පූර්ණය කොට බුදු බව දක්වා පැමිණ වදාළ බැවින් "**තථාගත**" නම් වේ.

❖ "තථා ගතොති තථාගතො"

**පූර්වයෙහි පහළ වූ බුදුරජාණන් වහන්සේලා අනුව ගිය බැවින් භාග්‍යවතුන් වහන්සේ තථාගත නම් වේ.**

පූර්වයෙහි පහළ වූ විපස්සී සිඛී වෙස්සභූ ආදී බුදුරජාණන් වහන්සේලා යම් සේ උපන් ඇසිල්ලෙහි සම වූ පාතයන්ගෙන් උතුරු දෙසට සත් පියවරක් වැඩි සේක් ද, දෙවියන් විසින් ස්වේතච්ත්‍ර දරණ කල්හි සියලු දෙස බැලූ සේක් ද, "**අග්ගොහමස්මි ලොකස්ස**" යනා දී සිංහ නාද කළ සේක් ද අප භාග්‍යවතුන් වහන්සේ ද එලෙස ම ගිය බැවින් "**තථාගත**" නම් වේ.

❖ "තථලක්ඛණං ආගතොති තථාගතො"

**ඇත්තා වූ සත්‍ය ලක්ෂණයන්ට නුවණින් පැමිණි බැවින් භාග්‍යවතුන් වහන්සේ තථාගත නම් වේ.**

"**තථ**" යනු සත්‍යයට නමකි. භාග්‍යවතුන් වහන්සේ සියලු රූපී අරූපී (නාම රූප) ධර්මයන්ගේ සත්‍ය වශයෙන් ඇත්තා වූ පඨවි ධාතුවෙහි කර්කශ ලක්ෂණය, ආපෝ ධාතුවෙහි වැගිරෙන ලක්ෂණය, තේජෝ ධාතුවෙහි උණුසුම් ලක්ෂණය, වායෝ ධාතුවෙහි සැලෙන ලක්ෂණය, විඤ්ඤාණ ධාතුවෙහි විශේෂයෙන් දැන ගැනීමේ ලක්ෂණය ආදී ස්වලක්ෂණයන් ද, සියලු සංස්කාර ධර්මයන්හි ඇත්තා වූ අනිත්‍ය - දුක්ඛ - අනාත්ම යන සාමාන්‍ය ලක්ෂණයන් ද මනාකොට දත් බැවින් "**තථාගත**" නම් වේ.

❖ "තථධම්මෙ යාථාවතො අභිසම්බුද්ධොති තථාගතො"

**තථ ධර්ම ඇති ලෙස අවබෝධ කල බැවින් භාග්‍යවතුන් වහන්සේ තථාගත නම් වේ.**

දුක්ඛය සමුදය නිරෝධය මාර්ගය යන චතුරාර්‍ය සත්‍යය ධර්මයන් කිසි කලෙකවත් වෙනස් නොවී එලෙස ම පවත්නා බැවින් "**තථ**" නම් වේ. කිසි කලෙක අසත්‍ය නොවන ධර්ම බැවින් "**අවිතථ**" නම් වේ.

අන් අයුරකින් නො පවතින බැවින් "**අනඤ්ඤතථ**" නම් වේ. මෙසේ චතුරාර්‍ය්‍ය සත්‍ය ධර්‍මය ඇති සැටියෙන් අවබෝධ කළ බැවින් භාග්‍යවතුන් වහන්සේ "**තථාගත**" නම් වේ.

❖ "තථදස්සිතාය තථාගතො"

**සත්‍ය ලෙස දක්නා බැවින් භාග්‍යවතුන් වහන්සේ තථාගත නම් වේ.**

සත්වයන්ගේ ඇස් කන් නාස දිව කය යන ද්වාරයන්ට අරමුණු වන රූප, ශබ්ද, ගන්ධ, රස, ස්පර්‍ශ යන ධර්‍මයන් කෙරෙහි මුලා නොවී, ඇස යනු පූර්‍ව ජාතියෙහි දී ඇසෙන් රූප දැකීම හේතුවෙන් මතුවට ද රූප දැකීමේ කැමැත්ත නිදන කොට කර්‍මයෙන් හටගත් පෙනීමේ ශක්තිය ගෙන දෙන භූත රූප උපාදය රූප සමූහයකි, යනාදී ලෙස හේතු-ඵල දර්‍ශනය තුළින් ඇතිලෙස දක්නා ලද බැවින් භාග්‍යවතුන් වහන්සේ "**තථාගත**" නම් වේ.

❖ තථවාදිතාය තථාගතො,

**සත්‍ය වූ වෙනස් නොවන ධර්‍ම දේශනා ඇති බැවින් භාග්‍යවතුන් වහන්සේ තථාගත නම් වේ.**

භාග්‍යවතුන් වහන්සේ යම් රැයක සම්මා සම්බුද්ධත්වයට පැමිණි සේක් ද, යම් රැයක අනුපාදිශේෂ පරිනිර්‍වාණයෙන් පිරිනිවන් පා වදාළ සේක් ද, මේ අතර පන්සාළිස් වසක් මුළුල්ලෙහි දේශනා කොට වදාළ "**සුත්ත, ගෙය්‍ය, වෙය්‍යාකරණ, ගාථා, උදාන, ඉතිවුත්තක, ජාතක, අබ්භූතධර්‍ම, වෙදල්ල**" යන නවාංග ශාස්තෲ ශාසනයෙන් යුත් සත්‍ය ධර්‍මය කිසි කලෙක වෙනස් නොවන බැවින් ද, නොවරදවාම ඒ ධර්‍මය අනුව සියල්ල සිදුවන බැවින් ද "**තථ**" නම් වේ. මෙසේ නොවරදින ධර්‍මයක්ම දේශනා කොට වදාළ බැවින් භාග්‍යවතුන් වහන්සේ "**තථාගත**" නම් වේ.

❖ තථාකාරිතාය තථාගතො,

**යථාවාදී තථාකාරී බැවින් ඒ භාග්‍යවතුන් වහන්සේ තථාගත නම් වේ.**

ඒ භාග්‍යවතුන් වහන්සේ විසින් වචනයෙන් දේශනා කොට වදරණ දේ කායික පැවතුම්වලට පරස් නොවී අනුකූල වන ලෙස වදරණ සේක. කයින් කරන දේ කරන දේශනාවන්ට පරස් නොවන ලෙස කරන සේක. මෙලෙස ඒ භාග්‍යවතුන් වහන්සේ ගේ වචනය යම් සේ ද, කායික ක්‍රියාවන් ද එලෙස ම ය. කායික ක්‍රියාවන් යම් සේ ද, වචනය ද එසේම ය. මෙසේ "**යථාවාදී තථාකාරී** බැවින් ද, **තථාකාරී යථාවාදී බැවින් ද**" ඒ භාග්‍යවතුන් වහන්සේ "**තථාගත**" නම් වේ.

❖ "අභිභවනට්ඨේන තථාගතොති"

**අභිභවනය නොකළ හැකි බැවින් භාග්‍යවතුන් වහන්සේ තථාගත නම් වේ.**

ඒ භාග්‍යවතුන් වහන්සේ උඩින් භවාග්‍රය ද, යටින් අවීචිය ද, කෙළවර කොට ඇති සරසින් විශ්වය පුරා පවතින අපරිමාණ ලෝක ධාතූන්හි සියලු සත්වයන් සීලයෙන් සමාධියෙන් ප්‍රඥාවෙන් විමුක්තියෙන් විමුක්ති ඥාණ දර්ශනයෙන් ඉක්මවන සේක. සියලු සත්වයන් ඒ ගුණයන්ගෙන් යට කොට සිටින සේක. ඒ සියලු සත්වයන්ට අතුල්‍ය (අසමාන) වන සේක. අප්‍රමෙය්‍ය (මැනිය නොහැකි) වන සේක. නිරුත්තර (උසස්, ශ්‍රේෂ්ඨ) වන සේක. දෙවියන්ට අතිදේව වන සේක. ශක්‍රයන්ට අතිශක්‍ර වන සේක. බ්‍රහ්මයන්ට අති බ්‍රහ්ම වන සේක. සියලු සත්වයන්ට උතුම් වන සේක. එබැවින් ඒ භාග්‍යවතුන් වහන්සේ "**තථාගත**" නම් වේ.

"**ලොකෙ උප්පජ්ජති**" ඉහත කී ගුණ ඇති තථාගතයන් වහන්සේ නමක් ලොව පහළ වෙති. මෙහි ලෝක යනු "**සත්ව ලෝකය, සංස්කාර ලෝකය, අවකාශ ලෝකය**" යන ලෝක තුනයි. මෙහි දී "**සත්ව ලෝකය**" කියන ලදි. සත්ව ලෝකයෙහි පහළ වන්නේ නමුත් දෙව්ලොව බඹලොව පහළ නොවෙති. බුදුරජාණන් වහන්සේලා මනුලොව ම පහළ වෙති. එසේ මනුලොව පහළ වන්නේ ද අන් සක්වළක පහළ නොවෙති. මේ මංගල සක්වළෙහි ම පහළ වෙති. මේ මංගල සක්වළෙහි ද "**උතුරු කුරු දිවයින, පූර්ව විදේහය, අපරගෝයානය**" යන මහද්වීපයන්හි පහළ නොවෙති. "**ජම්බුද්වීපයෙහි**

ම” පහළ වෙති. ජම්බුද්වීපයෙහි ද සෑම තැනක ම පහළ නොවෙති. “**මධ්‍ය දේශයෙහි ම**” පහළ වෙති. ඒ මධ්‍ය දේශය මෙසේ ය.

මහා බෝධි මණ්ඩලය ජම්බුද්වීප භූමියෙහි මධ්‍යය වේ. ඒ බෝධි මණ්ඩලයට පෙර දිගින් ගව් සියයක් ගිය තැන කජංගල නම් නියම් ගමක් වේ. එයට නැගෙනහිරින් වූ ශාල වෘක්ෂයන්ගෙන් පිටත ප්‍රත්‍යන්ත ජනපදයෝය. ඇතුළත මධ්‍ය දේශය වේ.

මහා බෝධි මණ්ඩලයට ගිනිකොන දිසාවෙහි සලලවතී මහ ගංගාව වේ. ඉන් පිටත ප්‍රත්‍යන්ත ජනපදයෝය. ඇතුළත මධ්‍ය දේශය වේ.

මහා බෝධි මණ්ඩලයට දකුණු දිසාවෙහි ගව් පන්සියයක් ගිය තැන සේතකර්ණික නම් නියම් ගමක් වේ. ඉන් පිටත ප්‍රත්‍යන්ත ජනපදයෝය. ඇතුළත මධ්‍ය දේශය වේ.

මහා බෝධි මණ්ඩලයට බටහිරින් සය සියයක් ගව් ගිය තැන ථූණ නම් බ්‍රාහ්මණ ගමක් වේ. ඉන් පිටත ප්‍රත්‍යන්ත ජනපදයෝය. ඇතුළත මධ්‍ය දේශය වේ.

මහා බෝධි මණ්ඩලයට උතුරු දිසාවෙහි ගව් පන්සියයක් ගිය තැන උසිරද්වජ පර්වතය වේ. ඉන් පිටත ප්‍රත්‍යන්ත ජනපදයෝ ය. ඇතුළත මධ්‍ය දේශය වේ.

ඉහත කියන ලද නැගෙනහිර දිග වූ ශාල වෘක්ෂයෙහි සිට බටහිර දිසාවෙහි වූ ථූණ නම් බ්‍රාහ්මණ ගමට ගව් එක්දහස් දෙසීයක් ඇත්තේ ය. දකුණුදිග වූ සේතකර්ණික නම් නියම් ගම සිට උතුරුදිග වූ උසිරද්වජ පර්වතයට ගව්[1] දහසක් ඇත්තේ ය. මෙලෙස යොදුන්[2] තුන්සියයක් දිග ඇති, යොදුන් දෙසීයක් පළල ඇති මිහිගු බෙරයක

[1] ගව්වක් යනු වර්තමාන මිනුම්වලින් කිලෝමීටර පසකි.
[2] යොදුනක් යනු වර්තමාන මිනුම්වලින් කිලෝමීටර විස්සකි. සැතපුම් 12.5 කි.

හැඩය ඇති ඉහත කී සීමා මායිම්වලින් ඇතුළත භූමිය "මධ්‍ය දේශය" නම් වේ.

මහා බෝධි මණ්ඩලයට පූර්ව දිසාවෙහි හස්තිපුර නුවර, මාතාංගපුර නුවර, සවීර නුවර, සෞරාෂ්ට නුවර, පුණ්ඩරික නුවර, කලිඟු නුවර, රුවන් ආකර නුවර යන නුවර සත පිහිටියේ ය.

මහා බෝධි මණ්ඩලයට ගිනිකොන දිසාවෙහි සැවැත් නුවර, ජයතුරා නුවර, සාගල නුවර, කුසාවතී නුවර, රජගහ නුවර, මියුලු නුවර යන නුවර සය පිහිටියේ ය.

මහා බෝධි මණ්ඩලයට දකුණු දිසාවෙහි අරිට්ඨපුර නුවර, කුලසවුංග නුවර, අයෝධ්‍යා නුවර, ඉඳිපත් නුවර, කුරුරට, බරණැස් නුවර, කපිලවස්තුපුර නුවර යන මේ සතු නුවර පිහිටියේ ය.

මහා බෝධි මණ්ඩලයට බටහිර දිසාවෙහි සිංහබාහු නුවර, අරිට්ඨපුර නුවර, විසාලා මහනුවර, කොසඹෑ නුවර, පැළලුප් නුවර, කණ්ගෞඩ නුවර, දන්තපුර නුවර යන මේ සත් නුවර පිහිටියේ ය.

මහා බෝධි මණ්ඩලයට උතුරු දිසාවෙහි උත්තර පඤ්චාල නුවර, රෝජගය, වසාවස්ස නුවර, තක්සලා නුවර, කුසිනාරා නුවර, තාම්‍රපර්ණී නුවර, ගෞඩ දේශය, ගන්ධාර දේශය යන මේ අට මහ නුවර පිහිටියේ ය.

මේ පන්තිස් නුවර බුද්ධ කාලයෙහි පැවති සොළොස් මහා ජනපදයන්ගෙන් "**අංග, මගධ, කාසි, කෝසල, වජ්ජි, මල්ල, චේති, වත්ස, කුරු, පඤ්චාල, මත්ස, සූරසේන**" යන ජනපද දෙළොස මධ්‍ය දේශයට ඇතුළත් වේ. ලොව පහළ වන "**සම්මා සම්බුදු රජාණන් වහන්සේලා ද, පසේ බුදුරජාණන් වහන්සේලා ද, අග්‍ර ශ්‍රාවක මහා ශ්‍රාවක මහ රහතන් වහන්සේලා ද, සක්විති රජවරු ද, මහේශාක්‍ය දෙවියෝ ද, බ්‍රහ්මයෝ ද, මහ ධන සිටුවරු ද, මහත් කීර්තියක් ඇති ශ්‍රමණ බ්‍රාහ්මණාදීහු ආදී මහා පුණ්‍යවන්තයෝ ද**" මේ මධ්‍ය දේශයෙහි ම උපදිති. එයින් බැහැර ප්‍රත්‍යන්ත ජනපදයන්හි නූපදිති.

මෙසේ කියන ලද "**අරහං, සම්මාසම්බුද්ධො, විජ්ජාචරණ-සම්පන්නො, සුගතො, ලොකවිදූ, අනුත්තරො පුරිසදම්මසාරථි, සත්ථා දෙවමනුස්සානං, බුද්ධො, භගවා**" යන නව අරහාදී ගුණ ඇති භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ නමක් දීර්ඝ කාලයකින් පසුව ලොව පහළ වෙති.

ඒ භාග්‍යවතුන් වහන්සේ දෙවියන් සමග අවශේෂ ලෝකය ද, මාරයන් සමග අවශේෂ ලෝකය ද, බ්‍රහ්මයන් සමග අවශේෂ ලෝකය ද, බුදු සසුනට සතුරු වූ ශ්‍රමණ බ්‍රාහ්මණ සමූහයා ද, පව් නැසූ ආර්‍ය්‍ය උතුමන් ද, තදංග විෂ්කම්භන වශයෙන් කෙලෙසුන් යටපත් කළ ශ්‍රමණයෝ ද, රජුන් සහ මිනිසුන් සහිත වූ, වර්‍ණනය වූ දෙවියන් සහිත සත්ව සමූහය ද ස්වකීය වූ විශිෂ්ට ඥානයෙන් දැන ප්‍රත්‍යක්‍ෂ වශයෙන් අවබෝධ කරයි.

ඒ භාග්‍යවතුන් වහන්සේ සත්වයන් කෙරෙහි ඇති මහා කරුණාව නිසා අනුත්තර වූ විවේක සුවය වන ඵල සමාපත්ති සුවය පවා අත්හැර දමා දහම් දෙසන සේක. එය ද අල්ප කොට හෝ බොහෝ කොට හෝ දෙශනා කරන්නේ ද **ආදි කල්‍යාණ, මජ්ඣෙ කල්‍යාණ, පරියෝසාන කල්‍යාණ** වශයෙන් මුල මැද අග යහපත් ලෙසට ම නිවැරදිව ම දේශනා කරන සේක. මෙලෙස බුදු රජාණන් වහන්සේගේ ධර්‍ම දේශනාවෙහි මුලක් මැදක් අවසානයක් ඇත්තේ වේ.

භාග්‍යවතුන් වහන්සේ වදාළ සතර පද ගාථාවක මුල් පදය **ආදිය** හෙවත් මුල වේ. මැද දෙ පදය **මධ්‍යය** වේ. සිවුවන පදය **පරියොසානය** හෙවත් **අග** වේ. එක් අනු සන්ධියක් ඇති සූත්‍රයක සූත්‍ර නිදානය **මූලය** නම් වේ. "**ඉදමවොච භගවා අත්තමනා තෙ භික්ඛූ භගවතො භාසිතං අභිනන්දුන්ති**" යන මේ නිගමනය **අවසානය** නම් වේ. ඒ දෙක අතර කොටස **මධ්‍යය** නම් වේ. නොයෙක් අනු සන්ධි ඇති සූත්‍රයක සූත්‍ර නිදානය **මූලය** නම් වේ. **ඉදමවොච භගවා** ආදී නිගමන කථාව **අවසානය** නම් වේ. ඒ අතර වූ අනු සන්ධි සියල්ල **මධ්‍යය** නම් වේ.

එසේම බුද්ධ අනුශාසනාව වූ අර්‍ථ කථා සහිත සියලු ත්‍රිපිටක ධර්‍මය ද විශේෂයකින් තොරව සීල සමාධි ප්‍රඥා වශයෙන් මෙසේ ම වේ. ශාසනයෙහි "**සීලය**" මූලය වේ. "**සමාධිය**" මධ්‍යය වේ. "**ප්‍රඥාව**" **අවසානය** වේ. තව ද ශාසනයෙහි "**සීල සමාධි ප්‍රඥා**" තුන මූලය වේ.

"**ආර්‍ය්‍ය මාර්ගය**" මධ්‍යය වේ. "**ආර්‍ය්‍ය ඵලය හා නිවන**" අවසානය වේ. මෙහි දී "**බුද්ධ දේශනාව**" අදහස් කරන ලදි.

එම බුද්ධ දේශනාව **අර්ථ සහිත** ය. යමෙකුගේ ආහාර පාන ස්ත්‍රී පුරුෂ ආදීන්ගේ වර්ණනා ආශ්‍රිත දේශනාවක් වේ ද, හෙතෙම අර්ථ සහිතව නො දෙසයි. භාග්‍යවතුන් වහන්සේ වනාහී එබඳු දේශනා හැර **සතර සතිපට්ඨාන** ආදී බෝධි පාක්ෂික ධර්ම ඇතුළත් කොටම ධර්ම දේශනා කරන සේක. එබැවින් ඒ බුද්ධ දේශනාව "**සාර්ථක දේශනා**" යැයි කියනු ලැබේ.

එම බුද්ධ දේශනාව අක්ෂර පරිපූර්ණ කොට දේශනා කරන සේක. යමෙකු විසින් කරනු ලබන දේශනාවක් පරිපූර්ණ එක් ව්‍යඤ්ජනාක්ෂරයකින් යුක්ත වේ ද, තොළ ස්පර්ශ වී ශබ්දය පිට නොවේ ද, විසිරී ගිය උච්චාරණ ඇත්තේ වේ ද, අනුනාසිකව පමණක් හඬ පිට වේ ද ඔහුට **දමිළ, කිරාත, යවන** ආදී අනාර්‍ය්‍යයන්ගේ භාෂා මෙන් ව්‍යඤ්ජන පූර්ණත්වයක් නැති බැවින් එබඳු දේශනා "**අබ්‍යඤ්ජන දේශනා**" නම් වේ.

භාග්‍යවතුන් වහන්සේගේ දේශනාව වනාහී :-

"**සිථිලං ධනිතඤ්ච දීඝරස්සං - ලහුකං ගරුකඤ්ච නිග්ගහීතං,**
**සම්බන්ධං වවත්ථිතං විමුත්තං - දසධා බ්‍යඤ්ජනබුද්ධියා පභෙදො**"

යනුවෙන් සියලු ආකාරයෙන් පරිපූර්ණ දේශනා ඇති සේක.

- ❖ **සිථිල** :- වර්ගාක්ෂරයන්හි පළමු වන "**ක, ච, ට, ත, ප**" යන අකුරු පස හා තෙවන "**ග, ජ, ඩ, ද, බ**" යන අකුරු පසය.
- ❖ **ධනිත** :- වර්ගාක්ෂරයන්හි දෙවන "**ඛ, ඡ, ඨ, ථ, ඵ**" යන අකුරු පස හා සිවුවන "**ඝ, ඣ, ඪ, ධ, භ**" යන අකුරු පසය.
- ❖ **දීර්ඝ** :- "**ආ, ඊ, ඌ**" ආදී දීර්ඝ අක්ෂරයෝය.
- ❖ **රස්ස** :- "**අ, ඉ, උ**" ආදී හ්‍රස්ව අක්ෂර අක්ෂරයෝය.

- **ලහුක :-** "**න බමති**" ආදී ලෙස හල් අකුරක් අගට නොයොද හ්‍රස්ව අක්‍ෂර කීම.
- **ගරුක :-** "**නක්ඛමති**" ආදී ලෙස හල් අකුරක් අගට යොද දීර්ඝ අක්‍ෂර කීම.
- **නිග්ගහීත :-**"**0, ඞ**" බින්දුව හෙවත් අනු නාසික ශබ්දය.
- **සම්බන්ධ :-** "**තුණ්හී අස්ස**" යන්න "**තුණ්හස්ස**" යනුවෙන් පද දෙකක් සන්ධි කොට කීම.
- **වවත්ථිත :-** "**තුණ්හී අස්ස**" යනුවෙන් පර පදය සමග සම්බන්ධ නොකොට කීම.
- **විමුත්ත :-** "**එසං ඤත්තිං**" යනුවෙන් අනුනාසික නොකොට "**එසා ඤත්ති**" යනුවෙන් විවෘතව කීම.

යනුවෙන් ව්‍යඤ්ජන බුද්ධියෙහි[1] ප්‍රභේද දසයකි. මෙලෙස දසවිධ ව්‍යඤ්ජන සම්පත්තියෙන් යුක්ත වූ ධර්ම දේශනා ඇති බැවින් බුද්ධ දේශනාව "**සබ්‍යඤ්ජන**" නම් වේ.

ඒ භාග්‍යවතුන් වහන්සේගේ දේශනාව වනාහී අඩු ද නොවූ, වැඩි ද නොවූ සියලු ආකාරයෙන් පරිපූර්ණය. උපක්ලේශ රහිත වූයේ ය. යමෙක් ධර්ම දේශනාවක් කරන විට ලාභ සත්කාර කීර්ති ප්‍රශංසා අපේක්‍ෂා කොට කරයි ද, ඒ දෙසුම අපිරිසිදු දෙසුමකි. භාග්‍යවතුන් වහන්සේ වනාහී ලෝක ආමිෂ අපේක්‍ෂා රහිතව අන්‍යයන්ට යහපත කිරීමේ මෛත්‍රිය පැතිරුණු මොලොක් සිතින් ම ධර්ම දේශනා කරන සේක. එබැවින් බුද්ධ දේශනාව පාරිශුද්ධ දේශනාවකි.

භාග්‍යවතුන් වහන්සේගේ දේශනාව වනාහී බ්‍රහ්මචර්‍ය්‍යාව ප්‍රකාශ කරන්නකි. මේ බ්‍රහ්මචර්‍ය්‍යාව වනාහී **දානය, උපස්ථානය, පඤ්චසීලය, සතර බ්‍රහ්ම විහරණ, මෛථුනයෙන් වැළකීම, ස්වදාර සන්තෝෂය, වීර්‍ය්‍යය, අෂ්ටාංග උපෝසථ සීලය, ආර්‍ය්‍ය මාර්ගය, ශාසනය** යන අර්ථයන්හි යෙදේ. මෙහි **සීල සමාධි ප්‍රඥා** යන ශික්‍ෂාත්‍රයෙන් සම්පූර්ණ

---

[1] අක්‍ෂර උච්චාරණයෙහි

"**බුද්ධ ශාසනය**" කියන ලදි. එබැවින් බ්‍රහ්මචර්‍ය්‍යාව ප්‍රකාශ කරති යැයි කියනු ලැබේ. භාග්‍යවතුන් වහන්සේ ආදි කල්‍යාණ යනාදී ලෙස පිරිසිදුව දේශනා කරන ධර්මය ත්‍රී ශික්ෂාවන්ට ඇතුළත් කොට ම ශාසන බ්‍රහ්මචර්‍ය්‍යාව ප්‍රකාශ කරති. ශ්‍රේෂ්ඨ අර්ථයෙන් බ්‍රහ්මයන් මෙන් වස්තු කාම ක්ලේශ කාමයන්ගෙන් තොරව හැසිරීමයි. එබැවින් බ්‍රහ්මයන්ගේ ද, බුද්ධාදී උතුමන්ගේ හැසිරීම මෙයින් ප්‍රකාශ කරයි.

එලෙස කියන ලද ස්වභාවයෙන් යුත් ධර්මය ගෘහපතියෙකු හෝ ගෘහපති පුත්‍රයෙකු හෝ අන්‍ය කුලයක උපන්නෙකු හෝ අසයි. කුමක් හෙයින් මෙහි පළමු කොට ගෘහපති කුලය පිළිබඳ කියන ලද්දේ ද යත්? නිහතමානී බව හා උසස් බව නිසා ය.

බොහෝ සෙයින් ක්ෂත්‍රිය කුලයෙන් පැමිණ පැවිදි වූවෝ ජාතිය නිසා මානය ඇති කර ගනිති. බ්‍රාහ්මණ කුලයෙන් පැමිණ පැවිදි වූවෝ මන්ත්‍ර නිසා මානය ඇති කර ගනිති. හීන ජාතික කුලයන්ගෙන් පැමිණ පැවිදි වූවෝ වනාහී ඔවුන්ගේ පහත් පැවතුම් ඇති බැවින් පැවිදි වී මනා කොට සිල් රැකීමට නොහැකි වෙති. ඔවුහු පූර්ව කර්මය හේතුවෙන් උපතින් ම උපනිඃශ්‍රයෙන් පහත් ගති ඇතිව උපදින බැවින් උපනිඃශ්‍රය නැත්තෝ වෙති. එබැවින් ශාසන ධර්මයෙහි පිහිටා සිටින්නට නොහැකි වෙති.

ගෘහපති කුලයෙහි උපන් දරුවෝ වනාහී ක්ෂත්‍රිය බ්‍රාහ්මණාදීන් මෙන් මානයෙන් උමතු නොවන බැවින් පැවිදි වී ද, මානයෙන් මුසපත් බවක් අහංකාරකමක් නොකොට ශක්ති ප්‍රමාණයෙන් බුද්ධ වචනය උගෙන විදර්ශනා වඩා රහත් ඵලය ලැබීමට සමත් වෙති. අනෙක් කුලවල උපන්නවුන්ගෙන් පැවිදි වූවෝ ස්වල්ප දෙනෙකි. ගෘහපති කුලයෙන් පැමිණ පැවිදි වූවෝ බොහෝ වෙති. මෙසේ නිහතමානී නිසා ද, උසස් නිසා ද පළමු කොට ගෘහපති කුලය දක්වන ලදි.

මෙසේ ගෘහපති කුලයෙන් හෝ අන්‍ය කුලයකින් හෝ පැමිණ පැවිදි වූවෝ ඒ පිරිසිදු ධර්මය අසා ධර්ම ස්වාමී වූ තථාගතයන් වහන්සේ කෙරෙහි "**භාග්‍යවතුන් වහන්සේ ඒකාන්තයෙන් සම්මා සම්බුද්ධ වන සේක්මය, ධර්මය ස්වාක්ඛාත වන සේක්මය**" යැයි ශ්‍රද්ධාව ඇති කරගනී. ඔහු ඒ ශ්‍රද්ධාවෙන් යුක්තව මෙසේ නුවණින් සිහි කරයි.

සැට රියනක් පමණ ගෙයක යොදුන් සියයක් තරම් ඈතින් අඹු සැමියන් සිටියේ නමුත් ඔවුන්ගේ බැඳීම් හා ගැටීම් සහිත බව, කෙත් වතු හෝ වෙනත් කර්මාන්තාදිය ඇති කල්හි බොහෝ පළිබෝධ සහිත බව හේතුවෙන් ගෘහ වාසය පීඩා සහිත ම ය. නොවසන ලද කසල ගොඩකට නැවත නැවත කසල දමන්නාක් මෙන් රාගා දී කෙලෙස් කුණු උපදින තැනකි. එසේම අඹු දරුවන්ගේ හා කෙත් වතු කර්මාන්තාදියෙහි නිමාවක් නැති කටයුතු ඇති හේතුවෙන් කුසල ධර්ම වැඩීමට බාධා ඇති තැනකි.

කෙලෙසුන්ගෙන් මුලාවට පැමිණ නොලැගෙන හෙයින් පැවිද්ද එළිමහන් බිමක් මෙන් වේ. පැවිද්ද වනාහී වසන ලද දොර ජනෙල් ඇති, උඩුමහල් ඇති, සතරැස් අටැස් ආදී වූ පියසි ඇති, රන්වන් ප්‍රාසාද, දිව්‍ය විමාන ආදියෙහි සිටියේ නමුත් ඒවායෙහි නො ඇලී නොබැඳී වාසය කරයි. එසේ ම පැවිද්ද සැප සේ කුසල් කිරීමට අවකාශ ඇති තැනකි. **සීල, සමාධි, ප්‍රඥා** යන ශික්ෂාත්‍රය සංඛ්‍යාත බ්‍රහ්මචර්‍ය්‍යාව එක් දිනක් හෝ නොකඩ කොට පිරීමෙහි සිත ඇති කර ගත යුතු බැවින් ද, එක් දිනක් හෝ කෙලෙසුන්ගෙන් තොරව විසීමෙහි සිත ඇති කර ගත යුතු බැවින් ද, ලියවන ලද හක්ගෙඩියක් මෙන්, මනාව සෝදන ලද හක් ගෙඩියක් මෙන්, ස්වල්ප වරදකටවත් නොපැමිණ පිරිසිදුව විසිය යුතුය. ගිහිව වෙසෙන්නාට මෙසේ නිර්මලව පරිපූර්ණව සීලාදී ගුණ වැඩිය නොහැකිය. එබැවින් මම නොයෙක් සැරසිලි ආදියෙන් අලංකාර කරන කෙස් රැවුල් ඉවත් කොට නොයෙක් ලෙස අලංකාරමත් කොට හැඩ හුරුකම් ඇතිව සුවඳ වගී එක් කොට අඳින පලඳින ඇඳුම් ආයිත්තම් ඉවත් කොට, ගස් වැල් ආදියෙහි "**කොළ, මල්, ගෙඩි, මුල්, පොතු, කඳ**" ආදිය තම්බා සකස්කරගත් කසට දිය (පඬු) පොවන ලද සිවුරු හැඳ පෙරව ගෘහ දිවියට හිත වූ කෘෂි වෙළඳම් ආදී කර්මාන්තයන් හා කුසල් වැඩීමට බාධක වූ එබඳු අනෙකුත් කටයුතුවලින් නිදහස් වූ බැවින් "**අනගාර**" නම් වූ බුදු සසුනෙහි පැවිද්ද ලබන්නෙම් නම් ඉතා හොඳය කියා අදහස් වේ.

ඔහු පසු කාලයක අල්ප වූ භෝගස්කන්ධයන් ද, මහත් වූ භෝගස්කන්ධයන් ද හැර දමා, අල්ප වූ ඥාතීන් හෝ බොහෝ වූ ඥාතීන් හැර දමා, කෙස්, දැළි රැවුල් කපා දමා සිවුරු හැඳ පෙරව ගිහිගෙන් නික්ම බුදු සසුනෙහි පැවිදි වේ.

මෙහි කහවණු දහසකට වඩා අඩු වූ අර්ථයෙන් අල්ප වූ භෝගස්කන්ධ නම් වේ. කහවණු දහසකට වඩා වැඩි වූ අර්ථයෙන් මහත් වූ භෝගස්කන්ධ නම් වේ. විසි දෙනෙකුට වඩා අඩු වූ අර්ථයෙන් අල්ප වූ ඤාතීන් නම් වේ. විසි දෙනෙකුට වඩා වැඩි වූ අර්ථයෙන් බොහෝ වූ ඤාතීන් නම් වේ.

මෙසේ බුදු සසුනෙහි පැවිදි වී ප්‍රාතිමෝක්ෂ සංවර සීලයෙන් යුක්ත වූයේ වෙයි. "**පාතිමොක්ඛ**" යන මෙහි කෙලෙසුන්ගේ බලවත් බව හේතුවෙන් පව් කිරීමේ පහසුකමින් ද, පින් කිරීමේ අපහසුකමින් නොයෙක් වර අපායෙහි වැටීමට හේතුවන බැවින් සීලයෙන් ගුණයෙන් පහත හෙලන කෙලෙස් ක්‍රියාකාරකම් "**පාති**" නම් වේ. එනම් පුහුදුන් සත්වයෝ ය. ගිහිව හෝ පැවිදි වී හෝ බුදු සසුනට බැසගෙන යම් සීලයක මැනවින් පිහිටා ගත් ඒ පුහුදුන් සත්වයෝ අපායට වැටෙන්නට නොදී අපා දුකින් හා සසර දුකින් මුදවාලත් ද, ඒ උතුම් සීලය "**පාතිමොක්ඛ**" නම් වේ. මෙසේ වූ ප්‍රාතිමෝක්ෂ සංවර සීලයෙන් සංවර වූයේ වේ.

එහි සංවරය නම් **පාරාජික ආපත්ති ස්කන්ධය, සංඝාදිසේස ආපත්ති ස්කන්ධය, ථුල්ලච්චය ආපත්ති ස්කන්ධය, පාචිත්තිය ආපත්ති ස්කන්ධය, පාටිදේසනීය ආපත්ති ස්කන්ධය, දුෂ්කට ආපත්ති ස්කන්ධය, දුර්භාෂිත ආපත්ති ස්කන්ධය** යන සප්ත ආපත්ති ස්කන්ධයන්හි ඇතුළත් සික්ෂාපද නොබිඳෙන ලෙස මැනවින් රැකීමයි.

එසේම **ආචාරයෙන්** හා **ගෝචරයෙන්** යුක්ත වූයේ වෙයි. ප්‍රාතිමෝක්ෂ සංවර සීලයට උපකාර ධර්ම වනුයේ ආචාරය හා ගෝචරය යන ධර්ම දෙකයි. එහි ආචාරය මෙසේ ය.

## ☸ ආචාරය

බුදු සසුනෙහි පැවිදි වී ශ්‍රමණ සාරුප්‍ය දේ කිරීම "**ආචාරය**" නම් වේ. එනම් :-

**ප්‍රාණඝාතය, අදත්තාදනය, කාමමිථ්‍යාචාරය,** යන කයින් සිදුවන වැරදිවලින් වැළකී, කාය සුචරිතයෙහි පිහිටීම **"කායික ආචාරය"** නම් වේ. **බොරු කීම, කේලම් කීම, පරුෂ වචන කීම, හිස් වචන කීම** යන වචනයෙන් සිදුවන වැරදිවලින් වැළකී වාක් සුචරිතයෙහි පිහිටීම **"වාචසික ආචාරය"** නම් වේ. තව ද සියලු ආකාරයෙන් සීල සංවරය ඇති බව **"ආචාරය"** නම් වේ.

තව ද යම් පැවිද්දෙකු සිව්පස ප්‍රත්‍ය ලැබීමේ අපේක්ෂාවෙන් උණ දඬු, කොළ වගී, මල්, ගෙඩි, නහන සුනු (සබන්), දැහැටි ආදිය ගිහියන් සතුටු කිරීමට ඔවුන්ට නොදෙයි ද, දයකයන් සතුටු කිරීමට තමන් පහත් තැන තබා දයකයා උසස් තැන තබා කථා නොකරයි ද, ඇත්ත ටිකක් ද, බොරු බොහෝ කොට ද යොද කථා නොකරයි ද, දයකයන් ඉදිරියෙහි ඔවුන්ගේ කුඩා දරුවන් වඩා ගැනීම, ලංකොට ගැනීම, කිරි මවුවරුන් මෙන් නැළවීම නොකරයි ද, ගිහියන්ගේ පණිවුඩ ගෙන් ගෙට ගෙන යාම නොකරයි ද, එසේම වෙදකම් කිරීම, නැකත් කීම, වස්කවි - සෙත්කවි කීම, බලි තොවිල් කිරීම, තෙල් - නූල් මැතිරීම ආදී බුදුරජාණන් වහන්සේ විසින් ප්‍රතික්ෂේප කරන ලද වැරදි ලෙස දිවි පැවැත්වීම නොකරයි ද මේ සියල්ල **"ආචාරය"** නම් වේ.

තව ද යම් පැවිද්දෙකු වැඩිහිටි තෙරුන් වහන්සේලා කෙරෙහි ගෞරව ඇත්තේ වේ ද, වැඩිහිටි තෙරුන් වහන්සේලා කෙරෙහි ලැජ්ජා ඇතිව සිවුරෙන් හෝ සිරුරෙන් නොගැටෙන ලෙස සිටී ද, වැඩිහිටි තෙරුන් වහන්සේලා ඉදිරියෙහි සිටගෙන හෝ ඉඳගෙන නොසිටී ද, හිස වසා පොරවා නොසිටී ද, විහාර සීමාව තුළ දෙවුර වසා පොරවා නොසිටී ද, අසුන්වල හිඳ වැඩිහිටි තෙරුන් වහන්සේලා සමග කථා නොකෙරේ ද, වැඩිහිටි තෙරුන් වහන්සේලා ඉදිරියෙහි පාවහන් නොදරයි ද, ගමට යන කල්හි වැඩිහිටි තෙරුන් වහන්සේලාට ඉදිරියෙන් නො යයි ද, ස්ත්‍රීන් වසන කාමරයන්ට නොයයි ද, කුඩා ළමුන්ගේ ඇඟ ස්පර්ශ නොකරයි ද, මනාකොට අඳන - සිවුරු ඇඳීම පෙරවීම කරයි ද, දුටුවන් පහදින ලෙස යෑම ඊම අවට බැලීම කරයි ද, යට හෙලූ ඇස් ඇතිව යෑම ඊම කරයි ද, පමණ දන ප්‍රත්‍යවේක්ෂා නුවණින් වළඳයි ද, නින්දෙහි නො ඇලුණේ වේ ද, භාවනාවෙහි යෙදී වෙසෙයි ද, සිහි නුවණින් යුක්ත වේ ද, ලද දෙයින් සතුටු වේ ද, වීර්‍ය්‍යය ඇත්තේ වේ ද, උපාධ්‍ය වත - ආචාර්‍ය්‍යය වත ආදී ආභිසමාචාරික වත්

පිළිවෙත් පිරීමෙහි යෙදී වෙසෙයි ද, එසේ වූ සදචාර ගුණ ඇති බව, යහපත් පැවැත්ම **"ආචාරය"** නම් වේ.

තව ද වැඩිහිටි තෙරුන් වහන්සේලා විචාරා ම බණ කීම, ප්‍රශ්න විසඳීම, පාමොක් දෙසීම කරයි ද, ගෞරවයෙන් නැගී සිට කථා කරයි ද, ගම් වැදී නිවෙස්වලට ගොස් ස්ත්‍රීන් අමතා **"තිබෙන්නේ මොනවා ද, කැඳ තිබේ ද, බත් ව්‍යඤ්ජන තිබේ ද, කැවිලි තිබේ ද"** යනාදී ලෙස නොසාරුප්‍ය දේ නොකරයි ද, මෙසේ වූ සදචාර ගුණ ඇති බව **"ආචාරය"** නම් වේ.

## ☸ ගෝචරය

බුදු සසුනෙහි පැවිදි වූ භික්ෂූන් වහන්සේ වෙසඟනන්, වැන්දඹු කාන්තාවන්, වැඩි වියට පත් පති කුලයට නොගිය කාන්තාවන් සැමියන් බැහැර ගියා වූ භාර්‍යාව පමණක් ඇති නිවෙස්, පණ්ඩකයන්, භික්ෂුණීන් ආදී ශ්‍රමණ ධර්මයට අන්තරාය කර වූ රාගාධිකයන් ඇසුරු නොකෙරේ ද, මත්පැන් හල් ඇසුරු නොකෙරේ ද, ලාභ සත්කාර හේතුවෙන් ආජීව පාරිශුද්ධියට අන්තරාය කර වූ රාජ - රාජ මහාමාත්‍යයන් නුසුදුසු ලෙස ඇසුරු නොකෙරේ ද, තිර්ථකයින් තීර්ථක ශ්‍රාවකයින් මිසදිටුවන් බැවින් ඔවුන්ගේ ඇසුර දිට්ඨි විපත්තියට හේතුවන බැවින් ඔවුන් සමග ධර්මානුකූලත්වයෙන් තොරව නුසුදුසු ලෙස එක්ව නොහිඳී ද, බුදු සසුනට විරුද්ධ වූ භික්ෂු භික්ෂුණී උපාසක උපාසිකාදීන්ට අනර්ථය කැමතිව, අහිත කැමතිව, අපහසුවට පත් කරනු කැමතිව, භය උපදවනු කැමතිව පරුෂ ලෙස බැණවැදීම ආදිය කරන කුලයන් ඇසුරු නොකර, භික්ෂු භික්ෂුණී උපාසක උපාසිකාදීන්ට හිත ඇති අභිවෘද්ධිය කැමති ශ්‍රද්ධාව ප්‍රසාදය ඇති කුලයන් පයිරුපාසනය, භජනය කරයි ද මෙසේ වූ පැවතුම් ඇති බව **"ගෝචරය"** නම් වේ.

මෙම ගෝචරය වනාහී **"උපනිස්සයගොචරය ආරක්ඛගොචරය උපනිබන්ධගොචරය"** යනුවෙන් ත්‍රිවිධ වේ. එහි :-

# ⌘ උපනිස්සයගොචරය

**අප්පිච්ඡකථා, සන්තුට්ඨිකථා, පවිවෙකකථා, අසංසග්ගකථා, වීරියාරම්භකථා, සීලකථා, සමාධිකථා, පඤ්ඤාකථා, විමුත්තිකථා, විමුත්තිඤාණදස්සනකථා** යන දසවිධ කථාවන්ට අයත් ගුණයන්ගෙන් යුත් අප්‍රමාදයෙහි යෙදී වෙසෙන කල්‍යාණ මිත්‍රයා ය. එහිඃ-

## ✠ අප්පිච්ඡකථා

ලද දෙයින් සතුටු නොවී මතු මත්තෙහි නැවත ලාභ බලාපොරොත්තු වීම නම් වූ **අත්‍රිච්ඡතාවය** ද, ලාභාපේක්ෂාවෙන් නැති ගුණ හැඟවීම නම් වූ **පාපිච්ඡතාවය** ද, ඇති ගුණයන්ට ගරු බුහුමන් ලැබීමේ අපේක්ෂාවෙන් පිළිගැනීමෙහි පමණ නොදැනීම නම් වූ **මහිච්ඡතාවය** ද, යන දෝෂයන් දුරු කොට සත්සුන් ගුණ හඟවන අදහසින් යුත් පිළිගැනීමෙහි පමණ දැනීම අල්පේච්ඡතාවය යි. මේ අල්පේච්ඡතාවය **ප්‍රත්‍ය අල්පේච්ඡතාවය, ධුතාංග අල්පේච්ඡතාවය, පර්‍ය්‍යාප්ති අල්පේච්ඡතාවය, අධිගම අල්පේච්ඡතාවය** යැයි සිව් වැදෑරුම් වේ. එහි :-

සිව්පසයෙහි අල්පේච්ඡ තැනැත්තා ප්‍රත්‍ය දයකයා ද, දන වස්තුව ද, තම ශක්තිය ද බලා, දන වස්තුව බහුල වේ ද, දයකයා ස්වල්පයක් දෙනු කැමැත්තේ ද, එහි දී දයකයාගේ අදහස සලකා ස්වල්පයක් ගනී. එසේම දන වස්තුව ස්වල්ප වේ ද, දයකයා බොහෝ දෙනු කැමැත්තේ වේ ද, එහි දී දන වස්තුව බලා ස්වල්පයක් ගනී. එසේම දන වස්තුව බොහෝ වේ ද, දයකයා බොහෝ දෙනු කැමැත්තේ වේ ද, එහි දී තමාගේ ශක්තිය බලා යැපිය හැකි පමණ ගනී. මෙබඳු භික්‍ෂුව නූපන් ලාභ උපදව යි. උපන් ලාභ ස්ථාවර කරයි. දයකයන්ගේ සිත් සතුටු කරයි. මෙය **ප්‍රත්‍ය අල්පේච්ඡතාවය** නම් වේ.

සමාදන්ව ගත් ධුතාංග තමා කෙරෙහි ඇතිබව නොදන්වනු කැමති බව **ධුතාංග අල්පේච්ඡතාවය** යි.

යමෙක් තමාගේ බහුශ්‍රැතභාවය ප්‍රකට කරන්නට අකමැති වේ ද, මෙය **පර්‍ය්‍යාප්ති අල්පේච්ඡතාවය** යි.

යමෙක් සෝවාන් ආදී මාර්ගයකට පැමිණියේ වේ ද, ඒ බව සබ්‍රහ්මචාරීන්ට දන්වන්නට අකැමති වේ ද, මෙය **අධිගම අල්පේච්ඡතාවය** යි. මෙසේ වූ ගුණයන් පැහැදිලි කිරීම පිළිබඳ කථා ඇතිබව "**අප්පිච්ඡකථා**" නම් වේ.

✠ **සන්තුට්ඨිකථා,**

භාග්‍යවතුන් වහන්සේ අනුදන වදාළ ධාර්මික ක්‍රමවලින් ලැබෙන ප්‍රණීත වූ හෝ කටුක වූ හෝ ලද ප්‍රත්‍යයකින් සතුටු වීම **සන්තුෂ්ටිතාවය** යි. මෙහි සිව්පස ප්‍රත්‍යය පිළිබඳව **යථාලාභ, යථාබල, යථාසාරුප්‍ය** වශයෙන් වූ තෙවැදෑරුම් සන්තෝෂය දත යුතු ය. (137 පිටුව බලන්න). මෙලෙස වූ කථා ඇතිබව "**සන්තුට්ඨිකථා**" නම් වේ.

✠ **පවිවෙකකථා**

භාවනාවෙහි යෙදී විසීම "**පවිවේක කථා**" නම් වේ. එය **කාය විවේකය, චිත්ත විවේකය, උපධි විවේකය** යැයි තෙවැදෑරුම් වේ.

යම් භික්ෂුවක් පිරිසෙහි සිත් අලවා විසීමෙහි ආශාව අතහැර තම සියලු කටයුතු එකලාව අතරක් නැර අප්‍රමාදීව සිදුකර ගෙන කෙලෙසුන්ගෙන් දුරුව වෙසේ ද, එය **කාය විවේකය** නම් වේ. එසේ එකලා වී කුසීත නොවී අෂ්ට සමාපත්ති උපදවා නෙක්ඛම්මයෙහි ඇලී විසීම **චිත්ත විවේකය** නම් වේ. විදර්ශනාවෙහි යෙදී ආර්‍ය්‍ය සත්‍යයන් ප්‍රතිවේධ කොට නිවන ප්‍රත්‍යක්ෂ කොට උතුම් පාරිශුද්ධත්වයෙන් යුක්ත වීම **උපධි විවේකය** නම් වේ.

✠ **අසංසග්ගකථා**

ස්ත්‍රීන් පිළිබඳ වූ **ශ්‍රවණ, දර්ශන, සමුල්ලපන, සම්භෝග, කාය** යන සංසර්ගයන්ගෙන් වෙන්වීම පිළිබඳව ද, ගිහි පැවිදි කවරෙකු සම්බන්ධයෙන් හෝ අනනුලෝමික සම්බන්ධකම් ඇති නොකරගැනීම පිළිබඳව ද, සසරෙහි අස්ථිර බව පිළිබඳව ද කථා ඇතිබව "**අසංසග්ගකථා**" නම් වේ.

අසවල් ගමෙහි රූමත් ස්ත්‍රියක් සිටී යැයි අසා ඒ පිළිබඳ සිතැතිව සිහි මුලාව බඹසර රැකීමට නොහැකිව ගිහි බවට පත් වේ. මෙසේ විසභාග අරමුණු වශයෙන් උපන් කෙලෙස් සංවාසය **ශ්‍රවණ සංසර්ගය** නම් වේ. මෙලෙස විසභාග අරමුණු (ස්ත්‍රී රූප) දැක ගිහි වීමට හේතුවන දැකීම් වශයෙන් උපන් කෙලෙස් සංවාසය **දර්ශන සංසර්ගය** නම් වේ. එලෙස පිරිහීමට හේතුවන ස්ත්‍රීන් සමග කථා කිරීමට කැමැතිවීම් වශයෙන් උපන් කෙලෙස් සංවාසය **සමුල්ලපන සංසර්ගය** නම් වේ. ස්ත්‍රීන් සමග ඔවුනොවුන් සතු දෑ හුවමාරු කරගැනීම් වශයෙන් උපන් කෙලෙස් සංවාසය **සම්භෝග සංසර්ගය** නම් වේ. ස්ත්‍රියකගේ අතිනත ගැනීම් වශයෙන් උපන් කෙලෙස් සංවාසය **කාය සංසර්ගය** නම් වේ.

## ✠ විරියාරම්භකථා

අකුසල ධර්ම දුරු කිරීම පිළිබඳව ද, කුසල ධර්ම වැඩීම පිළිබඳව ද ක්‍රමානුකූලව පැවැත්විය යුතු උත්සාහය වීර්‍යය නම් වේ. මෙය **කාය, චිත්ත** වශයෙන් දෙවැදෑරුම් වේ. **ආරම්භධාතු, නික්ඛමධාතු, පරක්කමධාතු** වශයෙන් තෙවැදෑරුම් වේ. **සම්‍යප්‍රධාන** වශයෙන් සිව්වැදෑරුම් වේ. යම් ඉරියව්වක දී හටගත් ක්ලේශය අන් ඉරියව්වකට යෑම දක්වා ඇසුරු නොකොට එතැන්හිදී ම දුරු කිරීම පිණිස ආරම්භ කරන ලද වීර්‍යය පිළිබඳ වූ කථා ඇතිබව "**විරියාරම්භකථා**" නම් වේ.

## ✠ සීලකථා

ලෞකික වශයෙන් චතු පාරිශුද්ධි සීලය ද, ලෝකෝත්තර වශයෙන් මාර්ගය හා ඵලය සමග එක් වූ සීලය පිළිබඳ වූ කථා ඇතිබව "**සීල කථා**" නම් වේ.

## ✠ සමාධිකථා

විදර්ශනාවට පාදක වූ උපචාර සමාධිය ද, අෂ්ඨ සමාපත්තීන් ද, මාර්ග සම්ප්‍රයුක්ත වූ ලෝකෝත්තර සමාධිය ද පිළිබඳ වූ කථා ඇතිබව "**සමාධි කථා**" නම් වේ.

✠ **පඤ්ඤකථා**

සුතමය ඤාණය, චින්තාමය ඤාණය හා විදර්ශනා ඤාණය ද, ලෝකෝත්තර මාර්ග - ඵල ඤාණයන් ද පිළිබඳ වූ කථා ඇතිබව "**පඤ්ඤ කථා**" නම් වේ.

✠ **විමුත්තිකථා**

ආර්‍ය ඵල විමුක්තිය ද, නිර්වාණය ද පිළිබඳ වූ කථා ඇතිබව "**විමුත්ති කථා**" නම් වේ.

✠ **විමුත්තිඤාණදස්සනකථා**

එකුන්විසි ප්‍රත්‍යවේක්ෂා ඤාණයන් පිළිබඳ වූ කථා ඇතිබව "**විමුත්තිඤාණදස්සන කථා**" නම් වේ.

තව ද යම් කල්‍යාණ මිත්‍රයෙකු ඇසුරෙන් පෙර නො ඇසූ ධර්මයන් ඇසිය හැකි වේ ද, ඇසූ ධර්ම පිරිසිදු කරගත හැකි වේ ද, සැක විමති ඇති තැන් විමසා දුරුකර ගත හැකි වේ ද, කර්ම - කර්ම ඵල විශ්වාසය ඇත්තේ වේ ද, තෙරුවන් ගුණ කෙරෙහි පැහැදීම ඇත්තේ වේ ද, කාමාවචර රූපාවචර අරූපාවචර කුසල ධර්මයන් පිළිබඳ ඉගෙන ඒවා පිළිබඳ සැක දුරුකර ගත හැකි වේ ද, නාමරූප ධර්මයන් පිළිබඳ දැන ඉගෙන අතීත අනාගත වර්තමාන යන තුන් කාලය පිළිබඳව වූ හේතු - ඵල ධර්මයන් කෙරෙහි සැක දුරුකර ගත හැකි වේ ද, උදය වය ආදී ලෙස විදර්ශනා ඥානයන් වඩා ආර්‍ය භූමියට පැමිණ ධර්මයෙහි ස්ථිරත්වයට පැමිණීම වේ ද, **ශ්‍රද්ධා, සීල, ශ්‍රැත, ත්‍යාග, ප්‍රඥා** යන ධර්මයන්ගෙන් වැඩි දියුණුවට පැමිණේ ද මෙලෙස සියල්ලට උපකාර වන කල්‍යාණ මිත්‍රයා "**උපනිඃශ්‍රය ගෝචරය**" නම් වේ.

## ⌘ ආරක්ඛගොචරය

ඉන්ද්‍රිය සංවරය "**ආරක්ඛ ගෝචරය**" නම් වේ. මේ ශාසනයෙහි පැවිදි වූ භික්ෂුව ගමට හෝ වීථියට ගිය කල්හි යට හෙලූ ඇස් ඇතිව, විය දණ්ඩක පමණ දුර බලමින්, ඇස් කන් නාස දී ඉන්ද්‍රියයන් සංවර

කරගෙන, ඇත් අස් රිය පාබළ සෙනග ආදී නොයෙක් දේ නොබලා, ස්ත්‍රී පුරුෂයන් දෙස නොබලා, වටපිට නොබලා මනා සිහියෙන් යුක්තව කාලය ගත කරයි ද එය **"ආරක්ඛ ගෝචරය"** නම් වේ.

## ⌘ උපනිබන්ධගොචරය

සැම කල්හි සතර සතිපට්ඨාන භාවනාවෙන් යුක්ත වීම **"උපනිබද්ධ ගෝචරය"** නම් වේ. භාග්‍යවතුන් වහන්සේ එහෙයින් මෙසේ වදාළ සේක.

**මහණෙනි, තමන් සතු වූ, තමන්ට පියාගෙන් උරුම වූ, හැසිරීමට සුදුසු ගොදුරු බිම වූ සතර සතිපට්ඨානයෙහි හැසිරෙව්. පියාගෙන් උරුම වූ හැසිරීමට සුදුසු ගොදුරු බිම වූ, සතර සතිපට්ඨානයෙහි හැසිරෙන්නා වූ යෝගාවචරයන්ගේ සිතෙහි හිඩැසක් මාරයා නොදක්නේ ය. මුලා කර ගැනීමට අරමුණක් මාරයා නොලබන්නේ ය.** එබැවින් මනාකොට සතර සතිපට්ඨානයෙන් වෙන් නොවී පිහිටා ගැනීම ම **"උපනිබද්ධ ගෝචරය"** නම් වේ.

නොදැනීමෙන් හෝ අමතක වීමෙන් සිදුවන සේඛියා සිකපද බිඳීම වැනි කුඩා වරදකට පැමිණීම හා අකුසල සිතක් ඉපදීමට හේතුවන කාය වාක් ක්‍රියාව පවා පාරාජිකා ශික්ෂා පදයක් මෙන් සලකා සමාදන් වූ ශික්ෂා පද සීලය මැනවින් රක්නේ වේ.

ඉහත කියන ලද ආචාරයෙන් හා ගෝචරයෙන් යුක්තව ලෝභ, ද්වේෂ, මෝහ අකුසලයන්ගෙන් හා කාම විතර්ක, ව්‍යාපාද විතර්ක, විහිංසා විතර්ක යන අකුසල විතර්කයන්ගෙන් තොරව, කාය වාක් කුසල පැවැත්මෙන් යුක්ත වූයේ වේ. ධාර්මික ව ලැබෙන සිව්පස ප්‍රත්‍යයෙන් දිවි පැවැත්වීමෙන් යුක්ත වූයේ වේ.

එසේම **චූළ සීල, මධ්‍යම සීල, මහා සීල** යන තෙවැදෑරුම් සීලයෙන් යුක්ත වූයේ වේ.

ඇස, කන, නාසය, දිව, කය, මනස යන සදෙරෙහි සංවරයෙන් යුක්ත වූයේ වේ.

ඉදිරියට යාම - ආපසු ඊම කරන කල්හි ද, ඉදිරිය බැලීම - සරස බැලීම කරන කල්හි ද, අත් පා හැකිළීම - දිගු කිරීම කරන කල්හි ද, පාත්‍රය පරිහරණය - අඳනය ඇඳීම - දෙපට සිවුර - තනි පට සිවුර පෙරවීම කරන කල්හි ද, දනය වැළඳීම - අෂ්ටපාන ගිලන්පස ආදිය පානය කිරීම - කැවිලි පළතුරු ආදිය අනුභව කිරීම - සීනි පැණි චතුමධුර ආදිය රස බැලීම කරන කල්හි ද, මල - මුත්‍ර බැහැර කිරීම කරන කල්හි ද, යෑම - සිටීම - හිඳීම - නිදීම - නිදි වැරීම - කථා කිරීම - තුෂ්ණිම්භූතව හිඳීම කරන කල්හි ද මෙම ක්‍රියාවන් කරන්නා වූ සත්වයෙක් පුද්ගලයෙක් ආත්මයක් නැත. පඨවි ආපෝ තේජෝ වායෝ යන මහා භූතයන්ගෙන් නිර්මිත ධාතු සමූහයක්, නාම රූප දෙකක්, ස්කන්ධ පසක්, ආධ්‍යාත්මික බාහිර ආයතන දෙළොසක්, ධාතු අටළොසක්, පටිච්ච සමුප්පාද හේතු - ඵල ධර්මතාවයක් විසින් කරනු ලබන හේතු - ඵල ක්‍රියාත්මක භාවයක් පමණක් ඇත්තේ යැයි සම්‍යක් ප්‍රඥාවෙන් දැන කරන්නේ ය.

**"යථා ලාභ සන්තෝෂය යථා බල සන්තෝෂය යථා සාරුප්‍ය සන්තෝෂය"** යන තෙවැදෑරුම් සන්තෝෂයෙන් යුක්ත වූයේ වෙයි. එහි

- ලද සිව්පස ප්‍රත්‍යයන්ගෙන් සතුටු වීම **යථා ලාභ සන්තෝෂය** යි.
- ලද සිව්පස ප්‍රත්‍යය තමන්ගේ පරිහරණයට සුදුසු නුසුදුසු බව විමසා බලා අන් සබ්‍රම්සරුන් සමග හුවමාරු කොට පරිභෝග කිරීම **යථා බල සන්තෝෂය** යි.
- තමන්ට ධාර්මික ව උපන් කප්‍යය සාරුප්‍ය දේ අන් සබ්‍රම්සරුන්ට බෙදා දී පරිභෝග කිරීම **යථා සාරුප්‍ය සන්තෝෂය** යි.

භාග්‍යවතුන් වහන්සේ මෙසේ මාතෘකාව දේශනා කොට නිමවා එම කරුණු අනු පිළිවෙලින් බෙදා දක්වන සේක් **"මහරජ, භික්ෂුව කෙසේ නම් සීල සම්පන්න වේද?"** යනුවෙන් ප්‍රශ්න කිරීම් වශයෙන් ඉදිරිපත්

කොට එම කාරණාවන් "**චූළ සීල, මධ්‍යම සීල, මහා සීල**" යනුවෙන් විස්තර වශයෙන් මෙසේ වදාළ සේක.

## ❄ චූළ සීලය

මහරජ, මේ සසුනෙහි පැවිදි වූ භික්ෂුව පාණාතිපාත චේතනා සංඛ්‍යාත දුසිල්බව අත්හැර එයින් සම්පූර්ණයෙන් දුරින් ම දුරු වූයේ වෙයි. අනුන් නැසීම පිණිස දඬු මුගුරු ආයුධ ගැනීමෙන් වැළකුණේ වෙයි, පව් කිරීමෙහි ලැජ්ජාවෙන් යුක්ත වූයේ වේ. සත්වයන් කෙරෙහි කරුණාවෙන් යුක්ත වූයේ වේ. සියලු ප්‍රාණීන් කෙරෙහි හිත අනුකම්පාව ඇතිව වාසය කරයි. මෙසේ ප්‍රාණඝාතයෙන් වැළකීම භික්ෂුවගේ එක් සීලයක් වේ.

එසේම භික්ෂුව වස්තු හිමියාගේ අතින් හෝ අන් තිබූ තැනින් හෝ බැහැර නොකරන ලද්ද වූ ද, හිමිකරුවා විසින් අයිතිය අත් නොහරින ලද්ද වූ ද, වැට කඩුලු හෝ මුර කරුවන් යොදා හෝ ආරක්ෂා කරන ලද්ද වූ ද, මඤ්ජුසා ආදියෙහි බහා රක්නා ලද්ද වූ ද, වස්තු හිමියා විසින් අයිතිය අත් නොහරින ලද්ද වූ ද, ආරක්ෂා කරන ලද්ද වූ ද, මෙය මගේ යැයි තණ්හා මමත්වයෙන් අයිතිය ප්‍රකාශ කොට තබාගන්නා ලද්ද වූ ද මෙසේ වස්තු හිමියා විසින් සිතින් අත් නොහරින ලද්ද වූ ද, කයින් හෝ වචනයෙන් අන් හට නොදෙන ලද්ද වූ ද, නොපවරන ලද්ද වූ ද, නුදුන් දෙය පස් විසි අවහාරයන්ගෙන් යම් ක්‍රමයකින් ගැනීමේ චේතනා සංඛ්‍යාත දුසිල්බව අත්හැර එයින් සම්පූර්ණයෙන් දුරින් ම දුරු වූයේ වෙයි. අනුන් අයිතිය අත්හැර කාය ප්‍රයෝගයෙන් හෝ වාක් ප්‍රයෝගයෙන් දුන්දෙය ම ගන්නේ කැමති වන්නේ වේ. සොරකම පිළිබඳ සිතුවිලි මාත්‍රයකුදු නූපදවා පිරිසිදු වූ සිතින් යුක්තව වාසය කරයි. මෙය ද භික්ෂුවගේ එක් සීලයකි.

එසේම භික්ෂුව බුද්ධාදී උතුමන් විසින් පිළිකුල් කරන ලද පහත් වූ ලාමක වූ නින්දිත වූ හැසිරීම වන අබ්‍රහ්මචර්‍ය්‍යා චේතනා සංඛ්‍යාත දුසිල්බව අත්හැර එයින් සම්පූර්ණයෙන් දුරින් ම දුරු වූයේ වෙයි. **අධි සීල, අධිචිත්ත, අධිපඤ්ඤා** යන ත්‍රිවිධ ශික්ෂාවෙන් සංගෘහිත වූ භික්ෂු,

භික්ෂුණී, උපාසක, උපාසිකාවන් විසින් පිරිය යුතු ශාසන ප්‍රතිපත්ති මාර්ගය වූ උතුම් පැවතුම් ඇත්තේ ස්ත්‍රී පුරුෂ සංසර්ගය නම් වූ ග්‍රාම ධර්මයෙන් වෙන් වූයේ බ්‍රහ්මචාරී වේ. මෙය ද භික්ෂුවගේ එක් සීලයකි.

එසේම මේ සසුනෙහි භික්ෂුව දුටු දෙය නුදුටුවෙමි යැයි ද, නුදුටු දෙය දුටුවෙමි යැයි ද, නො ඇසූ දෙය ඇසුවෙමි යැයි ද, ඇසූ දෙය නො ඇසුවෙමි යැයි ද, ගඳ සුවඳ විඳි දෙය නො වින්දෙමි යැයි ද, රස විඳි දෙය නො වින්දෙමි යැයි ද, කයෙන් විඳින ලද ස්පර්ශ නොවින්දෙමි යැයි ද, නො විඳි ස්පර්ශ වින්දෙමි යැයි ද, නො විඳි රස වින්දෙමි යැයි ද, රස විඳි දෙය නොවින්දෙමි යැයි ද, සිදු නොවූ දෙය සිදු වූයේය යැයි ද, සිදු වූ දෙය සිදු නොවූයේය යැයි ද මෙසේ අසත්‍ය දෙය සත්‍ය දෙයක් ලෙස ද, සත්‍ය දෙය අසත්‍ය දෙයක් ලෙස ද කීමෙන් හෝ ලිවීමෙන් හෝ හස්ත විකාරාදියකින් හෝ හැඟවීමෙන් කරන බොරු කීමේ චේතනා සංඛ්‍යාත දුසිල්බව අත්හැර එයින් සම්පූර්ණයෙන් වැළකුණේ, දුරින් ම දුරු වූයේ වෙයි. සත්‍ය කියන සුළු වූයේ සත්‍යයෙන් සත්‍ය ගළපන ස්වභාවය ඇතිව ස්ථිර කථා ඇතිව ඇදහිය යුතු වචන ඇතිව වෙසෙන්නෙක් වේ. ලෝකයා නොරවටන්නෙක් වේ. මෙය ද භික්ෂුවගේ එක් සීලයකි.

තව ද මේ සසුනෙහි භික්ෂුව යම් කිසි වචනයකින් සමගි වූවන් භේද කෙරේ ද, තමන් ප්‍රිය පුද්ගලයෙක් වීමේ කැමැත්තෙන් හා අන් දෙදෙනෙකු බිඳුවීමේ කැමැත්තෙන් කෙනෙකු කී දෙයක් අනිකෙකුට කීමෙන් කරනු ලබන කේලාම් කීමේ චේතනා සංඛ්‍යාත දුසිල්බව අත්හැර එයින් සම්පූර්ණයෙන් වැළකුණේ, දුරින් ම දුරු වූයේ වෙයි. එක් තැනකින් අසා ඔවුන් බිඳවීම පිණිස අන් තැනක නොකියන්නේ වේ ද, එතැනින් අසා මොවුන් බිඳවීම පිණිස මෙතැන නොකියන්නේ වේ ද මෙසේ භේද වූවන් ගළපන්නා වූ සමගි වූවන්ගේ සමගිය තහවුරු කිරීමට අනුබල දෙන්නා වූ අනුන් සමගි කිරීම පිණිස කථා කරන්නෙකු වේ. මෙය ද භික්ෂුවගේ එක් සීලයකි.

තව ද මේ සසුනෙහි භික්ෂුව යම් වචනයක් කීමෙන් අන්‍යයන්ගේ මර්මස්ථාන හෙවත් බල නහර සිඳින්නාක් මෙන් වේ ද, යම් වචනයක් ස්වභාවයෙන් ම කර්කශ වේද ඇසීමෙන් කනට සුවයක් නොවේ ද, සිතට ප්‍රිය නොවේ ද, යම් වචනයක් කීමෙන් එය කියන්නා

ද, අසන්නා ද, රෞද්‍ර බවට නපුරු බවට පමුණුවයි ද, හිතවත් බව මිත්‍ර බව දුරු ව යයි ද එබඳු වූ පරුෂ වචන කීමේ චේතනා සංඛ්‍යාත දුසිල්බව අත්හැර එයින් සම්පූර්ණයෙන් වැළකුණේ, දුරින් ම දුරු වූයේ වෙයි. යම් වචනයක් නිදෙස් වේ ද, කනට සැප වේ ද, ප්‍රේමණීය වේ ද, සතුටු කරයි ද, යහපත් ද, බොහෝ දෙනාට ප්‍රිය වේ ද, බොහෝ දෙනාගේ හිත් ප්‍රිය කරන්නේ වේ ද, එබඳු වචන ම කියන්නෙකු වේ. මෙය ද භික්ෂුවගේ එක් සීලයකි.

තව ද මේ සසුනෙහි භික්ෂුව යම් වචනයක් කීමෙන් ස්වල්ප වූ වින්දනයක් සහනයක් ගෙන දේ ද, කුසල සිත විසිර යයි ද, මෙලොවත් පරලොවත් අර්ථය විනාශ කරයි ද, එබඳු නිරර්ථක වූ තමන්ටත් අනුන්ටත් අර්ථයක් ප්‍රයෝජනයක් නොවන එබඳු අර්ථ ශූන්‍ය වූ **භාරත යුද්ධය, රාමායනය, සීතාහරණය** ආදී හිස් වූ ප්‍රලාප කථා කීමේ චේතනා සංඛ්‍යාත දුසිල්බව අත්හැර එයින් සම්පූර්ණයෙන් වැළකුණේ, දුරින් ම දුරු වූයේ වෙයි. කාලයට සුදුසු කථා කරන්නේ වේ ද, සිදු වූ දෙයක් ම කියන්නේ වේ ද, අර්ථයෙන් යුක්ත වූ, ධර්මයෙන් යුක්ත වූ විනය සම්බන්ධ වූ දෙයක් ම කියන්නේ වේ ද, සුදුසු කල්හි උපමා හා කරුණු ඇතිව සීමා සහිතව, අර්ථයෙන් යුක්ත වූ නිධානයක් මෙන් සිතෙහි තැබිය යුතු වචන කියන්නේ වේ ද, මෙසේ ඒ හිස් කථාවෙන් වැළකී දියුණුවට හේතුවන වචන ම කියයි. මෙය ද භික්ෂුවගේ එක් සීලයකි.

තව ද මේ සසුනෙහි භික්ෂුව පැළවෙන ස්වභාවයෙන් යුත් මුල් ජාති, කඳ (දඬු), දළු වර්ග, ගෙඩි වර්ග, ඇට වර්ග යන බීජ ජාති හා ගස්, වැල්, මල් ආදී හටගත් දේවල් සිඳීම, බිඳීම, පිසීම ආදියෙන් සම්පූර්ණයෙන් වැළකුණේ වේ. මෙය ද භික්ෂුවගේ එක් සීලයකි.

තව ද මේ සසුනෙහි භික්ෂුව එක් වේලක් දන් වළඳන්නෙකු වේ. ඉර මුදුන් වූ තැන් පටන් පසු ද අරුණ නැගීම දක්වා වූ විකාලයෙහි හැල් වී හා අනෙකුත් වී වර්ග, යව, බාර්ලි, මෙනේරි, තණහාල්, අමු, වර, තිරිඟු, ගෝධුම, රසාල යන සහල් වර්ගවලින් නිපදවන ලද බත් ද, බදින ලද හා නොබදින ලද පිටි ද, වර්තමාන ලෝකයෙහි ඇති විස්කෝතු කේක් වැනි සියලු ආහාර වර්ග ද, යව, කුරක්කන්, සහල්, තිරිඟු ආදී පිටිවලින් නිපදවන පිට්ටු ද, අලි මස්, කොටි මස්, වලස් මස්, කලු වලස් මස්, සිංහ මස්, අශ්ව මස්, බලු මස්, සර්ප මස්, ව්‍යාඝ්‍ර මස්, මිනී මස් යන

මස් වර්ග දහය හැර අන් සියලු කැප මස් වර්ග ද, දියෙහි උපදින සියලු මත්ස්‍ය වර්ගයන් ද, එළකිරි, පිටිකිරි ආදී සියලු කිරි වර්ග ද, තැඹිලි පොල් වතුර ද, තල්, පොල් ආදියෙන් නිපදවන පැණි සකුරු හා ඒ ආශ්‍රිත නිෂ්පාදන ද, කිරි පිට, කොකෝවා වැනි දෑ මිශ්‍ර කොට සාදන ලද ටොෆී වැන දෑ ද, සූර්ය තාපයෙන් රත් කර ගන්නා ලද පළතුරු බීම හැර, කල් තබා ගැනීම පිණිස විදුලි තාපය ආදී ක්‍රමවලින් රත් කරන ලද පළතුරු බීම ආදිය ද පරිභෝගයෙන් සම්පූර්ණයෙන් වැළකුණේ වේ. මෙය ද භික්ෂුවගේ එක් සීලයකි.

තව ද මේ සසුනෙහි භික්ෂුව නැටීම - නර්තන - රංගන ආදිය බැලීමෙන් ද, අඩුම තරමින් මොනර නැටුමක් වැනි දෙයක් බැලීමෙන් ද සම්පූර්ණයෙන් වැළකුණේ වේ.

තව ද මේ සසුනෙහි භික්ෂුව භක්ති ගීත - ගීත - කවි - ශ්ලෝක ආදිය ද, බුද්ධ වචනය වූ ත්‍රිපිටක ධර්මයට අයත් කිසිවක් ගීත ස්වරයෙන් කීමෙන් ද සම්පූර්ණයෙන් වැළකුණේ වේ.

තව ද මේ සසුනෙහි භික්ෂුව ආතත, විතත, විතතාතත, ඝන, සුසිර යන තූර්ය භාණ්ඩ ද, බෙර, දවුල්, නළා, තම්මැට්ටම් ආදී වාද්‍ය භාණ්ඩයන් ද වාදනය කිරීමෙන් වැළකුණේ වේ.

තව ද මේ සසුනෙහි භික්ෂුව නැටීම, ගී කීම, බෙර ආදිය වාදනය, බොහෝ නළු නිළියන් රැස්ව කරන නැටුම්, රාමායනය ආදී කථා කීම, තාලම් ගැසීම, ඇත් පොර, අශ්ව පොර, මී හරකුන් ගේ පොර, එළ හරකුන් ගේ පොර, එළු පොර, බැටළු පොර, කුකුළු පොර, වටු පොර, පොලුවලින් කරන පොර, මිටින් කරන පොර, මල්ලව පොර, සෙබළුන්ගේ යුද්ධ, යුද සේනා ගණන් ගැන්ම, සේනා රැස්වීම, ඇත්, අස්, රථ, පාබළ බල ඇණි බැලීම ආදී සිතෙහි කෙලෙස් වැඩීමට හේතුවන කුසල් සිත විනාශ වන විෂම දේවල් බැලීමෙන් සම්පූර්ණයෙන් වැළකුණේ වේ. මෙය ද භික්ෂුවගේ එක් සීලයකි.

තව ද මේ සසුනෙහි භික්ෂුව වර්ණ ගන්ධ සම්පන්න මල් වර්ග ද, සුවඳ ඇති මල්, කොළ, ගෙඩි, පොතු, මුල්, කඳ ජාතීහු ද, විලවුන් වර්ග ද, ශරීරාලංකාරය පිණිස හා සුවඳවත් වීම පිණිස ඇඟ ගැල්වීම හා

වස්ත්‍රයන්ට යෙදීම ද, සුවඳ දුම් වර්ග ඇල්ලීම ආදියෙන් ද, රන් - රිදී - මුතු - මැණික් - පළිඟු පබළු වැනි දෑ අලංකාරය පිණිස හා මහන්තත්වය පිණිස දැරීම හෙවත් පැලඳීමෙන් ද, සැරසීමෙන් ද, ශරීරයෙහි අඩු තැන් පිරවීම පිණිස ආහාර පාන වැළඳීමෙන් ද සම්පූර්ණයෙන් වැළකුණේ වේ.

තව ද මේ සසුනෙහි භික්ෂුව මිටි රියනකට වඩා උස් වූ **ආසන්දි** නම් වූ නිදන - හිඳින ඇඳ පුටු ආදිය පරිභෝගයෙන් ද, **පල්ලංක** නම් වූ පාදයන්හි සිංහ - ව්‍යාඝ්‍රාදී සත්ව රූප යොදා කළ ඇඳපුටු ද, **ගොණක** නම් වූ සතරඟුලකට වඩා දික් වූ එළු ලොම්වලින් කළ ඇතිරිලි ද, **චිත්තක** නම් වූ එළු ලොම්වලින් විසිතුරු කොට වියන ලද ඇතිරිලි ද, **පටිකා** නම් වූ එළු ලොමින් කළ සුදු ඇතිරිලි ද, **පටලිකා** නම් වූ ඝනට මල් ඇතිව කළ එළු ලොම් ඇතිරිලි ද, **තූලිකා** නම් වූ පුළුන් පුරවා කළ ඇතිරිලි ද, **විකතිකා** නම් වූ සිංහ ව්‍යාඝ්‍රාදී රූපවලින් විසිතුරු කළ ඇතිරිලි ද, **උද්දලොමි** නම් වූ එක් පැත්තක ලොම් මතුව ඇති සත්ව ලොම්වලින් කළ ඇතිරිලි, **එකන්තලොමි** නම් වූ දෙපස ම ලොම් මතුව ඇති ඇතිරිලි ද, **කට්ඨිස්ස** නම් වූ රන් නූලෙන් විසිතුරු කළ තිහිරි නූලෙන් කළ ඇතිරිලි ද, **කොසෙය්‍ය** නම් වූ රන් නූලෙන් විසිතුරු කළ පට පණු නූලෙන් කළ ඇතිරිලි ද, **කුත්තක** නම් වූ නාටිකාවන් සොළොස් දෙනෙකුට නැටීමට ප්‍රමාණවත් වූ එළු ලොමින් කළ ඇතිරිලිද, **හත්ථත්ථර** නම් වූ ඇතු පිට අතුරන ඇතිරිලි ද, **අස්සත්ථර** නම් වූ අසු පිට අතුරන ඇතිරිලි ද, **රථත්ථර** නම් වූ රථයෙහි අතුරන ඇතිරියද, **අජිනප්පවෙණි** නම් වූ ඇඳේ ප්‍රමාණයට අඳුන් දිවි සමින් කළ ඇතිරිලිද, **කදලිමිගපවර පච්චත්තරණ** නම් වූ කදලිමිග නම් වූ මුවන්ගේ සමින් කළ උතුම් ඇතිරිලි ද, **සඋත්තරච්ඡද උභතොලොහිතකූපධාන** නම් වූ රතු වියන් ඇති හිස සහ පාදයන් තැබීමට දෙපස රතු කොට්ට තබන ලද ඇඳ (කවිච්චිය) යන වටිනා කමින් වැඩි වූ අලංකාරමත් වූ ඉතා සුව පහසුව ඇති මහ ආසන පරිභෝගයෙන් සම්පූර්ණයෙන් වැළකුණේ වේ. මෙය ද භික්ෂුවගේ එක් සීලයකි.

තව ද මේ සසුනෙහි භික්ෂුව රන් රිදී පරිහරණයෙන් ද, රජත යන්නෙන් කියවෙන **කහාපණ** නම් වූ කහවණු ද, **ලොහමාසක** නම් වූ තඹ ආදි ලෝහයෙන් කරන ලද සම්මත මුදල් වර්ග ද, **ජතුමාසක** නම් වූ ලාකඩ හා ලාටු මැලියම් වර්ගවලින් රූප යොදා කරන ලද සම්මත මුදල්

වගී ද, **දරුමාසක** නම් වූ ශක්තිමත් අරටු වලින් හෝ උණ පතුරුවලින් හෝ තල් කොළ වැනි කොළ වගීවලින් හෝ රූප ඇඳ කරන ලද සම්මත මුදල් වගී ද පරිහරණයෙන් සම්පූණීයෙන් වැළකුණේ වේ. මෙය ද භික්‍ෂුවගේ එක් සීලයකි.

තව ද මේ සසුනෙහි භික්‍ෂුව ඇල් හාල්, වී, යව, අමු, මෙනේරි, කුරක්කන් ආදී නොපිසන ලද අමු ධාන්‍ය වගී ඇල්ලීමෙන් හා පිළිගැනීමෙන් සම්පූණීයෙන් වැළකුණේ වේ. අරමුණක් නොමැතිව අමු මස් මාළු පිළිගැනීමෙන් සම්පූණීයෙන් වැළකුණේ වේ.

තව ද මේ සසුනෙහි භික්‍ෂුව විවාහපත් ස්ත්‍රීන් ද, විවාහ නොවූ කුමාරිකාවන් ද, පිළිගැනීමෙන් ස්පශී කිරීමෙන් සම්පූණීයෙන් වැළකුණේ වේ. මෙය ද භික්‍ෂුවගේ එක් සීලයකි.

තව ද මේ සසුනෙහි භික්‍ෂුව දාස දාසීන් පිළිගැනීමෙන් සම්පූණීයෙන් වැළකුණේ වේ. (කැපකරුවන් ආරාමිකයන් වශයෙන් පිළිගැනීම වටී). කුකුළන්, ඌරන්, ඇතුන්, ගවයන්, අසුන්, වෙළඹුන්, වැනි සතුන් පිළිගැනීමෙන් වැළකුණේ වේ.

තව ද මේ සසුනෙහි භික්‍ෂුව යම් තැනක ප්‍රධාන භෝග වැවේ ද එබඳු කෙත් (කුඹුරු) ද, යම් තැනක අන් භෝගයෝ වැඩෙත් ද එබඳු වතු ද, එසේම යම් තැනක මේ දෙවගීයම වැඩෙත් ද එබඳු කෙත් ද, වගාවන් සඳහා සකස් නොකරන ලද වතු ද, වැව් තටාක ආදිය ද පිළිගැනීමෙන් සම්පූණීයෙන් වැළකුණේ වේ.

තව ද මේ සසුනෙහි භික්‍ෂුව **දූතකම්ය** යැයි කියන ලද ගිහියන්ගේ හසුන් ගෙන තැන් තැන්වල දුර ගමන් යාමෙන් ද, ගෙන්ගෙට පණිවුඩ ගෙන යාම නම් වූ කෙටි ගමනින් ද, දූත මෙහෙවර කිරීමෙන් සම්පූණීයෙන් වැළකුණේ වේ.

තව ද මේ සසුනෙහි භික්‍ෂුව **කයවික්කය** යැයි කියල ලද ගිහියන් සමග භාණ්ඩ උපකරණ ආදිය මිලට ගැනීම, විකිණීම ආදියෙන් ගනුදෙනු කිරීමෙන් වැළකුණේ වේ.

තව ද මේ සසුනෙහි භික්ෂුව **තුලා කූට**, **කංස කූට**, **මාන කූට උක්කෝටන**, **තිකති**, **සාචියෝග** ආදියෙන් වඤ්චා කිරීමෙන් වැළකුණේ වේ. එහිඃ-

- හොර පඩි හොර තරාදි සාදගෙන බඩු කිරීම් ආදියෙන් වඤ්චා කොට දීම **තුලා කූට** නම් වේ.
- එක් රන් තලියක් කොට ලෝහ තලි කිහිපයක් ද කරවා විකිණීමෙහි දී, මුලින් රන් තලිය උරගා පෙන්වා අන් සියල්ල රන් වශයෙන් පෙන්වා රන් නො රන් සමග මිශ්‍ර කොට දී වඤ්චා කිරීම **කංසකූට** නම් වේ.
- ධාන්‍ය, තෙල්, කෙත් වතු ආදිය මැනීමෙහි දී වඤ්චා කිරීම **මාන කූට** නම් වේ.
- හිමියන් අහිමියන් කිරීමාදිය සඳහා අල්ලස් ගැන්ම ආදියෙන් වඤ්චා කිරීමයි **උක්කෝටන** නම් වේ.
- නා නා උපායෙන් අනුන් රැවටීමෙන් වඤ්චා කිරීම **තිකති** නම් වේ. එය වනාහී මායා වශයෙන් ද, වළල්ලක් නොවූ දෙය වළල්ලක් වශයෙන් ද, මැණික් නොවූ දෙය මැණික් වශයෙන් ද, රන් නොවූ දෙය රන් වශයෙන් ද යනාදී ලෙස සමාන දෙයින් වඤ්චා කිරීමයි.
- යකඩ ආදී ලොහ රන් රිදී යයි අඟවා රැවටීම ආදී නොයෙක් ආකාර වූ ප්‍රයෝගයනගෙන් වඤ්චා කිරීම **සාචියෝග** නම් වේ.

තව ද මේ සසුනෙහි භික්ෂුව අත් පා කැපීම, මැරීම, ලණු ආදියෙන් බැඳීම, සැඟවී සිට වස්තු පැහැර ගැන්ම, ගම් නියම්ගම් ආදියට පැන වස්තු පැහැර ගැනීම, නිවෙස්වලට පැන නිවැසියන්ගේ පපුවට ආයුධ තබා බිය ගන්වා වස්තු පැහැර ගැනීම, බලාත්කාරකමින් වස්තු පැහැර ගැන්ම යන මේ සාහසික ක්‍රියාවලින් සම්පූර්ණයෙන් වැළකුණේ වේ. මෙය ද මේ සසුනෙහි භික්ෂුවගේ සීලය යි.

## ❈ මධ්‍යම සීලය

මේ ලෝකයෙහි ඇතැම් ශ්‍රමණ බ්‍රාහ්මණයෝ (පැවිද්දෝ) කර්මය, කර්ම ඵලය හා මෙලොව, පරලොව විශ්වාසය නම් වූ ශ්‍රද්ධාවෙන් පූජා කරන ලද චීවර පිණ්ඩපාත සේනාසන ගිලන්පස ආදිය පරිභෝග කොට කහ - ඉඟුරු - වද කහ - හෙල වද කහ - ඉවද - කුළුරැණ - සුවඳ හොට - වම් මුතු ආදී මුල් පැළවෙන දේ ද, ඇහැටු - නුග - පුලිළ - දිඹුල් - කලහ - දිවුල් ආදී කඳ පැළවෙන දේ ද, උක් - උණ - බට ආදී පුරුක් පැළවෙන දේ ද, අඳුතලා - මුරුවා - හිරිවේරිය ආදී අග (කරටිය) පැළවෙන දේ ද, හැල් වී - වී ආදී පෙරදිග ධයාන්‍යය ද - උඳු - මුං - මෑ ආදී අපරදිග ධාන්‍ය වර්ග ආදී ඇට පැළවෙන දේ ද යන මේ **බීජගාම** නම් වූ පැළවෙන දේ ද, **භූතගාම** නම් වූ පැළවුණු දේ ද සිඳීමෙහි යෙදී වාසය කරත්. මේ සසුනෙහි භික්ෂුව එලෙස බීජගාම, භූතගාම සිඳීම්, බිඳීම් ආදියෙන් සම්පූර්ණයෙන් වැළකුණේ වේ. මෙය ද භික්ෂුවගේ එක් සීලයක් වේ.

"එසේම මේ ලෝකයෙහි ඇතැම් ශ්‍රමණ බ්‍රාහ්මණයෝ (පැවිද්දෝ) කර්මය කර්ම ඵලය හා මෙලොව පරලොව විශ්වාසය නම් වූ ශ්‍රද්ධාවෙන් පූජා කරන ලද චීවර පිණ්ඩපාත සේනාසන ගිලන්පස ආදිය පරිභෝග කොට **ආහාර සන්නිධි, පාන සන්නිධි, වස්ත්‍ර සන්නිධි යාන සන්නිධි, සයන සන්නිධි, ගන්ධ සන්නිධි, ආමිස සන්නිධි** යනාදී ලෙස සන්නිධි කාර පරිභෝගයෙහි යෙදී වාසය කරයි. මේ සසුනෙහි භික්ෂුව එලෙස සන්නිධි කාරක පරිභෝගයෙන් සම්පූර්ණයෙන් වැළකුණේ වේ. මෙය ද භික්ෂුවගේ එක් සීලයක් වේ. එහි :-

### ⌘ ආහාර සන්නිධි

රැස් කිරීම **සන්නිධි** නම් වේ. අද පිළිගත් ආහාර හෙට දින පරිභෝගය පිණිස තබා ගැනීම **ආහාර සන්නිධි** නම් වේ. මෙය **විනය ක්‍රමය, සල්ලේඛ ප්‍රතිපදාව** යැයි දෙවැදෑරුම් වේ. එක් දිනක පිළිගත් ආහාර ද්‍රව්‍ය අන් දිනක පරිභෝගයට තබා ගැනීමෙන් සන්නිධි කාරක සික්ෂාපදයෙන් දුෂ්කට ඇවතට පැමිණීමෙන් ද, වැළඳීමෙහි දී පිඩක්

පාසා පචිති ඇවතට පැමිණීමෙන් ද විනය ක්‍රමයෙන් වරදට පැමිණීම වේ.

දයකාදීන් විසින් ආරාමයට ගෙනවිත් පූජා කරන ලද ආහාර ආදිය අනුපසම්පන්නයන්ට භාර කොට ඔවුන් පසු දින පිළිගන්වන ලද්දක් ගෙන පරිභෝගයෙන් විනයෙන් ඇවතට නොපැමිණේ. එහෙත් එය සැහැල්ලු ප්‍රතිපදවට නොගැළපෙන බැවින් සල්ලේඛ ප්‍රතිපදාවෙන් වරදට පැමිණේ. මෙයින් ඇවැත් නොවේ.

## ⌘ පාන සන්නිධි

අෂ්ටපාන ගිලන්පස ද්‍රව්‍ය පිළිගෙන පසු දින පරිභෝගයට තබා ගැනීම **පාන සන්නිධි** නම් වේ. මෙය ද **විනය ක්‍රමය, සල්ලේඛ ප්‍රතිපද ක්‍රමය** යැයි දෙවැදෑරුම් වේ. පාන වර්ග පිළිගෙන පසු දින පරිභෝගයට තබා ගැනීමෙන් දුෂ්කට ඇවතට පැමිණීමෙන් ද, වැළඳීමෙහි දී ගිලින උගුරක් පාසා පචිති ඇවතට පැමිණීමෙන් ද විනය ක්‍රමයෙන් වරදට පැමිණී වේ.

අනුපසම්පන්නයන්ට භාර කොට ඔවුන් පසු දින පිළිගන්වන ලද්දක් ගෙන පරිභෝගයෙන් විනයෙන් ඇවතට නොපැමිණේ. එහෙත් එය සැහැල්ලු ප්‍රතිපදවට නොගැළපෙන බැවින් සල්ලේඛ ප්‍රතිපදාවෙන් වරදට පැමිණේ.

## ⌘ වස්ත්‍ර සන්නිධි

දෙපට සිවුර, තනි පට සිවුර, අඳන සිවුර යන තුන් සිවුරට අමතරව අඳින පොරවන සිවුරු මතු ප්‍රයෝජනය පිණිස තබා ගැනීම **වස්ත්‍ර සන්නිධි** නම් වේ. භික්ෂුවකට කැප වන්නේ අධිෂ්ඨාන සිවුරු එක් කට්ටලයක් පමණය. එයින් අමතරව ඇති රියනකට වඩා දිග ඇති, වියතකට වඩා පළල ඇති සියලු චීවර අතිරේක වශයෙන් දස දිනක් කැප වේ. ඉන් මතු තබා ගැනීමෙන් නිසඟි පචිති ඇවතට පැමිණේ.

ඇවැත් නොවීම පිණිස විනය ක්‍රමයෙන් විකල්පනය කිරීම ආදියෙන් කල් තබා ගත හැක. එසේ කිරීම සල්ලේඛ ප්‍රතිපදාවට නොගැළපෙයි.

## ⌘ යාන සන්නිධි

හස්ති යානය, අශ්ව යානය භික්ෂූන්ට අකැප ය. භික්ෂූන්ගේ යානය උපාහනයයි (පාවහන් දෙකය). පාවහන් වැඩියෙන් තබා ගැනීමෙන් වන ඇවතක් නැත. පාවහන් අවශ්‍ය වන්නේ පා සේදූ විට පාවිච්චියට එක් වහන් සඟලක් ද අන් තැන්හි දී පාවිච්චියට එක් වහන් සඟලක් දැයි වහන් සඟල් දෙකකි. ඊට වැඩියෙන් තබා ගැනීම **යාන සන්නිධි** නම් වේ. එය සල්ලේඛ ප්‍රතිපදාවට ද නොගැළපෙයි.

## ⌘ සයන සන්නිධි

සැතපෙන ඇඳ **සයනය** නම් වේ. වැඩිපුර ඇඳන් පරිහරණයෙන් විනයෙන් ඇවැත් නොවේ. භික්ෂුවකට දහවල් කාලයෙහි වෙසෙන තැන පහසුවට හා රාත්‍රියෙහි ගත කරන තැන සැතපීමට ඇඳන් දෙකක් පරිභෝග කළ හැක. ඊට වැඩියෙන් තබාගෙන පරිහරණය කිරීම **සයන සන්නිධි** නම් වේ.

## ⌘ ගන්ධ සන්නිධි

සඳුන් ආදී සුවඳ ද්‍රව්‍යයන්ට **ගන්ධ** යැයි කියනු ලැබේ. සමෙහි හටගන්නා රෝගයන් සුවකර ගැනීමට භික්ෂූන්ට සුවඳ වගී පාවිච්චි කළ හැක. රෝග සුව වූ පසු නැවත සමෙහි රෝග හටගතහොත් ගැනීමට කියා සුවඳ තම සන්තකයෙහි තබා ගැනීම **ගන්ධ සන්නිධි** නම් වේ. මෙයින් විනයෙන් ඇවැත් නොවේ. සල්ලේඛ ප්‍රතිපදාවට නොගැළපෙයි.

## ⌘ ආමිස සන්නිධි

දයකයන් නොපැමිණෙන හා පිඬු සිඟා නොයන දිනයන්හි පරිභෝගය පිණිස සහල් පොල් මිරිස් කරවල ආදිය රැස් කොට තබා ගැනීම **ආමිස සන්නිධි** නම් වේ. නොකල්හි පැමිණෙන සොරෙකුට හෝ අන් කෙනෙකුට දීම පිණිස භික්ෂුවට තමන් වසන තැන සහල් නැළියක් ද, සකුරු පිඩක් ද, ගිතෙල් කාලක් ද තබා ගත හැකිය. තමන්ගේ පරිභෝගය පිණිස ආහාර අනුපසම්පන්නයන් අයත් කොට තබා ගැනීමෙන් ද කැප කුටිවල තබා ගැනීමෙන් ද විනයෙන් වරදට පත් නොවේ. එය සල්ලේඛ ප්‍රතිපදවට නොගැළපෙයි.

මෙබඳු වූ සන්නිධි කාර පරිභෝගයෙන් වැළකී සිටීම භික්ෂුවගේ එක් සීලයක් වේ.

එසේම මේ ලෝකයෙහි ඇතැම් ශ්‍රමණ බ්‍රාහ්මණයෝ කර්‍මය කර්‍ම ඵලය හා මෙලොව, පරලොව විශ්වාසය නම් වූ ශ්‍රද්ධාවෙන් පූජා කරන ලද චීවර පිණ්ඩපාත සේනාසන ගිලන්පස ආදිය පරිභෝග කොට නැටීම, ගී කීමය, බෙර ආදිය වැයීම, බොහෝ නළුවන් රැස්ව ජනයා ඉදිරියෙහි කරන නැටීම, මහා භාරතය රාමායනය ආදී කථා කීම හා ඇසීම, අතින් ලෝහ බෙර ගැසීම හා අත්තල ගැසීම, තාලම් ගැසීම, ඝන තාලම් ගැසීම, මන්ත්‍ර ජප කොට මළ මිනී නැඟිටුවීම, කුම්භථූණ නම් සිවුරැස් බෙර වැයීම, රඟ මඬුලුවල දෙවියන්ට ස්තෝත්‍ර ගායනය, ප්‍රතිභාන චිත්‍ර කිරීම, චණ්ඩාලයන්ගේ හණ සේදීමේ ක්‍රීඩාව, අයෝගුඩු ක්‍රීඩාව, උණ ගස් ඔසවා නැටීම, මිනී ඇට සේදීමේ ක්‍රීඩාව, ඇත් පොර, අශ්ව පොර, මීමුන් පොර, ගව පොර, එළු පොර, බැටළු පොර, කුකුළු පොර, වටු පොර, පොලු හරඹ, මිටින් කරන පොර, මල්ලව පොර, යුද්ධ පවතින තැන් දක්නට යාම, බල සෙන් ගණින තැන් දක්නට යාම යනාදී විනෝදය පිණිස කරන දේවල් කිරීමෙන් ද, දැකීමෙන් ද යුක්තව වාසය කරත්. මේ සසුනේ භික්ෂුව මෙබඳු විසූළු දැක්මෙන් සම්පූර්ණයෙන් වැළකුණේ වේ. මෙය ද භික්ෂුවගේ එක් සීලයකි.

එසේම මේ ලෝකයෙහි ඇතැම් ශ්‍රමණ බ්‍රාහ්මණයෝ කර්‍මය, කර්‍ම ඵලය හා මෙලොව, පරලොව විශ්වාසය නම් වූ ශ්‍රද්ධාවෙන් යුතුව

පූජා කරන ලද චීවර පිණ්ඩපාත සේනාසන ගිලන්පස ආදිය පරිභෝග කොට එක අතකට කොටු අට බැගින් ඇති පෝරුවෙහි කරන ක්‍රීඩාවය, පෝරු නැති හිස් තැන කරන ක්‍රීඩාවය, දූ පෝරු ආදියෙහි මෙන් ආකාශයෙහි ක්‍රීඩා කිරීමය, බිම කොටු ඇඳ පනිමින් කරන ක්‍රීඩාවය, දූ කැට නොසොල්වා නියෙන් ගසා ක්‍රීඩා කිරීමය, දදු කැටවලින් කරන ක්‍රීඩාවය, දිග වූ ද කෙටි වූ ද දඬුවලින් කරන ක්‍රීඩාවය, ඉරට මිටිවලින් ඇත් අස් ආදී රූප දක්වා කරන ක්‍රීඩාවය, පන්දුවෙන් කරන ක්‍රීඩාවය, පත්‍රවලින් තැනූ නලා පිඹිමින් කරන ක්‍රීඩාවය, සෙල්ලම් නඟුලෙන් සී සෑමය, කරනම් ගැසීමය, තල්පත් ආදියෙන් කැරකෙන සුළං පෙති තනා ක්‍රීඩා කිරීමය, කොළවලින් තැනූ නැළියෙන් වැලි ආදිය මැනීමය, කුඩා රථයෙන් ක්‍රීඩා කිරීමය, සෙල්ලම් දුන්නෙන් ක්‍රීඩා කිරීමය, අහසෙහි හෝ පිටෙහි හෝ අකුරු ලිවීමෙන් කරන ක්‍රීඩාවය, සිතූ දේ කීමෙන් කරන ක්‍රීඩාවය, අනුන්ගේ ඇද පලුදු දක්වීමෙන් කරන ක්‍රීඩාවය යන මෙබඳු වූ ප්‍රමාදයට කාරණා වූ සූදු ක්‍රීඩාවල යෙදී වාසය කරති. මේ සසුනෙහි භික්‍ෂුව එබඳු දේ කිරීමෙන් සම්පූර්ණයෙන් වැළකුණේ වේ. මෙය ද භික්‍ෂුවගේ එක් සීලයකි.

එසේම මේ ලෝකයෙහි ඇතැම් ශ්‍රමණ බ්‍රාහ්මණයෝ කර්‍මය, කර්‍ම ඵලය හා මෙලොව, පරලොව විශ්වාසය නම් වූ ශ්‍රද්ධාවෙන් පූජා කරන ලද චීවර, පිණ්ඩපාත, සේනාසන, ගිලන්පස ආදිය පරිභෝග කොට **ආසන්දි** නම් වූ පමණට වඩා උස ඇති පුටු ය, පාදයන්හි සිංහ ව්‍යාඝ්‍රාදී සත්වයන්ගේ රූප යොදා කළ ආසනය, සතරඟුලකට වඩා දික් ලොම් ඇති ඇතිරිය, එළු ලොම්වලින් විසිතුරු කොට වියන ලද ඇතිරිය, ඝනට මල් කැටයම් යොදා කරන එළු ලොම් ඇතිරිය, පුළුන් පුරවා කරන ලද ඇතිරිය, සිංහ ව්‍යාඝ්‍රාදී සත්ව රූප යොදා විසිතුරු කළ ඇතිරිය, දෙපස රැලි යොදා කළ එළු ලොම් ඇතිරිය, එක් පසෙක රැලි යොදා කළ එළු ලොම් ඇතිරිය, රන් නූලෙන් විසිතුරු කරන ලද තිහිරි නූලෙන් කරන ලද ඇතිරිය, රන් නූලෙන් විසිතුරු කරන ලද පට නූලෙන් කරන ලද ඇතිරිය, නිළියන් සොලොස් දෙනෙකුට නැටීමට ප්‍රමාණවත් එළු ලොම් ඇතිරිය, ඇතුන් පිට අතුරණ ඇතිරිය, අසුන් පිට අතුරන ඇතිරිය, රථයෙහි අතුරණ ඇතිරිය, අඳුන් දිවි සමින් කළ ඇතිරිය, කදලිමිග නම් වූ මුව සමින් කළ උතුම් ඇතිරිය, රතු වියන් ඇති ඇඳය, දෙපස රතු කොට්ට තබන ලද ඇඳය, යන මෙබඳු උස් අසුන් මහ අසුන් පාවිච්චි කරති. මේ සසුනෙහි භික්‍ෂුව එබඳු වූ උස්

අසුන් මහ අසුන් පරිභෝග කිරීමෙන් වැළකුණේ වේ. මෙය ද භික්ෂුවගේ එක් සීලයකි.

එසේම මේ ලෝකයෙහි ඇතැම් ශ්‍රමණ බ්‍රාහ්මණයෝ කර්‍මය, කර්‍ම ඵලය හා මෙලොව, පරලොව විශ්වාසය නම් වූ ශ්‍රද්ධාවෙන් පූජා කරන ලද චීවර පිණ්ඩපාත සේනාසන ගිලන්පස ආදිය පරිභෝග කොට සුවඳ වර්‍ග ඇඟ ගෑම, අත් පා අලංකාරමත් වීමට තෙල් ගා පිරිමැදීම, සුවඳ පැනින් නෑම, මල්ලව පොර කරුවන් මෙන් මස් වැඩීමට මුගුරුවලින් ඇඟ තැලීම, කැඩ පතින් ශරීරාලංකාරාදිය බැලීම, ශරීරය අලංකාර කිරීමට අඳුන් තෙල් ගෑම, මල් හා මල් මාලා පැලඳීම, ඇඟ පැහැපත් වීමට විලවුන් ගෑම, මුහුණෙහි සුවඳ ද්‍රව්‍ය ගෑම, මුහුණෙහි කැළැල් මැකීමට විලවුන් ගෑම, අලංකාරය පිණිස අත්වල ආභරණ පැලඳීම, හිස මුදුනෙහි කොණ්ඩය බැඳ රන් ආභරණ ආදියෙන් සැරසීම, අලංකාර සැරයටි දැරීම, ස්ත්‍රී රූප පුරුෂ රූප ආදී විසිතුරු රූප යොදා කළ බෙහෙත් නළ දැරීම, තියුණු කඩු දැරීම, විසිතුරු කුඩ දැරීම, විසිතුරු පාවහන් දැරීම, නලල්පට දැරීම, සිළුමිණි පැලඳීම, වල්විදුනා දැරීම, දික් දහවලු ඇති සුදු වස්ත්‍ර දැරීම යනාදියෙන් ශරීරය සැරසීම් කරති. මේ සසුනෙහි පැවිදි වූ භික්ෂුව එබඳු සැරසීම් කිරීමෙන් වැළකුණේ වේ. මෙය ද භික්ෂුවගේ එක් සීලයකි.

එසේම මේ ලෝකයෙහි ඇතැම් ශ්‍රමණ බ්‍රාහ්මණයෝ කර්‍මය, කර්‍ම ඵලය හා මෙලොව, පරලොව විශ්වාසය නම් වූ ශ්‍රද්ධාවෙන් පූජා කරන ලද චීවර පිණ්ඩපාත සේනාසන ගිලන්පස ආදිය පරිභෝග කොට මහා සම්මත, මහා මන්ධාතු, ධර්‍මාශෝක ආදී මහා රජවරු මහානුභාව ඇත්තෝය[1] යනාදී රජුන් පිළිබඳ කථා, අසවල් සොරා බල සම්පන්නය යනාදී සොරුන් පිළිබඳ කථා, මහ ඇමතියන් පිළිබඳ කථා, යුද සෙනා පිළිබඳ කථා, භය පිළිබඳ කථා, යුද්ධ පිළිබඳ කථා, අසවල් ආහාර මෙසේ මෙසේ වූ රස ගුණ ඇත්තේය යනාදී ආහාර පිළිබඳ කථා, පාන වර්‍ග පිළිබඳ කථා, ඇඳුම් පිළිබඳ කථා, ඇඳන් පිළිබඳ කථා, මාලා පිළිබඳ කථා, සුවඳ ද්‍රව්‍යයන් පිළිබඳ කථා, අපගේ ඥාතියෝ ශූරයෝ ය යනාදී නෑයන් පිළිබඳ කථා, පෙර අපි සුඛෝපභෝගී රථවලින් ගමන් ගියෙමු

---

[1] මෙසේ මහානුභාව රජවරුන් පවා මරණයට පැමිණියහ සියල්ල වෙනස් වන්නේය යනාදී ලෙස කථා කිරීම ධර්‍ම කථාය.

යනාදී රථ පිළිබඳ කථා, අසවල් ගම සරුසාර ය ඒ ගම් වැසියෝ ශූරයෝ ය යනාදී ගම් පිළිබඳ කථා, නියම්ගම් පිළිබඳ කථා, නගර පිළිබඳ කථා, ජනපද පිළිබඳ කථා, අසවල් ස්ත්‍රිය ලස්සන ය, ශරීරාවයව පිරිපුන් ය යනාදී ස්ත්‍රීන් පිළිබඳ කථා, පුරුෂයන් පිළිබඳ කථා, කුමාරයන් පිළිබඳ කථා, කුමරියන් පිළිබඳ කථා, නන්දිමිත්‍ර යෝධයා ශූරයෙකි යනාදී යෝධයන් (ශූරයන්) පිළිබඳ කථා, අසවල් වීථිය හොඳින් සකසා ඇත යනාදී වීථි පිළිබඳ කථා, ජල ස්නානය පිළිබඳ හා දිය ගෙන යන දාසීන් පිළිබඳ කථා, කමටහනින් තොර වූ නිෂ්ඵල කථා, ලෝකය කවරෙකු විසින් නිර්මාණය කරන ලද්දේ ද යනාදී ලොකය පිළිබඳ කථා, සාගර දෙවියා විසින් සාරන ලද බැවින් සමුද්‍රය නම් විය. මා විසින් මෙය සාරන ලද්දේ යැයි හස්ත මුද්‍රාවෙන් තමා දැක්වූ බැවින් සමුද්‍රය නම් විය යනාදී වූ සමුද්‍රය පිළිබඳ කථා, දියුණුව හා පිරිහීම පිළිබඳ කථා යන මෙබඳු පහත් කථාවන්හි යෙදී වෙසෙති. මේ සසුනෙහි භික්ෂුව එබඳු තිරශ්චීන කථාවලින් වැළකුණේ වේ. මෙය ද භික්ෂුවගේ එක් සීලයකි.

එසේම මේ ලෝකයෙහි ඇතැම් ශ්‍රමණ බ්‍රාහ්මණයෝ කර්මය, කර්ම ඵලය හා මෙලොව, පරලොව විශ්වාසය නම් වූ ශ්‍රද්ධාවෙන් පූජා කරන ලද චීවර, පිණ්ඩපාත, සේනාසන, ගිලන්පස ආදිය පරිභෝග කොට මෙලෙස වාද විවාද කරමින් හැසිරෙති. එනම් :- ඔබ මේ ධර්ම විනය නොදන්නෙහි ය, මම මේ ධර්ම විනය දනිමි. ඔබ මේ ධර්ම විනය කුමක් යැයි දන්නෙහි ද? ඔබ වරදවා පිළිපදින්නෙහි ය, මම මනාකොට පිළිපදින්නේ වෙමි. මාගේ වචන යහපත් ය. අර්ථ සහිත ය, ඔබගේ වචන අර්ථ රහිත ය. නුඹ පළමුව කිය යුත්ත පසුව කීවෙහි ය, පසුව කිය යුත්ත පළමුව කීවෙහි ය. ඔබ යමක් බොහෝ කල් පුරුදු කරමින් ප්‍රගුණ කරගන්නා ලද්දේ ද? ඒ සියල්ල මාගේ එක් වචනයෙන් ම නිෂ්ඵල විය. ඔබට චෝදනා කරන ලද්දෙහි ය. නින්දා කරන ලද්දෙහි ය. වාදයෙන් මිදෙනු පිණිස තැන තැන ගොස් ඉගෙන ගනුව. එලෙස ඉගෙන ගෙන හැක්කෙහි නම් වාදයෙන් ගැලවෙව යනාදී ලෙස දෝෂාරෝපණ කථාවෙහි යෙදී වෙසෙත්. මේ සසුනෙහි භික්ෂුව එබඳු වාද කථාවලින් වැළකුණේ වේ. මෙය ද භික්ෂුවගේ එක් සීලයකි.

එසේම මේ ලෝකයෙහි ඇතැම් ශ්‍රමණ බ්‍රාහ්මණයෝ කර්මය, කර්ම ඵලය හා මෙලොව, පරලොව විශ්වාසය නම් වූ ශ්‍රද්ධාවෙන් පූජා කරන ලද චීවර, පිණ්ඩපාත, සේනාසන, ගිලන්පස ආදිය පරිභෝග

කොට රජුන්ගේ, රජ මහ ඇමතියන්ගේ, ක්‍ෂත්‍රියන්ගේ, බමුණන්ගේ, ගෘහපතියන්ගේ සහ කුමරුන්ගේ හසුන් ගෙණ මෙතැනින් අසවල් තැනට යව - අසවල් තැනින් මෙහි එව - මෙය ගෙන යව - එතැනින් අසවල් දෙය ගෙණ එව යනාදී ලෙස මෙහෙයවන කල්හි ඔවුන්ගේ දූත කර්‍මයෙහි යෙදී වෙසෙත්. මේ සසුනෙහි භික්‍ෂුව එබඳු දූත කර්‍මයන් හි යෙදීමෙන් වැළකුණේ වේ. මෙය ද භික්‍ෂුවගේ එක් සීලයකි.

එසේම මේ ලෝකයෙහි ඇතැම් ශ්‍රමණ බ්‍රාහ්මණයෝ කර්‍මය, කර්‍ම ඵලය හා මෙලොව, පරලොව විශ්වාසය නම් වූ ශ්‍රද්ධාවෙන් පූජා කරන ලද චීවර, පිණ්ඩපාත, සේනාසන, ගිලන්පස ආදිය පරිභෝග කොට කුහකකම් කිරීමෙන් දිවි පවත්වති. එනම් :- සිව්පස ප්‍රත්‍ය ලැබීම සඳහා සිත් ඇදෙන ලෙස කථා කරති. ප්‍රත්‍යය ලැබීම පිණිස කයින් වචනයෙන් හැඟවීම් කරති. නොදෙන්නවුන්ට නින්ද අපහාස කොට ලැජ්ජාවට පමුණුවති. එක් තැනකින් ලැබුණු දේවල් වැඩියෙන් ලබනු පිණිස අන් තැනකට දී ලාභයෙන් ලාභය සොයති. මේ සසුනෙහි භික්‍ෂුව එබඳු කුහකකම් කිරීමෙන් වැළකුණේ වේ. මෙය ද භික්‍ෂුවගේ එක් සීලයකි.

## ❄ මහා සීලය

මේ ලෝකයෙහි ඇතැම් ශ්‍රමණ බ්‍රාහ්මණයෝ කර්‍මය කර්‍ම ඵලය මෙලොව පරලොව විශ්වාසය නම් වූ ශ්‍රද්ධාවෙන් පූජා කරන ලද චීවර, පිණ්ඩපාත, සේනාසන, ගිලන්පස ආදිය පරිභෝග කොට, මෙලෙස අත් පා පිහිටි තැනැත්තා දීර්‍ඝායුෂ ඇත්තෙක් වෙයි යනාදී වූ **අංග ශාස්ත්‍රය**, මදුරා පුරයෙහි අග රජ වූ පණ්ඩු රජු මුතු ඇට තුනක් මිටෙහි තබාගෙන මගේ අතේ කුමක් තිබේද යැයි නිමිත්ත පාඨකයන්ගෙන් ඇසීය. එවිට ඔවුහු වටපිට බැලූහ. එවේලෙහි හූනෙකු විසින් මැස්සන් අල්ලමින් සිටින විට මැස්සෙක් එයින් අත මිදී යනු දැක මුතු යැයි කීහ. කීයක් තිබේ දැයි අසන විට කුකුළෙකු තෙවරක් හැඬලීය එයින් මුතු තුනක් යැයි කීහ යනාදී වූ **නිමිති ශාස්ත්‍රය**, මහත් වූ අකුණු ගැසීම් ආදිය දැක එයින් මෙසේ ඵල ඇතිවෙයි යනාදී **උත්පාත ලක්‍ෂණ ශාස්ත්‍රය**, යමෙක් පෙර යම සිහින දුටුව හොත් මේ විපාකය ඇතිවෙයි යනාදී වූ **ස්වප්න**

**ශාස්ත්‍රය**, මෙම ලක්ෂණයෙන් යුක්ත වූ තැනැත්තා රජවෙයි මේ ලක්ෂණයෙන් යුක්ත වූ තැනැත්තා යුවරජ වෙයි යනාදී වූ **ලක්ෂණ ශාස්ත්‍රය**, මීයන් කෑ වස්ත්‍රාදිය බලා එයින් මෙසේ විපාක ඇතිවෙයි යනාදී වූ **මූසිකච්ඡින්න විද්‍යාව**, මෙබඳු දර දමා ගිනි පිදීමෙන් මෙසේ අනුහස් ඇතිවෙයි යනාදී **අග්ගිහෝමය**, මෙබඳු හැන්දකින් දහයියා පිදීමෙන් මෙබඳු ඵල ඇතිවෙයි යනාදී **දබ්බිහොමය**, මෙබඳු හැන්දකින් මෙබඳු දහයියා පිදීමෙන් මෙබඳු ඵල ඇතිවෙයි යනාදී **තුෂහෝමය**, මෙබඳු කුඩු වර්ගවලින් ගිනි පිදීමෙන් මෙබඳු ඵල ඇතිවෙයි යනාදී **තණහෝමය**, මෙබඳු සහල් තෘණ ආදියෙන් ගිනි පිදීමෙන් මෙබඳු ඵල ඇතිවෙයි යනාදී **තණ්ඩුල හොමය**, ගිතෙල්වලින් ගිනි පිදීමෙන් මෙබඳු ඵල ලැබෙයි යනාදී **සප්පි හොමය**, තලතෙල් අබ තෙල් ආදිය කටින් ගෙන ගින්නට දැමීමෙන් මෙබඳු ඵල ඇතිවෙයි යනාදී **තේල හොමය**, මන්ත්‍ර ජප කිරීමෙන් කරන **මුඛ හොමය**, දකුණු අකු ඇටයෙහි ලෙයින් පිදීම වූ **ලේ හොමය**, ඇඟිලි ඇට බලා ඵලාඵල කියන **අංග විද්‍යා**, ගෙවතු ආරාම වතු ආදියෙහි ඵලාඵල කියන **වාස්තු විද්‍යාව**, නීති ශාස්ත්‍රය ඉගෙන ගෙන කරන්නා වූ **ක්‍ෂාත්‍ර විද්‍යාව**, සොහොනෙහි ශාන්ති කර්මය කරන්නා වූ **සිව විද්‍යාව**, සිවලුන්ගේ හඬ අසා ඵලාඵල කියන්නා වූ **සිඟාල විද්‍යාව**, **වෛද්‍ය ශාස්ත්‍රය**, (මන්ත්‍ර) ඉගෙන ගෙන කරන්නා වූ **භූත විද්‍යා**, විශාල ගෙයක වසන්නෙකු විසින් උගත යුතු මන්ත්‍ර ඉගෙන ගෙන කරන්නා වූ **භූරි විද්‍යාව**, සර්පයන් දෂ්ටකළ විට විෂ බෑම ආදී ලෙස කරන්නා වූ **සර්ප විද්‍යාව**. සර්ප විෂ බැස්සවීමට නොහැකිවන ලෙස කරන්නා වූ **විෂ විද්‍යාව**, ගෝණුස්සන් දෂ්ටකළ විට ප්‍රතිකර්ම කරන්නා වූ **ගෝණුසු විද්‍යාව**, මීයන් කෑ විට ප්‍රතිකර්ම කරන්නා වූ **මූෂික විද්‍යාව**, පියාපත් ඇති හෝ නැති සත්වයන්ගේ හඬ අසා ඵලාඵල කියන්නා වූ **සකුණ විද්‍යාව**, කපුටන්ගේ හඬ අසා ඵලාඵල කියන්නා වූ **වායස විද්‍යාව**, මොහු මෙපමණ කලක් ජීවත් වන්නේය යැයි **ජීවිත කාලය කීම**, ඊ තළ වෙඩි ආදිය නොවදින ලෙස කරන්නා වූ **ශරපරිත්‍රාණ විද්‍යාව**, සියලු තිරිසන් සතුන්ගේ ශබ්ද තේරුම් ගත හැකි **මෘග පක්ෂ විද්‍යාව**, යන පහත් විද්‍යා හේතු කොට ගෙන වැරදි ජීවිතයෙන් ජීවිකා කෙරෙත්. මේ බුදු සසුනෙහි භික්ෂුව එබඳු පහත් විද්‍යාවන් හේතුවෙන් කරන ලාමක ජීවිකාවෙන් සම්පූර්ණයෙන් වැළකුණේ වේ. මෙය ද භික්ෂුවගේ එක් සීලයකි.

එසේම මේ ලෝකයෙහි ඇතැම් ශ්‍රමණ බ්‍රාහ්මණයෝ කර්‍මය කර්‍ම ඵලය හා මෙලොව පරලොව විශ්වාසය නම් වූ ශ්‍රද්ධාවෙන් පූජා කරන ලද චීවර, පිණ්ඩපාත, සේනාසන, ගිලන්පස ආදිය පරිභෝග කොට මෙබඳු වර්‍ණයෙන් යුත් මෙබඳු හැඩයෙන් යුත් මැණික් ඇත්තහු නිරෝගී වෙයි, ආශ්චර්‍ය්‍යය ලැබීමට හේතු වෙයි යනාදී ලෙස මැණික්වල ලක්‍ෂණ බලා ඵලාඵල කියන්නා වූ **මිණි ලක්‍ෂණ විද්‍යාව**, වස්ත්‍රයන්හි ගුණ අගුණ දක්වන **වස්ත්‍ර ලක්‍ෂණ විද්‍යාව**, මෙබඳු දණ්ඩක් දැරීමෙන් මෙබඳු ඵලාඵල ඇතිවෙයි යැයි කියන **දණ්ඩ ලක්‍ෂණ විද්‍යාව**, මෙබඳු කඩුවක් දැරීමෙන් මෙබඳු ඵලාඵල ඇත්තේය යැයි කියනු ලබන **අසි ලක්‍ෂණ විද්‍යාව**, මෙබඳු දුන්නක් දැරීමෙන් මෙබඳු ඵලාඵල ඇත්තේය යැයි කියනු ලබන **දුනු ලක්‍ෂණ විද්‍යාව**, මෙබඳු ආයුධයක් දැරීමෙන් මෙබඳු ඵලාඵල ඇත්තේය යැයි කියනු ලබන **ආයුධ ලක්‍ෂණ විද්‍යාව**, මෙබඳු ස්ත්‍රියක් වෙසෙන නිවසට මෙබඳු ඵලාඵල ඇත්තේය යනාදී වූ **ස්ත්‍රී ලක්‍ෂණ විද්‍යාව**, මෙබඳු පුරුෂයෙකු වෙසෙන නිවසට මෙබඳු ඵලාඵල ඇත්තේය යනාදී වූ **පුරුෂ ලක්‍ෂණ විද්‍යාව**, එලෙසම **කුමාර ලක්‍ෂණ විද්‍යාව, කුමාරී ලක්‍ෂණ විද්‍යාව, දස ලක්‍ෂණ විද්‍යාව, දසී ලක්‍ෂණ විද්‍යාව, හස්ති ලක්‍ෂණ විද්‍යාව. අශ්ව ලක්‍ෂණ විද්‍යාව, මහිෂ ලක්‍ෂණ විද්‍යාව, වෘෂභ ලක්‍ෂණ විද්‍යාව, අජ ලක්‍ෂණ විද්‍යාව, මෙණ්ඩක ලක්‍ෂණ විද්‍යාව, කුක්කුට ලක්‍ෂණ විද්‍යාව, වටු ලක්‍ෂණ විද්‍යාව, තලගොයි ලක්‍ෂණ විද්‍යාව, කර්‍ණිකා ලක්‍ෂණ විද්‍යාව, මෘග ලක්‍ෂණ විද්‍යාව** යනාදී මෙබඳු තිරශ්චීන විද්‍යාවගෙන් ජීවිකාව කෙරෙති. මේ බුදු සසුනෙහි භික්‍ෂුව එබඳු තිරශ්චීන විද්‍යාවන්ගෙන් කරන ලාමක ජීවිකාවෙන් සම්පූර්‍ණයෙන් වැළකුණේ වේ. මෙය ද භික්‍ෂුවගේ එක් සීලයකි.

තව ද මේ ලෝකයෙහි ඇතැම් ශ්‍රමණ බ්‍රාහ්මණයෝ කර්‍මය කර්‍ම ඵලය හා මෙලොව පරලොව විශ්වාසය නම් වූ ශ්‍රද්ධාවෙන් පූජා කරන ලද චීවර, පිණ්ඩපාත, සේනාසන, ගිලන්පස ආදිය පරිභෝග කොට අසවල් දින අසවල් නැකතින් අසවල් රජුගේ බැහැර යෑම වන්නේය, අසවල් දින ඇතුළු නුවරට එන්නේ ය, අසවල් දින ඇතුළු නුවර රජුන් වෙත පැමිණීම වන්නේය, බැහැර රජුගේ බැහැරට යෑම වන්නේය, බැහැර රජුගේ ඇතුළු නුවරට ඊම වන්නේය, ඇතුළු නුවර රජුගේ ආපසු යෑම වන්නේය, ඇතුළු නුවර රජුට ජය වන්නේය, බැහැර රජුන්ට පරාජය වන්නේය, බැහැර රජුන්ට ජය වන්නේය, ඇතුළු නුවර රජුට පරාජය වන්නේය, මෙසේ මොහුට ජය වන්නේය, මෙසේ පරාජය

වන්නේය යැයි කියා මෙසේ මිථ්‍යා ජීවයෙන් ජීවිකා කෙරෙති. මේ බුදු සසුනෙහි භික්ෂුව එබඳු තිරශ්චීන විද්‍යාවන්ගෙන් කරන ලාමක ජීවිකාවෙන් සම්පූර්ණයෙන් වැළකුණේ වේ. මෙය ද භික්ෂුවගේ එක් සීලයකි.

තව ද මේ ලෝකයෙහි ඇතැම් ශ්‍රමණ බ්‍රාහ්මණයෝ කර්මය කර්ම ඵලය හා මෙලොව පරලොව විශ්වාසය නම් වූ ශ්‍රද්ධාවෙන් පූජා කරන ලද චීවර, පිණ්ඩපාත, සේනාසන, ගිලන්පස ආදිය පරිභෝග කොට අසවල් දින චන්ද්‍රග්‍රහණයක් වන්නේය. සූර්ය ග්‍රහණයක් වන්නේය, අසවල් දින චන්ද්‍රසූර්ය දෙදෙනාගේ නියම මාර්ගයෙහි ගමන වන්නේය, අසවල් දින චන්ද්‍රසූර්ය දෙදෙනාගේ අමාර්ගයෙහි ගමන වන්නේය, අසවල් දින නක්ෂත්‍රයන්ගේ නියම මාර්ගයෙහි ගමන වන්නේය, අසවල් දින නක්ෂත්‍රයන්ගේ අමාර්ගයෙහි ගමන වන්නේය, අසවල් දින උල්කාපාතයක් වන්නේය, අසවල් දින දිසාඩාහයක් වන්නේය, අසවල් දින භූමි චලනයක් වන්නේය, අහස ගිගිරුම වන්නේය, අසවල් වේලාවෙහි සඳ නැගීම වන්නේය, හිරු නැගීම වන්නේය, තාරකාවන්ගේ නැගීම වන්නේය, බැසීම වන්නේය, අඳුරු වීම වන්නේය, බැබළීම වන්නේය, මෙබඳු විපාක ඇති චන්ද්‍ර ග්‍රහණයක් වන්නේය, මෙබඳු විපාක ඇති සූර්ය ග්‍රහණයක් වන්නේය, මෙබඳු විපාක ඇති නක්ෂත්‍ර ග්‍රහණයක් වන්නේය, මෙබඳු විපාක ඇති චන්ද්‍ර සූර්යයන්ගේ නියම මාර්ගයෙහි යාමක් වන්නේය, මෙබඳු විපාක ඇති චන්ද්‍ර සූර්යයන්ගේ වැරදි මාර්ගයෙහි යාමක් වන්නේය, මෙබඳු විපාක ඇති නක්ෂත්‍ර තාරකාවන්ගේ නියම මාර්ගයෙහි යාමක් වන්නේය, මෙබඳු විපාක ඇති නක්ෂත්‍ර තාරකාවන්ගේ වැරදි මාර්ගයෙහි යාමක් වන්නේය, මෙබඳු විපාක ඇති උල්කාපාතයක් ඇති වන්නේය, මෙබඳු විපාක ඇති දිසාඩාහයක් ඇති වන්නේය, මෙබඳු විපාක ඇති භූමි කම්පාවක් වන්නේය, මෙබඳු විපාක ඇති අහස් ගිගිරුමක් වන්නේය, මෙබඳු විපාක ඇති සඳ, හිරු, තාරකාවන්ගේ නැගීමක්, බැසීමක්, අඳුරු වීමක්, බැබළීමක් වන්නේය යැයි මෙසේ ශාස්ත්‍ර කියමින් මිථ්‍යා ජීවයෙන් ජීවිකා කෙරෙති. මේ බුදු සසුනෙහි භික්ෂුව එබඳු තිරශ්චීන විද්‍යාවන්ගෙන් කරන ලාමක ජීවිකාවෙන් සම්පූර්ණයෙන් වැළකුණේ වේ. මෙය ද භික්ෂුවගේ එක් සීලයකි.

තව ද මේ ලෝකයෙහි ඇතැම් ශ්‍රමණ බ්‍රාහ්මණයෝ කර්‍මය කර්‍ම ඵලය මෙලොව පරලොව විශ්වාසය නම් වූ ශ්‍රද්ධාවෙන් පූජා කරන ලද චීවර, පිණ්ඩපාත, සේනාසන, ගිලන්පස ආදිය පරිභෝග කොට නැකත් බලා මැනවින් වැසි ඇතිවන්නේ ය යැයි කලින් කියති. වැසි මඳ වන්නේය යැයි කියති, රටට දුර්භික්‍ෂයක් ඇතිවන්නේය යැයි කියති, රට සුභික්‍ෂ වන්නේය යැයි කියති, භයක් ඇතිවන්නේය යැයි කියති, භය ඇති නොවන්නේය යැයි කියති, අසවල් කාලයෙහි රෝග හට ගැනීමක් වන්නේය යැයි කියති, නිරෝගී බව වන්නේය යැයි කියති, ඇඟිලි සලකුණෙන් ගණන් කිරීම කරති, දිගටම ගණන් කිරීම කරති, සමූහ වශයෙන් ගණන් කිරීම කරති, කාව්‍ය ශාස්ත්‍රයෙහි යෙදෙති, ලෝකායතන ශාස්ත්‍රයෙහි යෙදෙති, මෙසේ මිථ්‍යා ජීවයෙන් ජීවිකා කෙරෙති. මේ බුදු සසුනෙහි භික්‍ෂුව එබඳු තිරශ්චීන විද්‍යාවන්ගෙන් කරන ලාමක ජීවිකාවෙන් සම්පූර්‍ණයෙන් වැළකුණේ වේ. මෙය ද භික්‍ෂුවගේ එක් සීලයකි.

තව ද මේ ලෝකයෙහි ඇතැම් ශ්‍රමණ බ්‍රාහ්මණයෝ කර්‍මය කර්‍ම ඵලය හා මෙලොව පරලොව විශ්වාසය නම් වූ ශ්‍රද්ධාවෙන් පූජා කරන ලද චීවර, පිණ්ඩපාත, සේනාසන, ගිලන්පස ආදිය පරිභෝග කොට ආවාහයට නැකත් කියති, විවාහයට නැකත් කියති, අඹු සැමියන් වෙන් කිරීමට නැකත් කියති, වෙන් වූ අඹු සැමියන් එක් කිරීමට නැකත් කියති, පොලියට ණයට දුන් ධනය ගැනීමට නැකත් කියති, පොලියට ණයට ධනය දීමට නැකත් කියති, ශ්‍රියාව ඇතිවීමට ගුරුකම් කරති, කාලකණ්ණි කිරීමට ගුරුකම් කරති, දරු ගැබ් පිහිටීමට හෙළීමට ගුරුකම් කරති. බෙහෙත් දෙති, දිව තද කිරීමට, හකු තද කිරීමට ගුරුකම් කරති, කන් බිහිරි වීමට ගුරුකම් කරති, කණ්ණාඩියට දෙවියන් පමුණුවා ප්‍රශ්න විචාරති, කුමාරිකාවන්ට දෙවියන් ආරූඪ කරවා ප්‍රශ්න විචාරති, ජීවිකාව පිණිස සූර්‍ය්‍යයා ඇදහීම කරති, මහා බ්‍රහ්මයා පුදති, මන්ත්‍ර ජප කොට මුඛයෙන් ගිනි පිට කරති, ශ්‍රී දේවිය කැඳවති, මෙසේ මිථ්‍යා ජීවයෙන් ජීවිකා කෙරෙති. මේ බුදු සසුනෙහි භික්‍ෂුව එබඳු තිරශ්චීන විද්‍යාවන්ගෙන් කරන ලාමක ජීවිකාවෙන් සම්පූර්‍ණයෙන් වැළකුණේ වේ. මෙය ද භික්‍ෂුවගේ එක් සීලයකි.

තව ද මේ ලෝකයෙහි ඇතැම් ශ්‍රමණ බ්‍රාහ්මණයෝ කර්‍මය කර්‍ම ඵලය මෙලොව පරලොව විශ්වාසය නම් වූ ශ්‍රද්ධාවෙන් පූජා කරන ලද

චීවර, පිණ්ඩපාත, සේනාසන, ගිලන්පස ආදිය පරිභෝග කොට දෙවියන්ට බාර වීමට ශාන්තිකර්ම කරති, දෙවියන්ට බාර ඉෂ්ට කිරීමට ශාන්තිකර්ම කරති, මැටි ගෙවල්හි හිඳ මන්ත්‍ර පාඩම් කිරීම, යන්ත්‍ර යෙදීම කරති, පණ්ඩකයන් පුරුෂයන් කරති, පුරුෂයන් පණ්ඩකයන් කරති, ශාස්ත්‍රානුකූලව ගෙවල් තනති, භූමි දෝෂ නසනු පිණිස බලි තොවිල් කිරීම පූජා පැවැත්වීම කරති, මන්ත්‍ර ජලයෙන් මුව දෝවණය කිරීම නෑවීම කරති, ගිනි දෙවියන් පුදති, වමන කරවීම, විරේක කරවීම, ළය විරේක, අධෝවිරේක, ශීර්ෂ විරේක කරවති. අක්ෂි රෝග කන් රෝග ආදියට බෙහෙත් තෙල් පිළියෙළ කරති. ඇස් රෝගවලට බෙහෙත් කරති. නස්‍යකර්ම කරති. ඇසෙහි පටල කපන අඳුන් පිළියෙළ කරති. ඇසෙහි සැත්කම් කරති. කටු ගසා ඇසට පිළියම් කරති. ඇස් වැඩෙන සිසිල් බෙහෙත් පිළියෙළ කරති. ළදරුවන්ට පිළියම් කරති. සර්වාංග වෙදකම කරති. බෙහෙත් සැර නැසීමට පිළියම් කරති. මෙසේ මිථ්‍යා ජීවයෙන් ජීවිකා කෙරෙති. මේ බුදු සසුනෙහි භික්ෂුව එබඳු තිරශ්චීන විද්‍යාවන්ගෙන් කරන ලාමක ජීවිකාවෙන් සම්පූර්ණයෙන් වැළකුණේ වේ. මෙය ද භික්ෂුවගේ එක් සීලයකි.

මහරජ, මෙසේ ආර්‍ය්‍ය සීලස්කන්ධයෙන් යුක්ත වූ භික්ෂුව හට සීල සංවරය හේතුකොටගෙන කිසි තැනකින් බිය අරමුණක් ඇති නොවේ. කුමක් මෙන් ද යත් :- මහරජ, ක්ෂත්‍රියාභිෂෙකයෙන් අභිෂේක කරන ලද්ද වූ, සතුරන් නැති කළා වූ ක්ෂත්‍රිය රජෙකුට සතුරන් හේතුවෙන් කිසි තැනකින් භයක් නූපදී ද, එපරිද්දෙන් ම මහරජ සීල සම්පන්න වූ භික්ෂුව හට සිල් බිඳීම හේතුවෙන් උපදින ආත්මානුවාද භය, පරානුවාද භය, දණ්ඩ භය ආදී බියක් වේ ද, එසේ වූ භය කාරණයන් අතුරෙන් කිසිවක් සීල සංවරය හෙතුකොට ගෙන ඇති නොවේ. එම භික්ෂුව ආර්‍ය්‍ය වූ මේ සීලස්කන්ධය හේතුවෙන් ඇති වූ මනා ආත්ම දමනයෙන් සිදුවන නිරවද්‍ය (කායික චෛතසික) සැපය විඳියි. මහරජ, මෙසේ භික්ෂුව සීලයෙන් යුක්ත වූයේ වේ.

## ❄ ඉන්ද්‍රිය සංවරය

"මහරජ, මේ සසුනෙහි භික්‍ෂුව කෙසේ නම් ඉන්ද්‍රියයන් හි වැසූ දොරටු ඇත්තේ වේද යත්?

මහරජ, මේ සසුනෙහි භික්‍ෂුව, ඇසින් රූපයක් දැක නිත්‍ය, සුඛ, සුභ, ආත්ම වශයෙන් අරමුණු නොගනී. අත් පා ආදී ශරීරාංගයන්හි ද එසේ අරමුණු නොගනී. ඇසෙහි සංවරයක් නැතියහුට රූප දැකීමෙන් ඇලීම් ගැටීම් ආදියෙන් සිතට අකුසල ධර්‍මයෝ වැස්සෙත් ද, සිත අපිරිසිදු වේ ද, එසේ නොවීම පිණිස පිළිපදිති. ඔහු තමාගේ ඇසෙහි සංවරයට පැමිණේ. කන, නාසය, දිව, කය, සිත යන ඉන්‍ද්‍රියයන්හි ද මෙසේ ම ය. එබඳු වූ භික්‍ෂුව උතුම් වූ සීල සම්පත්තිය හේතුවෙන් අභ්‍යන්තරයෙහි පිරිසිදු වූ අධිචිත්ත සැපය විඳියි. මහරජ, මෙසේ මේ සසුනෙහි භික්‍ෂුව ඉන්ද්‍රිය සංවරයෙන් යුක්ත වූයේ වේ.

## ❄ සති සම්පජඤ්ඤය

මහරජ, මේ සසුනෙහි පැවිදි වූ භික්‍ෂුව කෙසේ නම් සිහියෙන් හා මනා ප්‍රඥාවෙන් යුක්ත වූයේ වේද?

මහරජ, මේ සසුනෙහි භික්‍ෂුව ඉදිරියට යෑමෙහි දී ද, ආපසු හැරී ඒමෙහි දී ද සතර සම්‍යක් ප්‍රඥාවෙන් යුතුව මෙනෙහි කරන්නේ ය. ඉදිරි බැලීමෙහි දී ද, හැරී දිසා අනු දිසා බැලීමෙහි දී ද සතර සම්‍යක් ප්‍රඥාවෙන් යුතුව මෙනෙහි කරන්නේ ය. අත් පා හැකිළීමෙහි දී ද, දිගු කිරීමෙහි දී ද සතර සම්‍යක් ප්‍රඥාවෙන් යුතුව මෙනෙහි කරන්නේ ය. දෙපට සිවුර, පාත්‍රය, අන් සිවුරු ආදිය දැරීමෙහි දී ද සතර සම්‍යක් ප්‍රඥාවෙන් යුතුව මෙනෙහි කරන්නේ ය. ආහාර ගැනීමෙහි දී ද, පානය කිරීමෙහි දී ද, කෑමෙහි දී ද, රස විඳීමෙහි දී ද සතර සම්‍යක් ප්‍රඥාවෙන් යුතුව මෙනෙහි කරන්නේ ය. මළ මූත්‍ර පහ කිරීමාදී ශරීර කෘත්‍යයන් කරන කල්හි ද සතර සම්‍යක් ප්‍රඥාවෙන් යුතුව මෙනෙහි කරන්නේ ය. යෑමෙහි දී ද, සිටීමෙහි දී ද, හිඳීමෙහි දී ද, සැතපීමෙහි දී ද, අවදියෙන් සිටීමෙහි දී ද, කථා කිරීමෙහි දී ද, තුෂ්ණිම්භූතව නිශ්ශබ්දව සිටීමෙහි දී

ද සතර සම්‍යක් ප්‍රඥාවෙන් යුතුව මෙනෙහි කරන්නේ ය. මහරජ, මෙසේ කරන්නා වූ භික්ෂුව සිහියෙන් යුක්ත වූයේ යහපත් නුවණින් යුක්ත වූයේ වෙයි.

❖ මෙහි සතර සම්‍යක් ප්‍රඥාව යනු **සාර්ථක සම්පජඤ්ඤය, සප්පාය සම්පජඤ්ඤය, ගොචර සම්පජඤ්ඤය, අසම්මොහ සම්පජඤ්ඤය** යන සම්‍යක් ප්‍රඥාවයි.

1. ගමනක් යෑමට ඇති කල්හි යෑමෙහි සිතක් පහළ වූ පමණින් නොගොස් ඒ ගමන යෑමෙන් සිදුවන අර්ථය හා අනර්ථය නුවණින් සිහි කොට චෛත්‍ය දර්ශන, බෝධි දර්ශන, සංඝ දර්ශන, අසුභ දර්ශන ආදී වූ කුසල් සිත් වැඩීමට සීල සමාධි ප්‍රඥා දියුණුවට හේතුවන ගමනක් වේ නම් එය සාර්ථකය. එසේ නොවේ නම් අසාර්ථක ය. මෙසේ ඒ ගමනෙහි අර්ථානර්ථ දෙක බලා අර්ථය තෝරා ගැනීම **සාර්ථක සම්පජඤ්ඤය** නම් වේ.

2. චෛත්‍ය දර්ශන, බෝධි දර්ශනාදී කුසල් සිත් වැඩෙන සාර්ථක ගමනක් වුව ද, එහි කැප අකැප බව, යුතු අයුතු බව, සුදුසු - නුසුදුසු බව, සප්‍රාය අසප්‍රාය බව නුවණින් විමසා බැලිය යුතුය. අකැප, අයුතු, නුසුදුසු, අසප්‍රාය ගමනක් වේ නම් ඒ ගමන හැර කැප, යුතු, සුදුසු, සප්‍රාය ගමන තෝරා ගැනීම **සප්‍රාය සම්පජඤ්ඤය** නම් වේ.

3. තමන් නිති වඩන භාවනා කමටහනක් හෝ එම ගමනෙහි දී විශේෂයෙන් ප්‍රයෝජනවත් වන කමටහනක් හෝ ගෙන පියවරක් පාසා කර්මස්ථාන සිහියෙන් ගමන් කිරීම **ගෝචර සම්පජඤ්ඤය** නම් වේ.

4. ගමනෙහි දී පහළ වන නාම රූප සියල්ල ස්කන්ධ, ධාතු, ආයතන, පටිච්ච සමුප්පාදදියට බෙද බලමින් ද ත්‍රිලක්ෂණ චතුරාර්‍ය්‍ය සත්‍යයට නංවමින් ද ගමන සම්පූර්ණ කිරීම **අසම්මොහ සම්පජඤ්ඤය** නම් වේ.

## ❄ සිව්පස ප්‍රත්‍යය සන්තෝෂ

මහරජ, මේ සසුනෙහි භික්ෂුව කෙසේ නම් ලද පමණින් සතුටු වූයේ වේද?

මේ සසුනෙහි භික්ෂුව සිව්පස ප්‍රත්‍යය පිළිබඳව දෙළොස් වැදෑරුම් සන්තෝෂයෙන් යුක්ත වූයේ වේ. එහි චීවරය පිළිබඳව **යථා ලාභ සන්තෝෂය, යථා බල සන්තෝෂය, යථා සාරුප්‍ය සන්තෝෂය** යැයි සන්තෝෂ තුනකි. පිණ්ඩපාත, සේනාසන, ගිලාන ප්‍රත්‍යය පිළිබඳව ද මෙසේ තුන් තුන් ආකාරයෙන් වූ කල්හි දෙළොසකි. එහි :-

කාය පරිහරණයට ප්‍රමාණවත් වූ රළු වූ හෝ සැහැල්ලු වූ හෝ ලද තුන් සිවුරකින් සතුටු වෙයි. ඉන් වැඩියක් බලාපොරොත්තු නොවෙයි. ප්‍රණීත සිවුරු ලැබුණේ නමුත් තමන්ගේ පරිහරණයට නොගනී. මේ භික්ෂුවගේ චීවරයෙහි **යථා ලාභ සන්තෝෂය** යි.

යම් ලෙසකින් ස්වභාවයෙන් ම හෝ ගිලන් කමක් නිසා හෝ වයෝවෘද්ධ නිසා හෝ ලැබුණු රළු සිවුරු බර සිවුරු නොදැරිය හැකි වේ ද, එකල්හි අන් සභාග (ප්‍රතිපත්තියෙන් සමාන වූ) භික්ෂුවක් සමග සැහැල්ලු සිවුරුවලට මාරු කරගෙන පරිහරණය කරයි. මෙය භික්ෂුවගේ චීවරයෙහි **යථා බල සන්තෝෂය** යි.

භික්ෂුව තමන්ට ලැබෙන හොඳ සිවුරු ආචාර්‍ය්‍ය, උපාධ්‍යාය තෙරුන් වහන්සේලාට පරිත්‍යාග කරයි. ගිලන් භික්ෂූන්ට හෝ දුර්වල වූ සිවුරු ඇති හෝ සිවුරු හිඟ භික්ෂූන්ට හෝ පරිත්‍යාග කරයි. තමන් රළු වූ හෝ පාංශුකූල සිවුරු හෝ පරිභෝග කරයි. මෙය භික්ෂුවගේ චීවරයෙහි **යථාසාරුප්‍ය සන්තෝෂය** යි.

භික්ෂුව කාය පරිහරණයට ප්‍රමාණවත් වූ රළු වූ හෝ සැහැල්ලු වූ හෝ ලද ආහාරයකින් සතුටු වෙයි. ඉන් වැඩියක් බලාපොරොත්තු නොවෙයි. ප්‍රණීත ආහාර ලැබුණේ නමුත් තමන්ගේ පරිහරණය පිණිස නොගනී. මේ භික්ෂුවගේ ආහාරයෙහි **යථා ලාභ සන්තෝෂය** යි.

යම් ලෙසකින් ස්වභාවයෙන් ම හෝ ගිලන්කමක් නිසා හෝ ලැබුණු ආහාර අපත්‍යකර වේ ද, එකල්හි අන් සභාග (ප්‍රතිපත්තියෙන් සමාන වූ) භික්‍ෂුවක් සමග සැහැල්ලු, ප්‍රණීත ආහාරයකට මාරුකරගෙන පරිහරණය කරයි. එයින් සතුටු වෙයි. මෙය භික්‍ෂුවගේ ආහාරයෙහි **යථා බල සන්තෝෂය යි.**

භික්‍ෂුව තමන්ට ලැබෙන හොඳ ආහාර ආචාර්‍ය්‍ය, උපාධ්‍යාය තෙරුන් වහන්සේලාට අන් වැඩිහිටි භික්‍ෂූන්ට හෝ ගිලන් භික්‍ෂූන්ට හෝ අල්ප ලාභීන්ට හෝ පරිත්‍යාග කරයි. තමන් එම භික්‍ෂූන් වළඳ ඉතිරි වූවක් හෝ පිඬු පිණිස හැසිර හෝ ලැබුණු ආහාරයක් වළඳයි. එයින් සතුටු වෙයි. මෙය භික්‍ෂුවගේ ආහාරයෙහි **යථාසාරුප්‍ය සන්තෝෂය** යි.

භික්‍ෂුව මනාප වූ හෝ අමනාප වූ හෝ සෙනසුනක් ලැබ එයින් සතුටු වෙයි. එයින් සිතෙහි අමනාපයක් ඇති නොකරගනී. ඉන් වැඩියක් බලාපොරොත්තු නොවෙයි. මනාප සෙනසුනක් ලැබුණේ නමුත් තමන්ගේ පරිහරණය පිණිස නොගනී. මේ භික්‍ෂුවගේ සේනාසනයෙහි **යථා ලාභ සන්තෝෂය** යි.

යම් ලෙසකින් ස්වභාවයෙන් ම හෝ ගිලන්කමක් නිසා හෝ වයෝවෘද්ධ නිසා හෝ ලැබුණු සෙනසුන හේතුවෙන් යම් අපහසුවක් වේ ද, එකල්හි අන් සභාග (ප්‍රතිපත්තියෙන් සමාන වූ) භික්‍ෂුවක් සමග ගැලපෙන සෙනසුනකට මාරුකරගෙන පරිහරණය කරයි. එයින් සතුටු වෙයි. මෙය භික්‍ෂුවගේ සේනාසනයෙහි **යථා බල සන්තෝෂය** යි.

භික්‍ෂුව තමන්ට ලැබෙන හොඳ සෙනසුන් ආචාර්‍ය්‍ය, උපාධ්‍යාය තෙරුන් වහන්සේලාට පරිත්‍යාග කරයි. ගිලන් භික්‍ෂූන්ට හෝ අල්ප ලාභී වූ භික්‍ෂූන්ට හෝ පරිත්‍යාග කරයි. තමන් කුඩා වූ හෝ රළු වූ හෝ සෙනසුනක් පරිභෝග කරයි. තව ද උතුම් සෙනසුන් නම් ප්‍රමාදයට කරුණු වූ ස්ථානයකි. එහි වාසය කරන්නහුට ථීනමිද්ධය ඇති වේ. සැපයෙහි ඇලී වසන්නහු නින්දෙන් මැඩ ගනී. පිබිදුණු කල්හි කෙලෙස් අරමුණු හටගනී යැයි සිතා උසස් සෙනසුන් ලැබුණු විට ඒවා ප්‍රතික්‍ෂේප කොට වෘක්‍ෂමූල, අභ්‍යවකාශ ආදී තැන්හි වාසය කොට

එයින් සතුටු වෙයි. මෙය භික්ෂුවගේ සේනාසනයෙහි **යථාසාරුප්‍ය සන්තෝෂය** යි.

භික්ෂුව ගිලන්කමක් ඇති වූ කල්හි ප්‍රමාණවත් වූ රළු වූ හෝ ප්‍රණීත වූ හෝ බෙහෙතක් ලබයි ද එයින් සතුටු වෙයි. ඉන් වැඩියක් බලාපොරොත්තු නොවෙයි. ලැබුණේ නමුත් තමන්ගේ පරිහරණය පිණිස නොගනී. මේ භික්ෂුවගේ ගිලානප්‍රත්‍යය ලාභයෙහි **යථා ලාභ සන්තෝෂය** යි.

යම් ලෙසකින් හකුරු අවශ්‍ය වූ විටෙක ගිතෙල් ලැබෙයි. එකල්හි අන් සභාග (ප්‍රතිපත්තියෙන් සමාන වූ) භික්ෂුවක් සමග හකුරුවලට අන් දෙයකට හෝ එම ගිතෙල් මාරුකරගෙන පරිහරණය කරයි. එයින් සතුටු වෙයි. මෙය භික්ෂුවගේ ගිලාන ප්‍රත්‍ය ලාභයෙහි **යථා බල සන්තෝෂය** යි.

භික්ෂුව තමන්ට ලැබෙන හොඳ ප්‍රණීත බෙහෙත් ආචාර්‍යය, උපාධ්‍යාය තෙරුන් වහන්සේලාට පරිත්‍යාග කරයි. අන් ගිලන් භික්ෂූන්ට හෝ අල්ප ලාභී භික්ෂූන්ට හෝ පරිත්‍යාග කරයි. තමන් අන් භික්ෂූන්ට ලැබුණු යම් බෙහෙතක් පරිභෝග කරයි. එයින් සතුටු වෙයි.

තව ද භික්ෂූන්ගේ පොදු පරිහරණයට එක් බඳුනක අරළු ගව මුත්‍රයෙහි ලා පල් කර ගන්නා ලද **පූතිමුත්ත භේසජ්ජය** ඇත්තේ වෙයි. **එක් බඳුනක චතුමධුර** ඇත්තේ වෙයි. භික්ෂුව රෝගාබාධයක් ඇති වූ විට මේ පූතිමුත්ත භේසජ්ජය බුද්ධාදී මහෝත්තමයන් වහන්සේලා විසින් වර්‍ණනා කරන ලද උතුම් ඖෂධයකි යැයි චතුමධුර ප්‍රතික්ෂේප කොට පූතිමුත්ත භේසජ්ජය වළඳයි ද, එම භික්ෂුව පරම සන්තෝෂයෙන් යුක්ත වූයෙක් ම වෙයි. මෙය භික්ෂුවගේ ගිලානප්‍රත්‍යය භේසජ්ජයෙහි **යථාසාරුප්‍ය සන්තෝෂය** යි.

සිව්පස ප්‍රත්‍යය පිළිබඳ වූ මෙම දොළොස් වැදෑරුම් සන්තෝෂයන්ගෙන් එකකින් හෝ කිහිපයකින් හෝ සියල්ලගෙන් ම හෝ යම් භික්ෂුවකට සතුටු විය හැක්කේ වේ ද, එම භික්ෂුවට පැවිදි කිස සඳහා අෂ්ට පරිෂ්කාරය පමණක් ම සෑහෙන්නේ ය. එය මෙසේ කියන ලද්දේය.

**"තිචීවරඤ්ච පත්තො ච - වාසි සූචි ච බන්ධනං,**
**පරිස්සාවනෙන අට්ඨෙ තෙ - යුත්තයොගස්ස භික්ඛුනො"ති.**

දෙපට සිවුර - තනි පට සිවුර - අඳන සිවුර යන තුන් සිවුර ය, පාත්‍රය, දැලි පිහිය, ඉඳි කටුව, කාය බන්ධනය (ඉන පටිය), පෙරහන, යන මේ පරිෂ්කාර අට යෝගී භික්‍ෂුවට සුදුසු ය.

මෙම පරිෂ්කාර අටෙන් කය ආරක්‍ෂා කරන්නේ ද, උදරය ආරක්‍ෂා කරන්නේ ද වේ. එය කෙසේ වේ ද යත්? මේ තුන් සිවුර හැඳ පෙරව හැසිරෙන කල්හි ශරීරය ආරක්‍ෂා වෙයි. සිවුරු කොනින් ජලය පෙරා පානය කරන කල්හි ද, කෑ යුතු පලාපල ගන්නා කල්හි ද උදරය පරිහරණය වෙයි. පාත්‍රයෙන් දිය ගෙන නහන කල්හි ද, කුටි සෙනසුන් පවිත්‍ර කරන කල්හි ද, කායික පරිහරණය වෙයි. ආහාර ගෙන වළඳන කල්හි උදරය පරිහරණය වෙයි. පිහියෙන් දැහැටි දඬු කපන කල්හි ද, ඇඳ පුටුවල පාද ආදිය සැකසීම, සිවුරු කුටියක් කිරීමට අවශ්‍ය ලී දඬු කැපීමාදිය කිරීමෙහි දී කායික පරිහරණය වෙයි. උක් කැපීම, පළතුරු කැපීම කැප කිරීමාදියෙහි දී උදර පරිහරණය වෙයි. කාය බන්ධනය ඉණෙහි බැඳි කල්හි කාය පරිහරණය වෙයි. උක් ආදිය මිටි කොට බැඳගෙන යන කල්හි උදර පරිහරණය වෙයි. පෙරහනෙන් දිය පෙරා ගෙන නහන කල්හි ද, සෙනසුන් පවිත්‍ර කරන කල්හි ද කාය පරිහරණය වෙයි. පැන් පෙරා පානය කරන කල්හි ද, තල හබල පෙති ආදිය ගෙන වළඳ කල්හි ද උදර පරිහරණය වෙයි.

මෙය වනාහී අෂ්ට පරිෂ්කාර දරන්නහුට පරිෂ්කාර මාත්‍රයක් පමණි. පරිෂ්කාර නවයක් දරන්නහු විසින් නින්දට පිවිසෙන කල්හි එම අෂ්ට පරිෂ්කාරය සමග ඇතිරිල්ලක් හෝ කෙණ්ඩියක් වටී. පිරිකර දසයක් දරන්නහුට ඉහත කී ඒවා සමග හිඳින සම් කඩක් වටී. පරිෂ්කාර එකොළොසක් දරන්නහුට ඉහත කී ඒවා සමග සැරයටියක් හෝ තෙල් කුලාවක් වටී. පරිෂ්කාර දෙළොසක් දරන්නහුට ඉහත කී ඒවා සමග කුඩයක් (තල් අතු කුඩය) හෝ පාවහන් යුවළක් වටී. මෙසේ පරිෂ්කාර දරන්නහු අතරින් අෂ්ට පරිෂ්කාරය පමණක් දරන්නා ම සන්තෝෂයෙන් යුක්ත වූවෙකු වේ. එයින් වැඩියක් පරිහරණය කරන්නා වූ භික්‍ෂුව අසතුටු වූවෝ, බොහෝ කැමති වූවෝ, මහත් තෘෂ්ණා ඇත්තෝ යැයි නොකිය යුතුය. එලෙස අතිරේක පරිෂ්කාර දරන්නා ද අල්පේච්ඡ වූවෝ

ම සතුටු වූවෝ ම පහසු විහරණ ඇත්තෝ ම සැහැල්ලු පැවතුම් ඇත්තෝ ම වෙති.

භාග්‍යවතුන් වහන්සේ මෙම සූත්‍රයෙන් අතිරේක පරිෂ්කාර දරණ භික්ෂුව අරමුණු කොට නො දෙසූ සේක. අෂ්ට පරිෂ්කාරය පමණක් දරණ භික්ෂුව ම අරමුණු කොට දෙසූ සේක. එම භික්ෂුව අඳනය හැඳ, කාය බන්ධනය බැඳ, තනි පට සිවුර හා දෙපට සිවුර එක්ව ගෙන කය වසා පෙරවාගෙන, කුඩා පිහිය ද, ඉදි කටුව ද පෙරහනෙහි ඔතා පාත්‍රයෙහි බහා, පාත්‍රය වම් කරෙහි එල්ලාගෙන කැමති තැනකට සුවසේ යයි. ආපසු හැරී ඇවිත් රැගෙන යා යුතු දෙයක් නම් එම භික්ෂුවට නැත්තේම ය. මෙසේ මේ භික්ෂුවගේ සැහැල්ලු පැවතුම් ඇති බව දක්වමින් භාග්‍යවතුන් වහන්සේ **"සන්තුට්ඨො හොති කායපරිහාරිකෙන චීවරෙන"** ආදිය වදාළ සේක. එබඳු භික්ෂුවට මේ මගේ කුටිය, මේ මගේ සෙනසුන, මේ මගේ උපස්ථායකයෝ, මේ මගේ දයකයෝ යැයි ඇලීමක් හෝ බැඳීමක් නැත. එම භික්ෂුව දූන්නෙන් මිදුණු ඊ තලයක් මෙන් ද, රැළෙන් ඉවතට යන මත් ඇතෙකු මෙන් ද, තමන් කැමති වන්නා වූ වන ළැහැබකට, වෘක්ෂ මූලයකට, අලුත් මිටියාවතකට හෝ ගොස්, ඒ තැන්හි සිත් අලවා හුදකලාව සිටියි. හුදකලාව හිඳියි. සියලු ඉරියව් පැවතුම් දෙවැන්නෙකු නැතිව පවත්වයි.

**"චාතුද්දිසො අප්පටිඝො ච හොති**
**සන්තුස්සමානො ඉතරීතරෙන,**
**පරිස්සයානං සහිතා අඡම්භී**
**එකො චරෙ ඛග්ගවිසාණකප්පො"ති**

**"ලද සිව්පස ප්‍රත්‍යයෙන් සතුටු වන්නා වූ, සතර දිසාවට ම පතුරවන ලද සතර බ්‍රහ්ම විහාරයන් ඇතිව කිසි තැනක ගැටුමක් නැතිව වෙසෙයි. කිසි උපද්‍රවයක් නැතිව තැති ගැනීමක් නැතිව එකලාව හැසිරෙන කඟවෙහෙණහඟක් මෙන් එකලාව හැසිරෙයි".**

තව ද උපමාවකින් එම කාරණය සාදනය කරන්නට මෙසේ වදාළ සේක.

පියාපත් ඇති පක්ෂීහු අසවල් ප්‍රදේශයෙහි ගසක පැසුණු ගෙඩි ඇත්තේය යැයි දැන නන් දෙසින් ඇවිත් නිය තුඩු ආදියෙන් විද ඒ ගෙඩි ආහාරයට ගනිති. මෙය අදට ය, මෙය හෙටට ය යැයි ඒවා වෙන් කර ගැනීමේ සිතක් ඔවුන්ට නැත. ගෙඩි අවසන් වූ විට එම ගසට ආරක්ෂාවක් හෝ කිසි සලකුණක් නො තබති. එම ගස පිළිබඳව කිසි අපේක්ෂාවක් නොකොටම යම් දිසා භාගයක් කැමති වේ ද, පියාපත් බරින් යුතුව අහසට නැඟී එහි යති. එලෙස ම මේ සසුනෙහි භික්ෂුව කිසි තැනක ඇල්මක් නැතිව අපේක්ෂා රහිතව වාසය කරයි.

යම් භික්ෂුවකට මේ සිව්පස ප්‍රත්‍ය පහසුව නැත්තේ වේ ද, එම භික්ෂුවට ආරණ්‍ය වාසයෙහි ප්‍රයෝජනය සිද්ධ නොවේ. තිරිසන් සතුන් මෙන් ද, වනයෙහි හැසිරෙන්නන් මෙන් ද, විසීම් මාත්‍රය පමණක් සිදු වේ. එය වනාහී ආරණ්‍ය වාසයට සුදුසු නොවේ. ආරණ්‍යයට අධිගෘහිත දෙවියෝ මෙබඳු පාප භික්ෂුවවකගේ ආරණ්‍ය වාසයෙන් කවර වැඩක් ද යැයි බියකරු ශබ්ද ඇති කරවති. අත්වලින් හිසට ගසා පළා යන බවක් දක්වති. අසවල් භික්ෂුව ආරණ්‍යයට පිවිස මෙබඳු මෙබඳු පවුකම් කළේ ය යැයි අපකීර්තිය පතුරුවති.

යම් භික්ෂුවකට සිව්පස ප්‍රත්‍ය පහසුව ඇත්තේ ද, එම භික්ෂුවගේ ආරණ්‍ය වාසයෙහි ප්‍රයෝජනය සිද්ධ වේ. එම භික්ෂුව තමාගේ සීලය පරීක්ෂා කොට බලා කිසි කිළුටක් හෝ කැළලක් නො දැක ප්‍රීතිය උපදවා එය ක්ෂය වීම්, වැය වීම් වශයෙන් සිහි කොට ආයර්‍ය භූමියට බැසගනී. ආරණ්‍යයෙහි අධිගෘහිත දෙවියෝ සතුටු සිත් ඇතිව එම භික්ෂුවගේ ගුණ කියති. දියෙහි දැමූ තෙල් බිඳුවක් හාත්පස පැතිරෙන්නාක් මෙන් එම භික්ෂුවගේ කීර්තිය හාත්පස පැතිරී යයි. එම භික්ෂුවගේ පැවිදි කෘත්‍යය පහසුවෙන් සම්පූර්ණ වේ. ඒ බව දක්වමින් භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළ සේක.

**සො ඉමිනා ච අරියෙන සීලක්ඛන්‍ධෙන සමන්නාගතො, ඉමිනා ච අරියෙන ඉන්ද්‍රියසංවරෙන සමන්නාගතො, ඉමිනා ච අරියෙන සතිසම්පජඤ්ඤෙන සමන්නාගතො, ඉමාය ච අරියාය සන්තුට්ඨියා සමන්නාගතො, විවිත්තං සෙනාසනං භජති අරඤ්ඤං රුක්ඛමූලං පබ්බතං කන්‍දරං ගිරිගුහං සුසානං වනපත්‍ථං අබ්භොකාසං පලාලපුඤ්ජං.**

මහරජ, මෙලෙස මේ සසුනෙහි පැවිදි වූ භික්ෂුව මෙසේ වූ නොකිලිටි ආර්‍ය්‍ය සීලස්කන්ධයෙන් යුක්තව, මෙසේ වූ ආර්‍ය්‍ය ඉන්ද්‍රිය සංවරයෙන් යුක්තව, මෙසේ වූ ආර්‍ය්‍ය සති සම්පජඤ්ඤයෙන් යුක්තව, මෙසේ වූ ආර්‍ය්‍ය සන්තෝෂයෙන් යුක්තව **විවික්ත සෙනසුන්, වෘක්ෂ මූල, පර්‍වත, කඳු රැළි, ගල් ගුහා, සොහොන්, ඉතා දුර වූ කැලෑ, විවෘත තැන්, පිදුරු කිළි** ඇසුරු කොට වෙසෙයි.

එහි **විවිත්තං සෙනාසනං භජති** යන මෙහි **විවිත්ත** යනු සමීපයෙහි වූ සේනාසනයක් වුව ද ජනයාගෙන් හිස් වූ ශබ්ද අඩු ගිහියන්ගෙන් හා පැවිද්දන්ගෙන් නො ගැවසුනු වෙන්වුණු තැන්ය. **සේනාසන** යනු සයනය කරන හිඳින ආසන ඇති තැන්ය. මෙය වනාහී ඇඳ පුටු ආදියට නමකි. **ඇඳ, පුටුව, මෙට්ටය, කොට්ටය, විහාරය, අඩ්ඪයෝගය, ප්‍රාසාදය, සඳලුතලය, ගුහාව, අට්ටාලය, මිදුල, ලෙන, උණ පඳුර, වෘක්ෂමූලය, මණ්ඩපය** යැයි සේනාසන පසළොසක් වේ. යම් තැනකට භික්ෂූන් වහන්සේලා පැමිණෙත් ද ඒ සියල්ල **සේනාසන** නම් වේ. මෙම සේනාසන **විහාර සේනාසන, මඤ්චපීඨ සේනාසන, සන්ථර සේනාසන, ඕකාස සේනාසන** යැයි සතර වැදෑරුම් වේ. එහි

- ❖ විහාරය, අඩ්ඪයෝගය, ප්‍රාසාදය, සඳලුතලය, ගුහාව යන පස **විහාර සේනාසන** නම් වේ.
- ❖ ඇඳ, පුටුව, මෙට්ටය, කොට්ටය යන සතර **මඤ්චපීඨ** සේනාසන නම් වේ.
- ❖ තල් කොළ ඇතිරිය, සම් කඩ, තෘණ ඇතිරිය, කොළ ඇතිරිය යන සතර **සන්ථර සේනාසන** නම් වේ.
- ❖ යම් තැනකට භික්ෂූන් වහන්සේලා නැවත පැමිණෙත් ද ඒ තැන් **ඕකාස සේනාසන** නම් වේ.

තව ද ලිහිණියෙකුට සමාන පැවතුම් ඇති සිව් දිසාවන්ගෙන් කැමති ඕනෑම දිසාවක ඕනෑම තැනක් භික්ෂුවගේ වාසයට සුදුසු වන්නේය. ඒ බව දක්වීමට **ආරණ්‍ය, වෘක්ෂමූල, පර්‍වත, කඳුරැළි, ගිරිගුහා, සොහොන, වනලැහැබ, එළිමහන් තැන, පිදුරු ගෙය** යන සෙනසුන් නවය වදාළ සේක. එහි

- ගමක හෝ නියම්ගමක හෝ නගරයක ඇති ඉන්ද්‍රකීලයෙන් පිටත **ආරණ්‍ය** නම් වේ. මෙය භික්ෂුණීන්ගේ වශයෙනි. භික්ෂූන්ගේ වශයෙන් ඉන්ද්‍රකීලයෙහි සිට දුණු පන්සියයකින් (සැතපුමක්) ඈත ප්‍රදේශය **ආරණ්‍ය** නම් වේ.

- මධ්‍යාහ්න කාලයෙහි හාත්පසින් බොහෝ ප්‍රදේශයක සෙවන ඇති සුළං නැති විට ඈතට කොළ වැටෙන ඝනව වැවුණු ජනයා ගැවසීමක් නැති වෙන් ව පිහිටි ගසක යට ප්‍රදේශය **වෘක්ෂමූලය** නම් වේ.

- ජනයා නො ගැවසෙන අන් කිසි බාධාවක් නැති විවේකය ඇති ගල් පර්වතය හෝ පස් කන්ද **පර්වත** නම් වේ. එහි ඇති හෙබකින් (පොකුණ) ජලය පානය කර ගත සිසිල් කරගෙන සිසිල් සුළං හමන තැනක පර්‍යංකයක් බැඳ හුන් කල්හි සිත එකඟ වේ.

- කඳු දෙකක් අතර හෝ ගල් පර්වත දෙකක් අතර එක් පැත්තක හෝ දෙපැත්තෙහි ම ජල පහරින් හෑරුණා වූ විවර **කන්දර** නම් වේ. මෙයට **නිතම්බ** යැයි ද **ගං දෙණිය** යැයි ද කියනු ලැබේ. එබඳු තැන්හි රිදී පටක් වැනි වැලිතලා ඈත. උඩින් මැණික් වියනක් වැනිව පිහිටි වන ගහනය ඈත. මැණික් කඳන් වැනිව ජලය ගලා බසී. මෙවැනි කඳුරකට ගොස් ජලය පානය කොට ගත සිසිල් කොට වැලි ගොඩකර ඒ මත පාංශුකූල චීවරය එළා පර්‍යංකයක් බැඳ වැඩහුන් කල්හි සිත එකඟ වේ.

- පර්වත දෙකක් අතර එක් පසෙක හෝ දෙපසෙහිම හෝ උමඟක් වැනිව පිහිටි විවර **ගිරි ගුහා** නම් වේ.

- යම් තැනක එක් මිනියක් හෝ දවන ලද්දේ ද එතැන් පටන් එම භූමියෙහි නැවත මිනී නොදැවුව ද **සොහොන** හෙවත් **සුසානය** නම් වේ. මෙබඳු තැන්හි සක්මන් - මඬු ආදිය තනා, ඇඳ - පුටු පනවා නොසිටිය යුතුය. විහාරයෙහි සංඝ ස්ථවිරයන්ට ද ගම් ප්‍රධානියාට ද දන්වා ජීවිතාශාව හැර රාත්‍රියෙහි සොහොනට ගොස් මැදි යම් රැය එහි කමටහන් වඩමින් ගත කොට අළුයම එයින් නික්ම යා යුතුය. (වැඩි විස්තර විශුද්ධි මාර්ගයෙන් බලා දත යුතුය.)

- ❖ ග්‍රාමාන්තය ඉක්මවා ගියා වූ සිංහ, ව්‍යාඝ්‍රාදී දරුණු වන සතුන් වසන, නයි - පොළොන් - පිඹුරන් වැනි උරගයන් වෙසෙන ජීවිත ආශාව අත්හැර යා යුතු වූ ගොවිතැන් ආදී කිසි කර්මාන්තයක් පිණිස මිනිසුන් නොයන ඈත ප්‍රදේශ **වනලැහැබ** හෙවත් **ප්‍රාන්ත සේනාසන** නම් වේ.

- ❖ විවෘත ආකාශය ඇති තැන **අභ්‍යවකාශය** හෙවත් **එළිමහන් තැන** නම් වේ. එහි සතර රියනක සිවුරු කුටියක් සාද එහි විසිය හැක.

- ❖ මහත් පිදුරු කන්දක යටින් පිදුරු ඉවත් කොට පර්වත ගුහාවක් වැනිව කුහර සාද හෝ වනලැහැබක් මත පිදුරු අතුරා ඇතුළත ගුහාවක් සේ සකසා එහි ඇතුළත සිටිය හැකි වේ ද මෙය **පිදුරු ගෙය** නම් වේ.

එම භික්ෂුව මෙබඳු සෙනසුන් ඇසුරු කොට වෙසෙමින් මනා සිහි නුවණින් යුක්තව පිඩුසිඟා වැඩ යැපීමට සෑහෙන තරම් වූ ආහාරයක් ලැබ තම වාසස්ථානයට පැමිණ ප්‍රත්‍යවේක්ෂා නුවණින් එය වළඳ, කැමැත්තෙහි නම් බත්ත සම්මදය දුරු කොට කායික පහසුව ඇති කර ගනු පිණිස මඳක් විවේක ගෙන, ලෑලි කෑල්ලක හෝ දඬු සතරක් කොටුවක් වන ලෙසට බැඳ එහි අරුණුවන් මැටි[1] ගෙන සියුම් ලෙස අඹරා ගෙන එක් වියත් සතරඟුලක ප්‍රමාණයට කඩතොලු නොවන සේ රවුම් කසිණ මණ්ඩලයක් සාදගෙන, වසන සෙනසුන පිරිසිදු කොට ගෙන, කය ද පිළිදැගුම් කොට, සාද ගත් කසිණ මණ්ඩලය රියන් දෙක හමාරක් තරම් දුරක තබාගෙන, එක් රියන් සතරඟුලක් පමණ උස් ආසනයක පර්යංකයක් බැඳ වැඩ හිඳ, සම් මස් නහර නැමීමෙන් තැලීමෙන් ඇතිවෙන වේදනා අපහසුකම් බාධා වැළැක්වීම පිණිස හා වැඩි වේලාවක් එකඟ සිතින් විසිය හැකි ලෙසට අටළොස් පිට කටු එකින් එක සමව සිටින සේ උඩු කය කෙලින් තබාගෙන, නෛර්යාණික සද්ධර්මය කෙරෙහි බලවත් ප්‍රසාදයෙන් යුක්තව නොවෙනස් වන ලෙස අධිෂ්ඨානය ඇතිව, නුමුළා වූ සිහිය නුවණ ඇතිව, උපාදනස්කන්ධ පසෙන් නිදහස් ව නිවන් සුව පසක් කරනු පිණිස, පනවා ගත් අරමුණක් වන ඒ කසිණ මණ්ඩලය මත දෙනෙත්

---

[1] අරුණෝත්ගමනය වන වේලාවෙහි නැගෙනහිර අහසේ පෙනෙන රන්වන් පැහැය බඳු

පිහිටුවා ගෙන **"පඨවි, පඨවි"** යනුවෙන් විටෙක දෙනෙත් අරිමින් ද, විටෙක දෙනෙත් පියමින් ද එම අරමුණෙහි සිත පුරුදු කරයි. වඩයි. එම භික්ෂුව දෙනෙත් පියාගත් විට ද ඇසින් දකින්නාක් මෙන් එම අරමුණ ප්‍රකට වන්නේ වේ. මෙසේ වඩන කල්හි පෙර භවයන්හි දී පඨවි කසිණාදී භාවනාවන් ප්‍රගුණ කර ඇත්තේ නම් පහසුවෙන් අභිඥත්වය හෝ සිද්ධ වන්නේය. සෝවාන් ආදී යට මාර්ගයක් හෝ ලබන්නේ ය. ධ්‍යාන සමාපත්තියකට හෝ පහසුවෙන් පැමිණෙන්නේ ය. එසේ පුරුදු පුහුණු නොකරන ලද්දක් වේ නම්, නීවරණාදී බාධක ජය ගනිමින් අනු පිළිවෙලින් ප්‍රගුණ කළ යුතු වන්නේ ය.

## ❄ නීවරණ ප්‍රහාණය

ඉහත කී ලෙස භාවනාරම්මණය වඩන විට නැවත නැවත නීවරණ මතු වී කර්මස්ථානය වැඩීමට බාධා කරන්නේ නම්, මෙලෙස ප්‍රයෝග කොට නීවරණ ජය ගත යුතු වේ. භාග්‍යවතුන් වහන්සේ එය මෙසේ වදාළ සේක.

## ☸ කාමච්ඡන්ද නීවරණය ප්‍රහාණය කිරීම

මහරජ, යම් සේ පුරුෂයෙක් ණය ගෙන කර්මාන්තයන් හි යොදන්නේ ද, ඔහුගේ ඒ කර්මාන්තයෝ දියුණු වන්නාහු නම් ඔහුගේ ඒ පරණ ණය මුදල් සියල්ලම ගෙවන්නේ ය. ඔහුගේ අඹුදරුවන් ආරක්ෂා කරණු පිණිස වැඩි යමක් ඉතුරු වූයේ නම් ඔහුට මෙබඳු අදහසක් ඇති වේ. **"මම පළමුවෙන් ණය ගෙණ කර්මාන්තයන් හි යෙදුවෙමි. ඒ මාගේ කර්මාන්තයෝ දියුණු වූහ. ඒ මම පැරණි ණය ගෙවූවෙමි. අඹුදරුවන් පෝෂණය කිරීම පිණිස අතිරේක මුදලක් ද මට ඇත්තේය"** කියායි. හෙතෙම ඒ ණය නැති බව මුල්කොට ගෙණ බලවත් සතුටට පැමිණෙන්නේ ය.

මහරජ මේ ශාසනයෙහි භික්ෂුව කාමච්ඡන්ද නීවරණය ණයක් මෙන් දකියි, කෙසේ ද යත්? යමෙකු ණය ගෙන කර්මාන්ත කරන්නේ

එයින් පිරිහී වැනසී යයි ද, ණය හිමියන් විසින් ණය ගෙවන ලෙස කියා චෝදනා කරයි ද, පරුෂ වචනයෙන් බැණවදී ද, තර්ජනය කරයි ද, මරණයට හෝ පමුණුවයි ද, ඊට එරෙහිව නැගී සිටිය නොහැකි වෙයි. ඒ සියල්ල ඉවසයි. එයට හේතුව නම්, ණය ගෙන නො ගෙවීමේ වරදයි.

එසේම යම් කෙනෙක් සවිඤ්ඤාණක හෝ අවිඤ්ඤාණක වස්තූන් කෙරෙහි කාමච්ඡන්දයෙන් ඇලෙයි ද, මම මගේ කියා තෘෂ්ණාවෙන් දැඩිව අල්ලා ගනී ද, ඒ හේතුවෙන් අනුන් විසින් කරනු ලබන චෝදනා, පරුෂ වචන, තර්ජන, මරණයට පැමිණ වීම් ආදියට විරුද්ධ නොවී ඉවසිය යුතු වෙයි. එබඳු වරද හේතුවෙන් ගෙහිමියන් විසින් මරනු ලබන ස්ත්‍රියක් මෙන් වේ.

එබැවින් කාමච්ඡන්දයෙන් නිදහස්වීම ණයෙන් නිදහස්වීම හා සමාන වේ. ණය ගත් පුරුෂයා මෙම ණය නම් බොහෝ කරදරයන්ට මුලක් යැයි එහි ආදීනව සලකා පොලියත් සමග ණය ගෙවා එම ලියුම ද ඉරා ඉවත දමන්නෙය. ඉන් පසු ණය හිමියන් විසින් ඔහුට එම ණය හේතුවෙන් ලිපි හෝ දූතයෙකු හෝ නො එවන්නේ ය. පසුව ණය හිමියා දැක කැමති නම් අසුනෙන් නැගිටියි. අකැමැති නම් නො නැගිටියි. කුමක් හෙයින් ද යත්? ඔහු කෙරෙහි පැහැදීමක් හෝ බැඳීමක් නැති බැවිනි.

එසේම මේ සසුනෙහි භික්ෂුව ද මේ කාමච්ඡන්දය නම් බොහෝ කරදරයන්ට මුලකි යැයි, ධර්ම සයක් වඩා කාමච්ඡන්ද නීවරණය දුරු කරයි. එනම් :-

1. අසුභ භාවනාව ඉගෙනීම.
2. අසුභ භාවනාව වැඩීම.
3. ඇස කන ආදී ඉන්ද්‍රියයන් සංවර කර ගැනීම.
4. පමණ දැන ආහාර ගැනීම.
5. කල්‍යාණ මිත්‍රයන් ඇසුරු කිරීම.
6. කාමච්ඡන්දය හි ආදීනව හා නෙක්ඛම්මයෙහි ආනිශංස ද, අල්පේච්ඡ කථා ආදී නිවන් මඟට උපකාර වන දස කථාවන්හි ද යෙදීම.

තව ද භික්ෂුව ඇස, කන, නාසය, දිව, කය යන පඤ්ච ඉන්ද්‍රියයන්ට ගෝචර වන රූප, ශබ්ද, ගන්ධ, රස, ස්පර්ශ යන පඤ්ච කාමයන් කෙරෙහි කැමති වීමක්, සතුටු වීමක්, ආශාවක්, ස්නේහයක්, පරිළාහයක් හෙවත් දැවිල්ලක්, මුලා වීමක්, මම මගේ කියා දැඩිව ගැනීමක් වේ ද, නිත්‍ය - සුඛ - ආත්ම - සුභ වශයෙන් වරදවා ගැනීමක් වේ ද, ඒ සියල්ල කෙරෙහි මනා සිහිය නුවණ ඇතිව ඒ සියල්ල අනිත්‍ය - දුක්ඛ - අනාත්ම - අසුභ - අසාර - නිස්සාර වශයෙන් ද, ඒ කාම වස්තූන් කෙරෙහි ආස්වාදය - ආදීනවය - නිස්සරණය වශයෙන් සලකා බැලීමෙන් ද, නාම රූප - ස්කන්ධ - ධාතු - ආයතන - පටිච්ච සමුප්පාද ආදී වශයෙන් බෙද වෙන් කොට බලමින් ද කාමච්ඡන්දය දුරු කොට වෙසෙයි.

මෙලෙස එම භික්ෂුව කැඩී බිඳී යන ස්වභාවයෙන් යුත් ක්ෂණයක් පාසා වෙනස් වන ස්වභාවයෙන් යුත් පඤ්ච උපාදනස්කන්ධ ලොකයෙහි මම ය, මගේ ය යැයි නොගෙන එහි දැඩි ලෝභය දුරු කිරීමෙහි යෙදී වෙසෙයි.

මෙසේ මනා පිළිවෙතෙහි යෙදීමෙන් කාමච්ඡන්දය ප්‍රහීණ කළ භික්ෂුවට ණයෙන් මිදුණු තැනැත්තාට ණය හිමියන් දැක බියක් තැති ගැනීමක් නොවන්නා සේ පර පුද්ගලයන් කෙරෙහි සම්පත් කෙරෙහි ඇලීමක් බැඳීමක් ඇති නොවේ. දිව්‍යමය රූප දකින්නේ නමුත් කෙලෙස් සිතක් ඇති නොවේ. එබැවින් භාග්‍යවතුන් වහන්සේ කාමච්ඡන්දය ප්‍රහාණය කිරීම ණය නැති බවක් හා සමානය යැයි වදාළ සේක.

## ☸ ව්‍යාපාද නීවරණය ප්‍රහාණය කිරීම

අසවලා මට අනර්ථයක් කළේ ය යනාදී වූ නව ආඝාත වස්තු අරමුණු කොට යම් වෛරයක්, අස්ථාන කෝපයක්, අරමුණු වශයෙන් ගැටෙන බවක්, විරුද්ධ බවක්, සිත දූෂ්‍ය කරන බවක් වේ ද, එසේ වූ ව්‍යාපාදයෙහි ආදීනව හා එයින් නිදහස් වීමෙහි ආනිශංස සලකා කිසි තැනක අරමුණු වශයෙන් නො ගැටී ව්‍යාපාදය දුරු කොට වෙසෙයි.

මහරජ, යම් පුරුෂයෙක් පිත් රෝගයකින් පෙලෙන බැවින් බලවත් දුකට පැමිණ ආහාර රුචිය ද, නැතිව ගොස් ශරීර ශක්තිය ද නැතිව ගියේ වේ ද, ඒ පුරුෂයා පසු කලෙක එම රෝගය සුව වී නිරෝගී බව ලබා ආහාර රුචිය ඇතිව ශරීර බලය ලබන්නේ වේ ද, පසුව ඔහුට මෙබඳු අදහසක් වන්නේය. **"මම පෙර රෝගාතුර ව දැඩි ලෙස ගිලන් වීමි. මට ආහාර රුචිය ද නොවීය, ශරීර බලය ද නැතිවිය, ඒ මම පළමු තිබූ ආබාධයෙන් මිදුණෙමි. මට ආහාර රුචිය ද ඇත්තේය. දැන් මට කාය බලය ද ඇත්තේය"** කියායි. ඔහු රෝගය සුව වීම මුල්කොට බලවත් සතුටක් ලබන්නේ ය, සොම්නසට ද පැමිණෙන්නේ ය.

මහරජ මේ ශාසනයෙහි භික්ෂුව ව්‍යාපාද නීවරණය රෝගයක් මෙන් දකී. කෙසේ ද යත්?

පිත් රෝගයකින් ආතුර වූවෙකුට මී පැණි, හකුරු ආදිය දුන් කල්හි එහි රසය නොදැනගනී. තිත්ත යැයි කියා වමනය කරයි. එසේම ව්‍යාපාදයෙන් දූෂිත වූ සිත් ඇති තැනැත්තා ද, හිත කැමති ව ආචාර්‍ය්‍ය උපාධ්‍යයන් වහන්සේලා විසින් කරනු ලබන අවවාද අනුශාසනා පිළිනොගනී. **ආචාර්‍ය්‍ය උපාධ්‍යයන් වහන්සේලා මට අතිශයින් පීඩා කරන්නාහුය** යනාදිය කියා සිවුරු හැර යයි. මෙය වනාහී පිත් රෝගයෙන් පෙලෙන තැනැත්තාට පැණි හකුරු ආදිය තිත්ත රස වන්නාක් මෙන් ක්‍රෝධයෙන් පෙලෙන තැනැත්තාට ධ්‍යාන සුවය ආදී වූ ශාසන රසය අමිහිරි වේ. මෙලෙස ව්‍යාපාදය රෝගයක් වැනිය.

පිත් රෝගයෙන් පෙලෙන තැනැත්තා එයට නිසි බෙහෙත් කිරීමෙන් ඒ රෝගය සන්සිඳවාගෙන සුවය ලැබීමෙන් පසු මී පැණි හකුරු ආදියෙහි නියම රසය විඳ ගනී ද, එලෙස ම භික්ෂුව මේ ව්‍යාපාදය බොහෝ අනර්ථ ඇති කරන්නක් යැයි සලකා ධර්ම සයක් වඩා ව්‍යාපාද නීවරණය අත්හැර දමයි. එනම් :-

1. මෛත්‍රී භාවනාව ඉගෙන ගනී.
2. මෛත්‍රී භාවනාව වඩයි.
3. තමන්ට ද අන්‍යයන්ට ද කළ කර්මය අනුව විපාක විඳීමට සිදුවනබව සිහි කිරීම.

4. තමනුත් අන්‍යයනුත් සත්ව පුද්ගල ආත්ම නොවූ, නාම රූප ස්කන්ධ ධාතු ආයතන පටිච්ච සමුප්පාද ආදී ධර්ම සමූහයක ක්‍රියාකාරිත්වයක් බව නුවණින් සිහි කිරීම.
5. කල්‍යාණ මිත්‍රයන් ඇසුරු කිරීම.
6. ව්‍යාපාදයෙහි ආදීනව හා මෛත්‍රියෙහි ආනිශංස කථා ද, අල්පේච්ඡ කථා ආදී නිවන් මඟට උපකාර වන දස කථාවන්හි ද යෙදීම.

මෙසේ මනා පිළිවෙතෙහි යෙදීමෙන් ව්‍යාපාදය ප්‍රහීණ කළ භික්ෂුව පිත් රෝගයෙන් සුවය ලැබූ තැනැත්තා මී පැණි හකුරු ආදිය ඉතා කැමැත්තෙන් අනුභව කොට රස විඳගන්නාක් මෙන්, බුදුරජාණන් වහන්සේ විසින් පනවා වදාළ ආචාර ශික්ෂා පද මුදුනින් පිළිගෙන බලවත් කුසලච්ඡන්දය ඇතිව මෛත්‍රී සිත පුරුදු කරමින් සීල සංවරයෙහි පිහිටා ගනී. ඉන් පසු කිසි අරමුණක නො ගැටී ව්‍යාපාද නැත්තෙකු ව පරම මෛත්‍රී සිත් ඇත්තෙකු වේ. එබැවින් භාග්‍යවතුන් වහන්සේ ව්‍යාපාදය ප්‍රහාණය කිරීම රෝග සුව වීම හා සමානය යැයි වදාළ සේක.

## ☸ ථීනමිද්ධය නීවරණය ප්‍රහාණය කිරීම

සිතෙහි හා චෛතසික ධර්මයන්හි අයෝග්‍ය බවක් හෙවත් ගිලන් බවක්, **අරති** යැයි කියන ලද අලස බවක්, විවේක සෙනසුන්හි නො ඇලීමක් - අධි කුසල ධර්මයන්හි නො ඇලීමක් - කලකිරීමක් - නොකැමැත්තක් වේ ද, **තන්දි** යැයි කියන ලද ප්‍රමාද වන බවක් - උදාසීන බවක් වේ ද, විජම්භිකා යැයි කියනු ලබන ශරීරයෙහි කිලි පෙලීමක් - මැලි කැඩීමක් - දිග හැරීමක් - ඉදිරියට නැමීමක් වේ ද, **බත්තසම්මදය** යැයි කියන ලද ආහාර ගැනීමෙන් පසු යම් බත් මතයක් - ක්ලාන්ත බවක් - දහයක් - දුෂ්කර බවක් - බර බවක් වේ ද, **චෙතසො ලීනත්ත** යැයි කියන ලද සිතෙහි රෝගී බවක් - අකර්මණ්‍ය බවක් - පසුබට වීමක් - සැඟවුණු බවක් - හැකිළුණු බවක් - අප්‍රකට බවක් - දුබල බවක් වේ ද, මෙසේ වූ ථීනමිද්ධයෙහි ආදීනව සලකා එය දුරු කොට දිවා රෑ දෙකෙහි ආලෝක සඤ්ඤාව ඇති, එළිමහනෙහි මනාව වාතාශ්‍රය ඇති තැනක වෙසෙමින් ථීනමිද්ධය නීවරණය දුරු කොට සිහි නුවණින් යෙදී වෙසෙයි.

මහරජ, යම් පුරුෂයෙක් කරන ලද අපරාධ කර්‍මයකට වරදකරු වී සිරගෙයි බැඳුණේ වේ ද, ඔහු පසු කලක ධනය වියදම් නොකොටම පහසුවෙන් සිරගෙයින් නිදහස් වන්නේ ද, සිරගත වීම හේතුවෙන් ඔහුගේ කිසි භෝග විනාශයක් නොවන්නේ ද, ඔහුට මෙබඳු අදහසක් වන්නේය. **මම පෙර සිරගත වූයෙමි. ඒ මම දැන් පීඩා රහිතව සැපසේ ඒ සිරගෙයින් මිදුණෙමි. මගේ වස්තු දේපළවලට ද කිසි හානියක් නොවූයේ ය** කියායි. ඔහු සිරගෙයින් මිදීම නිමිති කොට බලවත් සතුටට පැමිණෙන්නේ ය.

මහරජ මේ ශාසනයෙහි භික්ෂුව ථීනමිද්ධය නීවරණය සිර බන්ධනයක් මෙන් දකී. කෙසේ ද යත්?

නැකත් සැණකෙළියක් ඇති දිනක යම් අපරාධ කර්‍මයක් හේතුවෙන් බන්ධනාගාර ගත වූ තැනැත්තා ඒ නැකත් සැණකෙළිය පිළිබඳව මුල, මැද, අග යන කිසි තැනකින් කිසිවක් නොදනී. ඔහු දෙවැනි දවසෙහි සිර බන්ධනයෙන් නිදහස ලබා පැමිණි විට එම නැකත් සැණකෙළිය පිළිබඳව අන්‍යයන් කියනු ලබන ගුණ වර්‍ණනාව අසන්නට ලැබුණේ නමුත් ඔහු ඒ පිළිබඳව නොදන්නා බැවින් කිසිවක් නොකියයි. එලෙස ම ථීනමිද්ධයෙන් මැඩුණු භික්ෂුව විසිතුරු ධර්‍ම දේශනාවක් පවතින කල්හි නිදි බරව සිටින බැවින් එහි මුල මැද අග කිසිවක් නොදනී. එම ධර්‍ම දේශනාව අසා අන්‍යයන් එහි ගුණ කියන කල්හි ඒ භික්ෂුව නිදි බරව සිට කිසිවක් නො ඇසූ බැවින් එයට කිසිවක් නොකියයි. මෙලෙස ථීනමිද්ධය බන්ධනාගාරයක් වැනි යැයි වදාළ සේක.

මෙසේ නැකත් සැණකෙළියක් දවසක බන්ධන ගත වූ එම පුරුෂයා එයින් නිදහස ලබා ඇවිත් වෙනත් නැකත් සැණකෙළි දවසක මෙසේ සිතයි. **පෙර මම ප්‍රමාදය හේතුවෙන් සිරගත වූ බැවින් නැකත් සැණකෙළි රස නොවින්දෙමි. එබැවින් දැන් අප්‍රමාදී** වන්නෙමි යැයි සිතා නැකත් සැණකෙළි බලමින් ගීතිකා අසමින් රස වින්දනය කොට එහි රස මුසු තැන් කියා උදන් අනයි. එලෙස ම භික්ෂුව මේ ථීනමිද්ධය නම් මහත් අනර්‍ථ කරන්නක් යැයි සිහි කොට ධර්‍ම සයක් වඩා ථීනමිද්ධය නීවරණය අත්හැර දමයි. එනම් :-

1. වැඩිපුර ආහාර නො ගැනීම හෙවත් පමණ දැන ආහාර ගැනීම.
2. යම් ඉරියව්වකින් සිටින විට ථීනමිද්ධය පැමිණුනේ නම් අන් ඉරියව්වකට මාරු වීම.
3. සූර්‍ය්‍යාලෝකය, චන්ද්‍රාලෝකය, ප්‍රදීපාලෝක යනාදී ආලෝක සඤ්ඤාවක් සිහි කිරීම.
4. ථීනමිද්ධය පැමිණි විට, හොඳින් වාතාශ්‍රය ලැබෙන එළිමහන් තැනකට යාම.
5. කල්‍යාණ මිත්‍රයන් ඇසුරු කිරීම.
6. ථීනමිද්ධය හි ආදීනව හා ධම්මවිචය විරිය ප්‍රීති යන බොජ්ඣංග ධර්‍ම වැඩීමෙහි ආනිශංසය කථා ද, අල්පේච්ඡ කථා ආදී නිවන් මඟට උපකාර වන දස කථාවන්හි ද යෙදීම.

මෙහි සිතෙහි හා චෛතසික ධර්‍මයන්හි අයෝග්‍ය බවක් හෙවත් ගිලන් බවක්, **අරති** යැයි කියන ලද අලස බවක් විවේක සෙනසුන්හි නො ඇලීමක් - අධි කුසල ධර්‍මයන්හි නො ඇලීමක් - කලකිරීමක් - නොකැමැත්තක් වේ ද, **තන්දි** යැයි කියන ලද ප්‍රමාද වන බවක් - උදාසීන බවක් වේ ද, **විජම්භිකා** යැයි කියනු ලබන ශරීරයෙහි කිලි පෙලීමක් - මැලි කැඩීමක් - දිග හැරීමක් - ඉදිරියට නැමීමක් වේ ද, **බත්තසම්මදය** යැයි කියන ලද ආහාර ගැනීමෙන් පසු යම් බත් මතයක් - ක්ලාන්ත බවක් - දහයක් - දුෂ්කර බවක් - බර බවක් වේ ද, **චෙතසො ලීනත්ත** යැයි කියන ලද සිතෙහි රෝගී බවක් - අකර්‍මණ්‍ය බවක් - පසුබට වීමක් - සැඟවුණු බවක් - හැකිළුණු බවක් - අප්‍රකට බවක් - දුබල බවක් වේ ද, මෙසේ වූ ථීනමිද්ධයෙහි ආදීනව සලකා එය දුරු කොට දිවා රෑ දෙකෙහි ආලෝක සඤ්ඤාව ඇතිව එළිමහනෙහි මනාව වාතාශ්‍රය ඇති තැනක වෙසෙමින් ථීනමිද්ධ නීවරණය දුරු කොට සිහි නුවණින් යෙදී වෙසෙයි.

මෙසේ භික්ෂුව ථීනමිද්ධ නීවරණය ප්‍රහීණ කර බන්ධනාගාර ගත පුරුෂයා එයින් නිදහස ලබා ඇවිත් සත් දිනක් පුරාවට නැකත් සැණකෙළියෙන් සතුටු වී එහි රසය විඳගන්නාක් මෙන්, මනාකොට ධ්‍යාන විපස්සනා ධර්‍ම ක්‍රීඩාවෙහි යෙදී එහි සුවය විඳගෙන පිළිවෙත් සපුරා ප්‍රතිසම්භිධා සහිතව අර්හත්වයට පැමිණෙන්නේ ය. එබැවින් භාග්‍යවතුන් වහන්සේ ථීනමිද්ධය ජය ගැනීම බන්ධනාගාරයෙන් නිදහස ලැබීමක් මෙන් යැයි වදාළ සේක.

## ☸ උද්දච්ච කුක්කුච්ච නීවරණය ප්‍රහාණය කිරීම

**උද්දච්ච** යැයි කියනු ලබන සිතෙහි යම් නොසන්සුන් බවක් - විසිරයාමක් - නොසන්සිඳීමක් - සෙලවෙන බවක් වේ ද, **කුක්කුච්චය** යැයි කියනු ලබන අකැප දෙය කැප වශයෙන් ද - කැප දෙය අකැප වශයෙන් ද - වැරදි දෙය නිවැරදි වශයෙන් ද - නිවැරදි දෙය වැරදි වශයෙන් ද ගෙන කළ අකුසල් සහ නොකළ කුසල් පිළිබඳව නුනුවණින් මෙනෙහි කිරීම හේතුවෙන් වන්නා වූ යම් පසුතැවීමක් වේ ද, මෙහි ආදීනව සලකා එය දුරු කරනු පිණිස බහුශ්‍රැත භාවය, කැප, අකැප විචාරීමාදී තිසි පිළිවෙතෙහි යෙදී උද්ධච්චකුක්කුච්ච නීවරණය දුරු කොට සිහි නුවණින් යෙදී වෙසෙයි.

මහරජ, තමාට කැමති ලෙස කිසිවක් කළ නොහැකි අනුන්ගේ අදහස් ඉටු කරමින් කටයුතු කරන දසයෙක් වන්නේ ද, ඔහු පසු කලක ඒ දස භාවයෙන් මිදෙන්නේ ද, තමා ම අධිපති කොට ඇතිව අනුන්ට යටත් නොවී පහසුවෙන් ජීවත් වන්නේ ද, සිය අදහස් පරිදි ඒ ඒ තැන යා හැකි වන්නේ ද වෙයි. ඔහුට මෙබඳු අදහසක් වන්නේය. **"මම පෙර අනුන්ට යටත් ව අනුන්ගේ අදහස් පරිදි කටයුතු කරන කිසි තැනක මගේ කැමැත්තෙන් යා නොහැකි දසයෙක් වීමි. ඒ මම දැන් ඒ දස භාවයෙන් මිදුනෙක්මි. තමා අධිපති කොට ඇත්තෙක් වීමි. අනුන්ට යටත් නොවූ කෙනෙක් වීමි. මගේ කැමැත්තට අනුව ජීවත් වෙමි. කැමති තැනක යා හැක්කේ ද වෙමි"** කියායි. ඔහු ඒ දස භාවයෙන් මිදීම හේතු කොට බලවත් සතුටට පැමිණෙන්නේ ය.

මහරජ, මේ ශාසනයෙහි භික්ෂුව ද උද්දච්ච කුක්කුච්ච නීවරණය අනුන්ගේ බැල මෙහෙවර කරන දසත්වයක් මෙන් දකී. කෙසේ ද යත්?

නැකත් සැණකෙළියක විනෝද වන දසයෙකුට ඒ ගෙයි ස්වාමියා විසින් මෙනම් කටයුත්තක් ඇත වහා එහි යව, නොයන්නෙහි නම් අත් පා හෝ කන් නාසා හෝ කපන්නේහිය යැයි අණ කළ කල්හි වහාම ඒ කාර්‍ය්‍යය පිණිස යන්නේම ය. නැකත් සැණකෙළියෙහි මුල මැද අග සම්පූර්ණ වශයෙන් සතුටු වන්නට නොලැබෙන්නේ ය. කුමක් හෙයින් ද යත්? පරාධීන (අනුන් අයත් පැවතුම් ඇති) බැවිනි.

එසේම විනයෙහි අකෘතඥ[1] භික්ෂුව භාවනා යෝගය පිණිස ආරණ්‍ය ගත වූ විට, කිසියම් කැප මාංශයක් ලැබ වළඳ පසුව ඒ කැප මාංශයෙහි ද අකැප සඤ්ඤව ඇතිව එහි විමති ඇතිව විනිශ්චයක් නොලබා විපිළිසර බවට පැමිණ පටන් ගත් භාවනායෝගය ද අත්හැර සිල් පිරිසිදුකර ගැනීම පිණිස විනයධරයෙකු සොයා යා යුතුය. විවේක සුවය විඳ ගැනීම නොලබයි. කුමක් හෙයින් ද යත්? උද්දච්ච කුක්කුච්චයෙන් මැඩුණු බැවිනි. මෙලෙස උද්දච්ච කුක්කුච්ච නීවරණය දස බවක් මෙන් වේ.

දසයා කිසියම් මිතුරෙකුට ධනය දී එම කටයුත්තෙහි යොදවා එයින් නිදහස් ව තමන් කැමති ලෙස නැකත් සැණකෙළි ආදියෙහි යෙදීම කරන්නේ ද, එසේම භික්ෂුව මේ උද්දච්ච කුක්කුච්චය නම් මහා අනර්ථකර ධර්මයක් යැයි සිහි කොට ධර්ම සයක් වඩා උද්දච්ච කුක්කුච්චය නීවරණය අත්හැර දමයි. එනම් :-

1. බහුශ්‍රැත භාවය ( ධර්ම - විනය ඥනයෙහි පරිපූර්ණ දැනීම).
2. සැක සහිත තැන් ප්‍රශ්න කොට විසඳ ගැනීම.
3. තමා විසින් මනාකොට විනය සිකපදයන්හි හික්මෙන ලද්දේය යැයි දන්නා බව.
4. ධර්ම - විනය ඥනයෙන් ප්‍රතිපත්තියෙන් සම්පූර්ණ වැඩිහිටියන් ඇසුරු කරන බව.
5. කල්‍යාන මිතුරන් ඇසුරු කරන බව.
6. උද්දච්ච කුක්කුච්චයෙහි ආදීනව හා බහුශ්‍රැත භාවය ආදී උපකාරක ධර්මයන් පිළිබඳ කථාවන්හි ද, අල්පේච්ඡ කථා ආදී නිවන් මඟට උපකාර වන දස කථාවන්හි ද යෙදීම.

භික්ෂුව මෙලෙස මනා පිළිවෙතෙහි යෙදී උද්දච්ච කුක්කුච්ච නීවරණය ප්‍රහීණ කොට දස බැවින් නිදහස ලැබූ පුරුෂයා තමන් අයත් පැවතුම් ඇතිව යමක් කැමති වේ ද එලෙස කරන්නාක් මෙන්, උද්දච්ච කුක්කුච්චයෙන් බාධාවකට නොපැමිණ නෛෂ්ක්‍රම්‍ය ප්‍රතිපදාවෙහි යෙදී

[1] සැක සිඳ ඉගෙනීමක් නැති

වෙසෙයි. එබැවින් භාග්‍යවතුන් වහන්සේ උද්දච්ච කුක්කුච්චයෙන් නිදහස් වීම දසත්වයෙන් නිදහස ලැබූ පුරුෂයා මෙන් යැයි වදාළ සේක.

## ☸ විචිකිච්ඡා නීවරණය ප්‍රහාණය කිරීම

ශාස්තෘන් වහන්සේ පිළිබඳව ද, නව ලොව්තුරා ධර්මය පිළිබඳව ද, අෂ්ටාර්‍යය පුද්ගල සංඝරත්නය පිළිබඳව ද, ප්‍රතිපත්තිමය වූ සීලය පිළිබඳව ද, පෙර විසූ භවයන් පිළිබඳව ද, මතු උපදින භවයන් පිළිබඳව ද, අතීතානාගත සියලු භවයන් පිළිබඳව ද, හේතු - ඵල පටිච්ච සමුප්පාද ධර්මය පිළිබඳව ද යම් බඳු වූ සැකයක් - විමතියක් - විවිධ අදහස් ඇති බවක් - දෙමගක් - ගැටීමක් - සිතෙහි නො බැස ගැනීමක් - නොපිහිටීමක් - ඉරි තැලීමක් වේ ද, මෙසේ වූ විචිකිච්ඡා නීවරණයෙහි ආදීනව සලකා උපාය මනසිකාරය හෙවත් ධර්ම - විනය මනාව ප්‍රගුණ කොට සැක දුරු කොට පහ කළ විචිකිච්ඡා නීවරණය ඇතිව වෙසෙයි.

මහරජ, ධනවත් වූ භෝග සම්පත් ඇති පුරුෂයෙක් ආහාර දුර්ලභ වූ භය සහිත වූ නිරුදක වූ දීර්ඝ වූ කාන්තාර මාර්ගයකට පැමිණෙන්නේ ද, ඔහු මද කලකින් ඒ කාන්තාර මාර්ගය ඉක්මවා යන්නේ සොර සතුරන්ගෙන් පීඩා නැති ගම්මානයකට සැපසේ ක්‍රමයෙන් පැමිණෙන්නේ ද, ඔහුට මෙබඳු අදහසක් ඇති වේ. "**මම පෙර ධනවත් වූයෙමි, භෝග සම්පත් සහිත වූයෙමි, දුර්ලභ භික්ෂා ඇති භය සහිත වූ, නිරුදක වූ දීර්ඝ වූ කාන්තාර මාර්ගයකට පැමිණියෙමි. මම දැන් එම කාන්තාර මාර්ගය පසු කෙළෙමි. සැපවත් වූ භය රහිත වූ, ගමකට සැපසේ ක්‍රමයෙන් පැමිණියෙමි**" කියායි. ඒ පුරුෂයා ඒ කාන්තාර මාර්ගයෙන් එතර වීම නිමිති කොට බලවත් සතුටට පැමිණෙන්නේ ය.

මහරජ සසර දුකින් අත මිදීම පිණිස මේ ශාසනයෙහි පැවිදි වූ භික්ෂුව ද, විචිකිච්ඡා නීවරණය නිරුදක භය සහිත කාන්තාර මාර්ගයක් මෙන් දකී. කෙසේ ද යත්?

කාන්තාරයෙහි දිගු මගට පිළිපන් තැනැත්තා සොරුන් විසින් මිනිසුන් පහරන ලද තැන් ද, ගිය තැන් ද දැක, දඬු කැබැල්ලක ශබ්දයෙන් ද, පක්ෂි ආදීන්ගේ ශබ්දයෙන් ද, සොරු පැමිණියේ වනැයි

බියට හා සැකයට පැමිණෙයි. යම් තැනක ගියේ ද යම් තැනක සිටියේ ද යම් තැනක නැවතුණේ ද, ඒ ගිය තැන්වලට වඩා නොගිය තැන්ම බොහෝ වේ. මෙතෙමේ බොහෝ දුක් පීඩා සහිතව අසීරුවෙන් ක්ෂේම භූමියකට පැමිණෙන්නේ හෝ නොපැමිණෙන්නේ වෙයි.

එසේම යම් භික්ෂුවකට බුද්ධාදී අට තැන් පිළිබඳව විචිකිච්ඡාව ඇතිව භාග්‍යවතුන් වහන්සේ බුද්ධත්වය ලැබුවේ ද, නොලැබුවේ ද ආදී ලෙස සැක උපදවා මුලාවට පත්ව ශ්‍රද්ධාවෙන් පිළිගැනීමට කමටහන් වශයෙන් වැඩීමට නොහැකිව ධ්‍යානයකට, විදර්ශනා ඥාණයකට, මාර්ගයකට, ඵලයකට නොපැමිණෙයි.

කාන්තාර මාර්ගයෙහි යන පුරුෂයාට එහි සොරු ඇත්තේ ද, නැත්තේ ද යැයි සැක ඉපදීම හේතුවෙන් තැතිගැන්ම එම මාර්ගයෙහි ගමන් කිරීමට බාධාවක් කරගනී. එසේම භික්ෂුවට බුදුරජාණන් වහන්සේ ගේ බුද්ධත්වය ආදියෙහි සැක ඉපදීම නිවන් මගට බැස ගැනීමට බාධාවක් වන බැවින් එය ආර්‍ය භූමියට පැමිණීමට අන්තරායක් වෙයි. මෙලෙස විචිකිච්ඡාව බිය සැක සහිත කාන්තාර මාර්ගයක් මෙන් වේ.

බලවත් පුරුෂයෙක් හස්තසාර වස්තුව රැගෙන ආයුධ සන්නද්ධව සපිරිවරින් කාන්තාර මාර්ගයෙහි යනු දැක සොරු දුරින් ම පලා යති. ඒම පුරුෂයා කිසි උපද්‍රවයක් නැතිව සපිරිවරින් ඒ කාන්තාර මාර්ගය තරණය කොට ක්ෂේම භූමියකට පැමිණ සතුටු වේ ද, එසේම මේ ශාසනයෙහි භික්ෂුව විචිකිච්ඡාව බොහෝ අනර්ථකර ධර්මයක් යැයි සිහි කොට ධර්ම සයක් වඩා එය දුරු කරයි. එනම් :-

1. බහුශ්‍රැත භාවය ( ධර්ම විනය ඥානයෙහි පරිපූර්ණ දැනීම).
2. සැක සහිත තැන් ප්‍රශ්න කොට විසඳ ගැනීම.
3. තමා විසින් මනාකොට විනය සිකපදයන්හි හික්මෙන ලද්දේය යැයි දන්නා බව.
4. රත්නත්‍රය විෂයයෙහි සිතෙහි ස්ථිර ශ්‍රද්ධාව ඇති බව.
5. කල්‍යාන මිතුරන් ඇසුරු කරන බව.
6. විචිකිච්ඡාවෙහි ආදීනව හා බහුශ්‍රැත භාවය ආදී උපකාරක ධර්මයන් පිළිබඳ කථාවන්හි ද, අල්පේච්ඡ කථා ආදී නිවන් මඟට උපකාර වන දස කථාවන්හි ද යෙදීම.

බලවත් පුරුෂයෙකු ආයුධ සන්නද්ධව සපිරිවරින් නිභීයව සොරුන් තණ සුලකටවත් ගණන් නොගෙන යහතින් කාන්තාර මාර්ගය තරණය කොට ක්ෂේම භූමියකට පැමිණේ ද, එසේම භික්ෂුව විචිකිච්ඡාව ප්‍රහීණ කොට නිසි ප්‍රතිපදාවෙහි යෙදී දුෂ්චරිත නමැති කාන්තාරයෙන් එතරව උත්තරීතර ක්ෂේම භූමිය වන අමෘත මහා නිර්වාණයට සුව සේ පැමිණේ. එබැවින් භාග්‍යවතුන් වහන්සේ විචිකිච්ඡාව ප්‍රහාණය කිරීම ක්ෂේම භූමියකට පැමිණීමක් වැනිය යැයි වදාළ සේක.

මහරජ, භික්ෂුව මෙලෙස ණයක් මෙන් ද, රෝගයක් මෙන් ද, හිර ගෙයක් මෙන් ද, දාසත්වයක් මෙන් ද, නිරුදක වූ දීර්ඝ කාන්තාර මාර්ගයක් මෙන් ද, පහ නොකළ තමාගේ සිත තුළ ක්‍රියාත්මක වන නිවන් මග සුගති මග වළක්වන පඤ්ච නීවරණයන්හි ආදීනව දක්නේ ය.

මහරජ, එම භික්ෂුව ණයෙන් නිදහස් වීම මෙන් ද, රෝගයෙන් සුවය ලැබීමක් මෙන් ද, සිරගෙයින් නිදහස් වීමක් මෙන් ද, දාස බවෙන් නිදහස් වීමක් මෙන් ද, උවදුරු ඇති නිරුදක කාන්තාර මාර්ගයෙන් එතරව ආරක්ෂිත ස්ථානයකට පැමිණීමක් මෙන් ද නීවරණයන්ගෙන් නිදහස් වීම දක්නේය.

තමා කෙරෙන් නීවරණ පහ වීම දකින එම භික්ෂුව හට සතුට උපදී. සතුට නිසා (තරුණ) ප්‍රීතිය උපදී. ප්‍රීතිය ඇති බැවින් චිත්ත චෛතසික ධර්මයන්ගේ සංසිඳීම ඇතිවෙයි. සංසිඳුණු චිත්ත චෛතසික ධර්මයන් ඇති බැවින් චිත්ත චෛතසික ධර්මයන්ගේ සැපය ඇති වෙයි. චිත්ත චෛතසික ධර්මයන්ගේ සැපය ඇති එම භික්ෂුවගේ සිත සමාධි ගත වීම වෙයි

## ❄ ප්‍රථම ධ්‍යාන ලාභය

භික්ෂුව මෙලෙස නීවරණ ජය ගෙන පඨවි කසිණය අරමුණු කොට වඩන භාවනාව **"පරිකර්ම භාවනාව"** නම් වේ. ඒ තුළ ඇතිවෙන සිතෙහි එකඟ බව **"පරිකර්ම සමාධිය"** නම් වේ. මෙලෙස ඒ භාවනාරම්මණය පහසුවෙන් සිතට ගත හැකි වූ විට දෙනෙත්

පියාගෙන ඇසෙන් ගත් භාවනා අරමුණ මත සිත පිහිටුවාගෙන "**පඨවි, පඨවි**" යනුවෙන් වඩන විට ඇසෙන් ගත් කසිණාරම්මණය හා සමානව සිතට ඒ ආරම්මණය ප්‍රකට ව දර්‍ශනය වේ. මෙය "**උග්ගහ නිමිත්ත**" නම් වේ. ඒ නිමිත්ත අරමුණු කොට නාසිකා දෙරටුව ඉදිරියෙහි සිහිය පිහිටුවා ගෙන අඛණ්ඩව යෙදී වෙසෙයි. එලෙස කරන භාවනාව "**උපචාර භාවනාව**" නම් වේ. ඒ තුළින් මුලින් ඇති වූ උග්ගහ නිමිත්ත ස්ථිරව නොවෙනස්ව දර්‍ශනය වේ. එය "**පටිභාග නිමිත්ත**" නම් වේ. ඒ අවස්ථාවෙහි ඇතිවෙන බලවත් සමාධිය "**උපචාර සමාධිය**" නම් වේ. එකල්හි එම භික්‍ෂුව එම පටිභාග නිමිත්ත අධිෂ්ඨාන කොට අවට පතුරවමින් සක්වළ පුරාවට පතුරවා සම්පූර්ණ කරගනී. එලෙස එම කසිණාරම්මණය හි සම්පූර්ණත්වයට පත් වූ විට එම භික්‍ෂුව වස්තු කාම ක්ලේශ කාමයන්ගෙන් වෙන් ව, සෙසු අකුශල ධර්‍මයන්ගෙන් ද වෙන් ව, විතර්ක විචාර සහිතව, නීවරණයන් ගෙන් වෙන් වීම හේතුවෙන් ප්‍රීතියෙන් හා සුවයෙන් යුක්තව සිත එම කසිණ නිමිත්තට සමාධියට බැසගෙන එහි පිහිටීම වේ. මෙය "**ප්‍රථම ධ්‍යානය**" නම් වේ.

මෙලෙස භික්‍ෂුව ප්‍රථම ධ්‍යාන උපදවා එහි සිත පිහිටුවා ගෙන හෘදය මාංශය තුළ අඩ පතක් පමණ වූ ලේ ඇසුරුකරගත් සිත ප්‍රීතියෙන් සැපයෙන් පිරී යාමෙන් සකල ශරීරය පුරාවට ද ලේ ධාතුව හා චිත්ත කිරිය වායෝ ධාතුව ඔස්සේ පැතිරුණු ප්‍රීතිය හා සැපය ඇතිව ධ්‍යාන සුවයෙන් වාසය කරයි. එම ධ්‍යානය පඤ්ච වශීතාවෙන් වශී භාවයට පත් කර ගනී.

මහරජ, නහන සුනු සකසන්නට ද, යොදන්නට ද, දක්‍ෂ වූ කපුකම් කරන්නෙකු හෝ ඔහුගේ අතවැසියෙකු ස්නානයට ගන්නා වූ සුනු ලොහ තලියක බහා දිය ඉසිමින් අතින් අනමින් පිඩුකොට දියෙන් තෙත් කර නොවැගිරෙන ලෙස පිඩු කොට සාද ගන්නේ යම් සේ ද, මහරජ, එපරිද්දෙන් ඒ භික්‍ෂුව විවේකයෙන් හටගත් ප්‍රීති සැපයෙන් මේ ශරීරය තෙමයි, හාත්පසින් තෙමයි, සම්පූර්ණයෙන් පුරවයි, සැමතන්හි පතුරවයි. ඔහුගේ සියලු ශරීරයෙහි විවේකයෙන් හටගත් ප්‍රීති සැපයෙන් පැතිරෙයි.

මහරජ, මෙලෙස ප්‍රථම ධ්‍යානයට පැමිණ විසීම ද මේ ආත්මයෙහි දී දක්ක යුතු විපාක ඵලයකි. මෙය ඉහත කී මේ

ආත්මභාවයෙහි දැකිය යුතු විපාක ඵලයන්ට වඩා අතිශයින් මනොඥ ද, ශ්‍රේෂ්ඨ ද වෙයි.

## ❄ ද්‍රුතියධ්‍යාන ලාභය

මහරජ, එම භික්ෂුව ප්‍රථම ධ්‍යානය පඤ්ච වසිතාවෙන් පුරුදු කොට මේ ප්‍රථම ධ්‍යානයට ආසන්න වශයෙන් **නීවරණ** නම් සතුරා ඇති බව ද, එහි ඇති විතර්ක විචාරයන්ගේ ඕලාරික බව ද, එය ශබ්ද මාත්‍රයෙන් බිඳී යන ස්වභාවයෙන් යුක්ත බැවින් ද, එහි ඇති ආදීනව සලකා ද්‍රුතිය ධ්‍යානයෙහි විතර්ක විචාරයන් නැති බැවින් ද, ප්‍රීතිය සැපය බහුල බව ආදී එහි ආනිශංස සලකා ප්‍රථම ධ්‍යානයෙහි අපේක්‍ෂාව අත්හැර ද්‍රුතිය ධ්‍යානයෙහි සිත පිහිටුව යි.

ඉන් පසු එම භික්ෂුව විතර්ක විචාර සන් සිඳීමෙන් කැලඹිලි නැති සිතෙහි මනා ප්‍රසාදය ඇත්තා වූ නිශ්චල වූ බලවත් සමාධියෙන් යුත් ප්‍රීතිය, සැපය, ඒකාග්‍රතාව යන අංග තුනෙන් යුත් ද්‍රුතියධ්‍යානයට පැමිණ වෙසෙයි. එහිදී තම සිත ද, රූප කය ද බලවත් සමාධිය නිසා උපන් ප්‍රීතිය සැපය පැතිරීමෙන් නිරාමිස සුවයට පැමිණ වෙසෙයි.

මහරජ, ඇතුළතම උල්පතකින් ජලය උණන දිය විලක් වේද, එම විලට පිටතින් ජලය නොපැමිණේ ද, වැසි ජලය නොවැටේ ද, එසේ වූ ඒ විලෙහි සිහිල් දිය දහර පොළොව බිඳ නැගී ඒ මුලු විලම සිහිල් දියෙන් පැතිරෙයි. සම්පූර්ණයෙන් සිසිල් දියෙන් පිරී යයි. එම විලෙහි සීත ජලය නොපැතිර පවත්නා තැනක් නම් නැත්තේ ය.

මහරජ, එපරිද්දෙන් මේ සසුනෙහි භික්ෂුව තම ශරීරය සමාධියෙන් හටගත් ප්‍රීති සැපයෙන් සියලු තැන පතුරවන ලද්දක් කරයි. එම භික්ෂුවගේ සම්පූර්ණ ශරීරයෙහි දෙවෙනි ධ්‍යාන සමාධි සුවය පතුරවා වෙසෙයි.

මහරජ, මෙලෙස දෙවන ධ්‍යානයට පැමිණ විසීම ද, මේ ආත්මයෙහි දී දැක්ක යුතු විපාක ඵලයකි. මෙය ඉහත කී මේ

ආත්මභාවයෙහි දැකිය යුතු විපාක ඵලයන්ට වඩා අතිශයින් මනොඥ ද, ශ්‍රේෂ්ඨ ද වෙයි.

## ❄ තතියධ්‍යාන ලාභය

මහරජ, එම භික්‍ෂුව දුතියධ්‍යානය පඤ්ච විධ වසිතාවෙන් පුරුදු කොට ප්‍රගුණ වූ කල්හි එම ධ්‍යානයෙන් නැඟී සිට එම ධ්‍යාන සමාධිය විතර්ක විචාරයන්ට ආසන්න බැවින් ද, විතර්ක හේතුවෙන් බිඳී යන බැවින්, විතර්ක විචාර නමැති සතුරන් ඇති බව සලකා, ප්‍රීතිය සිත උල්පවන බැවින් ද, එය ඕලාරික බැවින් ද, දුතියධ්‍යානයෙහි දුර්වලභාවයද, දෙස් සහිත බව ද සලකා තතිය ධ්‍යානය වනාහී ප්‍රීතිය නැති බැවින් ද, සුඛයෙන් හා ඒකාග්‍රතාවෙන් පමණක් යුක්ත බැවින් එය ශාන්ත ද ප්‍රණීත ද වේ යැයි එහි ආනිශංස සලකා තතියධ්‍යානය ලබනු පිණිස සිත පිහිටුව යි.

මහරජ එම භික්‍ෂුව ප්‍රීතිය අත්හැර අග්‍ර වූ ධ්‍යාන සුවයෙහි ද පක්‍ෂපාත බවක් නූපදවන යම් මැදහත් බවක් වේ ද, ඒ ධ්‍යාන උපේක්‍ෂාවෙන් යුක්තව මනා සිහිය නුවණ ඇතිව කයින් ද ඉතා මියුරු සැපයට පැමිණ වෙසෙයි. බුදු පසේ බුදු මහරහත් ආදී ආර්‍ය්‍ය මහෝත්තමයන් වහන්සේලා යම් ධ්‍යාන සුවයක් ප්‍රීතිය නූපදනා බැවින් මනා සතියෙන් යුක්ත වේ යැයි ද, ඉතා මියුරු සැපයක් ගෙන දෙන නමුත් සැපයෙහි නො ඇලී උපේක්‍ෂාවෙන් යුක්ත වේ යැයි ද, ඒ හේතු කොට යම් ධ්‍යාන ලාභියෙකු කෙරෙහි උපේක්‍ෂාවත් සිහියත් සැප විහරණයත් ඇත්තේය යැයි පසසන ලද්දේ වේ ද, භික්‍ෂුව එසේ වූ තෙවැනි ධ්‍යාන කුසල චිත්තයට පැමිණ ප්‍රීතියෙන් තොර වූ සැපයෙන් තම සියලු ශරීරයම සම්පූර්ණයෙන් පුරවාලයි, පතුරවා වෙසෙයි.

මහරජ, මානෙල් විලක හෝ නෙළුම් විලක හෝ ඕ ලු විලක හෝ දියෙහි හටගත්, දියෙන් උඩට නොනැගුනු, දිය තුළ ම ගැලී වැඩෙන්නා වූ මානෙල් හෝ නෙළුම් හෝ ඕලු හෝ පොහොට්ටු - කොළ - දළු වෙත් ද, ඒ සියල්ල අග දක්වාත්, මුල දක්වාත්, සිහිල් ජලයෙන් තෙමී, හාත්පසින් සිසිල්ව පවතිත් ද, මහරජ, එපරිද්දෙන් ඒ

භික්ෂුව තම මුලු ශරීරයම දුරු කළ ප්‍රීතිය ඇතිව තුන්වෙනි ධ්‍යාන සැපයෙන් සියලු ශරීරය පතුරවා වාසය කරයි,

මහරජ, මෙලෙස තෙවන ධ්‍යානයට පැමිණ විසීම ද මේ ආත්මයෙහි දී දක්ක යුතු විපාක ඵලයකි. මෙය ඉහත කී මේ ආත්මභාවයෙහි දකිය යුතු විපාක ඵලයන්ට වඩා අතිශයින් මනොඥ ද, ශ්‍රේෂ්ඨ ද වෙයි.

## ❄ චතුර්ථධ්‍යාන ලාභය

මහරජ, එම භික්ෂුව ලබාගත් තතියධ්‍යානය පඤ්ච විධ වශීතාවෙන් පුරුදු කොට ප්‍රගුණ වූ කල්හි ධ්‍යානාංග ප්‍රත්‍යවේක්ෂා කොට බැලීමෙහි දී තුන් වන ධ්‍යානයෙහි ඇති සෝමනස්ස චෛතසික සංඛ්‍යාත සුඛය ඕලාරික වශයෙන් ද, චතුර්ථධ්‍යානයෙහි ඇති උපේක්ෂා වේදනාව හා චිත්තේකාග්‍රතාව ශාන්ත වශයෙන් ද වැටහී යාමෙන් තුන්වෙනි ධ්‍යානයෙහි අපේක්ෂාව අත්හැර චතුර්ථධ්‍යානය ලබනු පිණිස සිත පිහිටුවා ගනී.

මහරජ, එම භික්ෂුව ප්‍රථම ධ්‍යාන උපචාරය ඉක්මවා අර්පනාවට පැමිණීමෙහි දී කායික දුක්ඛය ප්‍රහාණය කිරීමෙන් ද, චතුර්ථධ්‍යාන උපචාරය ඉක්මවා අර්පනාවට පැමිණීමෙහි දී කායික සැපය ප්‍රහාණය කිරීමෙන් ද, මෙලෙස කලින් ම සැප හා දුක් වේදනා දුරු කිරීමෙන් හා දුතියධ්‍යාන උපචාරය ඉක්මවා අර්පනාවට පැමිණීමෙහි දී දෝමනස්සය ප්‍රහාණය වීමෙන් ද, තතියධ්‍යාන උපචාරය ඉක්මවා අර්පනාවට පැමිණීමෙහි දී සෝමනස්සය ප්‍රහීණ වීමෙන් ද මෙලෙස පළමුකොටම සැප දුක් සෝමනස්ස දෝමනස්ස වේදනා නැතිව යාමෙන් දුක් ද නොවූ, සැප ද නොවූ, මධ්‍යස්ථ බව කෘත්‍ය රසය කොට ඇති බැවින් උපේක්ෂාවෙන් ම හටගත් හෙයින්, කිසිවකින් බාධාවක් නැති පිරිසිදු ලෙස පිහිටි සිහිය ඇති බැවින්, උපේක්ෂා සති පාරිශුද්ධිය යැයි කියනු ලබන චතුර්ථ ධ්‍යාන කුසල චිත්තයට පැමිණ වාසය කරයි. එම භික්ෂුව තම සකල ශරීරයම පිරිසිදු වූ, අතිශයින් බබළන ධ්‍යාන සිතින් පතුරවා වෙසෙයි.

මහරජ, පුරුෂයෙකු පිරිසිදු වූ සුදු වස්ත්‍රයක් හිස සිට පෙරවාගෙන සිටින්නේ වේ ද, ඔහුගේ මුලු ශරීරයෙහි එකම තැනකුදු සුදු වතින් නොවසන ලද තැනක් නැත්තේ වේ ද. මහරජ, එපරිද්දෙන්ම ධ්‍යානලාභී භික්ෂුව තම සියලු ශරීරයම පිරිසිදු වූ, අතිශයින්ම බබළන්නා වූ සිව්වැනි ධ්‍යාන සිතින් පතුරවා වසන්නේ වේ. එම භික්ෂුවගේ සියලු ශරීරයෙහි පිරිසිදු වූ, බබළන්නා වූ සිව්වැනි ධ්‍යාන සිතින් නොපැතිරුණු තැනක් නැත්තේ වේ.

මහරජ, මෙලෙස චතුර්ථධ්‍යානයට පැමිණ විසීම ද මේ ආත්මයෙහි දී දැක්ක යුතු විපාක ඵලයකි. මෙය ඉහත කී මේ ආත්මභාවයෙහි දැකිය යුතු විපාක ඵලයන්ට වඩා අතිශයින් මනොඥ ද, ශ්‍රේෂ්ඨ ද වෙයි.

භික්ෂුව මෙලෙස පඨවි කසිණයෙන් චතුර්ථධ්‍යානය දක්වා ම ප්‍රගුණ වූ කල්හි සෙසු **ආපෝ කසිණ - තේජෝ කසිණ - වායෝ කසිණ යන භූත කසිණයෙන් ද, නීල කසිණ - පීත කසිණ - ලෝහිත කසිණ - ඕදාත කසිණ යන වර්ණ කසිණයන් ද, ආලෝක කසිණය** හා **ආකාශ කසිණය** ද අරමුණු කොට චතුර්ථධ්‍යානය දක්වා දියුණු කරගනී.

## ❄ ආකාසානඤ්චායතන සමාපත්ති ලාභය

මහරජ, එම භික්ෂුව දස කසිණයම භාවනා වශයෙන් ප්‍රගුණත්වයට පත් කරගෙන අරූප ධ්‍යානයන් වඩනු කැමති ව ආකාශ කසිණය හැර අන් කසිණාරම්මණයකින් චතුර්ථධ්‍යාන සමාධිය උපදවා එයින් නැගී සිට ධ්‍යානාංග ප්‍රත්‍යවේක්ෂා කොට බලා මෙලෙස රූපයෙහි ආදීනව මෙනෙහි කරයි.

බඹයක් පමණ වූ මේ රූපකය හේතු කොට ගෙන අනුන් පෙළනු පිණිස දඬු මුගුරු ගැනීම, කඩු - දුණු ආදී ආයුධ ගැනීම, කලහ කිරීම, විරුද්ධ වීම, විවාද කිරීමාදිය සිදු වන්නේය. එසේම චක්ෂු රෝග, සෝතරෝගාදී වූ අනේක විධ රෝගයන්ට උත්පත්ති ස්ථාන වන්නේය යැයි රූපයෙහි ආදීනව සලකා මෙම රූපය නැති විට ඒ කලහ ආදියක්

හෝ රෝග පීඩා ආදී කිසිවක් හෝ නැත්තේ ය යනුවෙන් රූපයෙහි ආදීනව සිහිකර රූපයෙන් වෙන් වී ආකාසානඤ්චායතන අරූපධ්‍යානය උපදවනු පිණිස ආකාශය අරමුණු කොට "**අනන්තො ආකාසො**" කියා හෝ "**ආකාශය අනන්තය**" කියා හෝ චක්ෂු විඤ්ඤාණයෙන් ආකාශාරම්මණයෙහි පරිකර්ම කොට එම ආරම්මණය හොඳින් ග්‍රහණය වූ පසු පහසු තැනක පර්‍ය්‍යංකයක් බැඳ වැඩ හිඳ, ඒ ආරම්මණය වැඩීමෙන් ආකාසානඤ්චායතන අරූපධ්‍යාන සමාපත්තිය ලැබ එහි සිත පිහිටුවා වෙසෙන්නේ ය.

මහරජ, මෙලෙස ආකාසානඤ්චායතන ධ්‍යාන සමාපත්තියට පැමිණ විසීම ද මේ ආත්මයෙහි දී දැක්ක යුතු විපාක ඵලයකි. මෙය ඉහත කී මේ ආත්මභාවයෙහි දැකිය යුතු විපාක ඵලයන්ට වඩා අතිශයින් මනොඥ ද, ශ්‍රේෂ්ඨ ද වෙයි.

## ❈ විඤ්ඤාණඤ්චායතන සමාපත්ති ලාභය

මහරජ, එම භික්ෂුව එම ධ්‍යානයෙන් නැඟී සිට, ධ්‍යානාංග ප්‍රත්‍යවේක්ෂා කොට ආකාසානඤ්චායතන සමාපත්තියෙහි ඇති රූපයට ආසන්න බව ආදී වූ ආදීනව සලකා විඤ්ඤාණඤ්චායතන ධ්‍යාන සමාපත්තියෙහි ආනිශංස සලකා ආකාසානඤ්චායතනය වැඩීමෙහි දී අරමුණු කළ අනන්තාකාශය තුළ පැතිර වූ සිත අරමුණු කොට "**අනන්තං විඤ්ඤාණං**" කියා හෝ "**විඤ්ඤාණය අනන්තය**" කියා හෝ පරිකර්ම කොට එය අරමුණු කොට සිටි කල්හි විඤ්ඤාණඤ්චායතන ධ්‍යාන සමාපත්තිය ලැබ එහි සිත පිහිටුවා වෙසෙන්නේ ය.

මහරජ, මෙලෙස විඤ්ඤාණඤ්චායතන ධ්‍යාන සමාපත්තියට පැමිණ විසීම ද මේ ආත්මයෙහි දී දැක්ක යුතු විපාක ඵලයකි. මෙය ඉහත කී මේ ආත්මභාවයෙහි දැකිය යුතු විපාක ඵලයන්ට වඩා අතිශයින් මනොඥ ද, ශ්‍රේෂ්ඨ ද වෙයි.

## ❈ ආකිඤ්චඤ්ඤායතන සමාපත්ති ලාභය

මහරජ, එම භික්ෂුව එම ධ්‍යානයෙන් නැගී සිට, ධ්‍යානාංග ප්‍රත්‍යවේක්ෂා කොට, විඤ්ඤාණඤ්චායතනය ආකාසානඤ්චායතනයට ආසන්න බව ආදී වූ ආදීනව සලකා බලා, ආකිඤ්චඤ්ඤායතන ධ්‍යාන සමාපත්තියෙහි ආනිශංස සලකා විඤ්ඤාණඤ්චායතනයට අරමුණු වූ අනන්තාකාශය තුළ පැවති හිස් බව වූ අභාවය අරමුණු කොට "**නත්ථි කිඤ්චි**" කියා හෝ "**කිසිවක් නැත**" කියා හෝ පරිකර්ම කොට එය අරමුණු කොට සිටි කල්හි ආකිඤ්චඤ්ඤායතන ධ්‍යාන සමාපත්තිය ලැබ එහි සිත පිහිටුවා වෙසෙන්නේ ය.

මහරජ, මෙලෙස ආකිඤ්චඤ්ඤායතන ධ්‍යාන සමාපත්තියට පැමිණ විසීම ද මේ ආත්මයෙහි දී දැක්ක යුතු විපාක ඵලයකි. මෙය ඉහත කී මේ ආත්මභාවයෙහි දැකිය යුතු විපාක ඵලයන්ට වඩා අතිශයින් මනොඥ ද, ශ්‍රේෂ්ඨ ද වෙයි.

## ❈ නෙවසඤ්ඤානාසඤ්ඤායතන සමාපත්ති ලාභය

මහරජ, එම භික්ෂුව එම ධ්‍යානයෙන් නැගී සිට ධ්‍යානාංග ප්‍රත්‍යවේක්ෂා කොට, ආකිඤ්චඤ්ඤායතනය විඤ්ඤාණඤ්චායතන ධ්‍යානයට ආසන්න බව ද, සඤ්ඤාව ඇති කල්හි බොහෝ පීඩා ඇතිවන්නේය යනාදී වූ ආදීනව ඇති බව සලකා නේවසඤ්ඤා නාසඤ්ඤායතන ධ්‍යාන සමාපත්තියෙහි ආනිශංස සලකා ආකිඤ්චඤ්ඤායතන චිත්තය අරමුණු කොට "**සන්තමෙතං පණීතමෙතං**" කියා හෝ "**මෙය ශාන්තය මෙය ප්‍රණීත ය**" කියා හෝ පරිකර්ම කොට එය අරමුණු කොට සිටි කල්හි නේවසඤ්ඤා නාසඤ්ඤායතන ධ්‍යාන සමාපත්තිය ලැබ එහි සිත පිහිටුවා වෙසෙන්නේ ය. ඉන් පසු භික්ෂුව එම ධ්‍යානයෙන් නැගී සිට ධ්‍යානාංග ප්‍රත්‍යවේක්ෂා කොට එය තහවුරු කරගන්නේය.

මහරජ, මෙලෙස නේවසඤ්ඤානාසඤ්ඤායතන ධ්‍යාන සමාපත්තියට පැමිණ විසීම ද මේ ආත්මයෙහි දී දක්ක යුතු විපාක ඵලයකි. මෙය ඉහත කී මේ ආත්මභාවයෙහි දැකිය යුතු විපාක ඵලයන්ට වඩා අතිශයින් මනොඥ ද, ශ්‍රේෂ්ඨ ද වෙයි.

## ❈ චුද්දසාකාර චිත්ත වශීතාවය

මහරජ, එම භික්ෂුව මෙලෙස රූප ධ්‍යාන සතර හා අරූපධ්‍යාන සතර වැඩීමෙන් එම ධ්‍යානයන්ගේ අංග සම්පූර්ණත්වයට පැමිණ අෂ්ට සමාපත්ති ලාභීව එම අට සමවත් "**කසිණානුලොමය, කසිණ පටිලෝමය, කසිණානුලොම පටිලොමය, ධ්‍යානානුලොමය, ධ්‍යාන පටිලොමය, ධ්‍යානානුලොම පටිලොමය, ධ්‍යානුක්කන්තිය, කසිණුක්කන්තිය,** ධ්‍යාන **කසිණුක්කන්තිය, අංග සංකන්තිය, ආරම්මණ සංකන්තිය, අංගාරම්මණ සංකන්තිය, අංග වවත්ථාපනය, ආරම්මණ වවත්ථාපනය**" යන ද හතරාකාරයෙන් වශී භාවයට පත් කර ගනී.

මෙහි දී ආලෝක කසිණය ඕදාත කසිණයෙහිම ඇතුළත් වන බැවින් ද, ආකාශ කසිණයෙන් අරූපධ්‍යාන නොලැබෙන බැවින් ද එම ධ්‍යාන දෙක අතහැර **පඨවි ආපෝ තේජෝ වායෝ නීල පීත ලෝහිත ඕදාත** යන කසිණ අට පමණක් චුද්දසාකාර චිත්ත පරිදමනයට යොදා ගනු ලැබේ.

1. පඨවි කසිණයෙහි පටන් ආලෝක කසිණය දක්වා ම පිළිවෙලින් චතුර්ථධ්‍යානය දක්වා සියවර, දහස්වර නැවත නැවත සමවැදීම **කසිණානුලොමය** නම් වේ.

2. ආලෝක කසිණයෙහි පටන් පඨවි කසිණය දක්වා ම ප්‍රතිලෝම වශයෙන් අනු පිළිවෙලින් චතුර්ථධ්‍යානය දක්වා සියවර, දහස්වර නැවත නැවත සමවැදීම **කසිණ පටිලොමය** නම් වේ.

3. පඨවි කසිණයෙහි පටන් ආලෝක කසිණය දක්වා ද, ආලෝක කසිණයෙහි පටන් පඨවි කසිණය දක්වා ද අනුලෝම ප්‍රතිලෝම

වශයෙන් සියවර, දහස්වර නැවත නැවත සමවැදීම **කසිණානුලොම පටිලෝමය** නම් වේ.

4. ප්‍රථම ධ්‍යානය පටන් පිළිවෙලින් නේවසඤ්ඤා නාසඤ්ඤායතනය දක්වා ම අනුලෝම වශයෙන් සිය, දහස්වර නැවත නැවත ධ්‍යානයන්ට සමවැදීම **ධ්‍යානානුලෝමය** නම් වේ.

5. නේවසඤ්ඤා නාසඤ්ඤායතනය පටන් ප්‍රථම ධ්‍යානය දක්වා ම පිළිවෙලින් ප්‍රතිලෝම වශයෙන් සිය, දහස්වර නැවත නැවත ධ්‍යානයන්ට සමවැදීම **ධ්‍යාන ප්‍රතිලෝමය** නම් වේ.

6. ප්‍රථම ධ්‍යානය පටන් පිළිවෙලින් නේවසඤ්ඤා නාසඤ්ඤායතනය දක්වා ද, නේවසඤ්ඤානාසඤ්ඤායතනය පටන් ප්‍රථම ධ්‍යානය දක්වා ද, අනුලෝම ප්‍රතිලෝම වශයෙන් සියවර, දහස් වර නැවත නැවත සමවැදීම **ධ්‍යානානුලොම පටිලෝමය** නම් වේ.

7. පඨවි කසිණයෙන් ප්‍රථම ධ්‍යානයට සමවැදී එයින් නැගිට දෙවන ධ්‍යානය ඉක්මවා තුන් වන ධ්‍යානයට ද, එයින් නැගී සිට චතුර්ථධ්‍යානය ඉක්මවා ආකාසානඤ්චායතනයට ද, එයින් නැගී සිට විඤ්ඤාණඤ්චායතනය ඉක්මවා ආකිඤ්චඤ්ඤායතනයට ද ධ්‍යාන ඉක්මවමින් සමවැදීම **ධ්‍යානුක්කන්තය** නම් වේ.

8. පඨවි කසිණයෙන් ප්‍රථම ධ්‍යානයට ද, ආපෝ කසිණය අත්හැර තේජෝ කසිණයෙන් ප්‍රථම ධ්‍යානයට ද, මෙලෙස ධ්‍යාන නොයික්මවා කසිණ ඉක්මවමින් එකම ධ්‍යානයට සමවැදීම **කසිණුක්කන්තිය** නම් වේ.

9. පඨවි කසිණයෙන් ප්‍රමථධ්‍යානයට ද, ආපෝ කසිණය අතහැර තේජෝ කසිණයෙන් තෙවන ධ්‍යානයට ද, වායෝ කසිණය අතහැර නීල කසිණයෙන් චතුර්ථධ්‍යානය ඉක්මවා ආකාසානඤ්චායතනයට ද, විඤ්ඤාණඤ්චායතනය ඉක්මවා ආකිඤ්චඤ්ඤායතනයට ද යනාදී ලෙස ධ්‍යාන හා කසිණ ඉක්මවමින් සමවැදීම **ධ්‍යාන කසිණුක්කන්තිය** නම් වේ.

10. පඨවි කසිණයෙන් ප්‍රථම, දුතිය, තතිය, චතුර්ථ යන ධ්‍යානයන්ට අනුපිළිවෙළින් සමවැදීම කොට, අන් කසිණයන්ගෙන් ද මෙලෙස ධ්‍යානයන්ට සමවැදීම **අංගසංකන්තිය** නම් වේ.

11. පඨවි ආදී අටවිධ කසිණයෙන් ම ප්‍රථමධයානයට සමවැදීම කොට, නැවත කසිණ පිළිවෙලින් ද්‍රතියධ්‍යානයට සමවැදීම ආදී ලෙස කසිණාරම්මණ පිළිවෙලින් සමවැදීම **ආරම්මණ සංකන්තිය** නම් වේ.

12. පඨවි කසිණයෙන් ප්‍රථම ධ්‍යානයට ද, ආපෝ කසිණයෙන් ද්‍රතියධ්‍යානයට ද, තේජෝ කසිණයෙන් තෘතිය ධ්‍යානයට ද වායෝ කසිණයෙන් චතුර්ථධ්‍යානයට ද, නීල කසිණයෙන් ආකාසානඤ්චායතනයට ද, පීත කසිණයෙන් විඤ්ඤණඤ්චායතනයට ද, ලෝහිත කසිණයෙන් ආකිඤ්චඤ්ඤයතනයට ද, ඕදාත කසිණයෙන් නේවසඤ්ඤ නාසඤ්ඤයතනයට ද අංග හා ආරම්මණ මාරු කරමින් සමවැදීම **අංග ආරම්මණ සංකන්තිය** නම් වේ.

13. ප්‍රථම ධ්‍යානය විතර්ක විචාර ප්‍රීති සුඛ ඒකාග්‍රතා යන අංග පසෙන් යුක්ත ය ආදී ලෙස සියලු ධ්‍යානයන් ගේ අංග ආවර්ජනා කිරීම **අංග වවත්ථාපනය** නම් වේ.

14. මෙය පඨවි කසිණය ය, මෙය ආපෝ කසිණය ය ආදී ලෙස ධ්‍යානයන්ට සම වදිමින් කසිණාරම්මණ ආවර්ජනා කිරීම **ආරම්මණ වවත්ථාපනය** නම් වේ.

මහරජ, එම භික්ෂුව මෙලෙස චිත්ත විශුද්ධිය සම්පූර්ණ වීමෙන් මනාව ඒකග්‍ර වූ සිත් ඇති වූ කල්හි, සර්වප්‍රකාරයෙන් පාප ධර්මයන්ගෙන් මිදුණු කල්හි, කෙලෙසුන්ගෙන් දුරු වූ කල්හි, උපක්ලේශයන් පහ වූ කල්හි, සිත මොලොක් වූ කල්හි, මනාව පිරිසිදු වූ දීප්තිමත් වූ සිත් ඇති කල්හි "**විදර්ශනා ඥනය**" ලැබීම පිණිස හෝ "**ඍද්ධිවිධ ඥනය, දිබ්බසෝතධාතු ඥනය, චේතෝපරිය ඥනය, පුබ්බෙනිවාස ඥනය, චුතූපපාත (දිව්‍ය චක්ෂු) ඥනය**" යන පඤ්ච ලෞකික අභිඥවන් ලැබීම පිණිස සිත මෙහෙයවයි.

ලෞකික අභිඥවන් වනාහී රූප ශබ්ද දී අරමුණු හමුවෙහි ඇලීම් ගැටීම්වලට හසුව පිරිහීමට කාරණා ඇති හෙයින් ද, විදර්ශනා ඥනය ඇති විට "**අනිත්‍ය, දුක්ඛ, අනාත්ම**" දර්ශනයන් තුළින් එබඳු

තැන්හි පරමාර්ථ සත්‍යය විද්‍යමාන ව දකින හෙයින් නොවෙනස්ව සිත පවත්වා ගත හෙයින් ද පළමුව විදර්ශනා ඥානය කියන ලදි.

## ❄ විදර්ශනා ඥාන ප්‍රතිලාභය

මෙලෙස චිත්ත විශුද්ධිය සම්පූර්ණ වීමෙන් මනාව ඒකාග්‍ර වූ සිත් ඇති වූ කල්හි, සර්වප්‍රකාරයෙන් පාප ධර්මයන්ගෙන් මිදුණු කල්හි, කෙලෙසුන්ගෙන් දුරු වූ කල්හි, උපක්ලේශයන් පහ වූ කල්හි, සිත මොලොක් වූ කල්හි, මනාව පිරිසිදු වූ දීප්තිමත් වූ සිත් ඇති කල්හි "**ඥාන දර්ශනය**" ලැබීම පිණිස සිත මෙහෙයවයි. මෙහි "**ඥාන දර්ශනය**" යනු "**මාර්ග ඥානය**" යි. තව ද "ඵල ඥානය ද, සර්වඥතාඥානය ද, ප්‍රත්‍යවේක්ෂා ඥානය ද, විදර්ශනා ඥානය ද" "**ඥාන දර්ශනය**" නම් වේ. මෙහි "**විදර්ශනා ඥාන දර්ශනය**" අදහස් කරන ලදි.

මහරජ එම භික්ෂුව, **විදර්ශනා ඥානය** ලබනු පිණිස ඒ සඳහා පරිකර්ම කිරීමෙහි මෙලෙස සිත පිහිටුව යි.

## ☸ දිට්ඨි විශුද්ධිය ලාභය

### ✠ රූප පරිග්‍රහය

මහරජ, එම භික්ෂුව නාම රූප ධර්මයන්ගේ ඇත්තා වූ ස්වභාවය දක්නා පිණිස **ලක්ෂණ, රස, පච්චුපට්ඨාන, පදට්ඨාන** වශයෙන් වෙන් කොට දැන ගැනීම පිණිස සිත යොදයි. එහි දී ප්‍රථමයෙන් ම භූත රූප හා ඒවා ඇසුරු කර ගත් උපාදය රූප සියල්ලක් ම පිරි සිඳ දැන ගනී. රූප ධර්මයන් පිරි සිඳ දැනගෙන රූප පරිච්ඡේදය සම්පූර්ණ කරයි.

### ✠ කලාප සම්මර්ශනය

මෙලෙස රූප ධර්ම සම්මශර්ණය කොට කර්මයෙන් නිපන් චක්ෂු - සෝත - ඝාණ - ජිව්හා - කාය - පුරුෂ භාව - ස්ත්‍රී භාව - හෘදය

වස්තුව යන දසක කලාපයන් ද, ජීවිත නවක කලාපය ද යන කර්මජ රූප කලාප නවය පිරි සිඳ දැන ගනී.

එසේම සිතින් උපන් චිත්තජ ශුද්ධාෂ්ඨකය, කාය විඤ්ඤත්ති නවකය, ලහුතාදී ඒකාදසකය, කායවිඤ්ඤත්ති ලහුතාදී ද්වාදසකය, වචීවිඤ්ඤත්ති දසකය, වචීවිඤ්ඤත්ති ශබ්දලහුතාදී තේරසකය යන චිත්තජ රූප කලාප සය පිරි සිඳ දැන ගනී.

එසේම සෘතුජ ශුද්ධාෂ්ඨකය, ශබ්ද නවකය, ලහුතාදී ඒකාදසකය, ශබ්ද ලහුතාදී ද්වාදසකය යන සෘතුජ රූප කලාප සතර පිරි සිඳ දැන ගනී.

එසේම ආහාරජ අෂ්ඨමක කලාපය, ලහුතාදී ඒකාදසකය යන ආහාරජ රූපකලාප දෙක පිරි සිඳ දැන ගනී.

### ✠ නාම පරිග්‍රහය

ඉන් පසු සබ්බචිත්ත සාධාරණ චෛතසික සත ද, ප්‍රකීර්ණක චෛතසික සය ද යන අඤ්ඤසමාන චෛතසික තෙළෙස පිරි සිඳ දැන ගනී.

ශ්‍රද්ධා - සති - හිරි - ඔත්තප්ප ආදී සෝභණ සාධාරණ චෛතසික එකුන්විස්ස ද, විරති චෛතසික තුන ද, අප්පමඤ්ඤ චෛතසික දෙක ද, ප්‍රඥාව ද යන මේ සෝභණ චෛතසික පස් විස්ස පිරි සිඳ දැන ගනී. එසේම කාම, රූප, අරූප, ලෝකෝත්තර මේ මේ චෛතසික යෙදෙන්නේය යැයි ප්‍රත්‍යක්‍ෂයෙන් දැනගනී.

එසේම මෝහ - අහිරික - අනොත්තප්ප - උද්දච්ච ආදී අකුසල චෛතසික තුදුස ද, මේ මේ සිත්හි මේ මේ චෛතසික යෙදෙන්නේ ය යැයි පිරිසිඳ දැනගෙන නාම පරිච්ඡේදය සම්පූර්ණ කරයි.

මෙලෙස නාම, රූප ධර්ම සියල්ලක් ම විනිවිද දැක ගත් කල්හි මෙහි අරමුණට නැමෙන ලක්‍ෂණයෙන් යුත් ධර්ම සමූහය නාම ධර්ම යැයි ද, සීත උෂ්ණාදියෙන් වෙනස් වන ස්වභාවයෙන් යුත් ධර්ම සමූහය රූප

ධර්ම යැයි ද වෙන්කරගෙන මේ නාමය වනාහී නාමය මිස රූපය නොවේ යැයි ද, රූපය වනාහී රූපය මිස නාමය නොවේ යැයි ද, මෙහි නාමරූප ධර්ම සමූහයක් මිස සත්වයෙක් පුද්ගලයෙක් ආත්මයක් නැත යැයි ද ප්‍රත්‍යක්‍ෂයෙන් දැන ගනී. එයින් එම භික්‍ෂුවගේ අනාදිමත් සසරක පැවති සත්ව පුද්ගල වශයෙන් වරදවා ගත් **දිට්ඨිය** අතහැරීම සිදු වේ.

## ☸ කංඛාවිතරණ විශුද්ධි ලාභය

### ✠ ප්‍රත්‍ය පරිග්‍රහ ඥානය

මහරජ, එම භික්‍ෂුව නාම රූපයන්ගේ ඇත්තා වූ ස්වභාවය සොයා දැනගෙන, කංඛාවිතරණ විශුද්ධිය ඇති කර ගැනීම පිණිස නාම - රූප ධර්මයන්ගේ ප්‍රත්‍ය සෙවීම සිදුකරයි. එහි දී චක්‍ෂු වස්තුවට රූපාරම්මණයක් මුණ ගැසුණු විට චක්‍ෂු විඤ්ඤාණ සිත් හට ගැනීම වේ. චිත්ත - ඍතු - ආහාර ප්‍රත්‍යයන්ගෙන් රූප ධර්මයන්ගේ හට ගැනීම වේ. අවිද්‍යා - තෘෂ්ණා - කර්මය - උපාදාන යන ධර්මයන් හේතුවෙන් නාම - රූප දෙකොටසම හට ගැනීම වේ. මෙලෙස නාම - රූප පරම්පරාව අතරක් නැර හේතු - ඵල වශයෙන් සම්බන්ධව පවතින ධර්මතාවයක් බව දැක ගැනීමෙන් අහේතුක දෘෂ්ටිය දුරු වීම වේ. ඒ ඒ අදාළ හේතු ධර්මතාවන්ගෙන්ම මිස මැවුම් කාර දෙවියන්ගේ නිර්මාණාදී වූ විපරිත දෘෂ්ටි දුරු වේ. මෙසේ නාම රූප ධර්මයන් හේතු - ඵල වශයෙන් දැකීම තුළින් අතීතයෙහි මම සිටියෙහි ද, අනාගතයෙහි ඇතිවන්නෙම් ද යනාදී වූ සැක දුරුව යයි. එයින් බුද්ධාදී අට තැන සැක දුරුව යයි. බුදු සසුනෙහි සැබෑ පිහිට ලැබූවෙකු බවට පැමිණේ.

## ☸ මග්ගාමග්ග ඤාණදස්සන විශුද්ධි ලාභය

එම භික්‍ෂුව ඉහත කී ලෙස කංඛාවිතරණ විශුද්ධිය සම්පූර්ණ කරගෙන නිවැරදි මාර්ගයට පැමිණීම පිණිස පංචස්කන්ධයෙහි ඇතිවීම හා නැති වීම, නැවත නැවත නුවණින් සලකමින් වාසය කරයි. එනම්:-

අවිද්‍යාව, තෘෂ්ණාව, කර්‍ම, ආහාර ප්‍රත්‍යයෙන් රූපස්කන්ධයෙහි හට ගැනීම වෙයි. අවිද්‍යාව, තෘෂ්ණාව, කර්‍ම, ස්පර්‍ශ ප්‍රත්‍යයෙන් වෙදනාස්කන්ධයෙහි හට ගැනීම වෙයි. අවිද්‍යාව තෘෂ්ණාව කර්‍ම ස්පර්‍ශ ප්‍රත්‍යයෙන් සංඥා ස්කන්ධයෙහි හට ගැනීම වේයි. අවිද්‍යාව, තෘෂ්ණාව, කර්‍ම, ස්පර්‍ශ ප්‍රත්‍යයෙන් සංස්කාර ස්කන්ධයෙහි හට ගැනීම වෙයි. අවිද්‍යාව, තෘෂ්ණාව, කර්‍ම, නාම - රූප පහළ වීමෙන් විඤ්ඤාණස්කන්ධයෙහි හට ගැනීම වෙයි. එම හේතු ධර්‍ම නිරුද්ධ වීමෙන් රූප - වේදනා - සඤ්ඤා - සංස්කාර - විඤ්ඤාණ යන ස්කන්ධයන්ගේ නිරෝධය වෙයි.

මෙලෙස රූපස්කන්ධය ආහාර නිසා හටගත්තේය. වෙදනා, සංඥා, සංස්කාර යන ස්කන්ධ තුන ස්පර්‍ශය නිසා උපදනාහ. විඥානස්කන්ධය නාම හා රූප නිසා උපදනේය. එම හේතු නිරුද්ධ වීමෙන් එම ස්කන්ධයන්ගේ නිරෝධය වන්නේය. මෙසේ පඤ්ච උපාදනස්කන්ධයන්ගේ ඇතිවීම හා නැති වීම නැවත නැවත බලමින් වාසය කරයි.

මෙලෙස අනිත්‍ය, දුක්ඛ, අනාත්ම ලක්‍ෂණයන් තුළින් උදය - වය නුවණින් දකින භික්‍ෂුවට **ඕභාස** ආදී දසවිධ **විදර්‍ශනා උපක්ලේශ** ඇති වේ. භික්‍ෂුව එම ආලෝකාදිය ද ත්‍රිලක්‍ෂණ විදර්‍ශනාවට නැගීමෙන් දුරු කොට මාර්‍ගය - අමාර්‍ගය දෙකෙහි ස්වභාවය තේරුම් ගෙන නිවැරදි මාර්‍ගයට අවතීරණය වේ. එබැවින් මේ අවස්ථාව "**මග්ගාමග්ග ඤාණදස්සන විශුද්ධිය**" යැයි කියනු ලැබේ.

## ☸ ප්‍රතිපදා ඤාණදස්සන විශුද්ධි ලාභය

උදය වය ඤාණ දර්‍ශනය සම්පූර්‍ණ කළ එම භික්‍ෂුව නැවත උදය වය ඤාණයෙහි පටන් **භංග ඥානය, භයතුපට්ඨාන ඥානය, ආදීනවානුපස්සනා ඥානය, මුඤ්චිතුකම්‍යතා ඥානය, පටිසංඛානුපස්සනා ඥානය, සංඛාරුපේක්‍ෂා ඥානය, අනුලෝම ඥානය** යන විදර්‍ශනා ඥානයන් පිළිවෙලින් ලබයි.

මහරජ, ඉතා යහපත් ඉල්ලමක පිරිසිදු ලෙස හටගත් අටැස් හැඩයෙන් යුත් වෛඩූර්‍ය මාණික්‍යයක් සෝද පවිත්‍ර කර, ඔප දමා, විද,

එහි නිල් - රතු - කහ - සුදු - පඬුවන් ආදී පැහැය ඇති යම් නූලකින් අමුණා, මනාව ඇස් පෙනෙන කෙනෙකු අතෙහි පළඳ, එම මැණික පිරිසිදු ඉල්ලමක හටගත් මනාව සෝද, ඔප දමා විද, නිල් පැහැ ආදී වූ යම් වර්ණවත් නූලකින් අමුණන ලද්දක් බව විශේෂයෙන් සලකා බලන්නේ ද, එලෙස ම විදර්ශනා ඥානය සම්පූර්ණ කළ භික්ෂුව මෙම ශරීරය වනාහී සීත උෂ්ණාදී විකාරයට පත්වන රූපයෙන් යුක්ත ය. සතර මහා භූතයන්ගේ හේතුවෙන් හටගත්තේය. මව්පියන්ගේ ශුක්‍ර ශ්‍රෝණිතයෙන් හටගත්තේය. මව්කුසෙහි දී මනාව නොපිහිටි ශරීරාංගයන් සකස් කරනු පිණිස බෙහෙත් ගැල්වීම, තද කිරීම ආදිය කිරීමෙන් ද, කුඩාකල ඇකයෙහි නිදිකරවීමෙන් ද, පෝෂණය කරන ලද්දේය. දහදිය - අසූචි - පිත - සෙම ආදියෙන් ඇතිවෙන දුගඳ නැති කිරීම පිණිස ශරීරයෙහි සුවඳ ගැල්වීම, ආබාධ නසනු පිණිස ද, අත් පා ආදී ශරීරාවයව ශක්තිමත් වීම පිණිස ද, පිරිමැදීම - සම්බාහනය ආදිය කළ යුතුය. බත් පිට්ටු ආදී ආහාරයෙන් වඩනා ලද්දේය. මෙලෙස පෝෂණය කර පරිහරණය කරනු ලබන්නේ නමුත් නිතර වෙනස් වන බැවින් අනිත්‍ය ලක්ෂණයෙන් යුක්ත වූ බිඳීයාම, විනාශ වීම, ස්වභාව කොට ඇති මාගේ මේ විඤ්ඤාණය ශරීරයට ඇලුම් කරයි, මෙහි ම බැඳුණේ වෙයි, යනුවෙන් නුවණින් දක නාම රූප සංඛ්‍යාත පඤ්චෝපාදනස්කන්ධයෙහි ඇලීම දුරු කොට වෙසෙයි.

මහරජ, මෙලෙස විදර්ශනා ඥානයට පැමිණ විසීම ද, මේ ආත්මයෙහි දී දක්ක යුතු විපාක ඵලයකි. මෙය ඉහත කී මේ ආත්මභාවයෙහි දකිය යුතු විපාක ඵලයන්ට වඩා අතිශයින් මනොඥ ද, ශ්‍රේෂ්ඨ ද වෙයි

## ❈ මනොමය ඍද්ධි ඤාණ ලාභය

මහරජ, නැවත එම භික්ෂුව **මනෝමය ඍද්ධි ඥානය** ලැබීම පිණිස සිත මෙහෙයවයි.

මහරජ, පළඳනා ආභරණයක් කරනු කැමති රන් කරුවෙකු ගිනි පිඹීමාදියෙන් රන් මෘදු කොට වැඩට සුදුසු පරිදි සකස් කොට ආභරණ

සාද ගන්නේ යම් සේ ද, භාජන කරනු කැමති කුඹල් කරුවෙකු, මැටි තලා අනා මෘදු කොට භාජන තනනුයේ යම් සේ ද, එපරිද්දෙන් ම භික්ෂුව ඉහත කියන ලද තුදුස් ආකාරයෙන් සිත හාත්පසින් දමනය කරගෙන **ඡන්ද, චිත්ත, විරිය, වීමංසා** යන සතර ඍද්ධිපාදයන්ගෙන් එකිනෙක මුල්කොටගෙන සමවැදීම් වශයෙන් ද, **ආවජ්ජන, සමාපජ්ජන, අධිෂ්ඨාන, උට්ඨාන, පච්චවෙක්ඛණ** යන පස් ආකාරයෙන් වශී භාවයට පැමිණවීමෙන් ද, සිත මොලොක් කොට, කර්මඤ්ඤ කොට, අභිඥ ඥනයන් ලබනු පිණිස පුරුදු කළ කසිණයකින් චතුර්ථ ධ්‍යානයට සමවැදී සිත මනාව සමාධිමත් වූ කල්හි, උපේක්‍ෂා සති පාරිශුද්ධියෙන් පිරිසිදු වූ කල්හි, ප්‍රභාස්වර වූ කල්හි, රාගාදී කෙලෙස් පහව ගොස් වශී භාවයට පැමිණ නිශ්චලව සිත පවත්නා කල්හි, ශ්‍රද්ධාදී ඉන්ද්‍රිය ධර්මයන් ශක්තිමත් ව නිශ්චල බවට පැමිණි කල්හි, **මනෝමය ඍද්ධි ඥනය** ලැබීම පිණිස සිත මෙහෙයවයි.

එම භික්ෂුවගේ ශ්‍රද්ධාව බලවත් ව පිහිටි සිත අශ්‍රද්ධාවෙන් නොසැලෙයි. වීර්යයෙන් බලවත් වූ සිත කුසීත බැවින් නොසැලෙයි. සිහියෙන් බලවත් ව පිහිටි සිත ප්‍රමාදයෙන් නොසැලෙයි. සමාධියෙන් බලවත් වූ සිත උද්ධච්චයෙන් නොසැලෙයි. ප්‍රඥවෙන් බලවත් වූ සිත අවිද්‍යාවෙන් නොසැලෙයි. ප්‍රඥ ආලෝකයෙන් බලවත් වූ සිත ක්ලේශාන්ධකාරයෙන් නොසැලෙයි. මේ ධර්ම සයෙන් බලවත් වූ සිත නිශ්චල බවට පැමිණියේ වෙයි.

තව ද "**චතුර්ථ ධයානයෙහි සිත පිහිටුවීම ය, පිරිසිදු බව ය, ප්‍රභාස්වර බව ය, අනංගණ (කෙලෙස් නැති) බව ය, කෙලෙස් මලයන්ගෙන් පිරිසිදු බව ය, මෘදු බව ය, ඍද්ධියට යෝග්‍ය බව ය, අචඤ්චල බව ය**" යන අංග අටෙන් යුත් චතුර්ථ ධ්‍යාන චිත්තය අභිඥ කර්මයට යෝග්‍ය වේ.

මෙලෙස පාදක චතුර්ථධ්‍යානයට සමවැදී තම කය ආවර්ජනා කොට පරිකර්ම කොට කය සිදුරක් වේවා යැයි අධිෂ්ඨාන කරයි. නැවත එම සිදුර ඇතුළත අනෙක් කයක් ආවර්ජනා කොට ඒ සිදුර ඇතුළත එබඳු ම කයක් වේවා යැයි අධිෂ්ඨාන කරයි. එවිට මුදු තණ ගසකින් ඇද ගන්නා ගොබයක් මෙන් ද, කොපුවකින් ඇද ගන්නා කඩුවක් මෙන්

ද, සැව හැර යන නයෙකු මෙන් ද අනෙක් කයක් ඇදගනී. එසේ මවන මනෝමය කය ද එම ඍද්ධිමතා හා සමාන වෙයි.

මහරජ, මෙලෙස මනෝමය ඍද්ධි ඥනයට පැමිණ විසීම ද මේ ආත්මයෙහි දී දැක්ක යුතු විපාක ඵලයකි. මෙය ඉහත කී මේ ආත්මභාවයෙහි දැකිය යුතු විපාක ඵලයන්ට වඩා අතිශයින් මනොඥ ද, ශ්‍රේෂ්ඨ ද වෙයි.

## ❄ ඍද්ධිවිධ ඤාණ ලාභය

මහරජ, නැවත එම භික්ෂුව ඍද්ධිවිධ ඥනය ලැබීම පිණිස සිත මෙහෙයවයි.

භික්ෂුව දස කසිණයන්ගෙන් යමකින් අභිඥ පාදක චතුර්ථධ්‍යානයට සමවැදී ඒයින් නැගීසිට, තමා එකලාව සිට සියදෙනෙකු හෝ දහස් දෙනෙකු හෝ වෙමි යැයි ආවර්ජනා කොට, මෙලෙස බොහෝ දෙනෙකු වෙම්වා යැයි නුවණින් අධිෂ්ඨාන කොට එසේ මවා දක්වයි. තමන් බොහෝ දෙනෙකුන්ව පෙනී සිට නැවත එක් කෙනෙකු ලෙස පෙනී සිටී.

තමාගේ ප්‍රකෘති වේශය අතහැර කුමාර වේශයක් හෝ නාග, ගුරුළු, අසුර, ශක්‍ර, දිව්‍ය, බ්‍රහ්ම, සමුද්‍ර, පර්වත, සිංහ, ව්‍යාඝ්‍රාදී වේශයක් හෝ මවා දක්වයි.

තමා ප්‍රකට ව පෙනී සිටියි. එසේම නොපෙනී සිටියි. අහසෙහි මෙන් බිත්ති, ප්‍රාකාර, පර්වත මැදින් ඒ කිසිවක නොගැටී විනිවිද යයි. දියෙහි මෙන් පොළොවෙහි කිමිදීම් මතු වීම් කෙරෙයි. පොළොවෙහි මෙන් දියෙහි මතුපිට ගමන් කෙරෙයි. පක්ෂියෙකු මෙන් අහසෙහි ද පර්‍යංකයෙන් හිඳගෙනම ගමන් කරයි.

මහත් ආනුභාව සම්පන්න ඉර හඳ දෙක සියතින් පිරිමදියි. දෙව්ලොව, බඹලොව වැනි ඈත තැන්වල ඇති වස්තූන් තම

ඍද්ධියානුභාවයෙන් ලංකොට දක්වයි. එසේම ළඟ ඇති දේ ඉතා ඈත් කොට දක්වයි. ස්වල්ප වූ දෙය බොහෝ කොට දක්වයි. බොහෝ කොට ඇති දේවල් ස්වල්ප කොට දක්වයි.

මහරජ, දක්‍ෂ කුඹල්කරුවෙකු හෝ කුඹල්කාර අතවැසියෙකු හෝ යහපත් සේ පදම් කළ මැටියෙන් කැමති කැමති වළං ආදී භාණ්ඩයන් යම් සේ කරන්නේ ද, නිපදවන්නේ ද, මහරජ, දළ කැටයම් කරුවෙකු හෝ අතවැසියෙකු හෝ සකස් කළ දළයෙහි යම් සේ කැමති කැමති දළ කැටයම් වර්‍ගයක් කරන්නේ ද, නිපදවන්නේ ද, මහරජ, දක්‍ෂ රන් කරුවෙකු හෝ ස්වර්‍ණකාර අතවැසියෙකු හෝ පදම් කළ රනින් කැමති කැමති රන් අබරණ ජාතීන් යම් සේ කරන්නේ ද, නිපදවන්නේ ද, එසේම භික්‍ෂුව ඍද්ධිවිධ ඤාණයෙන් නොයෙක් ඍද්ධීන් වෙන් වෙන් කොට මවා පායි.

මහරජ, මෙලෙස ඍද්ධිවිධ ඥානයට පැමිණ විසීම ද, මේ ආත්මයෙහි දී දක්ක යුතු විපාක ඵලයකි. මෙය ඉහත කී මේ ආත්මභාවයෙහි දකිය යුතු විපාක ඵලයන්ට වඩා අතිශයින් මනොඥ ද, ශ්‍රේෂ්ඨ ද වෙයි.

## ❄ දිබ්බසෝත ඤාණ ලාභය

මහරජ, නැවත එම භික්‍ෂුව දිබ්බසෝත ඥානය ලැබීම පිණිස සිත මෙහෙයවයි.

එම භික්‍ෂුව දස කසිණයන්ගෙන් යමකින් අභිඥා පාදක චතුර්ථධ්‍යානයට සමවැදී ඒයින් නැගී සිට දුර ශබ්දයන්ගේ ද, ළඟ ශබ්දයන්ගේ ද, මහත් ශබ්දයන්ගේ ද, සියුම් ශබ්දයන්ගේ ද, ඉතා සියුම් ශබ්දයන්ගේ ද, පූර්‍ව දිශාවෙහි ශබ්දයන්ගේ ද, පශ්චිම දිශාවෙහි ශබ්දයන්ගේ ද, උතුරු දිශාවෙහි ශබ්දයන්ගේ ද, දකුණු දිශාවෙහි ශබ්දයන්ගේ ද, පූර්‍ව අනු දිශාවෙහි ශබ්දයන්ගේ ද, පශ්චිම අනු දිශාවෙහි ශබ්දයන්ගේ ද, දකුණු අනු දිශාවෙහි ශබ්දයන්ගේ ද, යට දිශාවෙහි ශබ්දයන්ගේ ද, උඩ දිශාවෙහි ශබ්දයන්ගේ ද, ශබ්ද නිමිත්ත මෙනෙහි කරයි. හෙතෙම එසේ පුරුදු කරන ලද පිරිසිදු වූ හාත්පස පිරිසිදු වූ

සිතින් සෝත ධාතු විසුද්ධි ඥානය පිණිස සිත එළවයි. එම භික්ෂුව මිනිස් බව ඉක්ම වූ පිරිසිදු වූ දිව්‍ය ශ්‍රෝත ධාතුවෙන් දිව්‍යමය වූ ද, මනුෂ්‍ය වූ ද, දුර වූ ද, සමීප වූ ද, දෙවැදෑරුම් ශබ්දයන් අසයි.

මහරජ, දුර ගමනක් යන්නෙකුට දිග කාන්තාර මග සැක බිය සහිත වේ ද, එහි සැක සංකාවෙන් මේ බෙර හඬය මේ මිහිඟුබෙර හඬය යැයි පැහැදිලිව හඳුනා ගත නොහැකි වේ ද, එබැවින් කාන්තාර මග අනුගමනය නොකොට ක්ෂේම මාර්ගයක බිය සැක නැතිව සෙමින් යන එම පුරුෂයා බෙර හඬ, මිහිඟු බෙර හඬ, සක්, පණාබෙර, ගැටබෙර හඬ අසා ඔහුට මේ බෙරහඬ යයි ද, මිහිඟු බෙරහඬ යැයි ද, සක් බෙරහඬ යැයි ද, පණා බෙරහඬ යැයි ද, ගැටබෙර හඬය යැයි හඳුනා ගනී ද, මහරජ, භික්ෂුව දෙවියන්ගේ කන බඳු වූ දිව්‍යසෝත ඥානය ලබනු පිණිස සිත ඉදිරිපත් කොට මිනිස් කන ඉක්මවූවා වූ දිව්‍යමය වූ ද, මනුෂ්‍යමය වූ ද, දුර වූ ද, ලඟ වූ ද දෙයාකාර ශබ්දයන් අසයි.

මහරජ, මෙලෙස දිබ්බසෝත ඥානයට පැමිණ විසීම ද, මේ ආත්මයෙහි දී දක්ක යුතු විපාක ඵලයකි. මෙය ඉහත කී මේ ආත්මභාවයෙහි දකිය යුතු විපාක ඵලයන්ට වඩා අතිශයින් මනොඥ ද, ශ්‍රේෂ්ඨ ද වෙයි.

## ❄ චේතෝපරිය ඤාණ ලාභය

මහරජ, නැවත එම භික්ෂුව දස කසිණයන්ගෙන් යමකින් අභිඥා පාදක චතුර්ථධ්‍යානයට සමවැදී ඒයින් නැගී සිට පර සිත් දැනගන්නා ඥානය ලැබීම පිණිස සිත යොදයි.

මහරජ, එම භික්ෂුව අන්‍ය සත්වයන්ගේ, අන්‍ය පුද්ගලයන්ගේ සිත් තම සිතින් පිරිසිඳ දැන ගනියි. රාග සහිත සිත **සරාග සිත** යැයි දැන ගනියි. රාගය පහ වූ සිත **විරාග සිත** යැයි දැන ගනියි. ද්වෙෂ සහිත සිත **සදෙස සිත** යයි දැන ගනියි. ද්වේෂය පහවූ සිත **වීතදෝස සිත** යයි දැන ගනියි. මොහ සහිත සිත **සමෝහ සිත** යැයි දැන ගනියි, මෝහය පහවූ සිත **වීතමෝහ සිත** යැයි දැන ගනියි. ථිනමිද්ධය හේතුවෙන්

හැකුලුනු සිත **සංඛිත්ත සිත** යැයි දැන ගනියි, උද්ධච්චයෙන් විසිරුණු සිත **විසිරුණු සිත** යැයි දැන ගනියි. රූපාරූප සිත් සත් විස්ස **මහග්ගත සිත** යැයි දැන ගනියි. රූපාරූප නොවන සිත් දෙසැට **අමහග්ගත සිත** යැයි දැන ගනියි. ලෞකික සිත් අසූ එක **ස උත්තර සිත** යැයි දැන ගනියි. ලෝකෝත්තර සිත් අට **අනුත්තර සිත** යැයි දැන ගනියි. උපචාර අපර්ණා සමාධීන්ට පැමිණි සිත **සමාහිත සිත** යැයි දනියි, සමාධි ගත නොවූ සිත **අසමාහිත සිත** යැයි දැන ගනියි, තදංග විෂ්කම්භන සමුච්ඡේද වශයෙන් ක්ලෙශයෙන්ගෙන් මිදුණු සිත, **විමුත්ත සිත** යැයි දැන ගනියි. එලෙස කෙලෙසුන්ගෙන් නො මිදුණු සිත **අවිමුත්ත සිත** යැයි දැන ගනියි.

මහරජ, සැරසෙනු කැමති ස්ත්‍රියක් හෝ පුරුෂයෙකු හෝ ළදරුවෙකු හෝ තරුණයෙකු හෝ පිරිසිදු, නොකිලිටි කැඩපතෙකින් හෝ පිරිසිදු දිය භාජනයකින් තමාගේ මුහුණෙහි ශොභාව පරීක්‍ෂා කර බලා තල කැළැල් ආදී දෙස් ඇති තැන් දැක මේ තැන්හි කැළැල් ඇත්තේ යැයි ද, එසේ කැළැල් ආදී දෙස් නැති තැන්හි කැළැල් රහිත යැයි ද දැන ගනියි.

මහරජ, එසේම භික්‍ෂුව අභිඥවට සුදුසු වූ එකග වූ සිතින් පරසිත් දැනගන්නා ඥනය පිණිස සිත යොදා අන්‍ය සත්වයන්ගේ, අන්‍ය පුද්ගලයන්ගේ සරාගාදී වූ සිත් (තමන්ගේ) සිතින් දැන ගනියි.

මහරජ, මෙලෙස චේතෝපරිය ඥනයට පැමිණ විසීම ද, මේ ආත්මයෙහි දී දැක්ක යුතු විපාක ඵලයකි. මෙය ඉහත කී මේ ආත්මභාවයෙහි දැකිය යුතු විපාක ඵලයන්ට වඩා අතිශයින් මනොඥ ද, ශ්‍රේෂ්ඨ ද වෙයි.

## ❄ පුබ්බේනිවාස ඤාණ ලාභය

මහරජ, නැවත එම භික්‍ෂුව පෙර විසූ ආත්මභාවයන් දක්නා නුවණ ලැබීම පිණිස සිත මෙහෙයවයි.

මහරජ, භික්ෂුව දස කසිණයන්ගෙන් යමකින් අභිඥා පාදක චතුර්ථධ්‍යානයට සමවැදී ඒයින් නැගී සිට පෙර ජාති සිහි කිරීමේ ඥානය පිණිස සිත යොදයි. එම භික්ෂුව එක් ජාතියක් ද, ජාති දෙකක් ද, ජාති තුනක් ද, ජාති සතරක් ද, ජාති පසක් ද, ජාති දසයක් ද, ජාති විස්සක් ද, ජාති තිසක් ද, ජාති සතළිසක් ද, ජාති පණසක් ද, ජාති සියයක් ද, ජාති දහසක් ද, ජාති ලක්ෂයක් ද, නොයෙක් විනාශ වෙමින් පවතින කල්පයන් ද, නොයෙක් හැදෙමින් පවතින කල්පයන් ද, නොයෙක් විනාශ වන, හැදෙන කල්පයන් ද සිහි කරයි.

එකල්හි මම මෙසේ වූ නමක් ඇතිව මෙසේ වූ ගෝත්‍ර ඇතිව විසුවෙමි. මෙනම් ශරීර වර්ණය ඇත්තෙක් වීමි. මෙබඳු වූ ආහාර පාන ඇත්තෙක් වීමි. මෙබඳු වූ සැප දුක් වින්දෙමි. මෙබඳු ආයුෂ කෙළවර කොට ඇත්තෙම් වීමි. ඒ මම එයින් ච්‍යුතව අසවල් තැන උපන්නෙමි. එහිදී ද මෙබඳු නමක් ඇතිව, මෙබඳු ගෝත්‍ර ඇතිව, මෙබඳු පැහැ ඇතිව, මෙබඳු ආහාර පාන ඇතිව, මෙබඳු සුව දුක් ඇතිව, මෙබඳු ආයුෂ කෙළවර කොට විසුවෙමි. ඒ මම එයින් ච්‍යුතව මෙහි උපන්නෙමි යැයි මෙසේ අනේක විධ වූ පෙර විසූ ස්කන්ධ පරම්පරාව සිහි කරයි. මෙනම් ක්ෂත්‍රිය වංශයෙහි හෝ බ්‍රාහ්මණ වංශයෙහි මෙනම් වර්ණාදියෙන් යුක්ත වීමි යනාදී ආකාර වශයෙන් ද, මෙනම් නම් ඇතිව මෙනම් ගෝත්‍ර ඇතිව විසුවෙමි යනාදී උද්දේස වශයෙන් ද නා නා විධ වූ පෙර විසූ ස්කන්ධ පරම්පරාව සිහි කරයි.

මහරජ, පුරුෂයෙකු තමන් වසන ගමින් අන් ගමකට යන්නේ ද, ඒ ගමිනුත් අන් ගමකට යන්නේ ද, ඒ ගමිනුත් තමන් වසන ගමට ආපසු එන්නේ ද, ඔහුට මම, සිය ගමින් අසවල් ගමට ගියෙමි, එහි මෙසේ සිටියෙමි, මෙසේ හුන්නෙමි, මෙසේ කථා කෙළෙමි, මෙසේ නිශ්ශබ්ද වීමි. ඒ ගමින් ද අසවල් ගමට ගියෙමි, එහි ද මෙසේ සිටියෙමි. මෙසේ හුන්නෙමි, මෙසේ කථා කෙළෙමි, මෙසේ නිශ්ශබ්ද වීමි. ඒ මම ඒ ගමින් සිය ගමට ආපසු පැමිණියෙමි යැයි හෙතෙම දන්නේ ය.

මහරජ, එපරිද්දෙන් ම භික්ෂුව සිත එකග වූ කල්හි, අභිඥා කර්මයට යෝග්‍ය වූ කල්හි පෙර ජාති සිහි කිරීමේ ඥානය පිණිස සිත යොද නොයෙක් පෙර විසීම් සිහි කෙරෙයි. මෙනම් ක්ෂත්‍රිය වංශයෙහි හෝ බ්‍රාහ්මණ වංශයෙහි මෙනම් වර්ණාදියෙන් යුක්ත වීමි යනාදී ආකාර

වශයෙන් ද, මෙනම් නම් ඇතිව මෙනම් ගෝත්‍ර ඇතිව විසුවෙමි යනාදී උද්දේස වශයෙන් ද, නා නා විධ වූ පෙර විසූ ස්කන්ධ පරම්පරාව සිහි කරයි.

මහරජ, මෙලෙස චේතෝපරිය ඥානයට පැමිණ විසීම ද, මේ ආත්මයෙහි දී දැක්ක යුතු විපාක ඵලයකි. මෙය ඉහත කී මේ ආත්මභාවයෙහි දැකිය යුතු විපාක ඵලයන්ට වඩා අතිශයින් මනොඥ ද, ශ්‍රේෂ්ඨ ද වෙයි.

## ❄ දිබ්බචක්ඛු ඤාණ ලාභය

මහරජ, නැවත එම භික්ෂුව සත්වයන්ගේ ච්‍යුති උත්පත්ති දක්නා නුවණ ලැබීම පිණිස සිත මෙහෙයවයි.

මහරජ, භික්ෂුව දස කසිණයන්ගෙන් යමකින් අභිඥා පාදක චතුර්ථධ්‍යානයට සමවැදී අභිඥා කර්මයට යෝග්‍ය කල්හි ඒයින් නැගී සිට ච්‍යුත වන්නා වූ ද, උපදින්නා වූ ද සත්ත්වයන් දැනගන්නා නුවණ ලැබීම පිණිස සිත යොමු කර පිරිසුදු වූ මිනිසුන්ගේ ඇසට පෙනෙන සීමාව ඉක්මවා සිටියා වූ මිනිස් ඇසට නොපෙනෙන ඉතා සියුම් වූ රූපාදිය දැකීමට සමත් දිව්‍යමය ප්‍රසාද චක්ෂුසයෙන් (දෙවියන්ගේ ඇසෙන්) බලන්නාක් මෙන් සියුම් රූපාදිය දැකීමට සමත් දිව්‍යචක්ෂු අභිඥා නුවණින් ච්‍යුතවන්නා වූ ද, උපදින්නා වූ ද, හීන වූ ද, ප්‍රණීත වූ ද, යහපත් වර්ණ ඇත්තා වූ ද, අයහපත් වර්ණ ඇත්තා වූ ද සත්වයන් දකියි. කර්මානුකූලව උපදින්නා වූ සත්වයන් දැන ගනියි. කෙසේ ද?

අසවල් සත්වයෝ ඒකාන්තයෙන් කාය දුශ්චරිතයෙන් යුක්ත වූවාහු ය. වාක්දුශ්චරිතයෙන් යුක්ත වූවාහු ය. මනො දුශ්චරිතයෙන් යුක්ත වූවාහු ය. ආර්‍යයන්ට ගර්හා කළාහුය. මිථ්‍යාදෘෂ්ටි ගත්තාහුය. මිථ්‍යාදෘෂ්ටි කර්ම සමාදන් වූවාහුය. ඔවුහු කය බිඳීමෙන් මරණින් පසු සැපයෙන් පහ වූ දුක්ම උරුමව වැටෙන්නා වූ නපුරු ගති ඇත්තා වූ නිරයෙහි උපන්නාහුය.

අසවල් සත්වයෝ කාය සුචරිතයෙන් යුක්ත වූවාහු ය. වාක් සුචරිතයෙන් යුක්ත වූවාහු ය. මනො සුචරිතයෙන් යුක්ත වූවාහු ය. ආර්‍ය්‍යයන්ට නින්ද නොකළාහු ය. සම්‍යක් දෘෂ්ටි ඇත්තාහු ය. සම්‍යක් දෘෂ්ටි කර්ම සමාදන් වූවාහු ය. ඔවුහු කය බිඳීමෙන් මරණින් පසු යහපත් ගති ඇත්තා වූ ස්වර්ග ලොකයෙහි උපන්නාහුය යැයි, මෙසේ මිනිසත් බව ඉක්ම වූ පිරිසිදු වූ දිව්‍ය චක්ෂුසින් ච්‍යුතවන්නා වූ ද, උපදින්නා වූ ද හීන වූ ද, ප්‍රණීත වූ ද, යහපත් වර්ණ ඇත්තා වූ ද, අයහපත් වර්ණ ඇත්තා වූ ද, කර්මානුකූලව ඒ ඒ භවයෙහි ඉපදීමට එළඹ සිටින්නා වූ සත්වයන් දකියි.

මහරජ, සතර මං සන්දියක පිහිටි මහල් සහිත ගෙයක උඩුමහලෙහි සිටින ඇස් ඇති පුරුෂයෙකු ඒ ගෙට ඇතුල් වන්නා වූ ද, ගෙන් නික්මෙන්නා වූ ද, වීථියෙහි හැසිරෙන්නා වූ ද, සිවුමං හන්දිය මැද හිඳින්නා වූ ද මනුෂ්‍යයන් දක්නේ වේ ද, එසේ දක්නා ඔහුට මේ මනුෂ්‍යයෝ ගෙට ඇතුළු වෙති, මොවුහු ගෙන් නික්මෙති, මොවුහු වීථියෙහි හැසිරෙති, මොවුහු සිවුමං හන්දියෙහි හිඳිති යැයි දැක ගනී.

මහරජ, එලෙස ම භික්ෂුව සිත එකඟ වූ කල්හි, අභිඥා කර්මයට යෝග්‍ය කල්හි ඒයින් නැගී සිට ච්‍යුත වන්නා වූ ද, උපදින්නා වූ ද සත්ත්වයන් දැනගන්නා නුවණ ලැබීම පිණිස සිත යොමු කර පිරිසුදු වූ මිනිසුන්ගේ ඇසට පෙනෙන සීමාව ඉක්මවා සිටියා වූ, මිනිස් ඇසට නො පෙනෙන්නා වූ, ඉතා සියුම් වූ රූපාදිය දැකීමට සමත් දිව්‍යමය ප්‍රසාද චක්ෂුසයෙන් (දෙවියන්ගේ ඇසෙන්) බලන්නාක් මෙන් සියුම් රූපාදිය දැකීමට සමත් දිව්‍යචක්ෂු අභිඥා නුවණින් ච්‍යුත වන්නා වූ ද, උපදින්නා වූ ද, හීන වූ ද, ප්‍රණීත වූ ද, යහපත් වර්ණ ඇත්තා වූ ද, අයහපත් වර්ණ ඇත්තා වූ ද සත්වයන් දකියි. කර්මානුකූලව උපදින්නා වූ සත්වයන් දැක ගනියි.

මහරජ, මෙලෙස චුතුපපාත ඥානයට පැමිණ විසීම ද, මේ ආත්මයෙහි දී දැක්ක යුතු විපාක ඵලයකි. මෙය ඉහත කී මේ ආත්මභාවයෙහි දැකිය යුතු විපාක ඵලයන්ට වඩා අතිශයින් මනොඥ ද, ශ්‍රේෂ්ඨ ද වෙයි.

# ❄ ආශ්‍රවක්ෂය ඤාණ ප්‍රතිලාභය

මහරජ, නැවත එම භික්‍ෂුව දස කසිණයන්ගෙන් යමකින් විදර්ශනා පාදක චතුර්ථධ්‍යානයට සමවැදී ඒයින් නැගී සිට ආශ්‍රවයන් ක්‍ෂය කිරීමේ ඥානය ලැබීම පිණිස විදර්ශනා චිත්තය යොදයි.

එම භික්‍ෂුව ඉපදීම ද දුකකි. ජරාව ද දුකකි. මරණය ද දුකකි. සොකය ද, හැඬීම ද, වැලපීම ද, කායික දුක ද, මානසික දුක ද, සොකාදිය හේතුවෙන් ඇතිවෙන දැඩි වෙහෙස ද යන මේ සියල්ල ම දුක්ය. අප්‍රියයන් සමග එක්වීම ද දුකකි. ප්‍රියයන්ගෙන් වෙන් වීම ද දුකකි. යමක් කැමති නම් එය නොලැබීම ද දුකකි. සැකෙවින් රූප උපාදනස්කන්ධය, වේදනා උපාදනස්කන්ධය සංඥා උපාදනස්කන්ධය, සංඛාර උපාදනස්කන්ධය, විඤ්ඤාණ උපාදනස්කන්ධය යන උපාදනස්කන්ධ පසම දුක්මය. මේ සියල්ල "**පීඩන, සංඛත, සන්තාප, විපරිණාම**" ලක්‍ෂණයන්ගෙන් යුක්ත බැවින් ඒකාන්තයෙන් දුක් ම යැයි තතු ලෙස දැන ගනී. මෙයින් මතු අන්‍ය දුකක් නැතැයි දැන ගනී.

නැවත ඉපදීම ඇති කරන්නා වූ **නන්දිය** යැයි කියන ලද රාගයෙන් යුත් ඒ ඒ තැන ඇලෙන්නා වූ යම් මේ තෘෂ්ණාවක් වේ ද, ඒ කාම තණ්හාව ද, භව තණ්හාව ද, විභව තණ්හාව ද යන තුනට අයත් ය. මේ දුක් ඉපදීමේ හෙතුව "**ආයූහන, නිදන, සංයොග, පළිබොධ**" ලක්‍ෂණයන්ගෙන් යුක්ත බව ද තතු ලෙස දැන ගනී. මෙයින් මතු දුක් හට ගැනීමට හේතුවන වෙනත් හේතු නැත යැයි දැන ගනී.

ඒ දුක් උපදවන තෘෂ්ණාවගේම යම් සම්පූර්ණයෙන් වෙන් වීමක්, නිරුද්ධ කිරීමක්, අත්හැරීමක්, දුරුකිරීක්, මිදීමක්, ආලය හැරීමක් ඇත්තේ ද, ඒ මේ තෘෂ්ණාව ගේ නිරවශේෂ නිරෝධයෙන් ලබන නිර්වාණය දුක් නැති කිරීම **නිස්සරණ, විවේක, අසංඛත, අමත** ලක්‍ෂණයන්ගෙන් යුක්ත යයි තතු ලෙස දැන ගනී. මේ නිවන තෘෂ්ණාව ගේ අභාවයෙන් ම සිද්ධ යැයි තතු සේ දැන ගනී.

ඒ දුක්ඛ නිරෝධගාමිනී ප්‍රතිපදව මේ ආර්‍ය්‍ය අෂ්ටාංගික මාර්ගයම වෙයි. ඒ කවරේද? සම්‍යක් දෘෂ්ටිය, සම්‍යක් සංකල්පනාව, සම්‍යක් වචනය, සම්‍යක් කර්මාන්තය, සම්‍යක් ආජීවය, සම්‍යක් ව්‍යායාමය, සම්‍යක් සතිය, සම්‍යක් සමාධිය යන මේ අටය. මේ දුක් නැති කිරීමේ

මාර්ගය "**නීයාන හේතු දස්සන අධිපති**" ලක්ෂණයන්ගෙන් යුක්ත යැයි තතු ලෙස දැන ගනී. මෙය වනාහී මේ දුක් නැසීමට ඇති එකම ප්‍රතිපදාව වෙයි. මෙයින් මතු වෙනත් මාර්ගයක් නැත යැයි තතු ලෙස දැන ගනී.

සෝවාන් මාර්ග චිත්තයට පෙරටුව උපදින ගෝත්‍රභූ චිත්තය දක්වා ද, කාම රූප අරූප තුන් භවයෙහි ම පැවැත්ම වන හෙයින් ද, සිහිය නමැති අගුල නොදමන තාක් ඇස - කන - නාසය ආදී දොරටුවලින් සිදුරු වූ කලයකින් වැගිරෙන ජලයක් මෙන් ද, ව්‍රණ මුඛයකින් වැගිරෙන ලේ සැරව මෙන් ද, සසර දුක් වැඩි කරවන හෙයින් ද, සුරා පානය කළ තැනැත්තා ප්‍රකෘති ස්වභාවයෙන් වෙන් ව උමතු වූවන් මෙන් සියලු දුසිරිත්හි හැසිරෙත් ද, එලෙස ම "**කාම, භව, දිට්ඨි, අවිද්‍යා**" යන සතර ධර්මයෝ සත්වයා මත් කරවන හෙයින් ද, සසර දුකට කාරනා වන හෙයින් ද "**ආශ්‍රවයෝ**" යැයි දැන ගනී.

මෙසේ දක්නා එම භික්ෂුවගේ සිත අර්හත් මාර්ගක්ෂණයෙහි එම ආශ්‍රවයන්ගෙන් මිදෙයි. එලෙස සිත ආශ්‍රවයන්ගෙන් මිදුණු කල්හි අර්හත් ඵලයට පැමිණීම වේ. ඉන් පසු ප්‍රත්‍යවේක්ෂා ඥානයන්ගෙන් **මාර්ග ප්‍රත්‍යවේක්ෂාව ද, ඵල ප්‍රත්‍යවේක්ෂාව ද, නිර්වාණ ප්‍රත්‍යවේක්ෂාව ද, ප්‍රහීණ ක්ලේශ ප්‍රත්‍යවේක්ෂාව** ද සිදු කොට නැවත ප්‍රහීණ කිරීමට කෙලෙස් ඉතුරුව නැත යැයි ප්‍රත්‍යක්ෂ වශයෙන් ම දැන ගනී. නැවත භවයෙහි ඉපදීම පිණිස අවිද්‍යා තෘෂ්ණා ආදී කෙලෙසුන් නැති බැවින් ඉපැත්ම ක්ෂය වූයේය යැයි දැන ගනී.

කල්‍යාණ පෘථග්ජනයෝ ද, සෝවාන් මාර්ගයෙහි පටන් අර්හත් මාර්ගය දක්වා වූ ආර්යයෝ ද, බ්‍රහ්මචර්යාවෙහි හැසිරෙන උතුමෝ වෙති. අර්හත් මාර්ගය ලැබූ උතුමෝ බ්‍රහ්මචර්යාවෙහි හැසිරීම නිම කළ උතුමෝ වෙති. එබැවින් අර්හත් ඵලය ලැබූ එම භික්ෂුව බ්‍රහ්මචර්යාව නිමවන ලදි යැයි නුවණින් දැන ගනී.

එලෙස සෝවාන් මාර්ගයෙන් **සක්කාය දිට්ඨි, විචිකිච්ඡා, සීලබ්බත පරාමාස හා අපායගාමී කාම රාග, පටිඝ** යන සංයෝජනයන් ද, **දිට්ඨි විචිකිච්ඡා ක්ලේශයන්** ද, **දිට්ඨි, මුසාවාද, මිච්ඡා කම්මන්ත, මිච්ඡා ආජීව** යන මිච්ඡත්තයන් ද ප්‍රහීණ කරන ලද්දේය යැයි දැන ගනී.

සකෘදගාමී මාර්ගයෙන් **ඖදාරික කාම රාග, පටිඝ සංයෝජනයන්** ප්‍රහීණ කරන ලද්දේය යැයි දැන ගනී.

අනාගාමී මාර්ගයෙන් කාම රාග පටිඝ සංයෝජනයන් ද, ක්ලේශ වශයෙන් ද්වේෂය ද, මිච්ඡා සංකප්ප, පිසුණාවාචා, ඵරුසාවාචා, මිච්ඡත්තයන් ද, අලාභ, අයස, නින්ද, දුක්ඛ යන ලෝක ධර්මයන් ද ප්‍රහීණ කරන ලද්දේය යැයි දැන ගනී.

අර්හත් මාර්ග ඥානයෙන් රූප රාග, අරූප රාග, මාන, උද්දච්ච, අවිද්‍යා යන සංයෝජනයන් ද, ලෝභ, මෝහ, මාන, ථීන, අහිරික අනොත්තප්ප, උද්දච්ච යන ක්ලේශයන් ද, සම්ඵප්පලාප, මිච්ඡා වායාම, මිච්ඡා සති, මිච්ඡා සමාධි, මිච්ඡා විමුත්ති, මිච්ඡා ඥාන යන මිච්ඡත්තයන් ද, ලාභ, යසස, ප්‍රශංසා, සුඛ යන ලෝක ධර්මයන් ද ප්‍රහීණ කරන ලද්දේය යැයි දැන ගනී. මෙලෙස දුක් ඉපදීමට හේතුවන කෙලෙස් මුල් සම්පූර්ණයෙන්ම සිඳ දමන ලද්දේය යැයි දැන ගනී.

දැන් චතුරාර්‍ය්‍ය සත්‍යයන් පිළිබඳව සෝවාන් ආදී සිව් මගින් කළ යුතු සොළොස් වැදෑරුම් කෘත්‍යයන් නිමවන ලදි. නැවත ඒ සඳහා කෙලෙස් ක්‍ෂය කිරීම පිණිස භාවනා වැඩීමේ කෘත්‍යයක් මට නැත. දැන් පවතින වර්තමාන ස්කන්ධ සන්තානයෙන් අන්‍ය වූ ස්කන්ධ සන්තානයක් මට නැත. මේ පඤ්චස්කන්ධය මුල් සිඳ ලූ රුකක් මෙන් වේ. ඒවා ද අවසන් චිත්ත නිරෝධයෙන් ඉන්දන නැති ගින්නක් මෙන් නිවීමට යන්නේ ය. නමක් නැති බවට යන්නේ ය යැයි දැන ගනී.

මහරජ, පර්වත මුදුනක පිහිටි පිරිසිදු වූ නොකැළඹුනු දිය විලක් වේ ද, එහි ඉවුරේ ඇස් ඇති පුරුෂයෙකු සිටින්නේ, විල තුළ හැසිරෙන්නා වූ ද, නැවතී සිටින්නා වූ ද, සිප්පි බෙල්ලන් හා සක්බෙල්ලන් ද, බොරළු කැට ද, එහා මෙහා යන්නා වූ මත්‍ස්‍ය සමූහයා ද දක්නේ වේ ද, ඔහුට මේ දිය විල පිරිසිදු ය. නොකැළඹුනේය. එහි මේ සිප්පි බෙල්ලන් ද, සක් බෙල්ලන් ද, කැටකැබලිති ද, මත්ස්‍ය සමූහයා ද හැසිරෙන්නෝත් සිටින්නෝත් වෙයි යැයි මෙසේ සිතෙන්නේ ය.

මහරජ, එලෙසින් ම භික්‍ෂුව මෙලෙස දස කසිණයන්ගෙන් යමකින් විදර්ශනා පාදක චතුර්ථධ්‍යානයට සමවැදී ඒයින් නැගී සිට ආශ්‍රවයන් ක්‍ෂය කිරීමේ ඥානය ලැබීම පිණිස විදර්ශනා චිත්තය යොදයි.

එම භික්ෂුව මේ **දුකය** යැයි තතු ලෙස දැන ගනී, මේ **දුක් ඉපදීමේ හෙතුව** යැයි තතු ලෙස දැන ගනී, මේ **දුක් නැති කිරීම** යැයි තතු ලෙස දැන ගනී, මේ **දුක් නැති කිරීමේ මාර්ගය** යැයි තතු ලෙස දැන ගනී. මේ **කෙලෙස්** යැයි තතු ලෙස දැන ගනී, මේ **කෙලෙස් වැඩීමේ හේතු** යැයි තතු ලෙස දැන ගනී, මේ **කෙලෙස් නැති කිරීම** යැයි තතු ලෙස දැන ගනී, මේ **කෙලෙස් නැති කිරීමේ මාර්ගය** යැයි තතු ලෙස දැන ගනී. මෙසේ දන්නා ඔහුගේ සිත කාමාදී ආශාවන් කෙරෙන්ද මිදෙයි. මිදුණු කල්හි මිදුණේ ය යැයි දැන ගනී. නැවත භවයෙහි ඉපදීමට කාරනා නැතිවිය, මාර්ග බ්‍රහ්මචර්යාව වඩා නිමවන ලදි. චතුරාර්ය සත්‍ය ධර්මයන්හි සෝවාන් ආදී සිව් මගින් කළ යුතු සොළොස් වැදෑරුම් කෘත්‍යයන් කොට නිමවන ලදි. නැවත ක්ලේශ ප්‍රහාණය පිණිස කළ යුතු අන් කිසිවක් නැත යැයි දැන ගනී.

මහරජ, මෙලෙස ආශ්‍රවක්ෂය ඥානයට පැමිණ විසීම ද, මේ ආත්මයෙහි දී දැක්ක යුතු විපාක ඵලයකි. මෙය ඉහත කී මේ ආත්මභාවයෙහි දැකිය යුතු විපාක ඵලයන්ට වඩා අතිශයින් මනොඥ ද, ශ්‍රේෂ්ඨ ද වෙයි.

මහරජ, මේ ආත්මභාවයෙහි භික්ෂූන් වහන්සේලා විසින් ලැබිය යුතු මේ ඵලය හැර මෙයට වඩා ප්‍රිය වූ ද, උතුම් වූ ද, ශ්‍රේෂ්ඨ වූ ද සාන්දෘෂ්ටික සාමඤ්ඤ ඵලයක් වෙන නැත, යැයි භාග්‍යවතුන් වහන්සේ අර්හත්වය කුළු ගන්වමින් දේශනාව නිමවා වදාළ සේක.

## ❈ අජාසත් රජතුමා උපාසකත්වය ප්‍රතිඥා කිරීම

භාග්‍යවතුන් වහන්සේ මෙසේ සාමඤ්ඤ ඵලයන් වදළ කල්හි අජාසත් රජතුමා ඒ ඒ තැන දී සාධුකාර පවත්වමින් දේශනාව මුල, මැද, අග සකස් කොට අසා "**මම මේ ප්‍රශ්නය බොහෝ ශ්‍රමණ බ්‍රාහ්මණයන්ගෙන් බොහෝ කාලයක් ඇසුවේ නමුත් දහයියා කොටන්නාක් මෙන් කිසි හරයක් නොලැබුවෙමි. භාග්‍යවතුන් වහන්සේගේ ගුණ සම්පදාව පුදුමය. පහන් දහසක් දල්වන්නාක් මෙන් මේ ප්‍රශ්න විසඳූ සේක. දසබලධාරින් වහන්සේගේ ගුණානුභාවය**

**නොදන බොහෝ කලක් වඤ්චා කරනු ලැබීමි"** යැයි සිතා බුද්ධ ගුණ අනුස්මරණයෙන් පස්වනක් ප්‍රීතියෙන් පිනාගිය ශරීරයෙන් යුක්තව තම ප්‍රසාදය හෙලි කරමින් උපාසකත්වය ප්‍රතිඥා කරමින් භාග්‍යවතුන් වහන්සේට මෙසේ කීවේය.

**"අභික්කන්තං, භන්තෙ, අභික්කන්තං, භන්තෙ. සෙය්‍යථාපි, භන්තෙ, නික්කුජ්ජිතං වා උක්කුජ්ජෙය්‍ය, පටිච්ඡන්නං වා විවරෙය්‍ය, මූළ්හස්ස වා මග්ගං ආචික්ඛෙය්‍ය, අන්ධකාරෙ වා තෙලපජ්ජොතං ධාරෙය්‍ය 'චක්ඛුමන්තො රූපානි දක්ඛින්තී'ති; එවමෙවං, භන්තෙ, භගවතා අනෙකපරියායෙන ධම්මො පකාසිතො. එසාහං, භන්තෙ, භගවන්තං සරණං ගච්ඡාමි ධම්මඤ්ච භික්ඛුසඞ්ඝඤ්ච. උපාසකං මං භගවා ධාරෙතු අජ්ජතග්ගෙ පාණුපෙතං සරණං ගතන්ති".**

"ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස ,ඉතා යහපත්ය, ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස ,ඉතා යහපත්ය යැයි ප්‍රශංසා කළේ ය. මෙහි **"අභික්කන්තං"** යන්නෙන් ඉතා කදිමයි, ඉතා ඉෂ්ටයි, ඉතා මනාපයි, ඉතා සුන්දරයි යනුවෙන් අර්ථ සතරක යෙදෙයි. **"අභික්කන්තං භන්තෙ"** යනුවෙන් දෙවතාවක් කීමෙන් "භාග්‍යවතුන් වහන්සේ ඉතා කදිමයි, භාග්‍යවතුන් වහන්සෙගේ ධර්ම දේශනාව ඉතා කදිමයි. එබැවින් භාග්‍යවතුන් වහන්සේට මගේ පැහැදීම වේ. භාග්‍යවතුන් වහන්සේගේ ධර්ම දේශනාවට පිවිසීමෙන් මගේ පැහැදීම වේ යැයි කරුණු දෙකක් දෙකක් සඳහා ප්‍රශංසා කරයි.

භාග්‍යවතුන් වහන්ස ධර්ම දේශනාව ශ්‍රද්ධාව ඇති කරන හෙයින් ද, ප්‍රඥාව ඇති කරන හෙයින් ද, ආහාර පාන ස්ත්‍රී පුරුෂ ආදීන්ගේ වර්ණනා ආශ්‍රිත දේශනා හැර සතර සතිපට්ඨාන, සතර ඍද්ධිපාද ආදී අර්ථ ඇති බැවින් ද, දසවිධ ව්‍යඤ්ජන සම්පත්තියෙන් යුක්ත වූ පැහැදිලි පද බෙදුම් ආදියෙන් යුක්ත බැවින් ද, ගැඹුරු අර්ථ ඇති බැවින් ද, ඇසීමට ප්‍රිය වූ සිනිඳු මෘදු මධුර ස්වරය කනට සුවදයක බැවින් ද, විපුල විශුද්ධ ප්‍රිය කරු අර්ථයන්ගෙන් හෘදයාංගම බැවින් ද, එම දේශනාව මාන අති මාන ආදියෙන් තමන් උසස් නොකරන බැවින් ද, අනුන් මැඩ පැවැත්වීම් ආදියෙන් පහත් නොකරන බැවින් ද, අනුන්ට අවමන් නොකරන බැවින් ද, යහපත් අදහස් පැවසීමෙන් ද - අන්‍යයන්ගේ රාග ගිනි ආදිය නැති කිරීමෙන් ද, කරුණාවෙන් සිසිල් වූ බැවින් ද, කෙලෙස්

අඳුර නැසීමෙන් ප්‍රඥාවෙන් පිරිසිදු වූ බැවින් ද, කෝකිල නාදය සේ මධුර නාද ඇති බැවින් රමණීය බැවින් ද, පූර්වාපර කරුණු අතර අන්‍යෝන්‍ය විරුද්ධ බවක් නැතිව සුවිශුද්ධතාවයෙන් යුක්තව කෙලෙස් මර්ධනයෙහි දක්ෂ වූ බැවින් ද, දකීමට යොමුවන රමණීය භාවය හේතුවෙන් ඇසීම සුවදයක වන බැවින් ද, අහිත දේ ඉවත් කරවීමට ද හිත අදහස් ආදිය පවත්වා ගැනීමට ද ධර්මය ඇසීම සුව ඇති කරවන බැවින් ද, විමසීමට යහපත් බැවින් ද, සංසාර චක්‍රයේ ගමන නැවතීමෙන් ද, සද්ධර්ම චක්‍රය පැවැත්වීමෙන් ද, මිථ්‍යා මතවාද නැසීමෙන් ද, සම්‍යක් මතවාද පිහිටුවීමෙන් ද, අකුසල් මුල් උදුරා දැමීමෙන් ද, කුසල මුල් රෝපණය කිරීමෙන් ද, අපාය දොර වැසීමෙන් ද, ස්වර්ග මාර්ගයෙහි දොර විවෘත කිරීමෙන් ද, මතු වන කෙලෙස් සමනය කිරීමෙන් ද, යටපත් වී පවත්නා කෙලෙස් උදුරා දැමීමෙන් ද, බොහෝ උපකාර ඇති බැවින් දේශනාව ඉතා යහපති යයි ප්‍රශංසා කළේ ය.

නැවත ද "**නික්කුජ්ජිතං වා උක්කුජ්ජෙය්‍ය, පටිච්ඡන්නං වා විවරෙය්‍ය, මූළ්හස්ස වා මග්ගං ආචික්ඛෙය්‍ය, අන්ධකාරෙ වා තෙලපජ්ජෝතං ධාරෙය්‍ය චක්ඛුමන්තො රූපානි දක්ඛින්ති**" යනුවෙන් උපමා සතරකින් දේශනාවට ස්තුති කෙළේය. එහි

"**නික්කුජ්ජිතං වා උක්කුජ්ජෙය්‍ය**" යනුවෙන් මුව යටිකුරු කොට තබන ලද්දක් උඩුකුරු කරන්නේ යම් සේ ද, සද්ධර්මයට පිටු පා අසද්ධර්මයෙහි යෙදී සිටි මා භාග්‍යවතුන් වහන්සේ ධර්ම දේශනා කොට ඒ අසද්ධර්මයෙන් නැගිටුවාලූ සේක යැයි ප්‍රශංසා කළේ ය.

"**පටිච්ඡන්නං වා විවරෙය්‍ය**" යනුවෙන් තෘණ පිදුරු ආදියකින් වසා තැබූවක් ඒ වැසුම් හැර පෙන්වන්නාක් මෙන් භාග්‍යවතුන් වහන්සේ පෙර කාශ්‍යප දසබලධාරින් වහන්සේගේ ශාසන අන්තර්ධානයෙහි පටන් මිත්‍යාදෘෂ්ටි ග්‍රහණයෙන් වැසී ගිය ධර්ම - විනය නම් වූ ශාසනය විවෘත කළ සේක යැයි ප්‍රශංසා කළේ ය.

"**මූළ්හස්ස වා මග්ගං ආචික්ඛෙය්‍ය**" යනුවෙන් යම් සේ දිශාවන් සොයා ගත නොහැකි ලෙස මාර්ගය වැරදී මුලා වූවෙකුට මාර්ගය කියා දී උපකාර කරන්නේ යම්සේ ද, එසේම වැරදි මාර්ගයට මිථ්‍යා මාර්ගයට

බැස සිටි මට භාග්‍යවතුන් වහන්සේ සුගතියට නිවනට යන මාර්ගය කියා දුන් සේක යැයි ප්‍රශංසා කළේ ය.

**"අන්ධකාරෙ වා තෙලපජ්ජෝතං ධාරෙය්‍ය චක්ඛුමන්තො රූපානි දක්ඛින්ති"** යනුවෙන් ඇස් ඇත්තෝ රූප දකිත්වා යැයි අඳුරෙහි තෙල් පහනක් ධරන්නේ යම් සේ ද, එසේම භාග්‍යවතුන් වහන්සේ මෝහ අන්ධකාරයෙන් මුලා වී බුද්ධාදී රත්න ස්වරූපයන් නොදක සිටියා වූ මට ඒ මෝහාන්ධකාරය නසන ධර්ම දේශනාව නමැති ප්‍රදීපය දැරීමෙන් මගේ නුවණැස පාදන ලද්දේය යැයි ප්‍රශංසා කළේ ය.

**"අන්ධකාරෙ"** යන මෙහි අන්ධකාරය යන්නෙන් චතුරංග සමන්වාගත අන්ධකාරය අදහස් කරන ලද්දේය. එය වනාහි අව පක්ෂයෙහි අමාවක පෝය දිනයක් විය යුතුය. එදින ම මධ්‍යම රාත්‍රියකම විය යුතුය. මහා ඝන වනාන්තරයක් මධ්‍යයෙහි ම විය යුතුය. එම මධ්‍යම රාත්‍රිය ඝන වූ කළු වැහිවළාකුලින් වැසී තිබිය යුතුය. එවිට පියවි ඇසට යමක ඡායා මාත්‍රය කුඩු නො දැකිය හැකි එම රාත්‍රිය අතිශයින් ම ඝන අඳුරක් ම වේ. මෙය **චතුරංග සමන්වාගත රාත්‍රිය** හෙවත් **අන්ධකාරය** නම් වේ.

තවද **"නික්කුජ්ජිතං වා උක්කුජ්ජෙය්‍ය"** යන්නෙන් දුක දැකීමෙන් අසුභයෙහි සුභය යැයි ගන්නා වරදවා ගැනීම දුරු කිරීම සිදු වේ. මෙය යටිකුරු කර තැබූවක් උඩුකුරු කොට පෙන්වීම හා සමානය.

**"පටිච්ඡන්නං වා විවරෙය්‍ය"** සමුදය දැකීමෙන් දුකෙහි සැපය යැයි ගන්නා වරදවාගැනීම දුරු කිරීම සිදු වේ. මෙය වසා තැබූවක් විවෘත කොට පෙන්වීම හා සමානය.

**"මූළ්හස්ස වා මග්ගං ආචික්ඛෙය්‍ය"** නිරෝධය දැකීමෙන් අනිත්‍යයෙහි නිත්‍යය යැයි ගන්නා වරදවාගැනීම දුරු කිරීම සිදු වේ. මෙය මං මුළා වූවෙකුට පාර කියා දීම හා සමානය.

**"අන්ධකාරෙ වා තෙලපජ්ජෝතං ධාරෙය්‍ය චක්ඛුමන්තො රූපානි දක්ඛින්ති"** මාර්ගය දැකීමෙන් අනාත්මයෙහි ආත්මය යැයි ගන්නා

වරදවා ගැනීම දුරු කිරීම සිදු වේ. මෙය ඇස් ඇත්තෝ රූප දකිත්වා යැයි අඳුරෙහි තෙල් පහනක් දැරීම හා සමානය.

භාග්‍යවතුන් වහන්සේ නොයෙක් ක්‍රමයෙන් ධර්මය දේශනා කළ සේක යැයි ප්‍රශංසා කළේ ය. ඒ ධර්මය ඇසූ හේතුවෙන් මාගේ ශ්‍රද්ධාව දියුණු වීමෙන් තපස ද, කය වචනය සංවර වීමෙන් සීලය ද, හේතු - ඵල නුවණ ඇතිවීමෙන් ප්‍රඥාව ද, මනසෙහි අකුශල ධර්ම හට ගැනීමට ඇති බිය නම් වූ හිරියෙන් සමාධිය ද, සියලු දුක් නිවා ගැනීමට පිහිටා ගත් යෝගක්ෂේම නම් වූ නිවන ඉදිරියට පමුණුවන වීර්‍යයෙන් නිරෝධය ද යන ලෙස ආර්‍ය මාර්ගය හා නිරෝධය ප්‍රකාශ කරන ලද්දේය. එයින් මාර්ගය සමුදයට ප්‍රතිපක්ෂය. නිරෝධය දුකට ප්‍රතිපක්ෂය. මෙසේ චතුරාර්‍ය සත්‍යය නොයෙක් ක්‍රමයෙන් දේශනා කළ සේක යැයි ප්‍රශංසා කළේ ය.

මෙසේ නොයෙක් ක්‍රමයෙන් චතුරාර්‍ය සත්‍ය ප්‍රකට කරමින් වදාළ ධර්මය මම පිළිගනිමි. ඒ මම භාග්‍යවතුන් වහන්සේ සරණ යමි. නවලෝකෝත්තර ධර්මය සරණ යමි. අෂ්ටාර්‍යය පුද්ගල සංඝරත්නය සරණ යමි යැයි ප්‍රතිඥා කළේ ය.

## ❄ සරණාගමනය

බුද්ධ ධම්ම සංඝ යන ශ්‍රේෂ්ඨ රත්නත්‍රය තමාට ඇති එකම පිහිටය යැයි අදහා ගත්තවුන් පිළිබඳව මෙලොව පරලොව දෙකෙහි වන්නා වූ බිය, තැති ගැනීම, අවැඩ, රෝග භය, අපා භය, වධ, බන්ධන නසාලන්නේය යනාර්ථයෙන් "සරණ" නම් වේ. බුද්ධාදී රත්නත්‍රයම සත්වයන් හිත වැඩෙහි යොදන්නේ ය. අහිතයෙන් ගලවාලන්නේය. සියලු බිය නසන්නේ ය. සසර දුකින් මුදලන්නේ ය. රැකවරණය දෙන්නේ ය. ස්වල්ප වූ ද සත්කාරය මහත් ඵල කරන්නේ ය.

රත්නත්‍රය කෙරෙහි සිත පහදවාගෙන ගෞරව කොට පිළිගැනීමෙන් නැසූ කෙලෙස් ඇති පිරිසිදු සිතින් රත්නත්‍රය මට ඇති

එකම පිහිටය යැයි ශ්‍රද්ධාව පෙරටුකොට ගත් කර්‍ම ඵල විශ්වාසය නම් වූ සම්‍යක් දෘෂ්ටිමය වූ චේතනාව "**සරණගමනය**" නම් වේ.

මේ කියන ලද ශ්‍රද්ධා මූලික සිතින් යුක්තව රත්නත්‍රය මට ඇති එකම පිහිට යැයි අදහා ගෙන රත්නත්‍රය සේවනය කරන්නා, ඒ අනුව පිළිපදින්නා "**සරණගතයා**" නම් වේ. මේ සරණගතයාම "**උපාසකයා**" නමින්ද හඳුන්වනු ලැබේ. මෙම සරණගමනය "**ලෞකික, ලෝකෝත්තර**" වශයෙන් දෙවැදෑරුම් වේ.

## ☸ ලෝකෝත්තර සරණගමනය

දක්නා ලද ආර්‍ය්‍ය සත්‍යය ඇති ආර්‍ය්‍ය පුද්ගලයන්ගේ සෝවාන් ආදී මාර්‍ග සිත් උපදිනවාත් සමගම සරණගමනය කෙලෙසන ධර්‍මයන් මුළුමනින් ම විනාශ කොට අරමුණු වශයෙන් නිවන අරමුණු කොට කෘත්‍යය වශයෙන් රත්නත්‍රය විෂය කොට සමෘද්ධියට පැමිණෙන්නේය. සියලු දුක්ඛයන්ගේ අවසානය මේ ලෝකෝත්තර සරණ ගැනීමෙහි ආනිශංසය වේ. සෝවාන්, සකෘදගාමී, අනාගාමී, අර්හත් යන ආර්‍ය්‍ය ඵලයෝ මෙහි විපාක ඵලයෝය. මේ ලෝකෝත්තර සරණගමනය කිසිලෙසකින් කිලුටු නොවන්නේ වේ. මෙහි කිසි භේදයක් නැත. මරණයෙන් පසු හෝ අන්‍ය ශාස්තෘවරයෙකු නො අදහන්නේ ම ය. මේ ආර්‍ය්‍ය සරණ ලැබූවකුගෙන් භවාන්තරයෙහිදී හෝ ප්‍රාණඝාතාදී කිසිඳු අකුසලයක් සිදු නොවේ. එසේම තම ජීවිත හානියක් නොකරගනියි. හංසයෙකු ජලයෙන් කිරි වෙන් කොට පානය කරන්නා සේ මේ ආර්‍ය්‍ය පුද්ගලයෙකුට නොදැන හෝ කිසි ලෙසකින් සුරාවක් නොපෙවෙත්ම ය. කිසි කලක දැන දැන කෙලෙස් සිතකින් සිකපද බිඳීමක් නැත්තේ ම ය. ධර්‍ම විනය නොදැනීමෙන් ප්‍රඥප්ති වද්‍ය සිකපද බිඳීම විය හැකිය.

## ☸ ලෞකික සරණගමනය.

තෙරුවන් ගුණ අරමුණු කොට ප්‍රඥවන්තයාගේ සිත ඒ ගුණ විශේෂයෙහි සැක නූපදවා කෙලෙස් කිලුටු අත්හරිමින් අර්‍ථ වශයෙන්

බුද්ධාදී රත්නත්‍රෙයහි ගුණ ඇදහීම, පිළිගැනීම "**ලෞකික සරණගමනය**" නම් වේ. ශ්‍රද්ධා මූලික සම්‍යක්දෘෂ්ටියෙහි පිහිටා ගෙන දසවිධ පුණ්‍ය ක්‍රියා වස්තුන්ගෙන් දිට්ඨිජුකම්ම නමින් කියවෙන දෘෂ්ටිය ඍජු කර ගැනීම මේ ලෞකික සරණාගමනයයි. මෙය "**අත්තසන්නීයාතන සරණාගමනය, තත්පරායන සරණාගමනය, ශිෂ්‍යභාවෝපගමන සරණාගමනය, පණිපාත සරණාගමනය**" යනුවෙන් සතර වැදෑරුම් වේ.

## ⌘ අත්තසන්නීයාතන සරණාගමනය

මාගේ ආත්මභාවය භාග්‍යවතුන් වහන්සේට පරිත්‍යාග කරමි. නවලෝකෝත්තර ධර්මයට ද, අෂ්ටාර්‍ය පුද්ගල සංඝයාට ද මාගේ ආත්මභාවය පරිත්‍යාග කරමි. මාගේ ජීවිතය ද පරිත්‍යාග කරමි. රත්නත්‍රයට මාගේ ආත්මය ද ජීවිතය ද පරිත්‍යාග කරන ලද්දේමය. දිවි කෙළවර කොට ඇති උතුම් ම පිහිට, රැකවරණය රත්නත්‍රය යැයි ප්‍රතිඥා කොට "**බුද්ධං සරණං ගච්ඡාමි**" යනුවෙන් සමාදන් ව ගැනීම අත්තසන්නීයාතන සරණාගමනය යි.

## ⌘ තත්පරායන සරණාගමනය

මම අද පටන් රත්නත්‍රය පිහිට කොට ඇත්තෙම් වෙමි යැයි ප්‍රතිඥා කොට "**බුද්ධං සරණං ගච්ඡාමි**" යනුවෙන් සමාදන් ව ගැනීම "**තත්පරායන සරණාගමනය**" නම් වේ.

## ⌘ ශිෂ්‍යභාවෝපගමන සරණාගමනය

මම අද පටන් රත්නත්‍රයට ශිෂ්‍යයෙක් වෙමි. මෙසේ මම ශිෂ්‍යයෙකු කොට දරන සේක්වා යැයි "**බුද්ධං සරණං ගච්ඡාමි**" යනුවෙන් සමාදන් ව ගැනීම "**ශිෂ්‍යභාවෝපගමන සරණාගමනය**" නම් වේ.

## ⌘ පණිපාත සරණාගමනය

මම අද පටන් රත්නත්‍රයටම වැඳීම පිදීම ගෞරව සත්කාර සම්මානාදිය කරන්නෙමි මෙසේ මා දරාගණු මැනව යැයි **"බුද්ධං සරණං ගච්ඡාමි"** යනුවෙන් සමාදන් ව ගැනීම **"පණිපාත සරණාගමනය"** නම් වේ. මේ පණිපාත සරණාගමනය **ඥති - භය - ආචාර්‍ය්‍ය - දක්ෂිණාර්හ** වශයෙන් සිව් වැදෑරුම් වන්නේය. එයින් බුදු රජාණන් වහන්සේ නෑයෙකි යැයි ඥතිකම සැලකීමෙන් ද, බුදු රජාණන් වහන්සේ රාජ පූජිතය, මහානුභාව ඇත්තේය. එබැවින් නො වඳින්නේ නම් අනර්ථයක් විය හැකිය යැයි බිය හේතුවෙන් ද, බුදු රජාණන් වහන්සේ මාගේ ආචාර්‍ය්‍යවරයාය. එබැවින් නො වැඳ සිටීම නුසුදුසු ය යැයි ආචාර්‍ය්‍ය වශයෙන් සැලකීමෙන් ද සරණ නො පිහිටන්නේ ය.

යමෙක් **"මෙතෙමේ ම ලොව ආයර්‍ය භාවයට පැමිණියේය. ලොව සියලු සත්වයන්ට උතුම් ය. අග්‍ර දක්ෂිණාර්හය"** යැයි වැඳීම පිදීම ගෞරව සත්කාර සම්මානාදිය කරන්නේ ද හෙතෙමේටම **"බුද්ධං සරණං ගච්ඡාමි"** යනුවෙන් සමාදන් ව ගැනීමෙන් සරණ පිහිටන්නේය. මෙසේ සරණ **දක්ෂිණාර්හ** භාවයෙන් ශ්‍රේෂ්ඨ වශයෙන් ගැනීමෙන් ම පිහිටන්නේ ය. **ඥති - භය - ආචාර්‍ය්‍ය** භාවයෙන් ශ්‍රේෂ්ඨ වශයෙන් ගැනීමෙන් බිඳෙන්නේ ය.

මෙසේ රත්නත්‍රය සරණ ගිය බුද්ධ ශ්‍රාවකයෙකු අන්‍ය තීර්ථකයන් වෙත පැවිදි වූ හෝ ගිහි වූ හෝ තම ඥතියෙකු වෙත ගොස් ඥතිකම සලකා වැඳීමෙන් ද, රජ තෙමේ රටවැසියන් විසින් වඳිනු පුදනු ලබන්නේ ය. එබැවින් වැඳීම - පිදීම නොකළහොත් නපුරක් කරන්නට බැරි නැතැයි බිය හේතුවෙන් වැඳීම - පිදීම කිරීමෙන් ද, ශිල්ප ශාස්ත්‍ර ඉගැන්වූ වූ අන්‍ය තීර්ථකයකුට ගුරු ගෞරවයෙන් වැඳීම - පිදීමාදිය කරන්නාගේ ද සරණ නොබිඳෙන්නේය.

මේ **ලෞකික සරණගමනය** රත්නත්‍රය පිළිබඳ ගුණ නොදැනීමෙන් ද, ඒ මහත් වූ ගුණයන් පිළිබඳව උපදනා සැකයෙන් ද, රත්නත්‍රය පිළිබඳව වැරදි ආකාරයෙන් දැකීමෙන් ද කිලිටි වන්නේය. තවද මේ ලෞකික සරණගමනය **සාවද්‍ය - අනවද්‍ය** වශයෙන් දෙවැදෑරුම් වේ. එයින් **සාවද්‍ය සරණගමනය** අන්‍ය ශාස්තෲවරයෙකු

අත්තසන්නීයාතන ආදි ලෙස සරණ ගැනීමෙන් බිඳෙන්නේ ය. මෙයින් අනිෂ්ට විපාක ලැබෙන්නේ ය. **අනවද්‍ය සරණගමනය** මරණයෙන් බිඳෙන්නේ ය. මෙයින් අන්‍ය ශාස්තෘවරයන් සරණ ගැනීමක් නොවන බැවින් **අනවද්‍ය** සරණාගමනය නම් වේ.

මේ ලෞකික සරණාගමනය අත්තසන්නීයාතන ආදී, සතරාකාරයෙන් ම හෝ එක් ආකාරයකින් හෝ සරණ ගැනීමෙන් පිහිටන්නේ ය. මේ අජාසත් රජතුමා **පණිපාත සරණාගමනයෙන්** සරණ ගියේය.

ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස, අද පටන් දිවි හිමියෙන් සරණ ගියා වූ උපාසකයෙකු කොට මා දරණ සේක්වා යැයි උපාසක භාවය ප්‍රතිඥා කළේ ය.

මෙහි "**උපාසක**" යනු දිවි හිමි කොට අන් ශාස්තෲවරයෙකු හෝ ධර්මයක් හෝ සරණ පිහිට වශයෙන් නො අදහන්නා වූ නො පිළිගන්නා වූ රත්නත්‍රයම සරණ පිහිට කොටගත් තැනැත්තාය. භාග්‍යවතුන් වහන්සේ මේ උපාසකයාගේ ලක්‍ෂණ මේසේ වදාළ සේක.

බුද්ධශාවක වූ උපාසක භාවයට පැමිණියෙකු බුද්ධ රත්නය සරණ ගියේ වේද, ධර්ම රත්නය සරණ ගියේ වේද, සංඝ රත්නය සරණ ගියේ වේද මෙපමණකින් උපාසකයෙකු වේ. ඒ උපාසක තෙමේ සුගති මග, දුගති මග, නිවන් මග මේ මේ යැයි යා යුතු නොයා යුතු මග දැන දුක් කෙළවර කිරීම පිණිස පිළිපන්නෙකු වේ. එබැවින් **සත්ව වෙළඳම, ආයුධ වෙළඳම, වස විෂ වෙළඳම, මත් ද්‍රව්‍ය වෙළඳම, වහල් වෙළඳම** යන අධර්ම වෙළඳමෙන් වැළකුනෙකු වේ. නිති පන්සිල්, උපෝසථ සිල් සමාදන්ව පුරමින් සමථ විපස්සනා භාවනා වඩමින් සුපිරිසිදු ගුණගරුක දිවියක් ගත කරන්නෙකු වේ. යම් දිනක පටන් තෙරුවන් සරණ ගියේ වේ ද, එතැන් පටන් ඒ උපාසක තෙමේ **තෙරුවන් කෙරෙහි ශ්‍රද්ධාවෙන් යුක්ත වේ ද, සීලයෙන් යුක්ත වේ ද, ත්‍යාගවන්ත වේ ද, ශ්‍රමණ දර්ශනය කැමති වේ ද, ධර්ම ශ්‍රවණයට කැමති වේ ද, ඇසූ ධර්මය මතකයෙහි තබා ගනී ද, එය නැවත නැවත සිහි කරයි ද, අර්ථ වටහා ගනී ද, එහි ප්‍රතිපත්ති වශයෙන් හැසිරෙයි ද** මෙබඳු උපාසක තෙමේ තමාට හිත වැඩ

කරගන්නා වූ උපාසකයෙක් වේ. එසේම අන් අය මේ ධර්‍මයෙහි යොදවයි ද මෙතෙමේ අනුන්ට හිත වැඩ පිණිස පිළිපන්නෙකු වේ.

මෙහි දී අජාසත් රජතුමා **භාග්‍යවතුන් වහන්ස යම්තාක් මාගේ ජීවිතය පවතී ද, ඒ තාක් මම වෙනත් ශාස්තෘවරයෙකු නැති, භාග්‍යවතුන් වහන්සේ ම ශාස්තෘ කොට සරණ ගිය කැපකරු උපාසකයෙකු ලෙස භාග්‍යවතුන් වහන්සේ මා පිළිගන්නා සේක්වා. දැනගන්නා සේක්වා** යැයි ප්‍රතිඥා කොට නැවත ද මෙසේ කීවේය.

ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස, තියුණු කඩුවකින් මාගේ හිස සිඳ දැමූ නමුත් අද පටන් මම බුදු නොවූවෙකු බුද්ධ යැයි කියා ද, ධර්‍මය නොවූවක් ධර්‍මය යැයි කියා ද, සංඝ නොවූවක් සංඝ යැයි කියා ද නොකියන්නෙමි යනුවෙන් තම ආත්මභාවය පමුණුවාලීමෙන් සරණ ගොස්, තමා විසින් කරන ලද අපරාධය සිහි කොට ප්‍රකාශ කරමින් මෙසේ කීවේය.

**"අච්චයො මං, භන්තෙ, අච්චගමා යථාබාලං යථාමූළ්හං යථා අකුසලං, යොහං පිතරං ධම්මිකං ධම්මරාජානං ඉස්සරියකාරණා ජීවිතා වොරොපෙසිං. තස්ස මෙ, භන්තෙ භගවා අච්චයං අච්චයතො පතිගණ්හාතු ආයතිං සංවරායා"ති.**

ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස! මම මාගේ පියා වූ ධර්‍මයෙහි හැසිරුණු ධාර්මිකවම රාජ්‍යානුශාසනා කළ රජතුමා මාගේ බලය අණසක යෙදවීමෙන් රාජ්‍ය සම්පත් ලෝභයෙන් දිවියෙන් තොර කෙළෙමි. භාග්‍යවතුන් වහන්ස, ඒ අපරාධය බාල බැවින් මෝඩ බැවින් අදක්ෂ බැවින් මා ඉක්මවා ගියේය. භාග්‍යවතුන් වහන්ස, මින් මතු මා මෙබඳු වරදෙහි නොයෙදෙනු පිණිස භාග්‍යවතුන් වහන්සේ මගේ වරද වරද වශයෙන් පිළිගෙන මට සමාව දෙන සේක්වා යැයි පැවසුවේ ය.

එවිට භාග්‍යවතුන් වහන්සේ රජු අමතා මෙසේ වදාළ සේක.

**"මහරජ, ඔබ තම පියා වූ ධර්‍මයෙහි හැසිරුණු ධාර්මික රජෙකු වූ ඒ මහ රජතුමා ජීවිතක්ෂයට පත් කලෙහි ද, ඒකාන්තයෙන් බාලයෙකු, අනුවණයෙකු, අදක්ෂයෙකු බවට පත්ව වරද ඔබ ඉක්මවා ගියේ ය.**

**මහරජ, ඔබ යම් හෙයකින් වරද වරද වශයෙන් දැක ධර්මය ලෙස එයට පිළියම් කරන්නෙහි නම් මින් මතු එබඳු අපරාධ කර්මයන් නොකරනු පිණිස ආයති සංවරයට පැමිණෙන්නෙහි නම්, මෙය ආර්යය විනයෙහි (බුදු සසුනෙහි) ගුණයන්ගෙන් වැඩි දියුණුව පිණිස ම වන්නේය"** යැයි වදාළ සේක.

භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළ කල්හි අජාසත් රජතුමා භාග්‍යවතුන් වහන්සේට මෙසේ සැල කෙළේය. ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස, දැන් අපි පිටත්ව යමු. රජ වූ අපට බොහෝ වැඩකටයුතු ඇත්තෝ වෙමු යැයි කීවේය.

භාග්‍යවතුන් වහන්සේ, මහරජ, එසේ නම් ඔබට යාමට සුදුසු කාලය ඔබ ම දැනගනුව යැයි වදාළ සේක.

එකල්හි රජාසත් රජතුමා භාග්‍යවතුන් වහන්සේ වටා තෙවරක් ප්‍රදක්ෂිණා කොට නිය දසය එක් කොට බබළන ඇඳිලිය සිරසෙහි පිහිටුවා පෙනෙන තෙක් මානයේ පසුපසට ගොස් භාග්‍යවතුන් වහන්සේ නොපෙනී යන තැන්හිදී ගෞරව සම්ප්‍රයුක්තව පසඟ පිහිටුවා වැඳ නික්ම ගියේ ය.

භාග්‍යවතුන් වහන්සේ අජාසත් රජතුමා නික්ම යෑමෙන් පසු නොබෝ වේලාවකින් භික්ෂු සංඝයා ආමන්ත්‍රණය කොට මෙසේ වදාළ සේක.

මහණෙනි, මේ රජ තමන් ම වනසා ගත්තෙහි ය, මහණෙනි, මේ රජ සිය පියා නැසීමෙන් කළ කර්ම අපරාධය හේතුවෙන් උපනිඃශ්‍රය සම්පත් නැමති මුල් උදුරා දමන ලද්දේය. මුල සිඳගත්තෙකි. පිහිට නැති කර ගත්තෙකි. එබැවින් කෙලෙස් මල දුරු කිරීමෙන් ලබන්නට තිබුණු ආර්ය මාර්ගය ගිලිහී ගියේය. යම් හෙයකින් මේ රජු තම පියා ඝාතනය නොකරන ලද්දෙකු වී නම් දැන් මෙහි ම හුන්නේ මෙලෙස දේශනා කරන ලද ධර්මය අසා ඒ ආසනයෙහි දීම සෝවාන් මාර්ගයට පැමිණියෙකු වන්නේය.

පාප මිත්‍ර ආශ්‍රයෙන් මේ රජු ආනන්තර්‍ය්‍යය පාපකර්මයක් කර ගැනීමෙන් අපරාධකරුවෙකු වූයේය. මෙලෙස මරණින් මතු ඒකාන්තයෙන් ම අවීචි මහ නිරයට වැටී කල්පයක් දුක් විඳීමට හේතු වූ එබඳු බැරෑරුම් අකුසල කර්ම පතයක් ඇත්තේ නමුත් තථාගතයන් වහන්සේ වෙත එළඹ තෙරුවන් සරණ ගියේ වේ ද, ඒ හේතුවෙන් මාගේ ශාසනයෙහි මහත් බව නිසා යම් කිසිවෙකු, පුරුෂයෙකු මරා මල් මිටක් පමණ දඬුවමකින් ඒ අපරාධ කර්මයෙන් නිදහස් වන්නේ ද, එසේම මේ රජු ද ලෝකුම්භ නිරයෙහි ඉපද වසර තිස් දහසක් පැසෙමින් යට යන්නේ ය. නැවත වසර තිස් දහසක් පැසෙමින් උඩ ඇවිත් අපායෙන් නිදහස් වන්නේ ය.

මෙම සාමඤ්ඤ ඵල සූත්‍රය ශ්‍රවණය කොට අජාසත් රජතුමා විසින් කුමන ආනිශංසයක් ලබන ලද්දේ වේ ද? මහා ආනිශංසයක් ලබන ලද්දේය. මේ රජතුමා තම පියා මැරූ දින පටන් රෑ ද, දවල් ද නින්දක් නොලැබුවේම ය. ශාස්තෘන් වහන්සේ වෙත එළඹ මේ මඳුර වූ ඕජස් සහිත සූත්‍ර දේශනාව ඇසූ තැන් පටන් නින්ද ලැබීය. තෙරුවනට මහත් සත්කාර කළේ ය. පඤ්චසතික සංගායනාවෙහි දී එයට ආරක්ෂා සංවිධානය කරමින් බ්‍රහ්ම විමානයක් බඳු වූ අලංකාරමත් රත්න මණ්ඩපයක් ඉදිකොට, සිව්පස ප්‍රත්‍යයෙන් උපකාර කරමින් මහත් වූ සත්කාරයක් කලේ ය. භාග්‍යවතුන් වහන්සේගේ ශාසනයෙහි පෘතග්ජන ශ්‍රද්ධාවෙන් යුක්තව පැහැදුනවුන්ගෙන් මේ රජතුමා හා සමානයෙකු නම් නැත. මේ රජතුමා අනාගතයෙහි කල්ප ලක්ෂයකින් මතු **"විජිතාවි"** නමින් පසේ බුද්ධත්වයට පැමිණ පිරිනිවෙන්නේ ය.

භාග්‍යවතුන් වහන්සේ මෙම නිර්‍ගාථක සූත්‍ර දේශනාව වදාළ සේක. සතුටු වූ සිත් ඇති ඒ භික්ෂූන් වහන්සේලා භාග්‍යවතුන් වහන්සේගේ දේශනාව සතුටින් පිළිගත්හ.

සාධු සාධු සාධු

## ❄ පුණ්‍ය ප්‍රාර්ථනා

**"ඉති තං සඬ්ඛරොන්තෙන - යං තං අධිගතං මයා,**
**පුඤ්ඤං තස්සානුභාවෙන - ලොකනාථස්ස සාසනං,**

**"ඔගාහෙත්වා විසුද්ධාය - සීලාදිපටිපත්තියා,**
**සබ්බෙපි පාණිනො හොන්තු - විමුත්තිරසභාගිනො"**

මා විසින් දිවා රෑ වෙහෙසී මෙම අගනා ධර්ම ග්‍රන්ථය සැකසීමෙන් යම් කුසලස්කන්ධයක් රැස්කර ගන්නා ලද්දේ වෙම් ද, ඒ කුසලානුභාවයෙන් ලෝක නාථයන් වහන්සේගේ ශාසනයට විශුද්ධ වූ සීලාදී ප්‍රතිපත්තියෙන් බැසගෙන සියලු සත්ත්වයෝ විමුක්ති රසයෙහි හිමිකරුවෝ වෙත්වා.

**"චිරං තිට්ඨතු ලොකස්මිං - සම්මාසම්බුද්ධසාසනං,**
**තස්මිං සගාරවා නිච්චං - හොන්තු සබ්බෙපි පාණිනො"**

සම්මා සම්බුද්ධ ශාසනය ලොව බොහෝ කලක් නිර්මලව පවතීවා! සියලු සත්ත්වයෝ තථාගත ධර්මයෙහි සැම කල්හි ගෞරව ඇත්තෝ වෙත්වා!

**"සම්මා වස්සතු කාලෙන - දෙවොපි ජගතීපති,**
**සද්ධම්මනිරතො ලොකං - ධම්මෙනෙව පසාසතූති"**

සුදුසු කල්හි වැසි වසීවා. ලොවට අධිපති විශුද්ධ ධර්මයෙහි පිහිටියා වූ දෙවියෝ ද (බ්‍රහ්මයෝ ද) ධර්මයෙන්ම ලෝ වැසියන්ට අනුශාසනා කරත්වා!

(මෙම ප්‍රාර්ථනා ගාථා ඉතිවුත්තකට්ඨකථාවෙනි.)

**"ඉමිනා පුඤ්ඤකම්මෙන - මා මෙ බාලසමාගමො,**
**සතං සමාගමො හොතු - යාව නිබ්බානපත්තියා"**

ලොව පහළ වන ආශ්චර්යය පුද්ගලයන් වන බුදුරජාණන් වහන්සේ ගේ ශ්‍රාවක වූ භික්ෂූන් වහන්සේ ට එම පැවිදි දිවියෙන් ලැබිය හැකි ශ්‍රමණ ඵල වර්ණනා කොට දැක්වීමේ මහඟු කුසල බලයෙන් මාගේ ආචාර්යය උපාධ්‍යා උතුමන් වහන්සේලාට ද, මව්පිය ඤාතීන්ට ද,

උපකාරක අනුග්‍රාහක සැමට ද, සදේවක ලෝකවාසී සියලු සත්ත්වයන්ට ද මට ද නිවනට පැමිණීම දක්වා ම අසත්පුරුෂාදීන් ගේ ඇසුරක් කිසි කලෙක නොවේවා. එසේම නීවරණ, සොළොස් මහා උපක්ලේශ ආදී කෙලෙසුන් ගේ ද සතුරුකමක් නොමග යැවීමක් නොවේවා. බුදු, පසේ බුදු, මහ රහතන් වහන්සේලාගේ ද, සිල්වතුන්ගේ ද, ගුණවතුන්ගේ ද ඇසුර සැම කල්හි ලැබේවා. සත් තිස් බෝධිපාක්ෂික ධර්‍ම, දස පාරමිතා දී උසස් ගුණ පූර්‍ණය කරගෙන ත්‍රිලක්ෂණ, චතුරාර්‍ය්‍යසත්‍ය ධර්‍මය සුවසේම අවබෝධ කරගෙන ප්‍රාර්ථිතීය බෝධියෙන් නිවන්සුව ලබන්නට හේතු වාසනා වෙත්වා!

සාධු... සාධු... සාධු...

**නිමි.**

### ❄ ආශ්‍රිත ග්‍රන්ථ:-


| | |
|---|---|
| දීඝ නිකාය - 1 බු: ජ: මුද්‍රණය | බෞ: සං: මධ්‍යස්ථානය |
| දීඝ නිකාය - 1 | D P. D. සොයිසා පරිවර්තනය |
| අංගු : නි: ඡ: නිපාතය බු ජ මුද්‍රණය | බෞ: සං: මධ්‍යස්ථානය |
| දීඝනිකායට්ඨකථා - 1 සි: පරිවර්තනය | බෞ: සං: මධ්‍යස්ථානය |
| අංගුත්තරනිකායට්ඨකථා 2 සිංහල පරි: | ” |
| උදානට්ඨකථා සිංහල පරි: | ” |
| සුත්තනිපාතට්ඨකථා සිංහල පරි: | ” |
| ජාතකට්ඨකථා - 5 ” | ” |
| විශුද්ධි මාර්‍ගය ” | ” |
| සද්ධර්‍ම සාගර ධම්මපද වර්‍ණනාව | අම්බ: ධම්මකුසල නා හිමි |
| සූවිසි මහ ගුණය | රේරු: චන්‍දවිමල නා හිමි |
| උපසම්පදා සීලය | ” |
| පාලි සිංහල ශබ්දකෝෂය | මඩිතියවෙල සුමංගල හිමි |
| මහා සිංහල ශබ්දකෝෂය | හරිස්චන්ද්‍ර විජේතුංග |
| පූජාවලිය | කිරි ඇල්ලේ ඤාණවිමල හිමි |